# ආඛ්‍යාන narrations

*open access, refereed journal*
ISSN 2478-0642 | Volume 06 | Issue 02| 2021



**Center for Indigenous Knowledge and Community Studies (CIKCS)**
**Sabaragamuwa University of Sri Lanka**

# ආඛ්‍යාන narrations

*open access, refereed journal*

ISSN 2478-0642
Volume 06 | Issue 02| 2021
Sabaragamuwa University of Sri Lanka



**Attribution-NonCommercial-ShareAlike**
**CC BY-NC-SA**
Legal Code: https://creativecommons.org/licenses/by-nc-nd/4.0/legalcode



**Editorial Board**

Dr. Jayaprasad Welgama – Editor in Chief
BA Hons, MA, PhD

Prof. Sarath Ananda
BA Hons, M.Phil, PhD

Prof. Manoj Ariyarathne
BA Hons, MA, PhD

Prof. Hiniduma Sunil Senevi
BA Hons, MA, PhD

Dr. E. P. N. Udaya Kumara
BSc (sp), Msc, PhD

A. H. Lareena
B.A, M.A

Prabath Galagamage
BA Hons, M.A, M.Phil

Nalaka Jayasena (Language Editor - Sinhala)
BA Hons, Dip in NLP

S.P.S.P. Weerasinghe (Language Editor - English)
BA Hons

**Reviewers**

Prof. Emer. Kalinga Tudor Silva
Prof. Emer. H.M.D.R Herath
Prof. Premakumara De Silva
Dr. Sumudu Premachandra



Submit your academic papers to jwelgama@gmail.com or gprabath@gmail.com

**Center for indigenous Knowledge and Community Studies**
**Sabaragamuwa University of Sri Lanka**

**Cover Page**

Sathsara Illangasinghe

නාට්‍ය නිර්මාණ කාර්යය ගැටුම් මූලාශ්‍රයක් බවට පත්වීම පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්: දූව හා පිටිපන පාස්කු නාට්‍ය හා බැඳුණු සමාජ ගැටුම් ඇසුරෙන්
**ඉරංගා සමින්දනී වීරක්කොඩි | සමන් එම්. කාරියකරවන**

ශ්‍රී ලාංකේය බෞද්ධ පෙරහැර සංස්කෘතියේ උඩැක්කි නර්තන කලාව හින්දු ආභාසයක් ද?
**කේ.එම්. සමන් කුමාරතුංග**

ශ්‍රී ලංකාවේ කසළ කඳු උප සංස්කෘතිය: මීතොටමුල්ල කසළ කන්ද ඇසුරෙන් සිදු කරන ලද සමාජ විද්‍යාත්මක අධ්‍යනයක්

**සුපේෂලා රත්නායක**

බෞද්ධ සාහිත්‍යයික ප්‍රස්තුත චිත්‍රණය කිරීමේ දී ශ්‍රී ලාංකේය චිත්‍ර ශිල්පියා විශද කළ නිර්මාණ ශක්‍යතාව: අනුරාධපුර හා පොළොන්නරු අවධිවල බිතු සිතුවම් ඇසුරෙන්
**අයි.එම්.ටී. ඉලංගසිංහ**

අතීතය සහ ආඛ්‍යාන, ඉතිහාසයේ ස්වභාවය පිළිබඳ මුල්කාලීන අදහස සහ එහි න්‍යායාත්මක පසුබිම පිළිබඳ විමසීමක්
**ඉන්දික තෙන්නකෝන්**

ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රභවය, විකාසනය හා 1971 පළමු සන්නද්ධ අරගලය පිළිබඳ කෙටි විමර්ශනයක්

**දේව මයිකල් ද සිල්වා**

Authoritative Domestic Power versus Latent Domestic Power: The Decision-Making Process in the Context of Rural Sri Lanka

**N.V.G. Hemantha Kumara**

ආඛ්‍යාන narrations

**Volume 06 | Issue 02 | July - December 2021 | Article 01**
**ISSN 2478-0642**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

CC BY NC ND

# නාට්‍ය නිර්මාණ කාර්යය ගැටුම් මූලාශ්‍රයක් බවට පත්වීම පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්: දූව හා පිටිපන පාස්කු නාට්‍ය හා බැඳුණු සමාජ ගැටුම් ඇසුරෙන්

**ඉරංගා සමින්දනී වීරක්කොඩි**[1]
PhD, MPhil, MA (Mass Communication), MA (Buddhist Ayurvedic Counseling), PG Dip. in Writership and Communication, BFA (Sp), "Sangeetha Visharadh" degree from the Bhatkande University of Lucknow, India.
iranga.w@vpa.ac.lk

**සමන් එම්. කාරියකරවන**[2]
PhD (Reading), M.A, B.A (sp)
kariyakarawana@gmail.com

**සාරසංක්ෂේපය**

චතුර්වේදය ස්පර්ශ නො කළ හැකි ජනයාට ද වින්දනය කළ හැකි වෙනත් වේදයක් ලෙස නාට්‍ය ශාස්ත්‍රය මහාබ්‍රහ්ම විසින් නිර්මාණය කරනු ලැබූ බව භරතමුනිහු නාට්‍යශාස්ත්‍රයේ දී සඳහන් කළහ. ඉන් ගම්‍ය වනුයේ තත් සමාජයේ පැවති කුල ගැටුම් සමථය සඳහා නාට්‍ය කලාව රැකුලක් වූ බවයි. ගැටුම් නිරාකරණය පිළිබඳ පර්යේෂණ කර ඇති බුද්ධිමතුන් රාශියක් ම නාට්‍ය කලාව ගැටුම් විපරිවර්තක මාධ්‍යයක් ලෙස භාවිත කිරීම පිළිබඳ අත්දැකීම් සංග්‍රහ කොට ඇත. 1980 දශකයේ ඉතා දරුණු තත්ත්ව යටතේ වුව ලංකාව තුළ නාට්‍ය කලාව අර්බුදයන්ට ගොදුරු නොවී ගැටුම් සහිත ප්‍රදේශවල පවා සහජීවන මාධ්‍යයක් ලෙස පැවති බව රංජනී ඔබේසේකර පෙන්වා දී තිබේ. අයර්ලන්තය පදනම් කොටගෙන ගැටුම් අධ්‍යයනයේ යෙදෙන **Mary Moynihan** නාට්‍ය කලාව ගැටුම් විපරිවර්තක මෙවලමක් ලෙස නම් කර ඇත. එවන් සාධනීය ගැටුම් නිවාරක මූලාශ්‍රයක් වූ නාට්‍යකරණය පදනම් කොටගෙන ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ **දූව** හා **පිටිපන** ජීවත්වන ප්‍රජාව අතරේ නිර්මාණය වී ඇති, ඉතා තදින් එම ජන සමාජයට බලපෑ ගැටුම් දෙකක් සිද්ධි ලෙස අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික කාර්යය යි. මේ පර්යේෂණය සඳහා ප්‍රදේශ දෙකෙහි ම නාට්‍ය හා සම්බන්ධ පුද්ගලයන් දොළොස්දෙනකු සමග සාකච්ඡා කළ අතර, ග්‍රන්ථගත මූලාශ්‍රය

---

[1] අධ්‍යක්ෂ, සී.ද. එස්. කුලතිලක සංරක්ෂණ හා පර්යේෂණ ඒකකය, සංගීත පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

[2] බාහිර කථිකාචාර්ය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

ඇසුරෙන් නාට්‍යයේ පැරණි ස්වභාවය පිළිබඳ කරුණු අනාවරණය කර ගන්නා ලදී. නාට්‍ය රඟදැක්වීම් හා සාකච්ඡා පටිගත කෙරිණ. එම දත්ත ගුණාත්මක ව විශ්ලේෂණයෙන් සොයාගත හැකි වූ කරුණු නම්, මේ සමාජය එක ම ආගමික සංස්ථාවකට අයත් වුව ද එහි විවිධ කණ්ඩායම් අතර ඇති විශේෂ අනන්‍යතා හා අපේක්ෂාවන් ය. යොහාන් ගල්තුන් ගේ ගැටුම් ත්‍රිකෝණයට අනුව සංස්කෘතික ව්‍යුහයේ පවත්නා විසමතා නාට්‍ය ක්‍රියාවලියට බලපා ඇති බව නිරීක්ෂණය විය. එම ගැටුම් මතුපිටට ගෙන එන මාධ්‍ය බවට නාට්‍ය ක්‍රියාවලිය පත් ව ඇත. පාස්කු නාට්‍යය මේ ප්‍රදේශවල සංස්කෘතික ප්‍රාග්ධනයක් ව ඇති අතර, එය උරුමයක් හෝ බූදලයක් ලෙස බෙදාගැනීමට යාමේ දී මේ ගැටුම් නිර්මාණය වී ඇති බව පෙනීයන්නකි. පොදු ජන උරුමයක් ලෙසත්, අධ්‍යාපනික මූලාශ්‍රයක් ලෙසත් ඊට ඇති වටිනාකම මේ ගැටුම් ඇති වීමට හේතුකාරක වී ඇත.

**ප්‍රමුඛ පදඃ** පාස්කු නාට්‍ය, දූව, පිටිපන, ජන නාට්‍ය, ගැටුම, කතෝලික ආගම

**හැඳින්වීම**

නාට්‍ය ශාස්ත්‍ර සංග්‍රහයෙහි නාට්‍යය යන්න **ශ්‍රීමත් වාසුදේව ශාස්ත්‍රී** විසින් හඳුන්වනු ලැබූයේ ''නැටුම චතුර්විධ අභිනයෙන් යුක්ත වූ කලට නාට්‍යය වශයෙන් හඳුන්වන්නේ ය'' යනුවෙනි.[3] **භරතමුනි** විසින් නාට්‍යය යන්න අර්ථ දැක්වනු ලැබූයේ ''ලෝකයේ පැවැත්ම අනුකරණය කිරීම නාට්‍යය වේ'' යනුවෙනි.[4] ''ශෝකාන්ත නාට්‍යය වූ කලී යම් කාර්යයක් අනුකරණය කිරීමයි''යනුවෙන් ග්‍රීකයේ විසූ **ඇරිස්ටෝටල්** මහා පඬිහු පැවසූහ.[5] මේ නිර්වචනවලින් ගම්‍ය වනුයේ නාට්‍යය යන්න හුදෙක් සෞන්දර්ය කාර්යයක් නො වන බවයි. එහි නිරූපණය වනුයේ විවිධ පුද්ගල චර්යාවන් ය. එමෙන් ම එය සතර අභිනයෙන් යුක්ත ක්‍රියාවලියක් නිසා බොහෝ විට සාමූහික ක්‍රියාවලියක් වේ. ආංගික, වාචික, සාත්වික හා ආහාර්ය යන අභිනයන් තනි පුද්ගලයෙකුට පහසුවෙන් ඉදිරිපත් කළ නොහැකි ය. ආහාර්ය අභිනය යනු ඇඳුම් විලාසිතා, තිර ආලෝකය ආදිය වේ. වාචිකාභිනය විෂයෙහි ගීත හා ඊට උපකාර වන සංගීතය ආදිය ද ඇතුළත් කළ හැකි ය. වාචිකාභිනය ප්‍රේක්ෂකයා ගේ ශ්‍රවණේන්ද්‍රියන්ට ගෝචර වේ. ඒ අනුව නාට්‍යය යනු සමාජ ක්‍රියාවකි. නාට්‍ය රඟදැක්වීම මෙන් ම එය නැරඹීම ද ප්‍රේක්ෂාවේ කොටසකි. රසිකත්වයෙන් හීන ප්‍රේක්ෂකයෝ ප්‍රේක්ෂාගාරයේ ඇති කුලුණුවලට සම වේ යැයි සම්භාව්‍ය සකු ඇදුරෝ ඇදහූ හ. ඒ අනුව නාට්‍යය පුද්ගල ක්‍රියාවක් නොවන බවත් සමාජීය ක්‍රියාවක් වන බවත් පැහැදිලි වන්නකි. මේ නිසා ම නාට්‍යය

[3] චතුර්ධාභිනයෝපෙතං ලක්ෂණාවෘත්තිතො බුධෛඃ
නර්තනං නාට්‍යමිත්‍යුක්තං සර්වත්‍රාභිනයෝ භවෙත් - (නාට්‍ය ශාස්ත්‍ර සංග්‍රහ)

[4] නානාභාවොපසම්පන්නං නානාවස්ථාන්තරාත්මකං
ලොකවෘත්තානුකරණං නාට්‍යමෙතද්භවිෂ්‍යති - (නාට්‍ය ශාස්ත්‍ර)

[5] Tragedy is the imitation of an action – (Poetics By **Aristotle** Written 350 B.C.E Translated by **S. H. Butcher**, Part vi)

සමාජය එකමුතු කිරීම සඳහා භාවිත කළ හැකි මෙවලමක් ය යන්න බොහෝ විචාරයන් විසින් පිළිගෙන ඇත. නාට්‍යයේ කාර්යයට සම්බන්ධ වන නිෂ්පාදක කණ්ඩායමත්, එහි ප්‍රේක්ෂක කණ්ඩායමත් යන සියලු දෙනා නාට්‍යය රංගනය තුළ සහජීවනයෙන් බැඳ තබන බව ඔවුන් තුළ වූ විශ්වාසය යි.

නාට්‍යය යනු මිනිස් ක්‍රියාකාරකමකි. ඉන් මනුෂ්‍යයා ගේ යම් පෞද්ගලික අවශ්‍යතාවක් ද තෘප්ත කරයි. එම පුද්ගලික අවශ්‍යතාව තෘප්ත කරන අතර ම සමාජ ක්‍රියාවක් ලෙස එය සහජීවනය ඇති කිරීම ද කරනු ලබයි. සමාජ ක්‍රියාවලියක් ලෙස එමගින් සහජීවනය ඇති කළ හැකි බව ක්‍රි.පූ 1 වන සියවස තරම් ඈත කාලයක භාරතයේ විසූ භරතමුනි පවා පිළිගෙන ඇත. බ්‍රිතාන්‍යයෙහි බොහෝ කලක් දිග්ගැස්සුණු අයර්ලන්ත වාර්ගික සටන් මධ්‍යයේ වුව නාට්‍යය මිනිසුන් අතර සහජීවනය ඇති කිරීමට හේතු වූ බව **Mary Moynihan** විසින් හෙළිදරව් කර ඇත. ලංකාවේ වියවුල් බහුල දශකය වූ 1980 දශකය තුළ සියලු වාරණයන් හා තාඩන පීඩන හමුවේ පවා නාට්‍ය කලාව ඉහළ මට්ටමක පැවති බව රංජනී ඔබේසේකර විසින් නිරීක්ෂණය කර ඇත. උතුරු - නැගෙනහිර ප්‍රදේශවල වාර්ගික සටන් මධ්‍යයේ පවා වාර්ගික භේදයකින් තොර ව නාට්‍ය කලාව පැවති බව ඇය ගේ නිරීක්ෂණය යි. ඒ අනුව නාට්‍යය සමාජ සහජීවනය ඇති කරන කලා මාධ්‍යක් ලෙස හඳුනාගෙන ඇතත් නාට්‍යය හා සම්බන්ධ වන පුද්ගලයන් ගේ අභිලාස මෙම සමාජ අර්ථය හා ගැටෙන අවස්ථාවල දී නාට්‍යය සමාජ සහජීවනය නැතිකරන මාධ්‍යයක් ලෙස ද ක්‍රියා කිරීමේ හැකියාව ඇත. එනම් තාවෝ දහමේ උගන්වන '**යැං**' වරෙක '**යුං**' වනවා සේ ම තවත් වරෙක '**යුං**' '**යැං**' වීම ද සිදු වේ. භරත ඇතුළු ශාස්ත්‍රඥයන් නාට්‍යයේ සමාජ කාර්යය හඳුන්වා දීමේ දී එහි පුද්ගල අභිලාස පිළිබඳ එතරම් අවධානයක් දක්වා නැත. මෙකී පර්යේෂණය මගින් සිදුකරනු ලබන්නේ නාට්‍යයේ සමාජ අභිලාස එහි ක්‍රියාකාරිකයන් ගේ පුද්ගල අභිලාස සමග ගැටෙන අවස්ථාවේ දී සිදුවන තත්ත්වය පැහැදිලි කිරීමයි.

**සාහිත්‍ය විමර්ශනය**

නාට්‍ය ශාස්ත්‍රයේ ආරම්භය පිළිබඳ **භරතමුනි** ගේ ප්‍රකාශනය මෙබඳු වේ.

> *''වේදයිතයන්ගෙන් තොර වූ ස්වර්ණමය යුගයෙන් අනතුරුව එළඹි රජත යුගයේ දී සාහිත්‍ය කලා ආදිය නිපදවීම සිදු විය. සියලු දෙවියෝ මහා බ්‍රහ්මයා හමු වී අනෙකුත් වේද සතර වෙන් කොට **ඇස් සහ කන් පිනවිය හැකි පස්වන වේදයක් මවන ලෙස ද එය බ්‍රාහ්මණ ක්ෂත්‍රිය වෛශ්‍ය වැනි ද්විජ කුලවලට පමණක් සීමා වුවක් නොව ශුද්‍ර කුල අයට ද පොදු එකක් විය යුතු යැයි ද ආයාචනය කළ හ.** මේ අයදුමට කන්දුන් මහා බ්‍රාහ්මයා පස් වන වේදයක් සම්පාදනය කරන්නට කටයුතු යෙදූහ. එහි දී මිනිසුන්ගේ සියලු චේෂ්ටාවන් සම්බන්ධයෙන් දෙනු ලබන සියලු උපදෙස් ඉතිහාසය සමග බද්ධ විය යුතු යැයි නියම කෙරිණ. මේ කටයුත්ත සම්පාදනය කිරීම සඳහා මහා බ්‍රහ්ම තෙම පෙළ කියවීම ඍග් වේදයෙන් ද ගීතය සාම වේදයෙන් ද අංගාභිනය යජුර් වේදයෙන් ද චිත්තවේගී හැඟීම් අථර්ව වේදයෙන් ද උපුටා ගන්නා ලද්දේ ය. අනතුරුව*

*මා හැඟි රඟහලක් තනන්නැයි දිව්‍ය ගෘහ නිර්මාණ ශිල්පී වූ විශ්වකර්මට නියම කළ හෙතෙම එ තුළ හිඳගෙන මෙසේ නිම වූ කලාව අභ්‍යාස කරන්නැයි භරතමුනිවරයාට උපදෙස් දුන්හ''* (නාට්‍ය ශාස්ත්‍ර. පරි. මාරසිංහ, 1994:1-18).

භරතට අනුව නාට්‍යය යනු ආගම මගින් බෙදා වෙන්කරන ලද සමාජය ඒකරාශී කරන විකල්ප ක්‍රියාමාර්ගය යි. එමගින් බ්‍රාහ්මණයන්ට මෙන් ම කොන්කරන ලද ශුද්‍ර ජනයාට ද වින්දනයක් ලැබිය හැකි බව ඔහු පිළිගෙන ඇත. කුල වශයෙන් වෙන් කරන ලද ජන සමාජය යළි ඒකරාශී කිරීමේ විභවය නාට්‍ය කලාව තුළ ඇති බව මධ්‍යතන අවධියේ සිටි බුද්ධිමතුන් විසින් පිළිගනු ලැබ ඇති බව භරතගේ උක්ත විස්තරයෙන් වටහා ගත හැකි ය. සියල්ලට ඉහළින් දෙවියන් ගේ අණසක පැවති අවධියේ පවා සාමූහික මිනිස් ක්‍රියාකාරකමක් වූ නාට්‍යය මගින් මනුෂ්‍යයන් අතර ඒකමිතියක් තැනීමට දැරූ ප්‍රයත්නයක් ලෙස භරතගේ මේ විග්‍රහය සැලකිය හැකි ය. නාට්‍යය ගැටුමට නොව සහජීවනයට හේතු කාරක වන බව ඔහු ගේ විශ්වාසය විය.

එක්සත් රාජධානිය එකිනෙකට වෙනස් සංස්කෘතික කලාප තුනක එකතුවකි. එංගලන්තය, අයර්ලන්තය හා ස්කොට්ලන්තය යන මේ කලාප තුන අතර තවමත් පූර්ණ එගඟතාවක් නැත. **ජෙරී ඇඩම්** ගේ නායකත්වයෙන් සන්නද්ධ ක්‍රියාමාර්ගයක් දක්වා අයර්ලන්ත විමුක්තිවාදීන් ගමන් කර ඇත. අයර්ලන්තයේ පවත්නා විවිධ අන්තවාදී පිරිස් අතර සහජීවනය ඇති කිරීම සඳහා නාට්‍යය භාවිත කරන ප්‍රමුඛ නාට්‍යවේදිනියක ලෙස **මේරි මොයිනිහාන්** හඳුනාගත හැකි ය. **මොයිනිහාන්** සම්බන්ධ වූ ව්‍යාපෘති රාශියක් වේ. ඇය සහජීවනය සඳහා යොදාගන්නා ප්‍රධාන ම මෙවලම නාට්‍යය යි.

**ස්මාෂිං ටයිම්ස්** සහ **කොරිමීලා** අයර්ලන්ත ප්‍රජා සාම මධ්‍යස්ථාන විසින් ක්‍රියාත්මක කරන ලද **ඇක්ටිං ඩිෆරන්ට්** ව්‍යාපෘතිය ද නාට්‍ය මගින් සහජීවන පැතිරවීම පිළිබඳ කදිම නිදසුනකි. **ලිස්බර්න්**හි විරුද්ධවාදී ප්‍රජාව සමග පවත්වන ලද නාට්‍ය වැඩමුළු සහ සම්මන්ත්‍රණ මාලාවකින් මෙම වැඩසටහන සමන්විත විය. උතුරු අයර්ලන්තයේ **කාසල්රීග්** සහ අයර්ලන්ත ජනරජයේ **කවුන්ටි ලිට්‍රිම්** ප්‍රදේශයේ ජනයා සමග මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ සාමය ගොඩනැගීම හා ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම සඳහා උසස් තත්ත්වයේ නාට්‍ය ක්‍රියාවලීන් භාවිත කිරීමයි. **ස්මාෂිං ටයිම්ස්** රඟහල සමාගමේ වෘත්තීය රංග ශිල්පීන් එකී අරමුණ සාක්ෂාත් කරගැනීමෙහිලා වැඩමුළු පැවැත්වීය. ව්‍යාපෘතියේ භාවිත වන නාට්‍ය වැඩමුළු ආකෘති තුනකි. වර්ගවාද විරෝධී නාට්‍ය නිර්මාණය කිරීම, නිකායික විරෝධය

ප්‍රවර්ධනය කිරීම සහ කතන්දර කීම තුළින් සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම එම ආකෘති වේ (**Moynihan** & **Manweiler**, 2011). **මොයිනිහාන්** ගේ මූලිකත්වයෙන් **ස්මාෂිං ටයිම්ස්** ආයතනය විසින් සාමය හා ප්‍රතිසංධානය සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘති රාශියකි. **Acting for Peace, Acting for the Future, Acting for Change** ඉන් කිහිපයක් පමණි. මේ සියල්ල නාට්‍ය කලාව සාමය හා සහජීවනය සඳහා ප්‍රායෝගික ව භාවිත කළ ව්‍යාපෘති වේ (**Moynihan**, 2008 & 2012).

ලංකාව ද ගැටුම් පිළිබඳ දිගු ඉතිහාසයක් ඇති රටකි. 1970 දශකයේ අවසාන භාගයේ සිට දිගින් දිගට ම ජාතිවාදී ගැටුම් ද පන්තිය පදනම් කරගත් ගැටුම් ද අද වන විට ආගම මූලික කරගත් ගැටුම් ද වශයෙන් ලාංකිකයෝ විවිධ ගැටුම් අත්දකිමින් සිටිති. 1980 දශකය ගැටුම් අතින් විශේෂ කාල සීමාවකි. ගැටුම් සහ සීමා පැනවීම් මධ්‍යයේ පවා 80 දශකයේ දී නාට්‍ය කලාව බිම්ගත නොවී පොදු ජන අවකාශ තුළ රැඳෙමින් ජනතාව ගේ වින්දන අවශ්‍යතා සම්පූර්ණ කළ ආකාරය රංජනී ඔබේසේකර විසින් අධ්‍යයනය කරනු ලැබ ඇත. 1983 දී ඇති වූ සිංහල ද්‍රවිඩ කෝලාහල නිසා ජාති දෙක අතර මහත් විරසකයක් ඇති වුව ද දකුණේ නාට්‍ය උතුරේ ප්‍රදර්ශනය කිරීමට එය බාධාවක් නො වූ බව ඇය ගේ නිරීක්ෂණය යි. 1987 - 1989 කාලයේ දී ඇති වූ සිංහල තරුණයන් ඇති කළ සිවිල් යුද්ධයේ දී රාජ්‍යය විසින් කවර ආකාරයේ බාධා කිරීම් කළ ද නාට්‍ය කලාව පොදු මහජන අවකාශයෙන් පලා නොගිය බව ඔබේසේකර නිරීක්ෂණය කරයි (**Obeyesekere**, 1995:1). මිනිස් සමාජය වියවුල් සහිත වුව ද නාට්‍යය වැනි සාමූහික කලා මාධ්‍යයකට සහජීවනය වෙනුවෙන් පෙනී සිටිය හැකි බව ඇය ගේ අධ්‍යයනයේ ගම්‍යාර්ථය යි.

ඉහත අධ්‍යයනය කළ අවස්ථා තුන ම නාට්‍යය සමාජ ක්‍රියාවක් ලෙස සලකා සිදු කළ අධ්‍යයන වේ. නාට්‍යය සමාජ ක්‍රියාවක් මෙන් ම පුද්ගල ක්‍රියාවක් ද වේ. නාට්‍යයට සම්බන්ධ වන පිරිස නාට්‍යය විෂයෙහි අධි නිශ්චය වී ඇති අර්ථ සම්භාරය පමණක් අනුයන්නෝ නොවෙති. නාට්‍යයට සම්බන්ධ වන විවිධ පුද්ගලයන්ට ඔහු ජීවත්වන කාලයේත් අවකාශයේත් සීමා හා කොන්දේසිවලට මුහුණ දීමට සිදු වේ. ඒ කොන්දේසි විසින් නාට්‍යයේ සමාජ අර්ථ විස්ථාපනය කරනු ලබන අවස්ථා ද තිබිය හැකි ය. නාට්‍යය නමැති ක්‍රියාව අන්තර්පුද්ගල සබඳතාවක් ලෙස ඉතා ගැඹුරු සමාජ ආර්ථික දේශපාලන ව්‍යුහයන් දක්වා විශ්ලේෂණය කළ හැකි ය. සමාජ ක්‍රියාවක් ලෙස නාට්‍යය සහජීවනය හා සාමය උදෙසා වන ක්‍රියාකාරකමක්

ලෙස භාවිත කිරීමට ඇති හැකියාව එලෙස ම පවතිද් දී ඊට සම්බන්ධ වන පුද්ගලයන් ගේ අපේක්ෂා අතර ගැටුම් නිර්මාණය වීම සිදු විය හැකි ය. නාට්‍යය කලාවක් ලෙස පමණක් හදාරන අයෙකුට නාට්‍යය තුළ ඇති මේ ගැටුම්කාරක මූලාශ්‍රය මගහැරී යයි. නාට්‍යය ගැටුම් නිවාරක සමාජ ක්‍රියාවක් මෙන් ම ගැටුම්කාරක සමාජ ක්‍රියාවක් වීමේ විභවතාවෙන් ද යුතු බව එය කලාවක් මෙන් ම සමාජ ක්‍රියාවක් ලෙස ගෙන අධ්‍යයනය කළ විට හඳුනාගත හැකි ය.

**පර්යේෂණ ගැටලුව**

නාට්‍යය ගැටුම් නිවාරක මූලාශ්‍රයක් ය යන්න පෙර අපර දෙදිග න්‍යායයිකයින් විසින් පිළිගෙන ඇත. එහෙත් සෑම කාලයක ම සෑම සන්දර්භයක දී ම මේ න්‍යාය එලෙසින් ම ක්‍රියා කරන්නේ ද යන්න ගැටලු සහගත වේ. සාමූහික ක්‍රියාවලියක් වූ නාට්‍යය ඒ සාමූහික බව නිසා ම ගැටුම් මූලාශ්‍රයක් වීමේ විභවතාවෙන් ද යුක්ත වේ. ඒ අනුව නාට්‍යය ගැටුම් නිවාරක මූලාශ්‍රයක් පමණක් ද යන්න මෙහි දී විමර්ශනයට ලක් කෙරෙයි.

**පර්යේෂණ අරමුණු**

මෙම අධ්‍යයනයේ අරමුණු තුනකි. ගැටුම් විපරිවර්තක මාධ්‍යයක් ලෙස නාට්‍ය කලාවෙහි උපයෝගිතා හඳුනාගැනීම, නාට්‍ය කලාව හා වෙනත් සමාජ ව්‍යූහ අතර ඇති සම්බන්ධය අධ්‍යයනය කිරීම සහ කතෝලික පාස්කු නාට්‍ය ඇසුරෙහි වර්තමානයෙහි නිර්මාණය වී ඇති ගැටුම් විග්‍රහ කිරීම එකී අරමුණු වෙයි.

**පර්යේෂණයේ වැදගත්කම**

නාට්‍ය සම්බන්ධව දැනට ඇති ඇතැම් න්‍යායාත්මක කරුණු ඍෂි භාෂිතයන් වේ. ඉන් පරිබාහිරව ගොඩනැඟී ඇති දැනුම ද ගැඹුරු පර්යේෂණ හරහා සම්පාදනය කළ අවස්ථා ඉතා දුලබ වේ. නාට්‍යය ගැටුම් නිවාරකයක් ලෙස භාවිත කළ හැකිය යන දැනුම මේ සන්දර්භ දෙක තුළ ම සම්පාදනය වී ඇත. එමගින් සම්පාදිත න්‍යායාත්මක කරුණු සිද්ධියෙන් සිද්ධියට වෙනස්වීමේ සම්භාවිතාවක් පවතී. මේ තත්ත්වය මානව ශාස්ත්‍ර විෂයන් සියල්ලෙහි ම පාහේ බහුලව දක්නට ඇතත්, දැනට සංගෘහිත න්‍යායාත්මක කරුණු අභියෝගයට ලක් කරන ආකාරයේ සංසිද්ධීන් අධ්‍යයනය කොට ඒවා සංග්‍රහ කිරීම දක්නට ලැබෙනුයේ ඉතා අල්ප වශයෙනි. ශුද්ධ විද්‍යාවන්හිදී දැනට පවත්නා න්‍යායක් අභියෝගයට ලක්කරමින් සිදු කරනුයේ වෙනත් නව න්‍යායයක් නිර්මාණය කිරීමයි. මෙම අධ්‍යයනය එම ධාරාවෙන් වෙනස් වෙයි. එමගින් දැනට පවත්නා න්‍යායික දැනුම ප්‍රශ්න කරන මුත් වෙනත් විකල්ප න්‍යායක් සම්පාදනය කිරීම සිදු නොකරයි. එමගින් න්‍යායෙහි ඇති සූත්‍රගත ස්වාභාවය වඩා ලිහිල්භාවයට පත් කිරීම

පමණක් අපේක්ෂා කෙරෙයි. මෙම අධ්‍යයනය නිසා පූර්වන්‍යාය අභාවිත නොවන අතර, එහි භාවිතයේ වෙනස්කම් පමණක් යෝජනා කෙරෙයි.

**පර්යේෂණ විධික්‍රමය සහ ක්‍රමවේදය**

සිද්ධි අධ්‍යයනය මෙහි මූලික ප්‍රවේශයකි. මෙය අවශ්‍යතාව සඳහා නියැදීම **(Purposive Sampling)** අනුව අධ්‍යයන ප්‍රදේශය ලෙස බස්නාහිර පළාතෙහි ගම්පහ දිස්ත්‍රික්කයට අයත් මීගමුව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි **දූව'** ග්‍රාම නිලධාරි වසම (162 ඒ) සහ **'පිටිපන'** ග්‍රාම නිලධාරි වසම (162) තෝරා ගැනිණි (සිතියම් 01 බලන්න). එහි දී **දූව** හා **පිටිපන** ප්‍රදේශ දෙකෙහි පාස්කු නාට්‍ය ආශ්‍රිත ව නිර්මාණය වී ඇති ගැටුම් දෙකක් සිද්ධි ලෙස අධ්‍යයනය කිරීම සිදු කෙරිණ. ගුණාත්මක තනි පුද්ගල සාකච්ඡා, ක්ෂේත්‍ර නිරීක්ෂණ, කණ්ඩායම් සාකච්ඡා, වාර්තා අධ්‍යයන හා සාහිත්‍ය මූලාශ්‍රය ආශ්‍රිත තොරතුරු ආදිය යොදාගනිමින් දත්ත රැස් කෙරිණි. උක්ත සිද්ධි අධ්‍යයනය තුළ **යොහාන් ගල්තුන්ග්** ගේ ගැටුම් අයිස් කඳු මාදිලිය (**Conflict Iceberg Model**) අනුව යමින් මේ ගැටුම්වල පුද්ගල අපේක්ෂා සමාජීය ගැටුම් දක්වා දිග්ගැස්සෙන ආකාරය විශ්ලේෂණය කෙරිණ. පර්යේෂණයේ දී සොයාගනු ලැබූ දත්ත **මැන්ෆ්‍රෙඩ් මැක්ස්නීෆ්** ගේ අවශ්‍යතා හා තෘප්තිමත් වීමේ වින්‍යාසය (**Matrix of Needs and Satisfiers**) පාදක කොටගෙන ද විශ්ලේෂණය කිරීම කරනු ලැබිණ. එමගින් නාට්‍යය නමැති සමාජ ක්‍රියාව කවර පුද්ගල අපේක්ෂා ඉටුකරන්නේ ද යන්න සොයා බැලිණ.

**සාකච්ඡාව**

දූව ප්‍රදේශයේ ගැටුම නිර්මාණය වී ඇත්තේ පාස්කු නාට්‍යයේ ප්‍රධාන චරිතය වන 'ක්‍රිස්තු ප්‍රතිමාව' සම්බන්ධයෙනි. පාස්කු නාට්‍ය හා බැඳුණු උක්ත සිද්ධිය තුළ අපේක්ෂා ගැටෙන ආකාරයත් එමගින් නාට්‍ය ක්‍රියාවලියේ සාමූහිකත්වය බිඳී යන ආකාරයත් එනිසා නාට්‍ය ක්‍රියාවලිය බිඳවැටෙන ආකාරයත් නිරීක්ෂණය විය. එකී සිද්ධි අධ්‍යයනය මෙසේ ය.

වසර එකසිය අසූවක පමණ ඉතිහාසයක් ඇති දූවේ 'පාස්කු නාට්‍ය' දූව ධීවර ප්‍රජාව ගේ සංස්කෘතික අනන්‍යතාවකි (වීරක්කොඩි, 2017). දින හතළිහකට ආසන්න චතාරික සමයේ අවසන් සතියේ යෙදෙන 'මහ සිකුරාදා' මෙකී දුක්ඛඃප්‍රාප්ති නාටකය පැවැත්වෙනුයේ භක්ති අභ්‍යාසයක් ලෙසිනි. ගමේ සියලු දෙනා ගේ සහාය ඇති ව මෙකී නාට්‍ය සංවිධානය කෙරෙයි. චතාරික සමය හා ඍජු සබඳතාවක් දක්වන පාස්කු ජන වන්දනා පිළිවෙත හා බැඳි පාස්කු දුක්ප්‍රාප්ති නාට්‍ය දූව ප්‍රදේශයෙහි පැවැත්වීම නිසා ම එය '*පාස්කු ග්‍රාමය*' ලෙස ඉමහත් ජනප්‍රියත්වයට පත් ව තිබේ. දූව පාස්කු ගම පිළිබඳ 1989 වසරේ දී මර්සිලින් ජයකොඩි පියනම දුටු ආකාරය මෙබඳු ය.

> *පාස්කු දර්ශනයක් නැරඹීමට අප කිතුනුවෝ වැඩිදෙනා ප්‍රිය කෙරෙති. සමහරුන් එය කරනුයේ හුදු භක්තියෙන් ම ය. පොතේපතේ කියැවුණු දේ කෙසේ නාට්‍යාකාරයෙන් කෙරෙතිදැයි අත්හදා බැලීමය ය. ක්‍රිස්තු දුක්ප්‍රාප්තිය නැරඹීමෙන් හිතේ භක්තිය වැඩි කරගැනීමට ය. එය යහපත් දෙයක් වන හෙයින් පෙර කාලවල පොතපත කියවීමට පවා නොහැකි වූ අයට ආගම ඉගැන්වීමට කළ මේ උත්සාහය දැනුදු පවා සෙත සලසන දෙයකැයි පිළිගැනීමට ය.* (දූව ආශ්චර්යමත් ක්‍රිස්තු ප්‍රතිමාව, 1989)

අතීතයේ සුරුවම් උපයෝගි කරගනිමින් දුඃඛප්‍රාප්තිය රංග ගත කොට ඇති අතර, පාස්කු නාට්‍යයෙහි ප්‍රධාන චරිතය වන 'ආශ්චර්යවත් ක්‍රිස්තු ප්‍රතිමාව' දූව ග්‍රාමයට ලැබී ඇත්තේ ක්‍රි. 1839 පමණ දී ය. ඊට හේතු වී ඇත්තේ ලංකාවේ බඩු ගෙන ගොස් ඉන්දියාවේ දී විකුණා ඉන්දියාවේ බඩු ගෙනෙන අය අතර ප්‍රමුඛතාවක් දරා සිටි මිහිඳුකුලසූරිය අදිරියන් ප්‍රනාන්දු, මිහිඳුකුලසූරිය දුමින්ගු ප්‍රනාන්දු සහ මිහිඳුකුලසූරිය පේදුරු ප්‍රනාන්දු යන අය ගේ දායකත්වයක ප්‍රතිඵලයක් ලෙසිනි. මේ තිදෙනා කොචින් ග්‍රාමය සමග පැවති සම්බන්ධතා මත ***ජෝකීනු (ජොක්ක) මේස්ත්‍රි*** නැමැත්තා හඳුනාගැනීමත් සමග ප්‍රතිමාවෙහි වැඩ කටයුතු අරඹා තිබේ. මේ සඳහා බර පැන දරන්නට මිහිඳුකුලසූරිය පටබැඳි පවුල දායකත්වය ලබා දී ඇතැයි කියැවෙයි. වර්ෂ 1838 පාස්කු දර්ශනය පැවැත්වීමට සූදානමින් සිටි අවදියක ප්‍රතිමාව රැගෙන ඒමට දූවෙන් විශේෂ කණ්ඩායමක් **කොචින්** ගොස් ඇත. (**ජෝන් කැනීසියස් මැල්**) එන අතරමග මග දී චණ්ඩ මාරුතයකට අසු වූ බවත් ගමන් මාර්ගය වෙනස් කිරීමට සිදු වීමෙන් දින හයක් ගත වූ බවත් අනතුරුව 1838 මාර්තු 27 අඟහරුවාදා දූවට ගොඩ බැස්ස වූ බවත් කියැවෙයි (දූව ආශ්චර්යමත් ක්‍රිස්තු ප්‍රතිමාව, 1989). (හේමමාලා සහ දන්ත කුමරු දළදාව රැගෙන ඒමේ දී ද මෙවැනි ම බාධක රැසකට මුහුණු දුන් බව දළදා සිරිතෙහි සඳහන් වෙයි.) ප්‍රතිමාවට ගල්වා තිබූ වර්ණ ආලේප ගැටලුවක් හේතුවෙන් පාස්කු දර්ශනයට උක්ත ප්‍රතිමාව යොදා නොගත්ත ද මහා සෙනසුරාදා දින දූවේ ප්‍රජාවට පමණක් කුරුසියේ *උකුත්වීම* අවස්ථාව මෙම නව ප්‍රතිමාව ඇසුරින් දැකබලා ගැනීමට හැකි ව තිබේ. රන් ආලේපිත කිරීමෙන් පසු 1839 මහ සිකුරාදා දින ප්‍රථම වරට පාස්කු දර්ශනය සඳහා උපයෝගි කරගන්නා ලද බව කියැවෙයි (දූව ආශ්චර්යමත් ක්‍රිස්තු ප්‍රතිමාව, 1989). එතැන් සිට ජාකොමේ ගොන්සාල්වේස් පියනම විසින් රචිත දුක්ප්‍රාප්ති ප්‍රසංගයයේ දේශනාවට අනුව සුරුවම් හසුරුවමින් දූවේ පාස්කු දර්ශනය සිදු කර තිබේ.

දුඃඛප්‍රාප්තියේ උච්චතම අවස්ථාව වන මහ සිකුරාදා දින 'කුරුසියේ ඇණ ගැසීම' සහ 'ඉකුත්වීමේ' ජවනිකාව ඇතුළු ක්‍රිස්තු චරිතය විදහාපාන නාට්‍යමය අවස්ථා සඳහා එතැන් සිට මෙම සුරුවම යොදාගෙන තිබේ. පෞරාණික අගයකින් යුතු මෙකී සුරුවම දූව ධීවර ප්‍රජාව ගේ ජන ජීවිතය හා තදානුබද්ධ ව වන්දනාමානයට පාත්‍ර වූවකි. ''දූව පාස්කු ගම ගැනයි'' ලෙසින්

1989.04.03 මර්සිලින් ජයකොඩි පියනම ලියූ ලිපියක එකී ජන ජීවිතයේ ස්වභාවය හෙළි කර ඇත්තේ

> *''මෙහි තරුණ මහලු දෙපිරිසම තමුන් ගැන සැලකිලිමත් වීම සමගම දෙවියන් ගැන ද සැලකිලිමත්වීම ද එක සේ කළහ. ක්‍රිස්තු දුක්ප්‍රාප්තියට ඔවුනගේ දිවිය අධික ලෙස මුසු වී තිබුණ හෙයින් එතුමන් ඔවුනට ආරූඪ වී තිබුනා සේ ය. කුඩා ගමක් නිසා සියල්ලම එක පවුලක් සේ විසූහ.''* ලෙසිනි (දූව ආශ්චර්යමත් ක්‍රිස්තු ප්‍රතිමාව, 1989).

'දූව' ග්‍රාම නිලධාරි වසම වර්ග කිලෝමීටරයක භූමි භාගයකින් යුතු ශ්‍රී ලංකාවේ බටහිර වෙරළ සීමාවේ පිහිටි ධීවර ගම්මානයකි. පවුල් සංඛ්‍යාව 887 කින් යුතු එම දූපත තුළ ජීවත් වන ජනගහණය 3361 කි. ඉන් 98. 8 %ක් කතෝලිකයෝ වෙති (වීරක්කොඩි, 2017). දූව පාස්කු නාට්‍යයේ වෙනස්කම් කිහිපයක් වසර සියයකට පසු එනම් වර්ෂ 1939 දී සිදු වී ඇති අතර, මර්සලින් ජයකොඩි පියතුමා ගේ මැදිහත්කරණය ඊට හේතු වී තිබේ. සුරුවම් වෙනුවට නළු නිළි දායකත්වය, පාස්කු වේදිකාව නව ක්‍රමවේදයකට සැකසීම, වසර තුනකට වරක් නාට්‍යය පැවැත්වීම, මහ සිකුරාදා ජන වන්දනාව හා බැඳී පැවතීම, පාස්කු නාට්‍ය ගීත රචනා කිරීම සහ ඒවා සමාජගත කිරීම ජයකොඩි පියතුමාගේ අවශ්‍යතාව මත යම් වෙනසකට භාජනය වී තිබේ. දූවේ මීසම පාලනාධිපති මර්සිලිනු ජයකොඩි පියතුමන් දූවේ පාස්කු ඉතිහාසය වෙනස් කරමින් එතුමන් රචනය කළ පිටපත සහ පාස්කු දර්ශනයේ ගීත සියල්ල වේදිකා ගත කරන ලදී. ක්‍රිස්තු චරිතයේ විදහාපාන සුරුවම හැර අනෙකුත් සියලුම චරිත ජීවමාන මිනිසුන් යොදා රංගගත කරන ලදී. ඒ අනුව අනෙකුත් ප්‍රතිමා දූවේ පාස්කුව තුළින් ඉවත් විය. එනමුදු ආශ්චර්යමත් ක්‍රිස්තු ප්‍රතිමාව යොදාගැනිණි.




ඡායාරූප 01 ආශ්චර්යමත් ක්‍රිස්තු ප්‍රතිමාව; දූව, මීගමුව, බස්නාහිර පළාත

පාස්කු නාට්‍ය හා සබැඳි දූවේ ආශ්චර්යවත් ක්‍රිස්තු ප්‍රතිමාව සම්බන්ධ 1989 වසරේ දී 'ගැටුම' නිර්මාණය වී ඇත්තේ 150 වන ජුබිලියත් සමගිනි. මිහිඳුකුලසූරිය පරම්පරාවට අයත් එකම සහෝදර ජන කොටසක් ලෙස ජීවත් වූ දෙපිරිසක් අතර මෙකී ගැටුම ඇති වූයේ 20 වන සියවසේ අගභාගයේ දී ව්‍යාපාරික කටයුතු පහසුව සඳහා සමහර දෙනා මීගමුවට සංක්‍රමණය වීමෙන් පසුව ය. එකී ජන ප්‍රජාව ධීවර කටයුතු මෙන් ම අරක්කු රේන්ද කටයුතුවලින් මුදල් උපයාගත් ධනවතුන් ලෙස පිළිගැනීමට ලක් ව තිබේ. සිය ආගමික කටයුතු සඳහා පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් දේවස්ථාන ගොඩනගා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ඔවුහු ශාන්ත පීතර දේවස්ථානය ගොඩනගා ගත්හ. පසුකලක දී මොවුන් මිහිඳුකුලසූරිය පටබැඳිගේ ලෙස හඳුන්වා තිබේ. දූව ධීවරයින්ට වඩා මොවුන් ධනයෙන්, කුලයෙන්, බලයෙන් උසස් ඉඩම් හිමියන් යැයි සම්මුඛ සාකච්ඡාවල දී නිරීක්ෂණය විය. සිංහල බෞද්ධ වෙළෙඳ ප්‍රජාව ගේ නැගී ඒම සහ නගරාශ්‍රිත බෞද්ධ විහාරස්ථාන ඉදිවීම අතර ඇති සම්බන්ධතාව ද මෙබඳුම බව කුමාරි ජයවර්ධන පෙන්වා දෙයි (කුමාරසිරි සහ වක්කුඹුර, 2006). කුඩා නැව් අයිතිකාරයන් වූ මොවුන් ධීවර කර්මාන්තයට අමතර ව පොල් වතු අයිතිකාරයින් ලෙස ද පසු ව රේන්ද අයිතිකාරයින් බවට ද පත් ව තිබේ. එවක යාපනයෙහි පැතිර ගිය කොළරා වසංගතයට හැලි අරක්කු ප්‍රතිකාරයක් ලෙස සුදුසු යැයි පැවති විශ්වාසය මත යාපනයේ මිනිසුන් රත්තරන් දී හැලි අරක්කු ගත් බවත්, ඉන් විශාල ලාභයක් අත්කරගැනීමත් සමග විශාල ධනස්කන්ධයක් උපයා ගත් බවත් නම හෙළි කිරීමට අකැමැති ප්‍රසිද්ධ සමාජ ක්‍රියාකාරකයෙකු පවසා සිටියේ ය. දූව ග්‍රාමයේ ආශ්චර්යවත් ක්‍රිස්තු ප්‍රතිමාව සඳහා මතෙස් පවුලේ දායකත්වය ලැබී ඇති හෙයින් ඔවුනට පවරා ඇති රාජකාරියක් ද දැකිය හැකි වෙයි. ප්‍රතිමාව තැන්පත් කර ඇති මංජුසාවෙහි යතුර භාරව ඇත්තේ මෙම පවුල සතුව බැවින් එය විවෘත කළ හැක්කේ මොවුනට පමණි.

දූව ග්‍රාමය තුළ කරාව වංශික එකම වාසගම සහිත කුල ස්තරායනයක් තුළ සුරුවම එළියට ගෙන පිහිදා දැමීම, වර්ණ ගැන්වීම, කඩතොළු ඇත්නම් සකස් කිරීම, කුරුසයේ ඇණ ගැසීම සහ නූල් ඇදීම එක් එක් පවුල් හෝ කණ්ඩායම් සතු වගකීමක් ලෙස පැවරී තිබේ. පවරන ලද අයෙකුට හැර එකී කාර්යයට මැදිහත්වීමට තව අයෙකුට ඉඩ ප්‍රස්තාව හිමි වන්නේ නැත. සිද්ධි අධ්‍යයනයේ දී නිරීක්ෂණ වූ ආකාරයට මිහිඳුකුලසූරිය පටබැඳි පරම්පරාවට මෙම ආශ්චර්යවත් ක්‍රිස්තු ප්‍රතිමාව සංකේතීය ප්‍රාග්ධනයකි. ගැටුම උද්ගත වන්නේ එබැවිනි. දේවස්ථානය මෙකී ගැටුම හඳුනාගෙන තිබූ බව මර්සිලින් ජයකොඩි පියනම 1989.04.03 දී තැබූ පහත සටහනකින් ද පෙනී යයි.

*සෑම පවුලෙන්ම එක්කෙනෙකු හෝ වැඩි ගණනක් හෝ නළු නිළියන් වශයෙන් පාස්කු සතියේ දී රඟපෑමට වේදිකාවට පැමිණීමත් ක්‍රිස්තු දුක්ප්‍රාප්තියට සහභාගි වූ පිරිසක් විසින් සැලකෙන හෙයින් ඔවුන් එකමුතු කිරීමට අදිසි හේතුවක් විය. ඒ අතරතුර මිනිස්කම නිසා යම් යම් අමනාපකම් සමහරුන් අතර ඇති වුවත්, පාස්කුව පැමිණෙත්ම සියල්ලෝම එක පවුලක් විය. එහෙයින් ඒ ගැමියන් අතර පැවතුණ සහෝදරකම අඛණ්ඩ පැවතිණ. එදත් එසේය. අදත් එසේය. එහෙයින් ඔවුන් අතර ක්‍රිස්තු භක්තිය ජීවමානව පවතී. අනික් කොයියම් ගමකවත් එවැන්නක් එපමණින් ජීවමානව පවතිනු නොපෙනේ* (දූව ආශ්චර්යමත් ක්‍රිස්තු ප්‍රතිමාව, 1989).

මර්සිලින් ජයකොඩි පියතම දූව ග්‍රාමය අනෙකුත් ග්‍රාම සමග සසඳා බලමින් ඉදිරිපත් කෙරෙන පහත අදහස ද මෙහිලා වැදගත් ය.

*අනෙක් ගම්මාන හා සසඳා බලන විට දූව අපේ අල්ලට ගත හැකි කුඩා ගමකි. මගේ හිත කියන්නේ ක්‍රිස්තු ගතිය මෙහි නිවැසියන් තුළ අරටු බහින්නට හේතුව ඒ ගමේ පුංචිකමය කියායි. විශ්වාසය ගැඹුරු හෙයිනුත් කලී කාලයක්ම දේව පිහිටයෙන් මුහුදු සමග පොර බදා අඩුපාඩුවෙන් තොරව එදිනෙදා රැකුණ හෙයිනුත් වෙන කිසිම විදිහක බලපෑමක් නොමැති ව දේව මාතාවන්ගේ අතේ හැදුන හැදෙන හෙයිනුත් නාසරෙනයේ ගෝචර පුළුල්කොට ගමකට පෙරළුනාසේ පෙනෙන* ***මේ ගමේ වැසියෝ ඔවුනගේ සියලුම ඕනෑ එපාකම්වල දී විසඳීම් සෙවීමට ඔවුනගේ හදවත ලෙස සැලකූ දෙව් මැදුර කරා ඇදුනහ. මේ දෙව් මැදුර හිස්ව පාලුව තිබුන මොහොතක් නොතිබුනා සේ ය.***

*උදයේ යාඥාවට ද දැල් පන්න ගෙන මුහුදට යනු පෙර ද මුහුදෙන් ආපසු ද සවස යාඥාවට ද භාරහාර වීමට ද මෙහි වැසියෝ දෙව් මැදුරට ඇදුනාහ. ප්‍රතිමාව ඇතා නැතා ඔවුහු ගියහ.* ***ප්‍රතිමාව ඇති දා වැඩිපුරත් ගියහ. එහෙයින් දුක්ප්‍රාප්තියේ සංකේතය වන ක්‍රිස්තු ප්‍රතිමාව ඔවුනගේ ජීවිතයේ සංකේතය ද විය*** (දූව ආශ්චර්යමත් ක්‍රිස්තු ප්‍රතිමාව, 1989).

දූව ග්‍රාමය තුළ ජීවත් වන මිහිඳුකුලසූරිය ධීවර කතෝලික ප්‍රජාවට මෙම ආශ්චර්යවත් ක්‍රිස්තු ප්‍රතිමාව සිය ජීවිතය හා බද්ධ වූවකි. කතෝලික ජන වන්දනාවෙහි වැදගත්ම කාල පරිච්ඡේදය වන චතාරික සමය තුළ දී මෙම ප්‍රතිමාව සමග බැඳෙන සහසම්බන්ධතාව එයට හේතු වී තිබේ. මෙය වසරේ අළු බදාදා දිනෙන් ඇරඹෙන දින 40 ක කාලයක් තුළ ජන වන්දනාවට පාත්‍ර වෙයි. ධීවර කටයුතුවලින් මෙන්ම නොයෙක් දුක් ගැහැටවලින් පීඩාවිඳින ජනයාට තම දුක බෙදාහදා ගැනීමේ මෙවලමක් වූයේ මෙම ප්‍රතිමාව බව පෙනී යයි. වී. පෙරින් පීරිස් මහතා සිය අත්දැකීම සඳහන් කරන්නේ මෙලෙසිනි.

*කුඩා කල සිටම සැමදාම සවස දෙව්මැදුරට ගැම එදා අපේ සිරිතක් විය. මෙයට ප්‍රධානම හේතු වූයේ මේ ශුද්ධ ප්‍රතිමාව යැයි කිවහොත් අතිශයෝක්තියක් නොවනු ඇත. අපේ ජීවිතයේ හැම දුකක්ම ජේසුතුමන් සමග බෙදා ගත්තෝ මේ ප්‍රතිමාව ඉදිරියෙහි දනින් වැටී කරනු ලබන යැදුම් වලිනි. මෙය ප්‍රතිමා භක්තියක් ලෙස සමහරුන් පෙන්වීමට උත්සහ කළත් එය එලෙස සීමා කිරීමට උත්සහ කිරීම ජන වන්දනාව හුදු බුද්ධිමය කෝණයකින් බැලීමක් ලෙස පිළිගත හැකි ය. තමන් කළ ඕනෑම වරදක් මේ ප්‍රතිමාව ඉදිරියේ දණගසා ප්‍රකාශ කිරීමට අප පුරුදු වී සිටියෙමු. මෙය ඉතා සාර්ථක පාපොච්ඡාරණයක් විය. මේ ප්‍රතිමා භක්තිය වටා විවිධාකර භක්ති අභ්‍යාස බැති වදන් අතර ප්‍රචලිත වීම සමහර බුද්ධිමතුන්ට තේරුම් ගැනීමට නොහැකිය. ප්‍රතිමාව ස්පර්ශ කිරීම ප්‍රතිමාව අසල තිබූ ගම්මිරිස් ප්‍රතිමාව ස්පර්ශ කළ නූල් ප්‍රතිමාව අසල දැල්වෙන පහන් පොල්තෙල් කටුඔටුන්න මේ සැම දෙයක්ම එක්තරා සංකේතයක් විය. එම සංකේතයෙන් එක්තරා ආධ්‍යාත්මික පණිවිඩයක් ගෙනඑන ලදී* (දූව ආශ්චාර්යමත් ක්‍රිස්තු ප්‍රතිමාව, 1989).

මෙකී ප්‍රතිමාව සමස්ත කතෝලිකයින් ගේ පූජනීය වස්තුවකි. දූව වැසියන් ගේ පමණක් නොව නොයෙක් ප්‍රදේශයන්හි සිට පැමිණෙන බැතිමතුන් එදා මෙන් අදත් දැකිය හැකි ය. ඊට හේතු කිහිපයකි. ප්‍රතිමාව තුළින් පරම්පරා ගණනක කිතුනුවන් ලබා ඇති වරප්‍රසාදයන් ය. ප්‍රාතිහාර්යාත්මක ලෙසින් දුක් ගැහැට රෝ බිය සෝ තැවුල් අපහසුතා දුරුකර ගැනීමට නන් දෙසින් බැතිමත්තු පැමිණ පිහිට පතා නිදුක් නිරෝගි ජීවිත ගත කරති. චතාරික සමයේ පමණක් මෙකී ප්‍රතිමාව දැක බලා ගැනීමට සහ ගෞරව දැක්වීමට අවස්ථාව හිමි වීම නිසා දේවස්ථානය වෙත නන් දෙසින් බැතිමත්හු පැමිණෙති. චතාරික සමයේ සිකුරාදා හය තුළ සහ ශුද්ධ වූ සතිය පුරා මෙම ප්‍රතිමා වන්දනයට ඉඩ ප්‍රස්තාව හිමිවෙයි. ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී නිරීක්ෂණය වූ පරිදි ජනතාව ගේ ජන වන්දනාව උදෙසා දේවස්ථානයේ විශේෂ මංජුසාවක මෙකී ප්‍රතිමාව තැන්පත් කර තිබිණ. මහසිකුරාදා දින පැවති දුක්ප්‍රාප්ති නාට්‍ය අවසානයේ දී නොයෙක් ප්‍රදේශවලින් පැමිණි ජනයා මංජුසාව අසළට පැමිණ ආශිර්වාද කළ නූල්, වතුර ආදිය රැගෙන යාමටත්, මෙම සුරුවම ඉදිරියේ සිය දුක් ගැහැට කීමටත් භාවිත කරනු එහිදී දක්නට ලැබිණ.

දූවේ ආශ්චර්යවත් ක්‍රිස්තු ප්‍රතිමාව සම්බන්ධ ගැටුම දූව පාස්කු නාට්‍ය සඳහා බලපෑමක් ඇති කෙරිණ. පාස්කු නාට්‍යයේ ප්‍රධාන චරිතය මෙන් ම දූව ධීවරයින් ගේ ජන ජීවිතය හා සමීප ක්‍රිස්තු ප්‍රතිමාව සම්බන්ධ ගැටුම සාකච්ඡා මාර්ගයෙන් හෝ මැදහත්කරණයෙන් විසඳා ගැනීමට නොහැකි වූ බව පෙනී යන්නකි. මීගමු නගරයෙහි පදිංචියට යන එක් පිරිසක් සහ නැගෙනහිර දූව ජන කණ්ඩායම අතර ඇති වූ මතභේද අවසන් වූයේ නඩු තීන්දුවකිනි (2137/විශේෂ, මීගමුව දිසා අධිකරණ තීන්දුව). එකී නඩු තීන්දු ප්‍රකාරව නැගෙනහිර දූව පාස්කු සංවිධානයට පාස්කු සුරුවමේ අයිතිය වසර දෙකක කාලයකට ද ශාන්ත පීතර දේවස්ථානයෙහි පාරම්පරික මීසම්වාසි සංවිධානයට එක් වසරක් සඳහා ද අයිතිය හිමි ව තිබේ. නඩු තීන්දු ප්‍රකාරව ප්‍රතිමාව තම දේවස්ථානයට හිමිවන වසරට අදාළව පමණක් පාස්කු නාට්‍ය රංගගත කිරීමට දූව කතෝලික ප්‍රජාව සූදානම් ව සිටියහ. දූව නැගෙනහිර කණ්ඩායම චතාරික සමයේ දී පාස්කු නාට්‍ය සම්බන්ධව ක්‍රියා කළහ. සින්දාත්‍රි දේවස්ථාන ජුබිලිය, පාස්කු නාට්‍ය චරිත තෝරාගැනීම, සිය පවුල් අනන්‍යතාව, අභිමානය ආදි විවිධ කරුණු හේතුවෙන් තව දුරටත් ආරවුල් සහ ගැටුම් ඇතිවිණ. එකී ආරවුල පසුව පාස්කු නාට්‍ය පිටපතෙහි අයිතිය ලබා ගැනීම දක්වා පැතිරිණ. දූව නැගෙනහිර සහ බටහිර ප්‍රදේශවාසීන් අතර නාට්‍ය පිටපතක් සඳහා වන ආරවුල දුටු පාස්කු නාට්‍ය පිටපත රචනා කළ මර්සලින් ජයකොඩි පියනම විසින් පාස්කු නාට්‍ය අත් පිටපතෙහි අයිතිය දූව ග්‍රාමයෙහි නැගෙනහිර ජීවත්වන මිහිඳුකුලසූරිය පරම්පරාව නියෝජනය කරන කණ්ඩායමට ස්ව කැමැත්තෙන් පවරා තිබේ. බටහිර දූව කණ්ඩායම් සිය අනන්‍යතාව පවත්වා

ගත්තේ රජතුන් කට්ටුව නාඩගම හා සම්බන්ධ වීමෙනි. එය නත්තල් සමයේ දී පැවැත්විණ. රජතුන් කට්ටුව නාඩගම අවසන් වරට පවත්වා ඇත්තේ 2010 වසරේ දී ය.

දූව ප්‍රදේශයේ ජීවත්වන ජනයා භක්තිමත් කිතුනුවෝ වෙති. පාස්කු නාට්‍යයට සම්බන්ධ වීම හරහා යම් පුද්ගලයෙකුට සමාජයේ කැපී පෙනීම උදෙසා මහඟු අවස්ථාවක් උදා කරයි. එනිසා පාස්කු නාට්‍යයේ පාර්ශ්වකරුවකු වීම මගින් විසල් සංකේතීය ප්‍රාග්ධනයක් උපයා ගැනීමට ඔවුනට අවස්ථාව හිමි වේ. ක්‍රිස්තු සුරුවම මෙම නාට්‍ය ක්‍රියාවලියෙහි ප්‍රධාන චරිතය වෙයි. ඒ වටා අනෙකුත් සියලුම චරිත හා ක්‍රියාවලි කේන්ද්‍රගත ව ඇති නිසා මෙම ක්‍රිස්තු සුරුවමට පල්ලිවල ඇති අනෙකුත් සුරුවම්වලට වඩා විශේෂිත වූ අගයක් ලැබී තිබේ. නඩු තීන්දුව මගින් සුරුවම අවස්ථා දෙකක් සඳහා කණ්ඩායම් දෙකකට භාවිත කිරීමට අවසර දීම නිසා පාස්කු නාට්‍ය කේන්ද්‍රකොටගෙන අන්‍යෝන්‍යතාව සකසා ගත් පිරිස් අතර ගැටුම් නිර්මාණය වී තිබේ. මෙම ගැටුම්කාරක නාට්‍යයම ගැටුම් නිවාරණය සඳහා යොදාගැනීමට පල්ලිය විසින් උත්සාහ ගෙන ඇතත් එය සාර්ථක වී නැත. මෙකී ගැටුම හේතුවෙන් දූව සංස්කෘතික අනන්‍යතාවක් වූ පාස්කු නාට්‍ය රඟ දැක්වීම වසර විස්සක කාලයක් බිඳවැටී ඇති අතර, සමාජ ගැටීමක් ද නිර්මාණය වී ඇති බව හෙළි වෙයි. ගැටුමට මූල හේතුව සුරුවමක් වුව ද එකම ආගමික, එකම කුල කණ්ඩායමක් අතර පවතින සැබෑ ගටුමට හේතු වී ඇත්තේ ඉඩම් දේපළ හිමි ප්‍රභූ පැළැන්තිය සහ සාමාන්‍ය ධීවර ප්‍රජාව අතර ඇති පන්ති විසමතාව සහ ආධිපත්‍ය බව ගම්‍ය වෙයි. එම සමාජ ස්ථරීගත ගැටුම ප්‍රකාශයට පත් වනුයේ නාට්‍ය ක්‍රියාවලිය හරහා ය.

**දෙවැනි සිද්ධි අධයයනයට** අදාළ **පිටිපන ගැටුම** නිර්මාණය වී ඇත්තේ පාස්කු නාට්‍ය හා සබැඳි පසන් ගායනයක් සම්බන්ධයෙනි. පිටිපන පාස්කු නාට්‍ය සඳහා ගීතය නැමති කලාංගය එක් ව ඇත්තේ මෑත කාලයක දී බව පෙනී යයි. එහි දී පාස්කු නාට්‍යයේ අවසන් ජවනිකාව සඳහා පිටිපන මා. ජයවීර විසින් ලියන ලද 'ආදර පුතුනේ' නමින් ගීයක් ඇතුළත් ව තිබේ. දේවමෑණියන් ගේ වැළැපීම ධ්වනිත කෙරෙන උක්ත ගීතය සම්බන්ධ ව ගායිකාව හා නිළිය එක් පාර්ශ්වයක් ලෙසත්, වෙනත් ගායිකාවක් දෙවන පාර්ශ්වය ලෙසත් මෙකී ගැටුමට සම්බන්ධ වී ඇත. එකී ගැටුමට අදාළ තොරතුරු පහත පරිදි වෙයි.

**'පිටිපන'** යනු මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි පිහිටි ග්‍රාම නිලධාරි වසම් සතරකින් සැදි කලාපයකි. එය වර්ග කිලෝමීටර 4.5 භූමි භාගයකින් යුක්ත ය. මෙහි ජීවත් වන ජනගහණය 16,010 කි. ඉන් බහුතරයක් එනම් 15,717 ක් කතෝලිකයෝ වෙති. එය ප්‍රතිශතයක් ලෙස 98.17%කි. (වීරක්කොඩි, 2017) පිටිපන සංස්කෘතික අනන්‍යතාව පිළිබඳ විමසීමේ දී පළමු

ව සිහිපත් වන්නේ **පිටිපන පාස්කුව** යි. පුරාවිද්‍යා ස්ථානයක් ලෙස නම් කොට ඇති ඓතිහාසික පාස්කු මණ්ඩපය ඊට සාක්ෂියකි (ඡායාරූප 02). මෙ රටට පැමිණි කතෝලික පූජකවරුන් ගේ සහය ඇති ව දෙව්මැදුර ඉදි කර, ඉන් පසු ව පාස්කු දුක්ප්‍රාප්ති නාට්‍ය ආරම්භ කළ බව ප්‍රදේශවාසීන්ගේ මතය යි. දකුණු පළාතේ රූකඩ ශිල්පියෙකු ලෙස කටයුතු කළ නයිදප්පුලාගේ මර්තීනු පේදුරු නම් වූ අන්නවිරාළගේ රූකඩ ශිල්පීය අත්දැකීම් එකී පාස්කුව සඳහා උපයෝගී කරගෙන තිබේ. ප්‍රතිමා රූප සහ සුරුවම් නිර්මාණය කරමින් ද, නූල් සූත්තරයෙන් ක්‍රියා කරවමින් ද පාස්කු දර්ශනය ඉදිරිපත් කිරීමට හෙතෙම පුරෝගාමී විය. වර්ෂ 1764 දී පිටිපන පාස්කු සම්බන්ධ වගකීම පිටිපන ග්‍රාමවාසීන්ට පැවරී තිබේ (රොහාන්, 2009). එතැන් සිට පාස්කු සුරුවම් නිර්මාණය කළේ නයිදප්පුලාගේ පරපුර ය. පාස්කු නාට්‍ය සඳහා ප්‍රසිද්ධියට පත් මේ ග්‍රාමය නාඩගම් කලාව සඳහා ද ප්‍රචලිත ය. 'පිටිපන' ග්‍රාමය සංස්කෘතිකාංග පෝෂණයෙහිලා තෝතැන්නක් ලෙස පිළිගැනෙයි.

පිටිපන පාස්කු නාටක තුළ ගීතයට ඉඩක් නොලැබූ බව වර්ෂ 1929 සහ 1933 දී රචිත පාස්කු නාට්‍ය අත්පිටපත් පරීක්ෂා කිරීමෙන් හඳුනාගත හැකි ය (රොහාන්, 1998). එසේ වුව ද 1965 වසරේ දී සලමන් ප්‍රනාන්දු විසින් රචනා කරන ලද පාස්කු නාට්‍ය පිටපතෙහි ගීත කිහිපයක් ඇතුළත් කර තිබේ (රොහාන්, 1998). ඒවා වර්තමානයේ අප්‍රකට ය. මෑත කාලයක දී පාස්කු නාට්‍යයේ අවසන් ජවනිකාව සඳහා පිටිපන මා. ජයවීර විසින් ලියන ලද 'ආදර පුතුනේ' නමින් ගීයක් ඇතුළත් ව තිබේ. මෙහි ගැටුම නිර්මාණය වී ඇත්තේ උක්ත පාස්කු නාට්‍ය හා සබැඳි පසන් ගායනය හා සම්බන්ධ තිදෙනකු අතර ය. A ඇග්නස් , B මැගිලින්, C මල්ලිකා යනු ඒ තිදෙනා යි.

**A** සහ **B** එකම පසන් ගායන කණ්ඩායමේ සාමාජිකාවන් දෙදෙනෙකි. පාස්කු නාට්‍ය ගීතය ගායනය කර ඇත්තේ **A** විසින් වන අතර, ඊට රංගනයෙන් දායක වී ඇත්තේ **B** ය. පුද්ගලික අභිමානය මූලික කොට ඇති වූ ගැටුම වර්තමානය වන විට එකිනෙකා අතර සන්නිවේදනය සහමුලින් බිඳවැටීම දක්වා දිග්ගැස්සී ඇත. වර්තමානයේ කතෝලික ජනමාධ්‍ය පසන් ගීත සඳහා තම ගුවන් කාලයෙන් ඉඩක් ලබා දීම හේතුවෙන් මෙකී තරගය තවදුරටත් නිර්මාණය වී ඇත. තම අනන්‍යතාව පිළිබඳ ඇති අයිතිය අභියෝගයට ලක්වීම හේතුවෙන් මෙකී තත්ත්වය දැකිය හැකි ය. තම තමාගේ ගායන හැකියාව දේවස්ථානයේ දී මහ සිකුරාදා දින හෝ චතාරික කාලය තුළ ගමට ම ප්‍රදර්ශනය කිරීමට තිබූ අභිලාස බිඳ වැටීම හේතුවෙන් ඇති වූ මානසික අසහනය මේ ගැටුමේ පදනම යි. **C** යනු ගැටලුවට බලපෑ ආදර පුතුනේ ගීතය

වර්තමානයේ මාධ්‍ය උදෙසා හෝ ප්‍රදර්ශනාත්මක අවස්ථාවල දී ගායනා කරන අයෙකි. ඇය පසුව ගායනයට එකතු වී ඇති බැවින් ද වෙනත් කණ්ඩායමක සාමාජිකාවක් වන බැවින් ද **A** සහ **B** දෙදෙනා ඊට අප්‍රසාදය පළ කරයි. මෙකී ගැටුම හේතුවෙන් පිටිපන පසන් ගායක කණ්ඩායම් දෙකොටසක් ලෙස බෙදී තම අනන්‍යතාව පෙන්නුම් කරමින් කටයුතු කරයි. එක් කාන්තාවක සියලු ගායනවලින් මෙන් ම ආගමික කටයුතුවලින් ද ඈත්ව හුදෙකලාව කාලය ගත කරයි. වර්තමානයේ පසන් ගායන ඉදිරිපත් කිරීම සහ සංරක්ෂණයට මාධ්‍ය ආයතන මෙන් ම කතෝලික දේවස්ථානය ද ප්‍රමුඛ ව කටයුතු කිරීම තුළ කැපීපෙනීම, අයිතිය හැඟවීම, අනන්‍යතා ප්‍රදර්ශනය කිරීම උදෙසා දැඩි තරගකාරිත්වයක් ඉස්මතු ව පවතින බව ද නිරීක්ෂණය වෙයි.

**පුද්ගල අවශ්‍යතා හා නාට්‍යමය අවශ්‍යතා**

නාට්‍යයේ අවශ්‍යතා එහි රංග සම්ප්‍රදාය හා වින්‍යාසය විසින් තීරණය කරනු ලැබේ. කවර නැටුම් විලාසයක් අවශ්‍ය ද යන්න මෙන් ම කවර ගායනයක් කවර ස්ථානයක ගැයෙන්නේ ද යන්න තීරණය වනුයේ එ මගිනි. එහෙත් පුද්ගල අවශ්‍යතා එතරම් සරල නොවේ. පුද්ගල අවශ්‍යතා පිළිබඳ විද්‍යාත්මක විදර්ශනාවක් අපට මුලින් ම හමු වනුයේ 1943 තරම් ඈත කාලයේ ඒබ්‍රහම් මාස්ලෝගේ "**A Theory of Human Motivation**" නමැති ලිපියෙනි (**Maslow**, 1943). අද වන විට මාස්ලෝ ගේ අවශ්‍යතා පිරමීඩය යම් පමණකට යල් පැනගොස් ඇත. අද මිනිස් අවශ්‍යතා පිළිබඳ න්‍යායයන් වඩා විස්තෘත මෙන් ම සංකීර්ණ ද වී ඇත. ඒ සංකීර්ණ ස්වභාවය ප්‍රකාශයට පත් වනුයේ මැන්ෆ්‍රෙඩ් මැක්ස් නීෆ් විසින් 1986 දී පළ කරනු ලැබූ **Human Scale Development** නමැති කෘතියේ සඳහන් කරුණුවලිනි. **මැක්ස්නීෆ්** ගේ පුද්ගල අවශ්‍යතා දාමය ධූරාවලිගත වූවක් නොවේ.

වගු අංක 01, **මැක්ස්නීෆ්**ගේ අවශ්‍යතා සහ තෘප්තියේ අනුකෘතිය

| **අවශ්‍යතා සහ තෘප්තියේ අනුකෘතිය** | | **පැවැත්මේ අවශ්‍යතා** | | | |
|---|---|---|---|---|---|
| | | **පැවැත්ම** | **තිබීම** | **කිරීම** | **අන්තර්ක්‍රියා කිරීම** |
| **ආචාරධාර්මික අවශ්‍යතා** | යැපීම | ශාරීරික සෞඛ්‍යය, මානසික සෞඛ්‍යය, සමතුලිතතාවය, හාස්‍යය පිළිබඳ හැඟීම,අනුවර්තනය වීමේ හැකියාව | ආහාර, නවාතැන්, වැඩ | පෝෂණය, ප්‍රජනනය, විවේකය, වැඩකිරීම | ජීවන පරිසරය, සමාජ පසුබිම |
| | ආරක්ෂාව | රැකවරණය, අනුවර්තනය වීමේ හැකියාව, ස්වාධීනත්වය, සමතුලිතතාවය, | රක්ෂණ පද්ධති, ඉතිරිකිරීම්, සමාජ ආරක්ෂාව, | සහයෝගයෙන් කටයුතු කිරීම, වැළැක්වීම, සැලසුම් කිරීම, රැකබලා ගැනීම, | ජීවන අවකාශය, සමාජ පරිසරය, වාසස්ථානය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | සහයෝගීතාවය | සෞඛ්‍ය පද්ධති, අයිතිවාසිකම්, පවුල, වැඩ | සුව කිරීම, උදව් කිරීම | |
| | සෙනෙහස | ආත්ම අභිමානය, සහයෝගිතාව, ගෞරවය, ඉවසීම, ත්‍යාගශීලිත්වය, පිළිගැනීම, ආශාව, අධිෂ්ඨානය, කාමුක හැඟීම, හාස්‍යය පිළිබඳ හැඟීම | මිත්‍රත්වයන්, පවුල, හවුල්කාරිත්වය, සොබාදහම සමග සබඳතා | ආදරය කරන්න, වැළඳගන්න, හැඟීම් ප්‍රකාශ කරන්න, බෙදාගන්න, බලාගන්න, වගා කරන්න, අගය කරන්න | පෞද්ගලිකත්වය, සමීපභාවය, නිවස, සාමූහික අවකාශය |
| | අවබෝධය | විවේචනාත්මක හෘදය සාක්ෂිය, පිළිගැනීම, කුතුහලය, විස්මයන්, විනය, ප්‍රතිභානය, තාර්කිකත්වය | සාහිත්‍ය, ගුරුවරුන්, ක්‍රමවේදය, අධ්‍යාපන ප්‍රතිපත්ති, සන්නිවේදන ප්‍රතිපත්ති | විමර්ශනය කරන්න, අධ්‍යයනය කරන්න, අත්හදා බලන්න, දැනුවත් කරන්න, විශ්ලේෂණය කරන්න, මෙනෙහි කරන්න | ආකෘතික අන්තර්ක්‍රියා, පාසල් , විශ්වවිද්‍යාල, ඇකඩමි, කණ්ඩායම්, ප්‍රජාවන්, පවුල |
| | සහභාගිත්වය | අනුවර්තනය වීමේ හැකියාව, පිළිගැනීම, සහයෝගිතාව, කැමැත්ත, අධිෂ්ඨානය, කැපවීම, ගෞරවය, ආශාව, හාස්‍යය පිළිබඳ හැඟීම | අයිතිවාසිකම් , වගකීම්, යුතුකම්, වරප්‍රසාද, වැඩ | අනුබද්ධ වන්න , සහයෝගයෙන් කටයුතු කරන්න, යෝජනා කරන්න, බෙදාගන්න, විරුද්ධ වන්න, කීකරු වන්න, මැදිහත් වන්න, එකඟ වන්න, අදහස් ප්‍රකාශ කරන්න | සහභාගිත්ව අන්තර්ක්‍රියා, පක්ෂ, සංගම්, පල්ලි, ප්‍රජාවන්, අසල්වැසිබව, පවුල |
| | උදාසීනත්වය | කුතුහලය, පිළිගැනීම, පරිකල්පනය, නොසැලකිලිමත්කම , හාස්‍යය පිළිබඳ හැඟීම, සන්සුන්භාවය, කාමුකත්වය | ක්‍රීඩා, කණ්ණාඩි, සමාජ ශාලා, සාද, මනසේ සාමය | දවල් සිහින, පැටවුන්, සිහින, පැරණි කාලය සිහිපත් කරන්න, මනස් කල්පිතයන්ට ඉඩ දෙන්න, මතක තබා ගන්න, විවේකීව, විනෝද වන්න, සෙල්ලම් කරන්න | පෞද්ගලිකත්වය, සමීපභාවය, සමීපතාවයේ අවකාශයන්, නිදහස් කාලය, වටපිටාව, භූ දර්ශන |
| | නිර්මාණය | ආශාව, අධිෂ්ඨානය, ප්‍රතිභාව, පරිකල්පනය, නිර්භීතකම, තාර්කිකත්වය, ස්වාධීනත්වය, නව නිපැයුම්, කුතුහලය | හැකියාවන්, කුසලතා, ක්‍රමය, වැඩ | වැඩ , නව නිපැයුම් , ගොඩනැගීම, සැලසුම් කිරීම, රචනා කිරීම, අර්ථ නිරූපණය කිරීම | ඵලදායී හා ප්‍රතිපෝෂණ සැකසුම්, වැඩමුළු, සංස්කෘතික කණ්ඩායම්, ප්‍රේක්ෂකයින්, අදහස් ප්‍රකාශ කිරීමට අවකාශය, තාවකාලික නිදහස |
| | **අනන්‍යතාවය** | අයිති හැඟීම, අනුකූලතාව, අවකලනය, ආත්ම | සංකේත, භාෂාව, ආගම, පුරුදු, සිරිත් විරිත්, විමර්ශන | තමන්වම කැප කරගන්න, තමන්වම ඒකාබද්ධ කර ගන්න, ගැටුම් ඇති කර | සමාජ රිද්ම, එදිනෙදා සැකසුම්, |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | අභිමානය, ස්ථිරභාවය | කණ්ඩායම්, ලිංගිකත්වය, සාරධර්ම, සම්මතයන්, ඓතිහාසික මතකය, වැඩ | ගන්න, තීරණය කරන්න, තමන්ව දැන හඳුනා ගන්න, තමන්ව හඳුනා ගන්න, තමන්වම සැබෑ කර ගන්න, වර්ධනය වන්න | කෙනෙකුට අයත් සැකසුම්, මේරීමේ අවධීන් |
| | නිදහස | ස්වයං පාලනය, ආත්ම අභිමානය, අධිෂ්ඨානය, ආශාව, ස්ථිරභාවය, විවෘත මනස, නිර්භීතකම, කැරැල්ල, ඉවසීම | සමාන අයිතිවාසිකම් | විසම්මුතිය , තෝරා ගැනීම, වෙනස් වීම, අවදානම් ධාවනය කිරීම, දැනුවත්භාවය වර්ධනය කිරීම, කැපවීම, අකීකරු වීම | තාවකාලික / අවකාශීය සුවකාර්යතාව |

අන්තර්පුද්ගල ක්‍රියාකාරී කටයුත්තක් වන නාට්‍යයමය ක්‍රියාවලිය තුළ බහුවිධ අවශ්‍යතා නියෝජනය වේ. මේ අවශ්‍යතාවල ස්වභාවය ඒකාකාරී නොවේ. උදාහරණයක් ලෙස එක් අයෙක් නාට්‍යය හා සම්බන්ධ වනුයේ අනන්‍යතා අවශ්‍යතාවක් වෙනුවෙන් විය හැකි ය. තවත් අයෙකු නාට්‍යයට සම්බන්ධ වනුයේ නිර්මාණ අවශ්‍යතාවක් වෙනුවෙන් විය හැකි ය. තුන් වැන්නෙකු සෙනෙහස බලාපොරොත්තුවෙන් නාට්‍ය කාර්යයට සම්බන්ධ වනවා විය හැකි ය. එහෙත් නාට්‍ය කාර්යය මේ සියලු අවශ්‍යතා තෘප්ත කරන ක්‍රියාවලියක් නො වනු ඇත. මේ තත්ත්වය බොහෝ සෙයින් බලපානුයේ වාණිජ පරමාර්ථ පෙරදැරි නොකර ගත් ස්වේච්ඡා පදනමින් ක්‍රියාත්මක වන ජන නාටකවල යි. මේ ජන නාටකකරුවන් ගේ පිටතින් ඇති අරමුණට යටින් වෙනත් අරමුණු රාශියක් වේ. එය අයිස් කන්දක් මෙන් සැඟවී පවතී. අප මෙම අධ්‍යයනයේ දී තෝරාගත් සිද්ධි දෙක ම මේ අවශ්‍යතා නියමයන් තුළ ක්‍රියාත්මක වනුයේ කෙසේ ද යන්න පැහැදිලි වෙයි.

**නිගමන**

නාට්‍යය යනු සාමූහික සමාජ ක්‍රියාවකි. එය කලා භාවිතයක් මෙන් ම පුද්ගල සමාජ අන්තර්ක්‍රියාවකි. වසර සිය ගණනක් පුරා විවිධ ජන කණ්ඩායම් අතර සහයෝගය ඇති කිරීමට නාට්‍යය නමැති සමාජ අන්තර්ක්‍රියාව භාවිත වී ඇත. නාට්‍යයක ක්‍රියාවලිය විවිධ පුද්ගලයන් විසින් නියෝජනය කරන එකිනෙකට වෙනස් ක්‍රියාවලියකින් යුක්ත වේ. එනම් එහි පැහැදිලි ශ්‍රම විභජනයක් දක්නට ඇත. මේ ශ්‍රම විභජනයේ කවර හෝ භූමිකාවක් බිඳවැටුණහොත් නාට්‍යයේ සමස්ත ක්‍රියාවලිය ම බිඳ වැටෙයි. නාට්‍යයට සමාජ අරමුණක් ඇතිවා සේ ම නාට්‍යයේ යෙදෙන පුද්ගලයන්ට සමාජ අරමුණෙන් පරිබාහිර වූ පුද්ගල අරමුණක් හෝ අරමුණු

කිහිපයක් තිබිය හැකි ය. මේ තත්ත්වය මනාව සංවිධානය කළ වාණිජ නාට්‍යයක දැකිය නොහැකි වුව ද වාණිජ පරමාර්ථවලින් තොර වූ ගැමි නාටක හෝ ජන නාට්‍යවල දී බොහෝ සෙයින් දැකගත හැකි ය. පුද්ගල පරමාර්ථ හා නාට්‍ය පරමාර්ථ අතර සන්ධානයක් නිර්මාණය කරගැනීමට අපොහොසත් වූ විට මේ පුද්ගල අපේක්ෂා ගැටුම් ලෙස ප්‍රකාශයට පත් වී නාට්‍ය කාර්යයත් සමාජ පර්යායත් යන දෙක ම එක විට බිඳ වැටීම සිදු වේ. එහෙයින් වාණිජ අපේක්ෂාවෙන් තොරව පවත්වාගෙන යන ආගමික හෝ වෙනත් යාතුකර්ම හා බැඳුණු නාට්‍ය භාවිතයන්හි පුද්ගල අපේක්ෂා පිළිබඳ දක්වන අඩු සැලකිල්ල එම අන්තර්ක්‍රියාවලිය බිඳවැටීම දක්වා ගමන් කරන බව පැහැදිලි වේ. ආගම, ජාතිය, කුල ස්තරායනය, පන්ති විසමතාව ගැටුමට හේතු වී නොමැති බවත් සංස්කෘතික ව්‍යූහ තුළ ගැටුම සහමුලින් ස්ථානගත වී ඇති බවත් පෙනී යන්නකි. ගැටුම් ඒජන්තයින් ගේ අවශ්‍යතා ගැටුම් කාරකයන් වී ඇත. ඉහත අධ්‍යයනයෙන් හඳුනාගත හැකි වනුයේ නාට්‍යය කලාව ගැටුම් නිවාරණයට පමණක් නොව ගැටුම් නිර්මාණය වීමට ද හේතු කාරක වන සමාජ ක්‍රියාවක් බව ය. නාට්‍ය ක්‍රියාවලිය හුදෙක් සෞන්දර්ය පරමාර්ථවලට සීමා වූවක් නොවන අතර, එහි ඇති පුද්ගල අපේක්ෂා පිළිබඳ අවධානය යොමු නොකළ විට නාට්‍ය ක්‍රියාවලිය මෙන් ම සමාජ පර්යාය ද බිඳවැටීම සිදු විය හැකි බව මෙ මගින් සාධනය කෙරේ. එම දත්ත ගුණාත්මක ව විශ්ලේෂණයෙන් සොයාගත හැකි වූ කරුණු නම්, මේ සමාජය එක ම ආගමික සංස්ථාවකට අයත් වුව ද එහි විවිධ කණ්ඩායම් අතර ඇති විශේෂ අනන්‍යතා හා අපේක්ෂාවන් ය. යොහාන් ගල්තුන්ගේ ගැටුම් ත්‍රිකෝණයට අනුව සංස්කෘතික ව්‍යූහයේ පවත්නා විසමතා නාට්‍ය ක්‍රියාවලියට බලපා ඇති බව නිරීක්ෂණය විය. එම ගැටුම් මතුපිටට ගෙන එන මාධ්‍ය බවට නාට්‍ය ක්‍රියාවලිය පත් ව ඇත.

පාස්කු නාට්‍යය මේ ප්‍රදේශවල සංස්කෘතික ප්‍රාග්ධනයක් ව ඇති අතර, එය උරුමයක් හෝ බූදලයක් ලෙස බෙදාගැනීමට යාමේ දී මේ ගැටුම් නිර්මාණය වී ඇති බව පෙනී යයි. කෝලම් නාට්‍යය ද අද වන විට විවිධ පරම්පරාවල අයිතියක් වී ඇතුවාක් මෙන් පාස්කු නාට්‍යය ද සිය අයිතියට නතු කරගැනීම සඳහා දරන උත්සාහයන් නිසා මේ මේ පාස්කු නාට්‍යය ගැටුම් නිර්මාපක මෙවලමක් බවට පත් ව ඇත. පොදු ජන උරුමයක් ලෙසත්, අධ්‍යාපනික මූලාශ්‍රයක් ලෙසත් ඊට ඇති වටිනාකම මේ ගැටුම් ඇති වීමට හේතු කාරක වී ඇත.

**සමුද්දේශ**


අංක 2137 /විශේෂ, 1992 ජුනි 02, මීගමුව **දිසා අධිකරණ තීන්දුව**

***දූවේ ආශ්චර්යමත් ක්‍රිස්තු ප්‍රතිමාව වසර 150 මංගල ජයන්තිය*** *1839-1989,* මීගමුව:දූව පාස්කු සංවිධානය

මාරසිංහ, වෝල්ටර් (පරි), 2005, ***භරතමුනි ප්‍රණීත නාට්‍ය ශාස්ත්‍ර ද්විතීය භාගය,*** කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රොහාන් විජිත්, (සංස්) 1998, ***ලංකා පාස්කු නාට්‍ය,*** කොළඹ 10: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රොහාන් විජිත්, 2009, ***ලාංකේය පාස්කු දුඃඛප්‍රාප්ති නාට්‍යයේ ඉතිහාසය, ආකෘති හා භාවිතය,*** කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

වීරක්කොඩි, අයි.එස්., 2017, **චතාරික සමය හා බැඳි සාම්ප්‍රදායික පසන් ගායන සම්ප්‍රදාය,** දර්ශනසූරි උපාධි නිබන්ධනය, නුගේගොඩ:ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

කුමාරසිරි පී, වක්කුඹුර ඒ. (පරි) 2006, **සොක්කන් ලොක්කන් වූ වගයි,** කොළඹ 05: සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

Butcher, S. H. (Ed.). (1907). The poetics of Aristotle. Macmillan.

Max-Neef, M., Elizalde, A., & Hopenhayn, M. (1992). Development and human needs. Real-life economics: Understanding wealth creation, 197-213.

Galtung, J. (1996). Peace and conflict research in the age of the cholera: ten pointers to the future of peace studies. International Journal of Peace Studies, 1(1), 25-36.

Arai, T. (2017). Toward a Buddhist Theory of Conflict Transformation: From Simple Actor-Oriented Conflict to Complex Structural Conflict. *Peace and Conflict Studies*, *24*(2), 5.

Muni, B., & Ghosh, M. (1956). *The Natyasastra*. Manisha Granthalaya.

Maslow, A. H. (1943). A theory of human motivation. Psychological review, 50(4), 370.

Moynihan, M., & Manweiler, F. (2011). Acting Different–Using Drama Workshops and Seminars to promote reconciliation, anti-racism and anti-sectarianism.

Moynihan, M. (2005). An Exploration into the Impact of Drama and Theatre on Policy.

Moynihan, M. (2008). Acting for Peace–The Effectiveness of Drama and Theatre as a Tool for Promoting Peace-Building and Reconciliation.

Moynihan, M. (2006). –A Model of Best Practise for using drama workshops and professional theatre performances to promote positive mental health and to raise awareness of issues surrounding suicide and suicide prevention.

Moynihan, M. (2012). Acting for Change–Four Drama Workshop Models in Anti-Racism, Anti-Sectarianism, Human Rights and Gender Equality and Storytelling to Promote Reconciliation.

Obeyesekere, R. (1995). Violence, Censorship and the Sinhala Theatre during the Eighties, Studies in Society and Culture, SSC Pamphlets.

Obeyesekere, R. (1999). *Sri Lankan theater in a time of terror: Political satire in a permitted space*. SAGE Publications Pvt. Limited.

Dewi, N. (2010). People's Theatre for Peace: Learning from Sri Lanka.

Thompson, J. (2005). Digging up stories: Applied theatre, performance and war. Manchester University Press

**සම්මුඛ සාකච්ඡා**

ජයවර්ධන, ප්‍රදීප් ප්‍රියන්ත.,1968.07.07, නො 24, දිය හොඳ ඇලවත්ත, කුරණ, මීගමුව

ජයවීර, මාකස්.,1951, පිටිපන, මීගමුව

ඩයස්, සුබසිංහ නිශ්ශංක ෂෙල්ටන්.,1947.11.28, සින්දාත්‍රි දේවස්ථානය, දූව, මීගමුව

ද මැල්, මිහිඳුකුලසූරිය එම්මානුවෙල් වෙන්ෂස් ලක්ෂ්මන්., 1951.05.26, දූව, මීගමුව

ප්‍රනාන්දු, දෙහිවලගේ මේරි ඇග්නස්., 1954.10.24, පිටිපන, මීගමුව

ප්‍රනාන්දු, දෙහිවලගේ ලූර්දු මල්ලිකා., 1956.07.03, පිටිපන, මීගමුව

ප්‍රනාන්දු, නයිදප්පුලාගේ ප්‍රැන්සිස් කැමිලස්, 1937.01.28

ප්‍රනාන්දු, මිහිඳුකුලසූරිය ජෝසෆ් එම්මානුවෙල් ක්ලේමන්ට්.,1949.11.23, නො 153, දූව, මීගමුව

ප්‍රනාන්දු, මිහිඳුකුලසූරිය වඩුගේ සුනිල්.,1951.05.26, නො 153, දූව, මීගමුව

ප්‍රනාන්දු, යමුනා 1948.07.22, පිටිපන, මීගමුව

ප්‍රනාන්දු, වැවලගේ බාබ්රා., 1942.07.11, පිටිපන, මීගමුව

මැල්, මිහිඳුකුලසූරිය ආරච්චිගේ ඇනා මැඩෝනා., 1964.07.11, දූව, මීගමුව

ආඛ්‍යාන narrations
**Volume 06 | Issue 02 | July - December 2021 | Article 02**
**ISSN 2478-0642**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

CC BY NC ND

# ශ්‍රී ලාංකේය බෞද්ධ පෙරහැර සංස්කෘතියේ උඩැක්කි නර්තන කලාව හින්දු ආභාසයක් ද?

කේ.එම්. සමන් කුමාරතුංග[6]
BFA, M.Phil
kumarathungasaman@gmail.com

**සාරසංක්ෂේපය**

ඩමරු ආකෘතිය දරන විවිධ ප්‍රමාණයේ ඩැක්කි, උඩැක්කි, එඩැක්ක, මහ ඩැක්කි, ගාන පටහ යනාදී සමාකෘතියකින් යුතු භාණ්ඩ වෙසෙස ප්‍රණාව භේරි කුලකයට අයත් වේ. ශ්‍රී ලාංකේය බෞද්ධ පෙරහැර සංස්කෘතියේ භාවිත උඩැක්කි නර්තන කලාව ක්‍රි: පූ: අවධියේ පටන් පැවති බවට සාක්ෂ්‍ය හමු වේ. ක්‍රි: පූ: 161ත් 137ත් අතර අවධියේ මහියංගන සෑය ආශ්‍රිත චාරිත්‍ර අවස්ථාහි දී ඩැක්කි, උඩැක්කි, ඩමරු භාවිත කළ බව **ථූපවංශය** (පියරතන හිමි 1958, 34) විස්තර කරයි. රුවන්මැලි සෑයේ ධාතු නිධානෝත්සවයට ඩැක්කි, උඩැක්කි සහිත වූ තූර්ය භාණ්ඩ (සෝරතහිමි 1970, 413) භාවිත කරමින් පෙරහැර කළ බව (1958, 34, 35) මූලාශ්‍රය ග්‍රන්ථයන්හි දක්වා ඇත. දළදා **සිරිත** දක්වන පරිදි දළඳා චාරිත්‍ර ආරම්භක අවධියේ සිට ඩැක්කි, උඩැක්කි සංගීත භාණ්ඩ වශයෙන් භාවිත විය (සෝරත හිමි 1950, 49). ශෛලමය, ලෝහමය පුරාවිද්‍යා මූලාශ්‍රය ඇසුරින් ද මේ බව සනාථ වේ. (අමරවංශහිමි 1970, 118, 119) අනුරාධපුර ලෝවාමහාපායේ වාමන රූප අතර උඩැක්කි දක්නට හැකි ය. මැදිරිගිරියේ වටදාගැබ් කණු ශීර්ෂයන්හි ද දැදිගම සූතිඝර විහාරයේ ඇත් පහන් යුගලෙහි ද ගඩලාදෙණිය විහාර ආලින්දයෙහි පාදමේ කැටයම්හි ද උඩැක්කි දක්නට හැකි ය. වැලිගම අග්‍රබෝධි විහාරයේ කැණීම්වලින් මතු වූ ලෝකඩ පාත්‍රයෙහි ද අභයගිරි කැණීම්හි දී ද පවතින උඩැක්කි කැටයම් කළ මූලාශ්‍රය මෙහි දී වැදගත් වේ. සමුද්‍රගිරි විහාර සිතුවම්හි ද උඩැක්කි දක්නට හැකි වේ. පහතරට සහ සපරගමුවේ පත්තිනි ඇදහිල්ල සමග ව්‍යාප්ත වූ මඩු ශාන්තිකර්මවල සහ නුවර කලාවියේ යාග ක්‍රමවල දී අතීතයේ මෙන් ම වර්තමාන දළදා පෙරහැරරෙහි කවිකාර මඩුවේ ශිල්පීන් හා නර්තන ශිල්පීන් අතර ද උඩැක්කි භාවිතය දක්නට හැකි ය. බෞද්ධ මුහුණුවරකින් මෙම කලාව වර්තමානයේ අපහට දක්නට හැකි වුව ද උඩැක්කිය ද්‍රවිඩ ජනයාගේ ඇදහිලි සහ චාරිත්‍ර සමග තදානුබද්ධ වූ තූර්ය භාණ්ඩයක් බව ද්‍රවිඩ - හින්දු පෙරහැර චාරිත්‍ර සහ විවිධ සිරිත්හි දක්නට හැකි ය. උඩැක්කියේ මුල් අවස්ථාව ලෙස සැලකෙන ඩමරුව ශිව දෙවියන් අතැති සෙලවුම් බෙරය යි.

[6] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

ශිවගේ විශ්ව නර්තනයේ වාද්‍ය භාණ්ඩය ලෙස සැලකෙන්නේ ඩමරුව යි. භාරතීය ඇදහිලි අතර ඩැක්ක, එඩැක්ක, ඩමරු කුලකයට අයත් සමාකෘති දරන තූර්ය භාණ්ඩ නන් අයුරින් හඳුනාගත හැකි වේ. හින්දු පුරාවෘත්තවලට අනුව මෙය ඔවුන්ගේ ප්‍රකට තූර්ය භාණ්ඩයක් බැව් අපගේ අධ්‍යයනයේ දී අනාවරණය විය. විවිධ අවධීන්හි හින්දු චාරිත්‍ර මෙරට මුල්බැසගත් බැව් ඓතිහාසික තොරතුරු අධ්‍යයනයෙන් පසක් වුණි. ඒ අතර පොළොන්නරු යුගයේ ශිව වන්දනය අතිශයින් ම ප්‍රකට ව පැවත ඇත. ශිවගේ වාද්‍ය භාණ්ඩය වූ ඩමරුව දේවත්වයෙන් සැලකීමත් ඒ ආශ්‍රිත නර්තන ක්‍රම ව්‍යවහාර වූ රාජ සභාවලින් ජනතා අවධානයට යොමු වීමත් විශේෂ ලක්ෂණයකි. එබැවින් උඩැක්කි වාදනය සහ නර්තනය හින්දු ආභාසයෙන් මෙරට ව්‍යාප්ත වූයේ ද නො එසේ නම් එය හෙළ වාද්‍ය භාණ්ඩයක් ද, එහි නිවැරදි අනන්‍යතාවය කුමක් ද යන්න මෙම අධ්‍යයනයේ දී විමසුමට ලක්කර තිබේ.

**ප්‍රමුඛ පදඃ** උඩැක්කි, තූර්ය භාණ්ඩ, පෙරහැර, ඩමරුව

**අන්තර්ගතය**

හෙළ භාෂාවේ උඩැක්කිය නම් වූ යෙදුම ද්‍රවිඩ භාෂාවේ උඩුක්කෛ යන යෙදුමෙන් බිඳී තත්භව වූ ව්‍යවහාරයක් බව වාග්විද්‍යාත්මක ව ඒ පිළිබඳ අධ්‍යයනයේ දී හඳුනාගත හැකි ය. **සිංහල විශ්වකෝෂය** දක්වන පරිදි කඳෙහි මැද භාගය සිහින් වූ හෙයින් උඩුක්කෛ වැනි නාමයක් ඊට පටබැඳී තිබේ (ලියනගේ 1998, 682). ශිව දෙවියන් ඇතැති කුඩා ඩමරුව මෙහි මූලික ආකෘතිය ලෙස සැලකෙයි. වාලුකා කාලමාන ඔරලෝසුවේ ආකෘතිය ඩමරුව සහ උඩැක්කි කඳ හා සෘජු ව ම සමාන ලක්ෂණ දිස්වෙයි. ශිවගේ ඩමරුව ඩැක්කා නමින් ද හැඳින් වේ. ශිව ඇදහිල්ලේ ආරම්භක පුරාවෘත්තයේ සඳහන් පරිදි ශිව විසින් ඉදිරිපත් කරන ලද මුල් ම විශ්ව නර්තනයේ දී වාද්‍ය භාණ්ඩය ලෙස භාවිත කර තිබෙන්නේ ඩමරුව නමැති කුඩා තූර්ය භාණ්ඩය යි. ඒ බව ශිවගේ මූර්තිවලින් ද අනාවරණය වේ. (කෝට්ටගොඩ. 2017, 38). හින්දු කෝවිල්හි භාවිත මේ භාණ්ඩ අඟල් හයේ සිට දොළහ දක්වා විවිධාකාර ප්‍රමාණයෙන් යුක්ත වීම විශේෂත්වයකි. භක්ති පූර්වක තූර්ය භාණ්ඩ හින්දු සමාජයේ ප්‍රකට වූවකි. භාරතීය කර්ණාට මයිසූර් ප්‍රදේශවල ඩමරුගා නමින් මෙය හැඳින් වේ (එහිම 38). ඩමරුගා, ඩක්කා, ඩමරු, උඩුක්කු, බුඩු බුඩුකේ, එඩැක්ක, තිමිලා, ඩැක්ක යනාදී එකම කුලකයකට අයත් විවිධ පරිමාණයෙන් යුතු තූර්ය භාණ්ඩ රාශියක් භාරතීය ජනයා අතර ප්‍රචලිත ය. බුඩු බුඩුකේ නමින් හඳුන්වනු ලබන කුඩා උඩැක්කි ආකෘති දරන භාණ්ඩය භාරතයේ විජ්ජාකාරයින්, ඉන්ද්‍රජාලකයින් භාවිත කරන්නකි. උඩුක්කු හෙවත් උඩුකේ නම් වූ අඩියක් පමණ දිග උඩැක්කි ආකෘතිය දරන භාණ්ඩය තමිල්නාඩු ප්‍රාන්තයේ ප්‍රචලිත ය. වීදි ගායකයින් සාස්තරකරුවන් පරිහරණය කරන මෙය වමතින් අල්ලා දකුණතින් වාදනය කරන්නකි. එය උඩැක්කිය ම බව පැහැදිලි වේ. ඩැක්ක හෙවත් ඉඩැක්ක නම් වූ ඒ හා සමානාකෘති දරන වාද්‍ය භාණ්ඩය කේරළයේ ප්‍රචලිත ව ඇත. මේ ආකාරයට ම ශ්‍රී ලංකාවේ පහතරට සහ සපරගමු පත්තිනි යාග අතර භාවිත උඩැක්කිය සහ ඩැක්කිය ද උඩරට සහ නුවරකලාවියේ ප්‍රචලිත උඩැක්කිය සහ ඩැක්කිය ද සමාන ලක්ෂණ සෘජු ව ම ප්‍රකට කරන බව ඉඳුරාම කිව හැකි ය. භාරතීය එඩැක්ක හෙවත් ඉඩැක්ක නමින් භාවිත කේරළයේ ප්‍රචලිත වාද්‍ය භාණ්ඩය පටියකින් වම් උරහිසෙහි එල්ලා ගන්නා අතර දකුණතින් වාදනය කෙරේ. එය වමතින් පහළට තද කිරීමෙන් හා බුරුල් කිරීමෙන් හෙවත් භාණ්ඩය උස් පහත් කිරීමෙන් උරහිසෙහි රැඳී පටියෙන් භාණ්ඩයේ වරපොට තදවීමත් සමග හඬෙහි උච්චභාවයේ ධ්වනි නිෂ්පත්තිය අඩු වැඩි කර ගැනේ. කේරළයේ කෝවිල්වල ගායනය කරනු ලබන භක්ති ගීත

අනුව අත්ලෙන් වාදනය කරන මෙම භාණ්ඩය භාරතයේ ඇතැම් ප්‍රදේශවල දකුණතින් අල්ලා කඩිප්පුවකින් වාදනය කිරීම දැකගත හැකි ය. එය කථකලි නර්තනයේ දී භාවිත කරන්නකි. ශ්‍රී ලංකාවේ සපරගමුවේ මඬු ශාන්තිකර්මවල දී හෙවත් ගී මඬුවල ගී කීම සඳහා මේ ආකාරයෙන් ඩැක්කි වාදනය සිදු කරනු ලබයි. දක්ෂිණ ශ්‍රී ලංකාවේ දේව යාගවල ද එලෙස වැයීම ප්‍රකට ලක්ෂණයකි (විදාන ගමගේ 2012-2013, 106). පහතරට මාතර රංග ශෛලියේ මෙය ප්‍රචලිත ව පවතින බව හඳුනාගත හැකි ය. මේ හා සමාන ආකෘතියක් ඇති අඩි දෙකක් පමණ දිගින් යුතු වූ වාද්‍ය භාණ්ඩයක් කේරළයේ පවතී. එය තිමිලා නමින් හැඳින් වේ. එය ද උරහිසෙහි එල්ලා වයනු ලබන අතර එක් මුහුණතක් උඩ පැත්තට හරවා දැත්ලෙන් වැයීම සිදු කරන්නකි. මේ ශෛලිය භාරතයේ පංච වාද්‍යම් නම් වූ වාදන ක්‍රමයට අයත් භාණ්ඩයක් ලෙස සැලකේ.

ශ්‍රී ලාංකේය සමාජයේ හින්දු චාරිත්‍ර පැතිරයාමත් සමග පූර්වෝක්ත වාද්‍ය භාණ්ඩ මෙරට ප්‍රචලිත වූ බව පිළිගැනීමට සාක්ෂ්‍ය හමුවේ. ශිවගේ සංගීත කලාව සිරිලක ප්‍රචලිතවීම රාවණ අවධියේ සිට සිදු වී තිබෙන බවට තොරතුරු හමු වේ. වාල්මීකී විසින් රචිත **රාමායණයේ** සඳහන් පරිදි ශ්‍රී ලංකාවේ රාවණා රජු ශිව ශ්ලෝක ගායනා කළ බවත් හෙතෙම ශිව භක්තිකයෙකු බවත් (අබේරත්න 2019, 128) පිළිගැනේ. ශිව වන්දනය සමග ඔහුගේ වාද්‍ය භාණ්ඩය ද භාවිතයට පැමිණි බව විශ්වාස කළ හැකි ය. රාවණා සංගීතය කෙරෙහි නැඹුරු වීමත් ශිව, ශ්ලෝක ගායනය කළ බවත් විස්තර කෙරෙන පරිදි රාවණ ද ඩමරුව භාවිත කරන්නට ඇති බව  පිළිගැනීමට බාධාවක් නොමැත. විජයාගමනයට පෙර සිට ලක්දිව තූර්ය භාණ්ඩ භාවිතයේ පැවති බව **මහාවංශය** සහ **වංසත්ථප්පකාසිනී** ඇසුරින් පසක් වේ.

රත්තිං තුරිය සද්දංච සුත්වාන ගීත රවංච සො
අපුච්ච සහ සෙ මානං කිංසද්දො ඉථී යක්ඛිනිං
(**මහාවංශය**, 1959)

ක්‍රිස්තු පූර්ව හයවන සියවසේ දී ලක්දිව ආක්‍රමණය කළ විජයට තූර්ය භාණ්ඩ නාදයක් ඇසුණු බව මෙයින් විස්තර කෙරේ. විජය කුවේණිය සමග ගත කරන කල්හි ඇසුණු මේ නාදය කුමක් ද යැයි කුවේණියගෙන් විමසූ ආකාරය මෙයින් ප්‍රකට කෙරේ. එම නාදය වූ කලී, සිරිලක සිරිසවත්තුපුරයේ යක්ෂ ගෝත්‍රික විවාහ මංගල්ලයකින් නිකුත් වූ තූර්ය නාදයක් යැයි කුවේණිය විසින් විජයට පවසන ලද බව **මහාවංශය** වැඩිදුරටත් විස්තර කරයි. **වංසත්ථප්පකාසිනි** නම් වූ **මහාවංශ** ටීකාව එම තූර්ය භාණ්ඩ වර්ගීකරණය විවරණය කර තිබේ.

එත්ථ පංචාංගික තුරිය නාම ආතතං විතතං - ආතතං විතතං සුසිරං ඝනංති පංචවිධො

ආතතං නාම ඒකතල තුරියං විතතං නාම උභයතලං - ආතතං විතතං නාම තන්තිබද්ධ පණවාදී

සුසිරංනාම වංසාදී ඝනං නාම සම්මාදි පංචවිධො....

යනාදී (**වංසත්ථප්පකාසිනි**, 1994) වශයෙන් මෙයින් විස්තර කෙරෙන පරිදි ආතත යනු එක් තලයක් ඇති තූර්ය භාණ්ඩ වෙසෙස යි. විතත යනු දෙපැත්තක් හෙවත් දෙමුහුණතක් තිබෙන තූර්ය වෙසෙස ය. ආතත විතත යනු එක් පැත්තකට තතක් බැඳ අනෙක් පස වාදනය කරන තූර්ය මෙන් ම තත් බැඳි තූර්ය භාණ්ඩ වෙසෙස ය. මේ විස්තරයෙන් සිදු කෙරෙන්නේ පංචතූර්ය භාණ්ඩ වර්ගීකරණය යි. ඒ අතර ඩමරු, ඩැක්කි, උඩැක්කි, මහ ඩැක්කි, තත් බැඳි

භාණ්ඩ භාවිත වූ බව ඉහත දත්ත පසක් කරයි. ඊට පර්යාය නාමයක් ලෙස ප්‍රණාව භේරි යෙදුම මෙහි දක්වයි. ක්‍රිස්තු පූර්ව හයවන සියවසේ මෙරට ඉතා දියුණු සංගීතයක් තිබුණු බවට මෙයින් අනාවරණය වුව ද විජයගේ පැමිණීමට මත්තෙන් වූ අතීතයේ වූ රාවණ අවධියේ ශිව වන්දනය ඇසුරින් මෙම භාණ්ඩ වර්ගය මෙරට භාවිතයට පත් වූ බව යට දැක් වූ කරුණුවලින් පිළිගත හැකි ය. මූලාශ්‍රයගත කරුණු අනුව විවිධ අවධිවල මෙරට පැවති තූර්ය භාණ්ඩ පිළිබඳ තොරතුරු අනාවරණය කරගත හැකි ය.

අනුරාධපුර අවධියේ පැවති නැකැත් කෙළියක දී තූර්ය භාණ්ඩ භාවිත වූ ආකාරය **සද්ධර්මාලංකාරය** පෙන්වා දෙන්නේ, ඒ ඒ තන්හි වීණා බෙර, මිහිගු බෙර, නානා තූර්ය ගෙන.... (බුද්ධ දත්ත හමි 1959, 33, 46, 126) සහ (සාරානන්ද 1953, 468) යනුවෙන් විස්තර කෙරේ. එළාර දුටුගැමුණු යුදට එළඹී කසට පිටියෙහි සිට මහියංගනය බලා යන ගමනේ විස්තරය අනුව එහි භාවිත වූ භේරි වර්ග පහත පරිදි විස්තර කෙරේ.

''ගැට බෙර පානා බෙර ආදී වූ සිය දහස් ගණන් භේරි තූර්ය භාණ්ඩ එක පැහැර ගස්වමින් රන්සක්, රිදීසක්, ඔත්තු, තන්තිරි, පට සිරිවිල් ආදී වූ කාහල ජාතීන් එක පැහැර හඬවමින් (සාරානන්ද හිමි 1953, 468) යනුවෙන් ද පණාබෙර, ගැට බෙර, තුඩිබෙර, මහබෙර, පොකුරු බෙර, රොදු බෙර, එකැස්බෙර, මිහිගු බෙර, දදුරු බෙර, දුදුගු බෙර, තම්මැට, නිසාන ආදි වශයෙන් ද නිළියන් පිරිවරා ගත්තා වූ දුටුගැමුණු රජු කණ්ඩුල ඇතුපිට නැග ධාතු නිධාන උත්සවයට පිටත් වූ විට වාදනය කළ බෙර හඬ සෝණුත්තර නම් යතිවරයාට පවා ශ්‍රවණය වූ බවත්, තැන තැන තිබූ තූර්ය ඝෝෂාව නිසා මිහිතලය ගුගුරන්නට වූ බවත් (බුද්ධ දත්තහිමි 1959, 33, 46, 126) **මහාවංශය** දක්වයි. මෙවැනි හෙළයේ භාවිත වූ භේරිවාදන සහ තූර්ය භාණ්ඩ නාමාවලි අනුරාධපුර, පොළොන්නරු, දඹදෙණි අවධිවල සිට කෝට්ටේ, සීතාවක, මහනුවර, අවධිතෙක් ශ්‍රී ලංකාවේ ඓතිහාසික මූලාශ්‍රය විස්තර කරයි. එම මූලාශ්‍රය ඇසුරින් කලාසූරි පියසාර ශිල්පාධිපති දක්වන පරිදි භේරි වර්ග විශාල ප්‍රමාණයක් හඳුනාගත හැකි ය. ඒවා නම්, මිහිගු බෙර, පටහ බෙර, රන බෙර, ඩෞර බෙර, ගැට බෙර, පනා බෙර, මද්දල, එකැස් බෙර, ලෝහො බෙර, මහ බෙර, දදුරු බෙර, රෝද බෙර, කැරඬි බෙර, ඝෝෂ බෙර, බුරුළු බෙර, තලප්පර, නිසාන, විරුදම්, තත්සර ඩැක්කි, දවුල්, තිඹිලිච්, යුවල බෙර, සමුද්‍රඝෝෂ, රණරඟ ඝොෂ, මොරසු, ලොහ දවුල්, ගැටපහටු, තුන්ඩි බෙර, දුන්දුගී, කුම්භ බෙර, ආඩිකෙයි, ඩමරු, උඩැක්කි, ඩැක්කි, මහඩැක්කි, එඩැක්ක, ගාන පටහය, ප්‍රණාව භේරි....(ශිල්පාධිපති 1998, 26) යනාදී වශයෙන් සිරිලක දිගු කලක් පැවති භාණ්ඩ **දඹදෙණි අස්න** ඇසුරින් ශිල්පාධිපති විස්තර කරයි. මේ භාණ්ඩ අතර ඩමරු කුලකයට අයත් ඩැක්කි, තත්සර ඩැක්කි. ඩෞර බෙර, ගාන පටහ. මහ ඩැක්කි. එඩැක්ක යනාදී භාණ්ඩ උඩැක්කි විශේෂය ම බව හඳුනාගත හැකි ය. හින්දු ආගමික චාරිත්‍ර කෙරෙහි පෙළඹුණු රජවරු භාරතීය සංගීතය දිගින් දිගට ම අනුගමනය කරමින් රාජ්‍ය සංගීත නර්තන කණ්ඩායම් පවත්වාගෙන ආ බව එම මූලාශ්‍රයෙන් ම අනාවරණය වේ. මෙවැනි තොරතුරු සමුදායක් **බෝධිවංශය, කාව්‍යශේඛරය, ධර්මප්‍රදීපිකාව, සද්ධර්මරත්නාවලිය, බුත්සරණය, පූජාවලිය, ථූපවංශය, ධාතු වංශය, උම්මග්ග ජාතකය, රිදී විහාර අස්න, කුවේණි අස්න, සිහබා අස්න** සහ **සංදේශ කාව්‍ය** ඇතුලු සාහිත්‍ය මූලාශ්‍රය ග්‍රන්ථ රාශියක පවතී. මේ කෘතිවල අන්තර්ගත භේරි නාමාවලි හුදෙක් ම භාරතීය ලේඛනවල සඳහන් නාමාවලි ම බව බොහෝ විචාරකයෝ පෙන්වා දෙති (කෝට්ටගොඩ 2017, 02). පූර්වෝක්ත තූර්ය භාණ්ඩවල ධ්වනිත කළ

යුතු බීජාක්ෂර භරත නාට්‍යම් සහ ද්‍රවිඩ භේරි වාදනවල භාවිත "ත, දි, තො, න" අක්ෂර මුල් කොට ගෙන තිබීම භාරතීය සබඳතා දැක්වෙන ප්‍රබලතම සාක්ෂ්‍යයකි.

**භාරතීය ආභාසය**

දක්ෂිණ භාරතීය අවනද්ධ භාණ්ඩයන්හි බෙර පද මුද්‍රන් කර වැයීමේ පදනම සිරිලක භේරි වාදනයන්හි එලෙස ම දක්නට හැකි ය. දේශීය රංගවස්ත්‍රාභරණ සහ භාරතීය නළු ඇඳුම් අතර පවතින්නේ ඍජු සබඳතාවකි. නර්තනයේ දී අංග ප්‍රත්‍යංග භාවිතය සහ තාල ප්‍රභේදවලින් ඍජු ව ම භාරතීය ලකෂණ ප්‍රකට කෙරේ. දේශපාලන ක්‍රියාදාමයේ දී පැවති රාජ්‍ය පෙළපත් ආශ්‍රිත භාරතීය සබඳතා ආවාහ විවාහ කටයුතු, බෞද්ධ සහ හින්දු ආගමික සබඳතා, භාරතයෙන් සිරිලකට ලැබුණු ආගමික, දේශපාලනික සහ නොයෙක් ආකාරයේ අත්‍යවශ්‍යතා පදනම්ව හටගත් සබඳතා මෙවැනි ආභාසයන්ට හේතු වූ බව පිළිගත හැකි ය. සිරිලක ජනගහනයෙන් වැඩි ප්‍රතිශතයක් අදහන බුදු දහම ලක්දිව ව්‍යාප්ත වීමට භාරතයෙන් ලැබුණු මෙහෙවර හේතුකොට ගෙන බෞද්ධ වත්පිළිවෙත් සපිරි රටක් ලෙස ලොව ගෞරවයට පාත්‍ර වී ඇති ආකාරයෙන් ද ඒ බැව් සනාථ වේ. භාරතයත් සිරිලකත් අතර පැවති රාජ්‍ය මිත්‍රත්වය සහ ආගමික සබඳතා මත සිරිලක පැවති හෙළ සංස්කෘතිය යටපත් වී රාජ්‍යානුග්‍රහය ලත් භාරතීය සිරිත් විරිත්, භාෂාව, ලේඛන කලාව, නර්තනය, ගායනය, වාදනය, සංගීතය සහ සිව්සැට කලා මෙරට මුල්බැසගත් බව දීර්ඝ ලෙස විවරණය කළ හැකි ක්ෂේත්‍රයකි. මහින්දාගමනය, සංඝමිත්තාගමනය, දළදාගමනය මෙන් ම ඊට පෙර ක්‍රිස්තු පූර්ව හයවන සියවසේ බුදුන් වහන්සේගේ වැඩමවීමේ විවිධ අවස්ථා ඒ බව සනාථ කරයි (පඤ්ඤාසේකර 1928, 34). මේ ප්‍රබල සංක්‍රමණ මුල්කරගෙන මෙරට කලාව දියුණු වූ බවට නොයෙක් සාධක පවතී. අපගේ අධ්‍යයනයට පාත්‍රවන උඩැක්කි වාදන කලාව ද මේ අතර පැවති එක් අංගයකි. හින්දු දේවාලාශ්‍රිත සංගීතය, පත්තිනි ඇදහිල්ල ආශ්‍රිත කෝල්මුර ගී ගැයීම, රාජ සභා ආශ්‍රිත සංගීතය සමග උඩැක්කිය ප්‍රමුඛ ව භාවිත වූ සංගීත තූර්ය භාණ්ඩයක් වශයෙන් බොහෝ විද්වත්හු හඳුන්වා දී තිබෙති.

රාජ්‍ය අනුග්‍රහයෙන් පැවැත් වූ උත්සව අවස්ථාහි දී උඩැක්කි භාවිතය ප්‍රචලිත ව පැවති බව ඓතිහාසික ලිඛිත මූලාශ්‍රයෝ ද හෙළි කරත්. අනුරාධපුර යුගයට අයත් දුටුගැමුණු - එළාර යුද්ධය පිළිබඳ විස්තර කෙරෙන **සද්ධර්මාලංකාරය** සහ **මහාවංශය** කෘතිවල දැක්වෙන බෙර වර්ග අතර පණා බෙර නමින් දක්වා තිබෙන්නේ ඩැක්කි, උඩැක්කි, ඩමරු කුලකයට අයත් තත් බැඳි අවනද්ධ භාණ්ඩ වෙසෙස බව පිළිගත හැකි ය. ප්‍රණාව භේරි නමින් ඒවා හඳුන්වා තිබෙන අතර පණාබෙර යනුවෙන් හෙළ වහරේ දී ව්‍යවහාර වූ බව මූලග්‍රන්ථයන්හි දක්නට හැකි ය. පහත දැක්වෙන්නේ එයින් උපුටාගත් භේරි නාමාවලිය යි.

''ගැටබෙර, පණා බෙර, ආදී වූ සිය දහස් ගණන් භේරි තූරිය භාණ්ඩ එක පැහැර ගසමින් රන්සක්, රිදීසක්, ඔත්තු, තන්තිරි, පටසිරිවිල්, ආදී වූ කාහල ජාතීන් එක පැහැර හඬවමින් (සාරානන්ද හිමි 1953, 468) බෙරලවා යනුවෙන් ද පණාබෙර, ගැටබෙර, තුඩිබෙර, මහබෙර, පොකුරු බෙර, රොදු බෙර, එකැස් බෙර, මිහිඟු බෙර (බුද්ධදත්ත හිමි 1959, 35-72, 73, 106) දුටුගැමුණු රජ ධාතු නිධාන උත්සවයට පිටත් වන විට වාදනය කළ බව මහාවංශය කියයි. මේ ආකාරයෙන් පොළොන්නරු, දඹදෙණි, කුරුණෑගල, කෝට්ටේ, සීතාවක සහ මහනුවර අවධි තෙක් රාජ්‍ය උත්සව අවස්ථා සඳහා භාවිත කළ තූර්ය භාණ්ඩ අතර උඩැක්කි විශේෂ වාද්‍ය

භාණ්ඩයක් ව පැවති බව සනාථ වේ. ඒ බව තවදුරටත් හුවා දැක්වීමට **දඹදෙණි අස්නේ** දක්වන විශාල සංඛ්‍යාවක තූර්ය භාණ්ඩ නාමාවලියේ පණා බෙර සඳහන් වීම විශේෂ කොට පෙන්වා දිය හැකිය.'' නිසාන, තම්මැට, තප්පු, තලප්පු, එකැස් බෙර, පණාබෙර..... යනාදී යෙදුම් ඊට සාක්ෂ්‍ය වශයෙන් පෙන්වාදිය හැකි ය.

පොළොන්නරු අවධියේ ශිව වන්දනය සමග ශිව ස්තෝත්‍ර ගීතිකා ගායනය සමග උඩැක්කි වාදනය අතිශයින් මෙරට ප්‍රචලිත වූයේ රාජ්‍ය අනුග්‍රහයන් සමග බව පිළිගැනීමට බොහෝ සාක්ෂ්‍ය පවතී. පොළොන්නරුවේ ශිව දේවාලය ආශ්‍රිත කැණීම්වලදී හමු වූ පුරාවස්තු අතර එකැස්බෙර, උඩැක්කි, ඩමරු යනාදී අවනද්ධ භාණ්ඩවල රූ කැටයම් කළ ලෝහ භාණ්ඩ ඒ සඳහා එක් නිදසුනක් ලෙස දැක්විය හැකි ය. මෙවැනි පුරාවිද්‍යාත්මක දත්ත පරිශීලනයේ දී ඓතිහාසික සාක්ෂ්‍ය නිරවුල් ව හඳුනා ගත හැකි ය. සීතාවක සහ මහනුවර අවධි තෙක් වූ සිරිලක හින්දු සංස්කෘතිය ප්‍රචලිත වීමට පාදක වූ රාජ්‍ය ප්‍රබලත්වය උඩැක්කිය මෙරට ස්ථාපිත වීමට හේතු වී තිබේ. භාරතයෙන් මෙරට රජවරු ගෙන්වා ගත් සංගීතඥයින් සහ විවිධ පූජකවරු ඔවුන්ගේ ඇදහිලි ක්‍රම හා සම්බන්ධ කලාව මෙරට මුල්බැසගත් බව පිළිගත් කාරණයකි. එහි ප්‍රතිඵලයක් ලෙස හින්දු ආගමික කටයුතු සඳහා යොදාගත් උඩැක්කි හෙළ වහරට අනුව හැඩගැසුණු කලාවක් බවට පත්විය. පත්තිනි ඇදහිල්ල සමග ව්‍යාප්ත වූ උඩැක්කි වාදන කලාව පහතරට සහ සපරගමු ගී මඬු යාග ප්‍රවේණි අතර දැනුදු එලෙස ම දැක ගත හැකි ය. මාතර ගී මඬු, කප්ඉන්දුම් මඬු, පත්තිනි යාතිකාවල දී උඩැක්කිය භාවිතය වර්තමානයේ ද ප්‍රචලිත ව පවතී. සපරගමුවේ බළන්ගොඩ සහ කලවාන ප්‍රදේශවල මඬු ශාන්තිකර්මවල දී එය දැනුදු භාවිත වේ. උඩරට උඩැක්කි නර්තන ප්‍රවේණි රාශියක් හඳුනාගත හැකි ය. මීගම්මන උඩැක්කි පරපුර, පාතදුම්බර පරණගම උඩැක්කි පරපුර, ඌරාපොළ උඩැක්කි පරපුර, හලාගිරිය උඩැක්කි පරපුර, නාපාන උඩැක්කි පරපුර, බටගල්ල උඩැක්කි පරපුර, බටුගොඩ උඩැක්කි පරපුර, වලල උඩැක්කි පරපුර, බූටාවත්ත උඩැක්කි පරපුර යනාදී වශයෙන් කන්ද උඩරට උඩැක්කි වාදන ප්‍රවේණි රාශියක් වර්තමානයේ හඳුනාගත හැකි ය. උඩරට මංගර ඇදහිල්ල, කඩවර යක් කංකාරිය, විහාරගේ මංගල්ල, ඇසළ පෙරහැර වැනි උත්සව සහ නුවර කලාවියේ බලියාග, වැව් ආශ්‍රිත ඇදහිලි චාරිත්‍රවලදී උඩැක්කි නර්තනය වර්තමානයේ භාවිත වන බව දැක ගත හැකි ය. දළඳා මාළිගාවේ රාජකාරියක් ලෙස පවතින කවිකාර මඬුවේ වාර්ෂික හා දෛනික චාරිත්‍රවල දී අතීතයේ සිට වර්තමානය තෙක් අඛණ්ඩව උඩැක්කි වාදනය සමග ගායන චාරිත්‍ර විධි පවත්වාගෙන එනු දැකගත හැකි ය.

මෙනයින් සලකා බලන කල අනාවරණය වන්නේ, ශිව ඇදහීම සහ භාරතීය සංගීත කලාව මෙරට ප්‍රචලිතවීමත් සමග උඩැක්කි වාදන කලාව ගායන විධි සමග භාවිතයට පත්ව තිබීමත් තූර්ය භාණ්ඩ සමග එය ව්‍යවහාරික වාද්‍ය කර්ම සඳහා යොදා ගැනීමත් අනුරාධපුර අවධියේ සිට මේ වනතෙක් අඛණ්ඩව පැවත එන බව යි. සීතාවක යුගයේ දී ආරම්භ වූවා යැයි සැලකෙන රාජ සභා කවිකාර නිල හෙබවූවන්ගේ වාද්‍ය භාණ්ඩයක් ලෙස උඩැක්කිය භාවිත වූ බවත් එය මහනුවර යුගයේ කවිකාර මඬුවේ දී වඩාත් ප්‍රචලිත භාණ්ඩය බවට පත්ව තිබූ බවත් ඓතිහාසික මූලාශ්‍රය සනාථ කරයි. (අබේරත්න 2019). වර්තමානයේ පෙරහැර නර්තන ක්‍රමයක් ලෙස ප්‍රවේණි නිලපංගු හිමි නර්තන පරම්පරා විසින් උඩැක්කි කලාව පවත්වාගෙන එනු ලැබ තිබෙන බවත් කිව යුතු ය. මුල්කාලීන ව ගායනයට පමණක් වාදනය කළ එය වර්තමානයේ වන විට නර්තන ක්‍රමයක් ලෙස පෙරහැර සංස්කෘතියේ දක්නට හැකි ය. එහි මූලාරම්භයේ දී

හින්දු ආගමික භාවිත ආශ්‍රයෙන් මෙරට ව්‍යාප්තවී තිබෙන බව අනුක්‍රමයෙන් මෙහි දැක් වූ කරුණුවලින් සනාථ වේ.

## සමුද්දේශ


1. අමරවංශ හිමි, කොත්මලේ .(1969). *ලක්දිව සෙල්ලිපි*, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

2. අබේරත්න, නිශ්ශංක .(2019). *මහනුවර යුගයේ කවිකාර මඩුව ආශ්‍රිත සංගීතය,* කොළඹ : ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

3. කුලතිලක, සී. ද එස් .(1974). *ලංකාවේ සංගීත සම්භවය*, කොළඹ: ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්ස්.

4. කෝට්ටගොඩ, ජයසේන .(2017). *ශ්‍රී ලාංකේය අවනද්ධ තූර්ය භාණ්ඩ පුරාණය සහ භාරතීය සබඳතා, බොරලැස්ගමුව* : ජේ.කේ. පබ්ලිකේෂන්ස්.

5. පඤ්ඤාසේකර හිමි, කළුකොඳයාවේ .(1928). *සිංහල බෝධිවංශය*, කොළඹ: විද්‍යාර්ථ යන්ත්‍රාලය.

6. පරණවිතාන, සෙනරත් .(1959). *පොළොන්නරු යුගය*, කොළඹ : තිසර ප්‍රකාශකයෝ.

7. පියරතන හිමි, මකුළුදූවේ. (1958). *ථූපවංශය,* කොළඹ: ඇම්. ඩී. ගුණසේන සමාගම.

8. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ .(1959). *මහාවංසො,* කොළඹ: ඇම්.ඩී. ගුණසේන සමාගම.

9. ලියනගේ, සිරි .(1998). *නිරුක්ති සහිත සිංහල ශබ්ද කෝෂය,* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

10. ලියනගමගේ, අමරදාස, පරි.(1989). *මධ්‍යකාලීන ලංකා ඉතිහාසය*, කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන.

11. වජිර හිමි, කුඹුරුගමුවේ .(1983). දළදා ඉතිහාසය සහ සංස්කෘතිය, දෙහිවල : තිස්ස ප්‍රකාශකයෝ.

12. විදානගමගේ, සුසන්ත. .(2012-2013). *මාතර ගුරුකුලයේ උඩැක්කි වාදනය*, පර්යේෂණ පරිසංවාදය. විස්තෘත පත්‍රිකා එකතුව, (සංසः) ලයනල් බෙන්තරගේ. රංජිත් ප්‍රනාන්දු, කොළඹ: සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය,

13. සාරානන්ද හිමි, කළුතර .(1953). *සද්ධර්මාලංකාරය*, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

14. සෝරත හිමි, වැලිවිටියේ .(1970). *ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය*, කොළඹ : ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.

15. ශිල්පාධිපති, පියසාර .(1998). *සිංහල බෙර වාදනය සහ සන්නිවේදන විධික්‍රම,* සංඛ- පාරම්පරික බෙර පිළිබඳ කලාපය (සංස්:) දිසානායක, මුදියන්සේ සහ අබේවික්‍රම, ටියුරින්, කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

16. ශ්‍යාමලී, සුරංජි .(2011). *උත්තර භාරතීය සංගීතය සහ ශාස්ත්‍රීය ගායන ශෛලි,* නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

17. හේමචන්ද්‍රරාය, සංස් .(1972). *ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය*, කැලණිය : විද්‍යාලංකාර මුද්‍රණාලය.

18. හේවාවිතාරණ, සයිමන්, සංස් .(1979). *සමන්තපාසාදිකා*, කොළඹ: ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.

19. හේමචන්ද්‍ර, දිසානායක, අමරවංශ හිමි, අකුරැටියේ .(1994). *වංසත්තප්පකාසිනී*, කොළඹ : පාලි හා බෞද්ධ අධ්‍යාපන ආයතනය.

20. හරිස්චන්ද්‍ර, විජයතුංග .(1982). *ප්‍රායෝගික සිංහල ශබ්ද කෝෂය*, කොළඹ : සංස්කෘතික අමාත්‍යාංශය.

21. හේවාවිතාරණ, සයිමන් .(1929). *සමන්තපාසාදිකා*, මාතර : වැලිගම ප්‍රින්ටර්ස්.

ආඛ්‍යාන narrations
**Volume 06 | Issue 02 | July - December 2021 | Article 03**
**ISSN 2478-0642**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

# ශ්‍රී ලංකාවේ කසළ කඳු උප සංස්කෘතිය:

# මීතොටමුල්ල කසළ කන්ද ඇසුරෙන් සිදු කරන ලද සමාජ විද්‍යාත්මක අධ්‍යනයක්

සුපේෂලා රත්නායක[7]
B.A (sp)

**සාරසංක්ෂේපය**

අපද්‍රව්‍යවල භෞතික ස්වරූපය සහ එහි සමාජ සංස්කෘතික ගොඩනැගීම අතර සම්බන්ධතාවය අතර ඇත්තේ ධනාත්මක සම්බන්ධතාවයකි (Gill,2007). ශ්‍රී ලංකාවේ නව කසළ කඳු උප සංස්කෘතියේ සමාජ සහ සංස්කෘතික ස්වරූපය හඳුනාගැනීම ප්‍රධාන අරමුණ කරගන්නා ලද මෙම ලිපිය සඳහා හේතු සධක සිද්ධි අධ්‍යයනය වූයේ 2017 වර්ශයේ මීතොටමුල්ල කසළ කන්ද නායයාමයි. මේ අනුව මීතොටමුල්ල කසළ කන්ද සමග බිම් මට්ටමේ නව උප සංස්කෘතියක් බිහිවීම කෙරෙහි හේතු වූ රාජ්‍ය සහ ආයතනික බල සම්බන්ධතාවයන් කවරේද යන්න පර්යේෂණ ගැටලුව කරගත් මෙම අධ්‍යයන ලිපිය සංවිධානයෙහිලා උප අරමුණු කිහිපයක් උපයුක්ත කරගන්නා ලදි. එනම් කසළ කඳු උප සංස්කෘතිය සමග සාමාන්‍ය ජන ජීවිතය වෙනස් වූ ආකාරය අවබෝධ කර ගැනීම, නිවාස සංකීර්ණ තුළ නැවත පදිංචි කිරීම හේතුවෙන් මුහුණ පෑමට සිදුවූ සමාජ ගැටලු, කසළ අංගනය සමග සම්බන්ධ වූ සුළු ව්‍යාපාර තුළ බිම් මට්ටමේ බලය ක්‍රියාත්මක වීම හඳුනා ගැනීම යන්නයි. මෙම පර්යේෂණයේ අධ්‍යයන ක්ෂේත්‍රය වූයේ කොළඹ දිස්ත්‍රික්කයේ මීතොටමුල්ල කසළ අංගනයයි. පර්යේෂණයේ ප්‍රධාන නියැදිය වශයෙන් කසළ කන්ද නායයාමෙන් පසුව ලක්සඳ සෙවණ නිවාස සංකීර්ණයේ පදිංචි කරවනු ලැබූ සමස්ත පවුල් සංඛ්‍යාව වූ 42න් විධිමත් නියැදිකරණය යටතේ තෝරා ගන්නා ලද සියයට පනහක නියැදියකට අයත් වූ පවුල් 21ක් තෝරා ගන්නා ලදි. තව ද ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ආයතනවල නිළධාරිවරු සහභාවි කරගන්නා ලදි. මිශ්‍ර පර්යේෂණ ක්‍රමයෙන් ලබාගත් දත්ත සඳහා තේමා අන්තර්ගත සහ ආඛ්‍යාන විශ්ලේෂණය යොදා ගන්නා ලදි.

**ප්‍රමුඛ පද:** මීතොටමුල්ල කසළ කන්ද ,නිලබලය ,ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, බිම් මට්ටම

[7] බාහිර කථිකාචාර්ය, ඇක්වයිනාස් උසස් අධ්‍යාපන ආයතනය

**හැඳින්වීම**

පාරිසරික ගැටලුවක් යනු සමාජ ප්‍රශ්නයක් ලෙස හඳුනාගැනීමෙන් පසුව එය පුද්ගලයාට සහ පොදු සමාජයට බලපෑම් එල්ල කරන ආකාරය හොඳින් අවබෝධ කර ගත හැකිය. බොහෝ පාරිසරික ගැටලු කිසියම් භෞතික පසුබිමක් තුළ නිර්මාණය වන අතර ඒවා මුලින් පුද්ගලයින්ට පෞද්ගලිකව බලපානු ලබන අතර එම පාරිසරික ගැටලු ක්‍රමයෙන් පොදු සමාජීය ගැටලු බවට පරිවර්තනය වෙයි. කාලානුරූපීව සිදුවන මානව පරිණාමයත් සමග පාරිසරික ගැටලුවල ස්වභාවය වෙනස් වෙයි. අතීත සමාජයට වඩා නූතන මිනිසාගේ ජීවන රටාවේ වෙනස්වීම් ඇති වීම හේතුවෙන් නව පාරිසරික අර්බුදයන් නිර්මාණය වෙමින් පවතී. ගෝලීය වශයෙන් පැන නැඟී ඇති නව පාරිසරික අර්බුදයන් අතුරින් වර්තමානයේ වඩාත් සමාජීය කතිකාවන්ට මුල් වී ඇති පාරිසරික අර්බුදයන් ලෙස ගෝලීය උණුසුම වැඩිවීම, සාගර ජල මට්ටම ඉහළ යාම, දේශගුණික සහ කාලගුණික විපර්යාසයන් ඇතිවීම, ලැව් ගිනි, හරිතාගාර ආවරණය, වන විනාශය, ජෛව විවිධත්වය හානිවීම මෙන්ම කැළි කසළ ජනනය වීම දැක්විය හැකිය.

මෙම පාරිසරික විපර්යාසයන් අතුරින් ඝන අපද්‍රව්‍ය ජනනය වීමේ වර්ධන වේගය ඉහළ යාම ගෝලීය අර්බුදයක් ලෙස බරපතල ගැටලුකාරී තත්ත්වයන් ඇති කරමින් සිටියි. ශීඝ්‍රයෙන් වර්ධනය වන ලෝක ජනගහනය, සංවර්ධනය වෙමින් පවතින රටවල සිදුවන වේගවත් නාගරීකරණය යන සාධකයන් නාගරික ඝන අපද්‍රව්‍ය ජනන වේගය වර්ධනය කිරීමට හේතු වී ඇත. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව සිදු කරනු ලැබූ බොහෝ පර්යේෂණ වාර්තාවන් මගින් පැහැදිලි කරනුයේ ලොව බොහෝ රටවල ඝන අපද්‍රව්‍ය ජනන වේගය ජනගහන වර්ධන වේගය ඉක්මවා යමින් පවතින බවයි (Hoornwey and Bhada-Tata,2012). එහිදී වඩාත් සාකච්ඡාවට භාජනය වන්නේ සංවර්ධනය වෙමින් පවතින රටවලවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ගැටලු කෙරෙහිය. සංවර්ධනය වෙමින් පවතින රටවල භාණ්ඩ පරිභෝජනය සංවර්ධිත රටවල් පරයා යමින් ඉහළයාම හේතුවෙන් නුදුරු අනාගතයේදී අපද්‍රව්‍ය ජනනය වීම දෙගුණයකින් ඉහළ යනු ඇතැයි ගෝලීය ඝන අපද්‍රව්‍ය වාර්තා දත්ත මගින් උපකල්පනය කෙරේ. ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේදී ගැටලු ඉස්මතු වන ප්‍රධාන අංශ කිහිපයක් පවතියි. එනම් ඝන අපද්‍රව්‍ය එකතු කිරීම, ප්‍රවාහනය කිරීම සහ බැහැර කිරීම යන ක්ෂේත්‍රයන් තුළ ගැටලු වර්ධනය වීමක් දක්නට ලැබේ. ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සුදුසු බිම් නැති වීම හේතුවෙන් විවෘත බිම්වලට ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම ගෝලීය වශයෙන් සාමාන්‍ය ක්‍රමය වී ඇත. නමුදු විවෘත බිම් පෙදෙස්වලට ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමෙන් විශාල පාරිසරික දූෂණයකට සහ මහජන සෞඛ්‍ය කෙරෙහි විවිධ ස්වරූපයෙන් අහිතකර බලපෑම් එල්ල කරනු ලබයි. ඒ අතර වඩාත් වැදගත් වන්නේ නීති විරෝධීව බැහැර කරනු ලබන විවෘත ඝන අපද්‍රව්‍ය හේතුවෙන් භූමිය මතුපිට සහ පෘථිවි අභ්‍යන්තරික ජල ප්‍රභවයන් විනාශ වී යාමයි. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රමවත් කිරීම සඳහා එක් එක් රටවල් වලට ආවේණික වන පරිදි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයන් වඩාත් වැදගත් වෙයි. ඒ සඳහා ඵලදායී නීතිරීති සම්පාදනය වී නොතිබීම ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ගැටලු විසඳිය නොහැකි තරමේ බරපතල පාරිසරික ගැටලු වීමට හේතු වී ඇත. හෙන්රි ඇතුළු පිරිස පෙන්වා දෙන්නේ ඝන අපද්‍රව්‍ය

කළමනාකරණය සඳහා විධිමත් නීතිමය රාමුවක් නොතිබීම හේතුවෙන් රජයන් විසින් අපද්‍රව්‍ය ගංගා ඉවුරු සහ පහත් බිම් වලට බැහැර කිරීමට යොමු වන බවය. මෙම ලක්ෂණය ශ්‍රී ලංකාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පැහැදිලිව හඳුනාගත හැකි ලක්ෂණයකි.

වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ ජීවන රටාවන්, පරිභෝජන රටාවන් වෙනස්වීම සහ ආදායම් තත්ත්වයන් දිනෙන් දින ඉහළ යමින් පවතින බව පහසුවෙන් හඳුනාගත හැකි කරුණකි. පරිභෝජන රටාවන් වෙනස් වීම, පරිභෝජනය ඉහළ යාම හේතුවෙන් ඒහා සාපේක්ෂව පුද්ගලයෙකු විසින් නිපදවන ඒක පුද්ගල අපද්‍රව්‍ය ප්‍රමාණය ද ඉහළ යනු ඇත. ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ඝන අපද්‍රව්‍ය උත්පාදනය දළ වශයෙන් කි.ග්‍රෑ. 0.2ක් වන බව උපකල්පනය කෙරේ (Thilakarathna,2018). පුද්ගලයින් විසින් නිපදවනු ලබන අපද්‍රව්‍යන්වල තෙතමනය වැඩි වශයෙන් අන්තර්ගත වන අතර කාබනික ද්‍රව්‍ය සංයුතිය ද ඒහා සමානවම ඉහළ මට්ටමක පවතියි. එසේම පුද්ගලයින් විසින් නිපදවනු ලබන ඝන අපද්‍රව්‍යයන් වෙන් නොකර මිශ්‍රව පැවතීම නිසා ඝන අපද්‍රව්‍ය දිරාපත් වීම සඳහා විශාල කාලයක් ගතවේ (Baandara,2008). නිශ්චිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයක් සහ නෛතිකමය ජාතික ප්‍රතිපත්ති රාමුවක් ශ්‍රී ලංකාව තුළ නොමැති වීම හේතුවෙන් විවෘත බිමකට ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ වඩාත් ජනාකීර්ණ නගරය සහ අගනගරය වන කොළඹ නගරය තුළ දිවයිනේ විශාලතම කසළ කන්ද නිර්මාණය විය. ඒ මීතොටමුල්ල කසළ කන්දයි. මීතොටමුල්ල කසළ කන්ද කොළඹ නගරයේ සිට කි.මී 4 ක දුරින් පිහිටා ඇත. මෙම භූමියේ සමන්විත වූයේ කොළඹ මහ නගර සභාව විසින් වසර කිහිපයක් තුළ බැහැර කරන ලද වෙන් නොකරන ලද අපද්‍රව්‍යයන්ය. නාය යාමේ අවදානමකින් පසුවූ එම කසළ අංගණය 2017 අප්‍රේල් 14 වන දින නායයාම මිනිසා විසින් නිර්මාණය කරන ලද මෑතකාලීන ප්‍රබලම පාරිසරික ව්‍යසනයක් ලෙස පෙන්වා දිය හැකිය. විද්‍යාත්මක පර්යේෂණ වාර්තාවන්ට අනුව කසළ කන්ද නායයාමට හේතු වූයේ වර්ෂාව හේතුවෙන් කසළ කන්දේ ඉහළට ඇතිවූ පීඩනයත්, කසළ කන්දේ යටි ස්තරය අස්ථාවර වීමය (NBRO,2017). මෙම සිදුවීම සමග ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පිළිබඳ රාජ්‍ය සහ පළාත් පාලන ආයතන වල අවධානය වැඩි වශයෙන් යොමු වන්නට හේතුවක් විය. මේ සිදුවීම හේතුවෙන් පාරිසරික ව්‍යසනයන් පිළිබඳව තිබූ ශ්‍රී ලාංකේය සමාජමය ආකල්පය වෙනස් වූ අතර ඒ පිළිබඳ විවිධ ක්ෂේත්‍ර තුළ විවිධ සංවාදයන් සහ කතිකාවන් ඇතිවීම කෙරෙහි ජනප්‍රිය මාතෘකාවක් බවට ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පත්විය.

**පර්යේෂණ ක්‍රමවේදය**

**මීතොටමුල්ල කසළ කන්ද හැඳින්වීම.**

මෙම අධ්‍යනයේ ප්‍රධාන ක්‍රමවේදය ලෙස භාවිත කරනු ලැබුවේ සිද්ධි අධ්‍යනයකි. එහිදි යොදා ගනු ලැබූ සිද්ධිය වූයේ මීතොටමුල්ල කසළ කන්ද පිළිබඳ සිද්ධි අධ්‍යනයයි. ශ්‍රී ලංකාවේ කැළි කසළ පිළිබඳ ගැටලුව වඩාත් සාකච්ඡාවට භාජනය වීමට ප්‍රධානම සිදුවීම වූයේ ද 2017 අප්‍රේල් 14 වන සිංහල අලුත් අවුරුදු උදාවත් සමගම මීතොටමුල්ල කසළ කන්ද නායයාමෙන් සිදුවූ බරපතල ව්‍යවසනයයි. මෙම ව්‍යසනකාරී සිදුවීමෙන් අනතුරුව ඝන අපද්‍රව්‍ය ජනනය වීම සහ කසළ කඳු නිර්මාණය වීම සඳහා හේතු සාධක වූ මූල බීජයන් පිළිබඳව සෑම පාර්ශ්වයක්ම අවධානය ඒ වෙත යොමු විය. සිද්ධි අධ්‍යයනයට ප්‍රවේශ වීමක් ලෙස මීතොටමුල්ල කසළ

කන්දේ ආරම්භය කෙරෙහි අවධානය යොමු කිරීම වටනේය. මීතොටමුල්ල කසළ කන්දේ ඓතිහාසික පසුබිම විමසා බැලීමේදී පැහැදිලි වන්නේ කසළ කන්ද අවුරුදු කිහිපයක් තුළ වර්ධනය වූ පාරිසරික ගැටලුවක් බවය (Petely,2017).

වර්තමානයේ මීතොටමුල්ල කසල කන්ද නිර්මාණය වී තිබූ කොළොන්නාව පොතුවිල් කුඹුර ප්‍රදේශය 1989ට පෙර ඉතාම පිරිසිදු ජලය සහිත කුඹුරු යායක්ව පැවතී ඇත. ඒ කාලය වන විට ප්‍රදේශවාසීන් 5000ක් පමණ එම ප්‍රදේශය තුල පදිංචි වී සිටි ඇති තරමක ජනාකීර්ණ ප්‍රදේශයක් විය. කසළ කන්ද කඩා වැටීමෙන් ආපදාවට ලක් වූ ප්‍රදේශය තුළ ජනාවාස ඉදිකරමින් ජනසතු කරනු ලැබුවේ රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිවරයාගේ ගම් උදාව සංවර්ධන ව්‍යාපෘතියේ එක් පියවරක් වශයෙනි (Chathumani *et al*,2019).

මෙම ගම් උදාව ව්‍යාපෘතිය සමග මෙම ප්‍රදේශය ජනාකීර්ණ වීමත් සමගම මෙම ප්‍රදේශය තුල මීතොටමුල්ල රාහුල විද්‍යාලයය, ටෙරන්ස් විද්‍යාලයය, කොලොන්නාව බාලිකා විද්‍යාලයය ස්ථාපනය කර ඇත. එසේම බහුජනවාර්ගක ජනතාවකගෙන් සමන්විත වන මෙම ප්‍රදේශය තුළ බෞද්ධ විහාරස්ථානයක්ද, මුස්ලිම් දේවස්ථාන ද්විත්ත්වයක්ද එක් කතෝලික දේවස්ථානයක්ද ස්ථාපිත කර තිබුණි. එසේම පොදු ළිං 100ක් පමණ ජලය ලබා ගැනීම සඳහා නිර්මාණය කර තිබී ඇත.

කොළඹ මහනගර සභාව විසින් 2009 අප්‍රේල් මාසය වන තෙක් කොළඹ මහනගර සීමාවට අයත් බල ප්‍රදේශයේ කසළ බැහැර කර ඇත්තේ බ්ලුමැන්ඩල් ප්‍රදේශයට ය. එම ප්‍රදේශයේ කසළ කන්දක් නිර්මාණය වීම හේතුවෙන් කසළ දැමීමට විරුද්ධව මහජන විරෝධතාවයන් ආරම්භ විය. එම විරෝධතාවලට ප්‍රතිචාරයක් වශයෙන් එම ප්‍රදේශයට කසළ බැහැර කිරිම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තහනම් කරන ලදි. ඒ අනුව කසළ බැහැර කිරීම සඳහා තාවකාලික විකල්ප ස්ථානයක් ලෙස පොතුවිල් ආර ප්‍රදේශයේ 2009 අප්‍රේල් මස සිට අක්කර දෙකක ප්‍රමාණයක පමණක් කසළ බැහැර කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කොළඹ මහ නගර සභාවට බලය ලබා දී ඇත. ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය වූයේ වසර දෙකක් සඳහා අක්කර දෙකක ඉඩම් ප්‍රමාණයක් භාවිත කිරීම වුවද කොළඹ මහ නගර සභාව එම නීතිය උල්ලංඝනය කරමින් 2017 වන තෙක් සැලකිල්ලකින් තොරව දෛනිකව කසළ බැහැර කිරීමට කටයුතු කිරීම තුළින් කොළඹ නගරය තුළ කසළ ගැටලුවට විසඳුමක් ලැබුණද වෙනත් කලාපයක කසළ කන්දක් නිර්මාණය විය (Jyakodi et al,2018).

ඒ අනුව 2012 වර්ෂය වන විට කසළ බැහැර කිරීමේ වපසරිය අක්කර 18ක් දක්වා වර්ධනය වී තිබූ අතර උස අඩි 200කින් යුත්ක කසළ කන්දක් එම අංගනයේ නිර්මාණය වී තිබුණි. මේ කාලය වන විට ප්‍රදේශවාසීන්ට කසළ කන්දෙන් අහිතකර බලපෑම් එල්ල වන්නට විය. දැඩි පාරිසරික හානිය, සෞඛ්‍ය ගැටලු මතුවීම, ඩෙංගු, මී උණ වැනි වසංගත රෝග තත්ත්වයන් පැතිරියාම හේතුවෙන් එම ප්‍රදේශය ජනාවාස සඳහා නුසුදුසු තත්ත්වයට පත් වෙමින් තිබුණි.

2013 වර්ෂය වන විට කසළ කන්දේ බලපෑම හේතුවෙන් වසර 75ක් පැරණි ඒ වන විට ශිෂ්‍යයින් 600ක් පමණ ඉගෙනීම ලැබූ මීතොටමුල්ල රාහුල විද්‍යාලය වසා දැමීමට සිදුවිය. මේ සිදුවීම හේතුපාදක කර ගනිමින් මුල් වරට කසළ කන්දට එරෙහි ජනතා විරෝධතා ව්‍යාපාරයන්

ආරම්භ විය. එම විරෝධතාවයන් එවකට පාලනයේ සිටි රජයන් විසින් අමානුෂික ලෙස මර්දනය කිරීමට කටයුතු කරන ලදි. 2014 වර්ශයේදී නැවත වරක් උද්ඝෝෂණ ආරම්භ වීම හේතුවෙන් එවකට පාලන තන්ත්‍රය විසින් උද්ඝෝෂණ ව්‍යාපාරයේ නිරතවූවන් සඳහා සම්මුඛ සාකච්ඡාවක් පවත්වා පුත්තලම අරුවක්කාලු ප්‍රදේශයේ හුණු ගල් කැණීම් සිදු කරන ප්‍රදේශයක වළවල් පිරවීම සඳහා දුම්රිය මගින් කසළ ගෙන ගොස් බැහැර කිරීමේ ව්‍යාපෘතියක් වසර දෙකකින් ආරම්භ කරන බවට පොරොන්දු වී ඇති අතර ඒ කාලය වන තෙක් වෙනත් විකල්පයක් නොමැති නිසාවෙන් මෙම ප්‍රදේශයටම කසළ බැහැර කිරීම සිදු කර ඇත. නමුත් එම ව්‍යාපෘතියේ කටයුතු කඩිනමින් ආරම්භ නොවීම හේතුවෙන් නැවත වරක් ජනතා විරෝධතා ව්‍යාපාරයන් ආරම්භ වී ඇත. මේ අවස්ථාවේදී ජනතා විරෝධතා ව්‍යාපාරයට සහභාගි වූ පුද්ගලයින් විසින් මහජන පීඩාවක් සිදු කළාය යන චෝදනාව මත වැල්ලම්පිටිය පොලිසිය විසින් විරෝධතා ව්‍යාපාරයේ සංවිධායකවරයාට සහ කැඳවුම්කරුට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනු කරන ලදි.

කොළඹ මහනගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ විශේෂ විගණන වාර්තාව (2018) ට අනුව කොළඹ 1 සිට කොළඹ 15 දක්වා වූ කලාපයන්වල කසළ බැහැර කිරීමේ ටෙන්ඩරය වසර ගණනාවක සිට කොළඹ මහ නගර සභාව විසින් ලබා දී ඇත්තේ පෞද්ගලික ආයතනයන් දෙකකටය. එසේ ලබාදීමේදී ඇස්තමේන්තුගත මුදලට වඩා වැඩි මුදලකට එනම් රුපියල් මිලියන 800කට පමණ මුදලකට ලබාදීමට කටයුතු කර ඇත.

මීතොටමුල්ල කසළ කන්ද හේතුවෙන් ප්‍රදේශවාසීන්ගේ සෞඛ්‍ය තත්ත්වයට එල්ල වූ බලපෑම් පිළිබඳව 2015 දී රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් සමීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කර ඇත. එම වාර්තාවට අනුව සනාථ වී ඇත්තේ ප්‍රදේශයේ දරුවන්ගෙන් 65%කට චර්ම රෝග සහ මානසික රෝග වැළඳී ඇති බවය. 2015 වන විට කසළ කන්ද හේතුවෙන් මී උණ, ඩෙංගු සහ පාචනය වැළඳීමෙන් පුද්ගලයින් 30 දෙනෙක් පමණ මිය ගොස් ඇති බව ද වාර්තා විය. එසේම මීතොටමුල්ල කසළ කන්ද තුළ කසළ දහනය වීම නිසාවෙන් මීතේන් වායුව විමෝචනය වීම සමගම නැවත පිළිසකර කළ නොහැකි තරමේ පාරිසරික හානියක් වී තිබූ බව පරිසර නීතීඥයින්ගේ පරිසර සංගමය පෙන්වා දී ඇත (Petely,2017).

2013 වර්ෂයේ සිට 2016 වර්ශය දක්වා අඛණ්ඩව පැවති උද්ඝෝෂණ හේතුවෙන් කුණු කන්ද ආසන්නයේ පැවති නිවාස 350කට ආසන්න ප්‍රමාණයක් බලධාරීන් විසින් ඉවත් කිරිමට කටයුතු සූදානම් කර තිබුණි. එසේම 2016 වනවිට තවත් නිවාස 300කට ආසන්න ප්‍රමාණයක් ඉවත් කිරිමට බලධාරීන් ක්‍රියා කොට ඇත. ඒ පිළිබඳව එවකට රජයේ අදාළ නියෝජ්‍ය ඇමැතිවරයාගේ ප්‍රකාශය වූයේ කසළ කන්ද ව්‍යාප්ත කිරීමට රජය ගත් තීරණයක් හේතුවෙන් මෙම නිවාස ඉවත් කිරීමට සිදුවූ බවය.

2017 මුල් කාර්තුව වන විට කුණු ලොරිවලට කසළ කන්ද මුදුනට යාමට තරම් නොහැකි මට්ටමක උසකින් කසළ කන්ද වර්ධනය වී තිබුණි. මේ හේතුව නිසාවෙන් කසළ එක තැන ගොඩ ගසන්නට විය. ඒ හේතුවෙන් බෑවුමක් සහිත කසළ කන්දක් අංගණය තුළ ක්‍රමයෙන් නිර්මාණය විය. මෙම අවදානම් තත්ත්වය යටතේ නගර සභාව විසින් කසළ දැමීම නතර කරනු විනා සිදු කරනු ලැබුවේ බැකෝ යන්ත්‍ර 7ක් යොදා ගනිමින් නැවතත කසළ කන්ද මුදුනට තල්ලු කිරීමය. මේ සඳහා විශාල පිරිවැයක් නගර සභාව විසින් දරන ලදි. කෙසේ නමුත්

කසළ කන්දට කසළ කන්දේ බර දරා ගැනීමට නොහැකි වීම හේතුවෙන් 2017 අප්‍රේල් මස පස්වරු 3.15ට පමණ නායයාමට ලක්විය. මෙම ව්‍යසනය හේතුවෙන් පුද්ගලයින් තිස්දෙදෙනෙකු ජීවිතක්ෂයට පත්විය. මෙසේ මියගිය පුද්ගලයින් අතරින් 9 දෙනෙකු වයස අවුරුදු 10 ට අඩු බාල වයස්කරුවන් වීම වඩාත් සංවේදී ජනක කාරණය විය. එසේම අතුරුදහන්වූ මරණ සංඛ්‍යාව 11ක් විය. මෙම ව්‍යසනයෙන් පුද්ගලයින් තිස් දෙදෙනෙක් මරණයට පත්වූ අතර එකොළොස් දෙනෙක් අතුරුදහන් ලෙස වාර්තා වූයේ ඔවුනගේ සිරුරු කසළවලට යට විම හේතුවෙනි. මේ හේතුව නිසාවෙන් පවුල් 72 කට අධික ප්‍රමාණයකට නිවාස අහිමි වී අවතැන් තත්ත්වයට පත්විය. එම පවුල්වල සමස්ත පුද්ගලයින් 1782 දෙනෙකු ආපදාවට ලක්වූවන් ලෙස හඳුනා ගන්නා ලදි. මෙම ව්‍යසනය හේතුවෙන් සිදු වූ දේපළ හානි ප්‍රමාණය නිශ්චිතව ගණනය කිරීමට පවා නොහැකි තත්ත්වයක් උද්ගත වී තිබුණි. කෙසේ නමුත් එහිදි පූර්ණ නිවාස හානි 60ක් සිදු වූ බවත් තවත් අර්ධ නිවාස හානි 22ක් සිදුවී ඇති බව පසු වාර්තාවලින් අනාවරණය විය (Chathumani *et al*,2019).

**අධ්‍යයන නියැදිය**

මෙම පර්යේෂණ ලිපියෙහි ප්‍රධාන අරමුණ වනුයේ මීතොටමුල්ල කසළ කන්ද හේතුවෙන් නිර්මාණය වූ නව කසළ උප සංස්කෘතිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමය එහි දී ප්‍රධාන අධ්‍යයන නියැදිය සකස් කර ගනු ලැබුවේ කසළ කන්ද නායයාම හේතුවෙන් පීඩාවට පත් වූ සමස්ත ජනගහන සංගහනයෙනි. මීතොටමුල්ල කසළ කන්ද නායයාම හේතුවෙන් ආපදාවට පත්වූවන්ගේ සම්පූර්ණ පවුල් ප්‍රමාණය පවුල් 72 ක් ලෙස වාර්තා විය. ව්‍යසනයෙන් පසුව එම පවුල්වලින් පවුල් 42ක් සඳහා රජයෙන් නිවාස සංවර්ධන අධිකාරියට අයත් වූ ලක්සඳ සෙවණ නිවාස සංකීර්ණයෙන් නිවාස ලබා දීමට ක්ෂණිකව කටයුතු කරන ලදි. ලක්සඳ සෙවණ නිවාස සංකීර්ණය තුළ පදිංචි කරවනු ලැබූ සමස්ත පවුල් ප්‍රමාණය 42කි. මෙම අධ්‍යයනයේ නියැදිය සඳහා එම පවුල්වලින් තෝරා ගන්නා ලද නියැදියක් භාවිත කරනු ලැබේ. එයට හේතුව වන්නේ ඔවුන් කසළ කන්ද නායයයාම හේතුවෙන් පීඩාවට පත්වූ ප්‍රධාන පුද්ලයින් වීමයි. කසළ කන්දේ වර්ධනය සහ එය නායයාමට ලක්වන තුරුම ඒ සමග ජීවත් වූ පුද්ගලයින් දත්ත ලබා ගැනීම සඳහා සුදුසුම කණ්ඩායම වන්නේ ය. එම පවුල් ලක්සඳ සෙවණ නිවාස සංකීර්ණයේ A- B- C යන නිවාස ඒකකයන් තුළ පදිංචි වී සිටිති. මෙම අධ්‍යයනයේ නියැදිය සකස් කිරීම සඳහා සමස්ත පවුල් සංගහනයෙන් සියයට 50 ක ප්‍රතිශතයක් තෝරාගන්නා ලදි. සියයට 50 ක ප්‍රතිශතයක් තෝරා ගැනීමට හේතුව වූයේ අධ්‍යයනය සඳහා ප්‍රමාණවත් තරම් ගුණාත්මක සහ ප්‍රමාණාත්මක දත්ත ලබා ගැනීම අවශ්‍ය බැවිනි.

සමස්ත පවුල් සංගහනය භාවිතයෙන් අධ්‍යයන නියැදිය සකස් කර ගැනීම සඳහා භාවිතා කරනු ලැබුවේ **විධිමත් නියැදිකරණ ක්‍රමවේදයයි.** විධිමත් නියැදිකරණය භාවිත කිරීමට හේතුව වූයේ සමස්ත පවුල් සංගහනයටම සමාන අවස්ථා ලබාදීමේ ක්‍රමවේදය සාධාරණය කිරීමටය. ඒ සඳහා සංගහනයට අයත් පවුල් පදිංචි වී සිටින නිවාස තට්ටුවට අදාළ නිවාස අංකයන් භාවිතා කරමින් අංක ආරෝහණ අනුපිළිවෙලට සකස් කරන ලද විධිමත් රාමුවක් සකස් කරගන්නා ලදි. ආරෝහණ පිළිවෙලට සකස් කරන ලද නිවාස සංකීර්ණයේ විධිමත් නියැදිකරණ රාමුව තුළින් සියයට 50ක නියැදියක් තෝරා ගැනීම සඳහා සමාජ විද්‍යාත්මක අධ්‍යනයන්හීදී භාවිත කරනු ලබන **නියැදි අන්තරය සහ නියැදි අනුපාතය** යන ගණිතමය


සංකල්පයන් භාවිතා කරන ලදි. එසේම දත්ත රැස් කිරීමේ ක්‍රමවේද ලෙස ප්‍රශ්නමාලා ක්‍රමය සහ ගැඹුරු සම්මුඛ සාකච්ඡා භාවිත කරන ලදි.

පර්යේෂණ තුළ සොයා ගනු ලැබූ ප්‍රාථමික සම ද්විතීයික දත්ත විශ්ලේෂණය සඳහා යොදා ගනු ලැබුවේ තේමා අන්තර්ගත විශ්ලේෂණය සහ ආඛ්‍යාන විශ්ලේෂණයයි. තේමා අන්තර්ගත විශ්ලේෂණය භාවිත කිරීම තුළින් පර්යේෂණයට අදාළ දත්තයන්ගේ සුලභ තේමා හඳුනා ගනිමින් ප්‍රධාන තේමාවලට වෙන් කර ගැනීමට හැකි විය. එසේම අඛ්‍යාන විශ්ලේෂණය ගුණාත්මක දත්ත විශ්ලේෂණය සඳහා සුදුසුම විශලේෂණ ක්‍රමවේදයයි. මේ තුළින් මීතොටමුල්ල කසළ කන්ද පිළිබඳව සිදු කළ ගැඹුරු සම්මුඛ සාකච්ඡා මගින් ලබා ගන්නා ලද ප්‍රතිචාරික අත්දැකීම්, අදහස්, නිලධාරීන්ගේ ප්‍රකාශනයන් සහ සිදුවීම් විස්තර කිරීම්, කසළ කන්ද පිලිබඳ ආකල්පයන් විශ්ලේෂණය කළ හැකි විය. ආඛ්‍යාන ක්‍රමවේදය තුළින් කසල කන්ද නායයාමෙන් පසුව ප්‍රතිචාරකයින්ගේ පදිංචිය සමග සිදුවූ සංක්‍රාන්තික වෙනස්වීම් අවබෝධ කර ගත හැකි විය.

**ජීවන පරිසරිය සහ උපසංස්කෘතිය**

සංස්කෘතික පරිසර විද්‍යාව තුළින් මානව පරිසර විද්‍යාඥයින් සමාජ සංවිධානමය සහ සංස්කෘතික විචල්‍යයන් කෙරෙහි අවධානය යොමු කරනු ලබයි. 1961 දි ඩන්කන් විසින් ඉදිරිපත් කරන ලද ජනගහන සංවිධානය-පරිසරය-තාක්ෂණය වන ආකෘති තුළින් පරිසරය සහ මානව සංස්කෘතිය තුළ ඇති සම්බන්ධතාවය පිළිබඳව අවධානය යොමු කරන ලදි. මෙම ආකෘතිය තුළ පරිසරය සංකීර්ණයක් ලෙස විස්තර කරන අතර, එහි සෑම අංගයක්ම අනෙක් අංගයන්ට බලපාන ආකාරය විස්කර කර ඇත. මෙම ආකෘතිය වැදගත් වන්නේ පරිසර විනාශයේ සංකීර්ණ ස්වරූපය පෙනවීමට හැකියාව ලැබූ හෙයිනි. මේ ඔස්සේ යමින් හේතුඵල සම්බන්ධය දැක්වූ Dunlap විසින් ජනගහනය වැඩිවීම, තාක්ෂණික වෙනස්කම් ඇති කිරිම, ආදී කරුණු නාගරීකරණය ශීඝ්‍රවීම සඳහා බලපාන බවත් පෙන්වා දී ඇත (Dunlap,1993). පරිසර විනාශයේ පරිසර විද්‍යාත්මක පදනම පැහැදිලි කරනු ලබන කැටන් සහ ඩන්ලැප් යන දෙදෙනා විසින් පරිසරය තුළ තරගකාරී ක්‍රියාවන් තුනක් උපයෝගී කරගත් ආකෘතියක් පෙන්වා දිය හැකිය. එම ආකෘතියට අනුව පරිසරය විසින් මානව වර්ගයා සඳහා කෘත්‍යයන් තුනක් ඉටු කරනු ලබයි (Catton and Dunlap උපුටා ගනු ලැබුවේ සිරිසේන 2010).

රූප සටහන අංක 01 පරිසරය තුළ තරගකාරී ක්‍රියවන්




පරිසරය සැපයුම් අංශයක් ලෙස ක්‍රියා කරමින් නැවත අලුත් කළ හැකි හා නොහැකි ස්වාභාවික සම්පත් සපයනු ලැබේ. මෙම සම්පත් ප්‍රමාණයට වඩා භාවිතා කළ විට ඒවා හිඟ

වීමක් සිදුවේ. ජීවත් වන පරිසරය මගින් නිවාස, ගමනාගමන පහසුකම් සහ එදිනෙදා ජීවත් වීමට අවශ්‍ය පහසුකම් නිර්මාණය කෙරේ. මෙයද ප්‍රමාණයට වඩා භාවිත කළ විට අධික ජනගහනය, මාර්ග තදබදය යන ගැටලුකාරී තත්ත්වයන් ඇති වේ. පරිසරය විසින් සිදු කරනු ලබන අපද්‍රව්‍ය තැන්පත් කිරීමේ කෘත්‍ය මගින් කුණු කසළ සහ කාර්මික අපද්‍රව්‍ය වැනි අතුරු නිෂ්පාදන නගරය තුළ ස්ථානගත වීම සඳහා ඉඩ සලස්වයි. පරිසර පද්ධතියට මෙම අපද්‍රව්‍ය උකහා ගැනීමට ඇති හැකියාවට වඩා අපද්‍රව්‍ය බැහැර කරන විට පරිසර පද්ධතිය විනාශවීම සිදුවන අතර නව සෞඛ්‍ය ගැටලුවලට මුහුණ දීමට සිදුවේ.

පාරිසරික සංස්කෘතිකවාදී න්‍යායාත්මක පසුබිම් කෙරෙහි අවධානය යොමු කරන විට එම ලක්ෂණයන් තුළින් මීතොටමුල්ල ප්‍රදේශයේ නව කසළ සංස්කෘතික ලක්ෂණ බිහිවූ බව පැහැදිලි වේ. එනම් කසළ උපසංස්කෘතිය බිහිවීම සඳහා ඉහත සඳහන් වූ කෘත්‍යයන් ඉඩකඩ සඳහා එකිනෙකා සමග තරග වැද ඇති බව පෙනී යයි. එනම් උපනාගරික කලාපයක් වන මෙහි කසළ බැහැර කිරීම හේතුවෙන් මෙම ප්‍රදේශය ජනාවාස සඳහා සුදුසු නොවන පරිසරයක් බවට පත් වී ඇත. කසළ කන්ද ආශ්‍රිතව නිර්මාණය වී තිබූ පරිසරය තුළ එයටම ආවේණික ලෙස හැඩගැසුණු උප සංස්කෘතියක් නිර්මාණය වී තිබුණි. අපද්‍රව්‍ය පරිසරයක් තුළ නිර්මාණය වී තිබූ මෙම උපසංස්කෘතිය තුළ යටිපෙළ සමාජ සම්බන්ධතා ජාලයක් තුල අවිධිමත් ලෙස බලයේ හැසිරීම ආකාර කිහිපයකින් නිරීක්ෂණය කළ හැකි විය.

**මීතොටමුල්ල කසළ කන්ද සහ කසළ උපසංස්කෘතිය**

ටයිලර්ට අනුව සංස්කෘතියක් හෝ සභ්‍යත්වයක් යනු දැනුම, ඇදහිලි, කලා, සිරිත් විරිත්, සහ මිනිසා සාමාජිකයෙකු ලෙස ලබාගත් සෙසු හුරු පුරුදු හා දක්ෂතා සියල්ලම ඇතුළත් සංකීර්ණ සමස්තයකි (ටයිලර්, උපුටා ගන්නා ලද්දේ ජයසිංහ,2013). මේ අනුව පැහැදිලි වන්නේ සංස්කෘතිය යන්න කිසියම් ජන සමාජයක උරුමය ලෙස අර්ථකථනය කළ හැකි බවය. උපසංස්කෘතියක් යනු ප්‍රධාන සංස්කෘතියේ ලක්ෂණ සහිතව එහි ඇතැම් මූලධර්මයන් භාවිතා කරමින් නිර්මාණය වී ඇති සමූහයකි (Henfler,2014). ඒ වෙනුවට උපසංස්කෘතියක ලිහිල් සහ අවිධිමත් සමාජ සහභාගිත්වයක් දක්නට ඇත (Williams,2011:41). උපසංස්කෘතියක් බිහිවීම සඳහා ප්‍රධාන සාධකයක් වන්නේ පාරිසරික සහ භූගෝලීය වශයෙන් ඇති වන කාලානුරූපී වෙනස්වීම්ය. පුද්ගලයින් ජීවත් වන ප්‍රදේශයක වසර කිහිපයක් තුළ කසළ කන්දක් නිර්මාණය වීම තුළින් නව පාරිසරික රටාවට අනුගත වීමට සාමාජිකයන්ට සිදු වේ. ඒ අනුව නව සමාජ පරිසරයක් නිර්මාණය වේ. කසළ කන්ද හේතුවෙන් මීතොටමුල්ල උපනාගරික කලාපයේ නිර්මාණය වී තිබූ උප සංස්කෘති පුද්ගල ජන ජීවිතයට බලපෑම් එල්ල කර ඇති බව අධ්‍යයනයේදී අනාවරණය විය. ඒ තුළ විවිධාකාරයෙන් බලයේ ස්වරූපයන් ක්‍රියාත්මක වූ බව සනාථ විය.

උපනාගරික කලාපයක් යනු ප්‍රධාන නාගරික මධ්‍යස්ථානයට ආසන්නයේ පවතින මධ්‍යම නාගරික කලාපයේ ලක්ෂණයන් අත්පත් කරගනු ලබන්නා වූ මධ්‍යම නගරයේ බලපෑමට ලක්වන්නා වූ භූමියයි. මීතොටමුල්ල කසළ කන්ද පිහිටා තිබෙන්නේ කොළඹ අගනගරයට කිලෝමීටර 4ක් දුරිනි. කසළ කන්ද ආරම්භ වීමට පෙර මීතොටමුල්ල ප්‍රදේශය කොළඹ ප්‍රධාන වෙළෙඳ නගරයට සම්බන්ධ වූ උපනාගරික කලාපයක් ලෙස වර්ධනය වෙමින් පැවතුණි. එහිදී ශීඝ්‍රයෙන් මාර්ග පද්ධතිය දියුණු වීම, කර්මාන්ත ශාලා ආරම්භ වීම, රාජ්‍ය ආයතන පිහිටුවීම,

සුපිරි වෙළෙඳසැලවල්, ඇඳුම් සාප්පු ආදිය නිර්මාණය වීමත් සමගම ගැමි ජීවන රටාව ක්‍රමයෙන් උපනාගරික සහ නාගරික ලක්ෂණයන් අත්පත් කර ගන්නා ලදි. නමුත් 2009 සිට කසළ කන්ද වර්ධනය වීමත් සමගම පුද්ගල ජීවිතවලට ඍණාත්මක බලපෑම් ඇති කළ බව ප්‍රතිචාරකයින් සියල්ලම අනුමත කරන ලද පොදු කාරණයක් විය. අධ්‍යයනයට සහභාගි වූ ප්‍රතිචාරකයින්ගෙන් 95% (පවුල් 20)ක්ම කසළ කන්ද ආරම්භයට පෙර එම ප්‍රදේශය තුළ වාසය කරන ලද පාරම්පරික ඉඩම්වල අයිතිකාරයන් වූහ. එනිසා වසර කිහිපයක් තුළ කසළ කන්දේ ආරම්භය සහ වර්ධනය හේතුවෙන් ඔවුන්ගේ සුපුරුදු ජීවන රටාව වෙනස් වී තිබුණි.

වගු අංක 1 මීතොටමුල්ල ප්‍රදේශයේ පදිංචි වී සිටි කාලය

| පදිංචි වී සිටි කාලය | පවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය(%) |
|---|---|---|
| අවු 5ට අඩු | 1 | 4 |
| අවු 6-10 අතර | 4 | 19 |
| අවු 10ට වැඩි | 16 | 76 |
| එකතුව | 21 | 100 |

මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020

කසළ කන්ද සමග පුද්ගල ජීවිතය වෙනස්වූ ආකාරය පිළිබඳව ප්‍රතිචාරකයින් දක්වූ අදහස් මෙසේය.

> 'කුණු කන්ද දවසින් දවස විශාල වෙනකොට ඒකෙන් ඇති වුණ බලපෑම නරක අතට හැරුණා. මදුරුවන් බෝවීම, අධික දුර්ගන්ධය නිසා හුස්ම ගැනීමට අපහසුවීම, බල්ලන් පූසන් වගේ කරදරකාර සතුන්ගේ ගහනයත් වැඩි වුණා. අපේ ජීවිත කුණු කන්දත් එක්කම වෙනස් වුණා'
>
> ක්ෂේත්‍ර පර්යේෂණ දත්ත,2020

> 'කුණු කන්දේ ජරාව එකතු වීම නිසා හොඳ පිරිසිදු ජලය ලැබුණු ජල මාර්ග වගේම පොදු ළිං අපවිත්‍ර වුණා'
>
> ක්ෂේත්‍ර පර්යේෂණ දත්ත,2020

> 'කුණු ගඳ හින්දා උයාගත්තු කෑමවත් කන්න බැරුව අපි දුක් වින්දා. කුණු කන්ද හින්දා මිහිපිට අපායක අපි ජීවත් වුණේ'
>
> ක්ෂේත්‍ර පර්යේෂණ දත්ත,2020

මෙම ප්‍රතිචාරක අදහස් සියල්ල ඇසුරින් පැහැදිලි වන්නේ කසළ කන්ද සමග එම පරිසරය විසින් අයෝග්‍ය භෞතික පරිසරයක් සහ අයෝග්‍ය මානසික පරිසරයක් නිර්මාණය කළ බවය. ඒ අනුව අයෝග්‍ය භෞතික පරිසරයේ ලක්ෂණ වූයේ කසළ කන්දෙන් වහනය වන දුර්ගන්ධය, කසළ කන්ද නිසා ස්වභාවික ජල ප්‍රභවයන්ට හානි වීම, කසළ කන්ද හේතුවෙන් මී උණ, පාචනය ව්‍යාප්ත වීම, නිතර ලෙඩ රෝගවලට පත්වන පරිසරයක් බිහි වීමයි. නිවාස

එකිනෙකට සම්බන්ධව පැවතීම හේතුවෙන් ඇතිවන තදබදය මෙන්ම සෝෂාවද , කසළ කන්ද හේතුවෙන් ඒ ආශ්‍රිතව වර්ධනය වී තිබූ සුනඛ, බළලුන් සහ කපුටන් වැනි සතුන් විසින් පුද්ගල ජන ජීවිතය උඩු යටිකුරු කරන ලද බව අධ්‍යනයේ ප්‍රතිචාරවලින් අනාවරණය විය.

**කසළ කන්දේ උප සංස්කෘතීය තුළ ජන ජීවිත වෙනස් වීම.**

කසළ කන්ද සමග නිර්මාණය වී තිබූ උප සංස්කෘතියේ ලක්ෂණ හඳුනා ගැනීම සඳහා මානයක් ලෙස ඔවුන්ගේ ඉඩම් සහ නිවාස පිළිබඳව අවධානය යොමු කරන ලදි. අධ්‍යයන නියැදියෙන් කසළ කන්ද නායයාමට පෙර ඔවුන් සතු වූ ඉඩම් සහ නිවාස පිළිබඳව ලද තොරතුරු මගින් කසළ කන්ද ආශ්‍රිත පවුල් පරිසරය සහ සමාජ පරිසරය පිළිබඳව අවබෝධයක් ලබා ගත හැකි විය. නියැදියෙන් පවුල් 19% (4) ක පිරිසක් එම ප්‍රදේශයේ කුලී නිවාසවල රැඳෙමින් රැකියා සහ පාසල් අරමුණු කර ගනිමින් නගරයට ආසන්නව ජීවත් වී ඇත. එසේම පවුල් 28%(6)ක් රජය විසින් සහ නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකිරීම් තහනම් කරන ලද අනවසර නිවාසවල පදිංචි වී සිට ඇත. එලෙස ඉදිකිරීම් තහනම් කර ඇත්තේ මීතොටමුල්ල කසළ කන්දට අයත් රජයේ ඉඩමක් වීම සහ රජයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා එම කලාපයන් වෙන් කර තිබීම හේතුවෙනි. අධ්‍යයන නියැදියෙන් වැඩිම පිරිසක් වූ 53%(11)ක පවුල් නීත්‍යානුකුල අයිතිය සහිත නිවාසවල ජීවත්ව සිට ඇත.

නීත්‍යානුකුල ලෙස නිවාසවල අයිතිය ලබා සිටි ප්‍රතිචාරකයින් සඳහන් කරනු ලැබුවේ එම ඉඩම් පාරම්පරිකව දෙමාපියන්ගේ ලැබුණු දේපළ බවය. තවද නීත්‍යානුකුල නිවාස අයිතිකරුවන් නගරයේ පාසල් සඳහා ළමුන් ඇතුළත් කර ගැනීමේ අපේක්ෂාවෙන් සින්නක්කර ලෙස ඉඩම් මිල දී ගෙන නිවාස ඉදිකර ගෙන සිටි බව අනාවරණය විය. කුලී පදනම මත නිවාසවල පදිංචි වී සිටි පුදගලයින්ට නායයාමෙන් ආපදාවට පත් නිවාස පිළිබඳ නීත්‍යානුකුල අයිතියක් නොමැති වුව ද ආපදාවට ලක්වූ හෙයින් නව නිවාස ලැබී තිබූ බව අනාවරණය විය. කසළ කන්ද හේතුවෙන් එම ප්‍රදේශයේ ඉඩම්වල සහ නිවාසවල මුදල්මය වටිනාකම් සහ විකුණුම් මිල පහළ ගිය බව ප්‍රතිචාරක අදහස විය. ඒ අනුව කසළ කන්ද හේතුවෙන් බොහෝ ඉඩකඩම් සින්නක්කර අයිතියට විකුණමින් වෙනත් ප්‍රදේශවලට පදිංචිය සඳහා ගිය පුද්ගලයන් තමන්ගේ ඉඩම් සහ නිවාසවලට නිසි ලාභ නොලැබූ බව අනාවරණය විය.

> 'කුණු කන්ද හින්දා මිනිස්සු ගෙවල් කුණු කොල්ලෙට විකිණුවා. ඉඩම්වල මිල පහළ ගියා'
>
> ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත,2020

නිවාස ඉදිකිරීමට යොදා ගන්නා ලද අමුද්‍රව්‍ය සහ නිවසේ ස්වභාවය පිළිබඳව ලද දත්ත අනුව පවුල් 61%(13)ක් තමන් විසින් සකස් කර ගන්නා ලද ස්ථිර නිවාස වල වාසය කර තිබූ බව අනාවරණය විය. එහි ඇතැම් නිවාස නිවාස තනි මහලේ නිවාස ලෙස සහ මහල් කිහිපයකින් යුක්ත නිවාස ලෙස නිර්මාණය කර තිබූ බව සඳහන් විය. ඉතිරි පවුල් 38%(8)ක ප්‍රමාණයක් තාවකාලිකව සකස් කරන ලද නිවාසවල ජීවත් වූ බව සඳහන් කරන ලදි. එසේම ඔවුන් එම තාවකාලික නිවාස සඳහා ටකරන්, ලෑලි, තාවකාලික තහඩු ආදිය භාවිතා කර තිබුණි. එම තාවකාලික නිවාස අතරින් බහුතරයක් කාමර එකකින් හෝ දෙකකින් සමන්විත වූ බව ප්‍රතිචාරකයින්ගේ දත්තවලින් අනාවරණය විය. එම නිවාස එකිනෙකට යාබදව සකස් කර

තිබූ අතර බොහෝ ඒවායෙහි අසල්වැසියන් නෑදෑයින් වීම හේතුවෙන් පවුල් අතර ශක්තිමත් සමාජ සම්බන්ධතා නිර්මාණය වී තිබූ බවත් එය ජීවත් වීමට පහසුවක් වූ බවත් සඳහන් කරන ලදි. ඒ තුළින් පවුල් අතර දැඩි විශ්වාසවන්තභාවයක් සහිත සම්බන්ධතා, අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වය, සමාජ ජාල සහ හවුල් ආශ්‍රයන් සමාජ ධනයට අදාළ කොන්දේසි වන අතර එම ලක්ෂණ මෙම නාගරික උප සංස්කෘතිය තුළ නිර්මාණය වී තිබුණි. ෆෝරරෙස්ට් සහ කීර්නස්ට (2001) ට අනුව සමාජ සංස්කෘතිකභාවයේ මානයන් ලෙස සමාජ ධනය සැලකිල්ලට ගත හැකිය (ෆෝරරෙස්ට් සහ කීර්නස්,උපුටා ගන්නා ලද්දේ නිරිඇල්ල,2017;103). ඒ අනුව මෙම නාගරික උප සංස්කෘතිය තුළ මනා සමාජ පරිසරයක් ගොඩ නගා ගැනීම නාගරික කටයුතු සහ ප්‍රජා සංවිධාන කටයුතු සඳහා වැදගත් වූ බව පැහැදිලි විය. කසළ කන්දට එරෙහි විරෝධතා ව්‍යාපාරය සඳහා සම්බන්ධ වීමේ දී මෙම ලක්ෂණයන් සංවිධානය වීම කෙරෙහි ධනාත්මකව බලපාන ලද බව පහතින් සාකච්ඡා කර ඇත.

**කසළ කන්ද හේතුවෙන් පාසල් අධ්‍යාපන අයිතීන් අහිමි වීම සහ බලාධිකාරියේ විසඳුම්**

මීතොටමුල්ල කසළ කන්ද එහි පදිංචිව සිටි දරුවන්ගේ පාසල් අධ්‍යාපනය කෙරෙහි ඇති කරනු ලැබුවේ ඍණාත්මක බලපෑමකි. නිවාස තුළ මෙන්ම පාසල තුළද දරුවන්ට අධ්‍යාපනය ලබාගැනීමට නොහැකි තත්ත්වයක් දක්වා කසළ කන්දේ බලපෑම වර්ධනය වී තිබුණි. ඒ අනුව 2013 වසරේ කුණු කන්දේ පුළුල් වපසරියක ව්‍යාප්ත වීම හේතුවෙන් ඒ වන විටත් සිසුන් 600ක් පමණ ඉගෙනුම ලැබූ මීතොටමුල්ල රාහුල විද්‍යාලය තුළ අධ්‍යාපන කටයුතු කරගෙන යාමට බාධා වී ඇත. එයට හේතුව වූයේ කසළ කන්දේ ඉවසිය නොහැකි දුර්ගන්ධය, මදුරුවන් බෝවීම සහ කසළ කන්දේ විසිරීම පාසල දක්වාම පැමිණීම සහ ඒ හේතුවෙන් පාසලේ තාප්පයට හානි සිදුවීමයි. කසළ කන්ද පාසල තෙක් ව්‍යාප්ත වීම පිළිබඳව දෙමව්පියන් සහ අධ්‍යාපන බලධාරීන් අදාළ ආයතනයන් දැනුවත් කළ ද ඒ සඳහා ස්ථිර විසඳුමක් නොලැබී තිබුණි. ඒ පිළිබඳව දැක්වූ රජයේ සහ අධ්‍යාපනික බලධාරීන්ගේ ප්‍රතිචාරය පුවත්පත් වාර්තාවක මෙසේ සඳහන් විය.

> ''ක්‍රමයෙන් පුළුල් වූ කුණු කන්ද 2013 වන විට පාසල ආසන්නයටම පැමිණ තිබුණි. එම වසරේදී කුණු කන්දේ කොටසක් පාසලට කඩා ගෙන වැටුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2013 ජනවාරි 2 වන දින පාසල තාවකාලිකව වසා දැමීමට බලධාරීන් කටයුතු කරන ලද බව ලංකා ගුරු සංගමය විසින් ඉදිරිපත් කරන ලද නිවේදනයක සඳහන් වෙයි. ආණ්ඩුව මෙම ව්‍යසනයට දැක්වූ එකම ප්‍රතික්‍රියාව වූයේ පාසල වසා දැමීමය''.

මෙම පුවත්පත් උපුටා ගැනීමට අනුව පැහැදිලි වන්නේ දරුවන්ගේ අධ්‍යාපනයට සුදුසු පරිසරය කසළ කන්ද විසින් විනාශයට පත් කිරීම හේතුවෙන් අධ්‍යාපන කටයුතු අඩාල වූ පරිසරයක් නිර්මාණය වූ බවය. දරුවකුට අධ්‍යාපනයක් ලැබීම සඳහා සුදුසු පරිසරයක් තිබීම තුළින් අධ්‍යාපන ඉලක්ක කරා දරුවන් සූදානම් කරවීමත් ඔවුන්ගේ මනස ඒ සඳහා පුහුණු කිරීමක් සිදුවෙයි. සිග්මන් ෆ්‍රොයිඩ් විසින් දරුවා ලබන අත්දැකීම්,දරුවාගේ මතකයට බුද්ධි වර්ධනයට මෙන්ම පෞරුෂත්ව වර්ධනයට පරිසරය තුළින් ගොඩ නැගෙන ආකල්පය බලපාන බව පෙන්වා දී ඇත (අතුකෝරාල සහ අතුකෝරාල,2016). නමුත් මෙවැනි කසළ පරිසරයක ජීවත් වන දරුවකුගේ අධ්‍යාපන පරිසරය විනාශ වීම තුළ එය ඍජුවම ඔහුගේ ආකල්පයන්ට ඔහුගේ අධ්‍යාපනයට සහ අනාගතයට අහිතකර ලෙස බලපාන බව පැහැදිලි වේ.

මේ පිළිබඳව රාජයේ ප්‍රතික්‍රියාව වූයේ තාවකාලික පැලැස්තරයක් ලෙස පාසල වසා දැමීමට පියවර ගැනීමයි. ඒ කෙරෙහි නිසි අවධායක් නොගැනීම තුළින් දරුවන්ගේ අධ්‍යාපන අයිතීන් උල්ලංඝනය කිරීම කෙරෙහි රාජ්‍ය බලය අත්තනෝමතික ලෙස බලපෑම් කරන ලද අවස්ථාවක් ලෙස දැක්විය හැකිය. පාසල වසා දැමීමෙන් පසුව දෙමව්පියන්ගේ උත්සාහය මතම දරුවන් වෙනත් පාසල් කරා යොමු කළ ද ඒ පිළිබඳව අධ්‍යාපන බලධාරීන් මැදිහත් වීමක් නොකළ බව ප්‍රතිචාරකයින්ගේ අදහස විය. රාහුල පාසල වසා දැමීම මූලිකවම උද්ඝෝෂණ ව්‍යාපාරයට තුඩු දුන් ප්‍රධාන හේතුව විය. එනම් පාරිසරික හේතූන් මත ප්‍රජා අයිතිවාසිකම් අහිමිවීම හේතුවෙන් ඊට එරෙහිව කටයුතු නැගී සිටීමේ බලවේගයන් ප්‍රජාව තුළින්ම ආරම්භ වීමට උත්තේජනයක් සැපයීම මෙහිදී කැපී පෙනෙන ලක්ෂණයක් විය.

**නැවත පදිංචි කළ නිවාස සංකීර්ණ තුළ නව උපසංස්කෘතියක සාමාජිකත්වය ගැනීම.**

රෙක්ස් සහ මුවර් විස්තර කරන ආකාරයට නිවාස පන්ති නාගරික සමාජයක් තුළ ප්‍රධාන සාධකයක් වෙයි. ඒ අනුව නිවාස පන්තියක සාමාජිකත්වය ලැබීම තුළින් එම පුද්ගලයින්ගේ ආශ්‍රය, උනන්දුන්, ජීවන ශෛලිය සහ ඔවුන්ට නාගරික සමාජ ව්‍යුහයේ හිමි වන ස්ථානය තීරණය කළ හැකිය. එසේම රස්කින් (1974) සඳහන් කරනු ලබන ආකාරයට අනුව නිවසක් යනු පුදගලයෙකුගේ ආදායම් මට්ටම, පන්තිය, ජීවන ශෛලිය සහ පවුලේ සම්බන්ධතාවයන් මතු පිටින් පෙන්වන, දෘශ්‍යමාන සාක්ෂියක් වැනිය. එමෙන්ම එම පුද්ගලයාගේ අනාගත අපේක්ෂාවන්ද පෙනෙන්නක් වෙයි (රෙක්ස් සහ මුවර් උපුටා ගැනීම,නිරිඇල්ල,2017). ඒ අනුව කසළ කන්ද නායයාමෙන් පසුව සිදු කරනු ලැබූ නව පදිංචි කිරීම් තුළින් අධ්‍යයන නියැදියට අයත් පුද්ගලයින්ට නව උපසංස්කෘතියක සහ සමාජ පන්තියක සාමාජිකයින් වීමට සිදුවී ඇත.

කසළ කන්ද කඩා වැටීමෙන් පසුව ආපදාවට ලක්වූවන්ගෙන් වැඩි පිරිසක් නැවත පදිංචි කර තිබුණේ ඒ ආසන්නයෙන්ම කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ආරම්භ කරන ලද ලක්සඳ සෙවණ නිවාස සංකීර්ණයේ ය. මෙම නිවාස යෝජනා ක්‍රමය ආරම්භ වී තිබුණේ මහින්ද චින්තන ප්‍රතිපත්ති මාලාවේ සැමට නිවසක් යන අඩු ආදායම්ලාභි නාගරික පවුල් පදිංචි කිරිම සඳහාය. මෙම නිවාස සංකීර්ණය තුළ නිවාස ඒකක 216ක් අයත් වේ. එක් නිවසක් සඳහා රුපියල් මිලියන 8ක් වියදම් කර ඇත (Thilakarathna,2018). එම නිවාස ඒකකයන් වර්ග අඩි 450කින් යුක්ත වේ. එම නිවාස එක් විසිත්ත කාමරයක්, නිදන කාමර දෙකක් සහ මුල්තැන්ගෙයක්, සහ බැල්කනියකින් යුක්ත වන බව අධ්‍යයන නිරීක්ෂණයේ දී පැහැදිලි විය. තෙකලා විදුලිය, ජල නළ මාර්ග, ප්‍රධාන මාර්ගයට පිවිසීමේ නව මාර්ගයක් සහ පොදු කටයුතු සිදු කිරීම සඳහා ප්‍රමාණවක් වන ඉඩ අවකාශයක් සහ වාහන නැවැත්වීම සඳහා රථගාලක්, විදුලි සෝපානයක් සහ රැස්වීම් ශාලාවක් මෙම නිවාස සංකීර්ණයට අයත් විය.

කසළ කන්ද ආශ්‍රිතව ගොඩ නැගී තිබුණු උපසංස්කෘතියට හාත්පසින්ම වෙනස් වූ උප සංස්කෘතියක් නිවාස සංකීර්ණ ආශ්‍රිතව ගොඩ නැගී තිබුණි. ඒ පිළිබඳව ප්‍රතිචාරකයින් දැක්වූයේ නිශේධනාත්මක අදහස් පමණි.

> ''අපි මෙහෙට ඇවිල්ලා කොටු කරපු සත්තු වගේ ඉන්නේ. කාමර දෙකයි පොඩි සාලෙයි හැරෙන්නවත් ඉඩ නැහැ. ඇඳුමක් පැළඳුමක් තියා ගන්න ඉඩක් නැහැ. වෙල්

එක ළඟම තියන නිසා හරිම කරදරයි. ශබ්දයි. අපිළිවෙලයි. ළමයෙක්වත් හදන්න හොඳ පරිසරයක් නෙවෙයි මේක''

ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත,2020

මීතොටමුල්ල ප්‍රදේශයේ තමන්ගේ අවශ්‍යතාවයන්ට සරිලන ආකාරයෙන් නිවාස සකස් කරගෙන සිටි මොවුන් මෙම නිවාස සංකීර්ණය තුළ අපහසුවෙන් ජීවත් වන බව සඳහන් කරන ලදි. නිවාසය ප්‍රමාණයෙන් කුඩා වීම හේතුවෙන් නිවැසියන් තම කටයුතු සීමා කිරීමට සිදු වී ඇත. පවුලේ සාමාජිකයින් වෙන් නිවාසවල පදිංචියට ගිය අවස්ථා ද තිබූ බව අනාවරණය විය. නමුදු මෙම නිවාස වෙනත් අයෙකුට විකිණීමට හෝ බදු දීමේ ක්‍රියාවලිය ආයතනික පද්ධතියක් හරහා සිදුවන සංකීර්ණ කටයුත්තක් බැවින් ඔවුන් එම නිවාසවල අයිතිය තමන් සතුව තබා ගැනීමට උත්සාහ දරන බවක් නිරීක්ෂණය විය.

නිවාස සංකීර්ණයේ නව නිවාස පිළිබඳව ඔබ තෘප්තිමත් වන්නේද යනුවෙන් ඉදිරිපත් කළ ඍජු ප්‍රශ්නය සඳහා ප්‍රතිචාරකයින් ලබා දුන් අදහස් මෙසේය.

වගු අංක 2 නිවාස ඒකකය පිළිබඳ අධ්‍යයන නියැදියේ අදහස

| ප්‍රතිචාරය | සංඛ්‍යාව | ප්‍රතිශතය(%) |
|---|---|---|
| තෘප්තිමත්ය | 7 | 33.3 |
| තෘප්තිමත් නොවේ | 14 | 66.6 |
| එකතුව | 21 | 100 |

මූලාශ්‍රයඃක්ෂේත්‍ර පර්යේෂණ දත්ත, 2020

නිවාස සංකීර්ණය පිළිබඳව තෘප්තිමත් වූවන් සඳහන් කරනු ලැබුවේ මීතොටමුල්ල කසළ කන්ද සමග ජීවත් වූ පරිසරයට වඩා ජීවත් වීමට සුදුසු පරිසරයක් නව පදිංචිය තුළ ඇති බවය. එසේම නිවාසවල ස්වභාවය පිළිබඳව ද සතුටු විය හැකි බව ඔවුන්ගේ අදහස විය. එසේම 66.6%(14)ක වැඩි ප්‍රතිචාරකයින් පිරිසක් එම නිවාස පිළිබඳ තෘප්තමත් නොවන බව සඳහන් කරන ලදි. එයට හේතු ලෙස ඔවුන් ඉදිරිපත් කර තිබුණේ නිවාස තුළ පෙර පැවති සමීප පුද්ගල සම්බන්ධතා නොමැති බව සහ හිත මිතුරන්ගෙන් වෙන්වීමට සිදුවීමත්, නව පරිසරයකට හැඩ ගැසීම අපහසු වූ බවත්ය.

මෙම නිවාස සංකීර්ණය ආශ්‍රිතව ගොඩනැගී තිබුණු උප සංස්කෘතියේ විශේෂ ලක්ෂණයක් වූයේ 'කල්ලි නිර්මාණය' වීමයි. කල්ලි යනු විවිධ ලක්ෂණයන්ගෙන් සැරසුණු කණ්ඩායමකි. ක්ෂේත්‍ර අධ්‍යයනයන්හිදී නිරීක්ෂණය වූ ලක්ෂණයන් වූයේ මෙම කණ්ඩායම්වල සාමාජිකයින් විවිධ විලාසිතා කොණ්ඩා මෝස්තර සකස් කර ගෙන සිටීම, විවිධ ආභරණ පැළඳීම, විවිධ ටැටූ ඇඳීම් ආදියෙහි නිරත වී සිටි බවයි. එසේම ඔවුන්ට ආවේණික වූ භාෂාවක් සහ මත්පැන් සහ මත්කුඩු සංස්කෘතියක් නිර්මාණය වී තිබු බව ප්‍රතිචාරක අදහස් විය. අධ්‍යයනයේදී කළ නිරීක්ෂණයන් මගින් මෙම ලක්ෂණ වඩාත් තහවුරු විය. මෙම කණ්ඩායම්වල මූලිකම අභිප්‍රාය වූයේ විනෝදාස්වාදයයි. එම නිසාවෙන් අනාගතය පිළිබඳව

ඔවුන් තුළ නිශ්චිත අරමුණක් නොවී ය. මෙහි ඇති බරපතලම අවධානම වූයේ මෙම කණ්ඩායම්වලට පහළින් ඇති වයස් කණ්ඩායම් විසින් මෙම ලක්ෂණයන් අනුගමනය කිරීමට පෙළඹීමයි. ප්‍රතිචාරකයින්ගේ හඳුන්වා දීම් තුළින් හඳුනාගත් කල්ලිවලට අයත් තරුණයින් කිහිප දෙනෙක් සමග පැවැත්වූ සාකච්ඡා මගින් මෙවැනි කරුණු අනාවරණය විය.

''අපිට වෙනම සෙට් එකක් ඉන්නවා. ඕනම දේකට ඉන්නවා. අපි සෙට් එකෙන් වැඩි පිරිසක් කරන්නේ වීල් එකක් හයර් කරන එක. ගොඩක් වෙලාවට ගෙවල් අස්සට වෙලා ඉන්නේ නෑ.සෙට් එකේ වයස අවුලක් නැහැ. අවුරුදු 14 වගේ ඉඳන් අන්කල්ලා වෙනකන්ම කට්ටිය ඉන්නවා. ෆ්ලැට් එකේ නැති අයියලාත් එනවා වෙලාවකට මෙහේ සෙට් වෙන්න''

ක්ෂේත්‍ර පර්යේෂණ දත්ත,2020

මෙම කාරණාවන් අනුව පැහැදිලි වන්නේ උපනාගරික කලාපයන්හි නිවාස සංකීර්ණ තුළ නවතම උපසංස්කෘතීන් බිහිවෙමින් පවතින බව සහ එම උපසංස්කෘතීන් බොහෝ විට සමාජ ප්‍රගමනය සඳහා සහභාගි නොවන බවය. වයස් භේදයකින් තොරව විචාරශීලීත්වයකින් තොරව දරුවන් විසින් මෙම කල්ලි අනුගමනය කිරීමට යාමෙන් සහ ඔවුන් අහිතකර ගති පැවතුම් සහිතව සමාජානුයෝජනය වන බව පැහැදිලි විය. ළමයෙකු සමාජයට අනුකූල ලෙස ජීවත් කරවීමට හුරුකරවන ක්‍රියාවලිය සමාජානුයෝජනය වන අතර මෙම ක්‍රියාවලිය සඳහා දෙමව්පියන්. වැඩිහිටියන්, ගුරුවරුන්, සාමාජීය නායකයින් සහ ආගමික නායකයින් වැදගත් වෙයි. නමුත් මෙම උප සංස්කෘතිය තුල දරුවකු සමාජානුයෝනය වන්නේ අහිතකර ලෙස බව ප්‍රතිචාරක මව්වරුන්ගේ චෝදනාවක් විය.

''මේ ෆ්ලැට් එකේ පොඩි ළමයි තමයි එක එක කල්ලිවලට අහුවෙන්නේ. ඒ වයස්වල ළමයි කුතුහලයෙන් ඉන්න වයස නිසා ඕනම වැරදි දෙයකට ඉක්මනින්ම යොමු වෙනවා. මේකෙ ඉන්න සමහර මිනිස්සු කුණුහරුප කියාගත්තු ගමන්මයි. අපි ගෙවල්වල කියන්නේ නැති වචන දැන් මේ දරුවෝ දන්නවා. සමහර වැඩිහිටි අය පොඩි ළමයි එක්ක වැරදි සම්බන්ධතා පවත්වා ගන්නවා. කුණු කන්ද නාය ගියත් කමක් නැහැ. එහේ මීට වඩා දරුවන් ගැන සැනසීමකින් අපි ජීවත් වුණා. දැන් අපි දරුවෝ සමාජෙට යවන්න බයෙන් ඉන්නේ''

ක්ෂේත්‍ර පර්යේෂණ දත්ත,2020

මෙම ප්‍රකාශය තුළින් පැතිකඩයන් කිහිපයක් හඳුනාගත හැකිය. එනම් සමාජ පරිසරයක් තුළ පවතින අසභ්‍ය වචන සහ වැඩිහිටියන් භාවිත කරනු ලබන භාෂා ශෛලීන්ට දරුවන් හුරුවීමත්, ඒවා නිරන්තරයෙන්ම ශ්‍රවණය වීමෙන් දරුවන්ගේ අධ්‍යාපනයට සහ සමාජානුයෝජනයට බාධාවන් ඇති වන බවය. එසේම වැඩිහිටි-ළමා නොගැළපෙන සම්බන්ධතා ඇති කර ගැනීම තුළින් දරුවන් එම උපසංස්කෘතිය තුළම රඳවා ගැනීම සඳහා පෙළඹවීමක් සිදු කරන බවයි. මීතොටමුල්ල ප්‍රදේශයේ නිවාසයන්ගෙන් ඉවත් වී නිවාස සංකීර්ණයක පදිංචි වීමට සිදුවීම පිළිබඳව ප්‍රතිචාරකයින්ගේ අදහස් සතුටුදායක නොවීය.

**කසළ කන්දේ පුද්ගලයින්ට නිවාස උපසංස්කෘතිය තුළ හිමිවී තිබූ ස්ථානය**

කසළ කන්දේ සිට පැමිණි පුද්ගලයින් හඳුන්වාදීම සඳහා නිවාස සංකීර්ණයේ සෙසු පදිංචිකරුවන් විශේෂිත නම් භාවිත කරන බව නිරීක්ෂණයේදි අනාවරණය විය. හෝවාර්ඩ් බෙකර්ටගේ ලේබල් වීමේ න්‍යායට අනුව(1963) උප සංස්කෘතියක් තුළ ලේබල් වීම යනු උප සංස්කෘතියට අයත් අය විසින් අධිපති සංස්කෘතියට නොගැළපෙන ආන්තික පුද්ගලයින් වීමයි (Henfeler,2014). තවද ඔහු උප සංස්කෘතියේ විශේෂ ලක්ෂණයක් ලෙස ඔවුන්ට ආවේණික වචන මාලාවක් නිර්මාණය කර ගන්නා බව දක්වයි. මෙම උපසංස්කෘතිය තුළ භාවිත කරනු ලැබූ විශේෂ පද අතුරින් කසළ කන්ද නාය යාම හේතුවෙන් පදිංචි කරන අය අනෙකුත් නිවැසියන්ගෙන් ඔවුන් වෙන් කර හඳුනා ගැනීම සඳහා නිලධාරීන් පවා භාවිතා කරනුයේ 'කුණු කන්දේ ඉදලා ආපු අය' යන වචනයයි. එසේම කන්දේ අය, කුණු ගොඩේ හිටපු අය, කුණු කන්දේ ගෙවල් වැනි කසළ කන්ද යන පදය විශේෂණ පදයක් ලෙස යොදා ගනිමින් තවමත් ඔවුන් ආමන්ත්‍රණය කරනු ලබයි. මෙයින් පැහැදිලි වන්නේ නිවාස සංකීර්ණයේ උපසංස්කෘතිය තුළ ද ඔවුන් වෙන් කර හඳුනා ගැනීම සඳහා යොදා ගන්නා වචන තුළින් ඔවුන් පොදු තත්ත්වයෙන් වෙනස් වූ බවය. එය ඔවුන්ට පීඩාවක් වූ අවස්ථාවන්ද සම්මුඛ සාකච්ඡාවලදී අනාවරණය විය. එනම් පොදු රැස්වීම්වලදී, පොදු කටයුතු වැනි බොහෝ අවස්ථාවන්වලදී ඔවුන් අපහසුතාවයන්ට පත්වී ඇත.

අධ්‍යයන නියැදියෙන් හමු වූ තවත් විශේෂ ලක්ෂණයක් වූයේ ඔවුන්ගෙන් සුළුතරයක් ආර්ථික සහ බාහිර භෞතික සාධක මත පහළ මධ්‍යම පන්තියට අයත් පුද්ගලයින් ලෙස වර්ග කළ හැකි බව ය. ඒ අනුව නියැදියෙන් පවුලේ ගෘහ මූලිකයන්ගෙන් 28%(පවුල් 6)කට ස්ථිර රැකියාවක් නොතිබුණි. එම නිවාසවල කල් පවත්නා භාණ්ඩ අවම ප්‍රමාණයක් තිබූ බව නිරීක්ෂණයේදී තහවුරු විය.දෛනිකව කරනු ලබන සුළු රැකියාවන් සහ නිවසේ සිටි කාන්තාවන් දරුවන් බලා ගැනීම, නිවසේ සිටම ස්වයං රැකියාවන් කිරීම ආදියෙහි නිරත වූහ. එහිදී බත් පැකට් කර විකිණීම, රෙදි මැසීම, කඩ සාප්පු පවත්වාගෙන යාම කැපී පෙණුනි. එම පවුල් පිළිබඳව කළ විශේෂ අධ්‍යයනයේදී පැහැදිලි වූයේ ඔවුනගේ දරිද්‍රතාවය කෙරෙහි බලපාන ලද එකම සාධකය ආර්ථික සාධක නොවන බවයි.


මෙම පවුල් හයෙහි සාමාජිකයින් සමග කළ සම්මුඛ සාකච්ඡාවන් මගින් හඳුනාගත හැකි වූ සංකල්පයක් වූයේ බහිෂ්කරණ සංකල්පයයි. 'කිසියම් සමාජයක බලය නොමැති වීම දිළිඳුකමට හේතුවයි' (සිල්වා,2001). බලරහිත වීම යනු පුද්ගලයන්ගේ හැසිරීම් තුළින් ඔවුන් අපේක්ෂා කරන දේ ලබා ගැනීමට නොහැකි වීමයි (Henfeler,2014:28). මේ අනුව මෙම පුද්ගලයන් බහිෂ්කරණය වීම පිළිබඳව විමසා බැලීමේදී උපසංස්කෘතිය තුළ ම දුප්පතුන් ලෙස කොන්වීම, ඒ තුළින්ම ලේබල් විම, නිවාස සංකීර්ණය තුළ සිටි පිරිස අතරින් සහ කසළ කන්ද නායයාමෙන් පසුව පදිංචියට පැමිණි පුද්ගලයින් අතරද මොවුන් කෙරෙහි පිළිගැනීමක් නොතිබීම සහ පිටත සමාජය තුළ මොවුන් පිළිබඳ විශ්වාස සහගත ආකල්පයක් නොවීම ආදී කාරණයන් තුළින් මෙම පුද්ගලයන් සාපේක්ෂව දුප්පත්භාවයේ රැඳී සිටීම හේතු වන බව අනාවරණය විය.

'පොඩි එදිනෙදා රස්සාවක් හොයා ගෙන ගියත් ගෙදර ලිපිනය ඇහුවම වෙලාවකට වැඩ නොදී අරින අවස්ථාවල් තියනවා. ඒ වගේ අවස්ථාවල කීයක් හරි හොයාගන්න ලොකු ගේමක් ගහන්න වෙනවා.'

ක්ෂේත්‍ර පර්යේෂණ දත්ත,2020

එසේම මෙම විශේෂ නියැදියෙන් හෙළි වූ තවත් කරුණක් වන්නේ ඔවුන් නිවාස සංකීර්ණයේ පොදු කටයුතුවලට සහභාගි වීමේ දී එවැනි අවස්ථාවන් මග හැරසීටීමට උත්සාහ දරන බවයි. ඔවුන් නිවාස සංකීර්ණයේ සමිතියට, මරණාධාර සමිතියට, ක්‍රීඩා සමිතියට සහභාගී වුව ද කිසිසේත් ම තනතුරු හෙඹවීම් නොකරන ලදි. මෙම පවුල් අනෙකුත් පවුල් අතරින් සාපේක්ෂව දිළිඳුවීම බලසතුකරණ න්‍යාය යටතේ පැහැදිලි කල හැකි ය. සිල්වා (2001) පුද්ගල විහීනතාවය පැහැදිලි කරනු ලබන්නේ මෙසේය.

රූප සටහන අංක 2: විහීනතා පාශය




මේ අනුව පැහැදිලි වන්නේ උප සංස්කෘතියක් තුළ රාමුගත කිරීමේදී සමාජයේ ලේබල් කිරීම ඔවුන් බහිෂ්කරණය වීමට ද බලපාන බවය (හඳරාගම,2004). අධ්‍යයන නියැදියට අයත් පිරිස මුල් පදිංචියේදී කසළ කන්ද හේතුවෙන් සහ ඉන්පසුව පදිංචි වූ නිවාස සංකීර්ණයේ උපසංස්කෘතික ලක්ෂණ හේතුවෙන් බහිෂ්කරණයයට ලක් වූ බවය. ඒ හේතුවෙන් බල රහිතභාවයට පත්වූ ඔවුහු තමන්ගේ ඇතැම් හැසිරීම් නිශේධනය කර ගැනීමට උත්සාහ කර තිබූ බව අනාවරණය විය.

**නිවාස සංකීර්ණයේ සමිති තුළ බලය බෙදී යාම.**

නිවාස සංකීර්ණය තුළ නොයෙකුත් අරමුණු සඳහා නිර්මාණය කරගන්නා ලද සමිති ගණනාවක් විය. එම සමිති ක්‍රීඩා සමාජ, සුබසාධන, මරණාධාර, නිවාස සංකීර්ණයේ ගැටලු පිළිබඳව සාකච්ඡා කිරීම ආදිය සඳහා නිර්මාණය කර ගන්නා ලද ඒවා විය. මෙම සමිතිවලින් නිවාස සංකීර්ණය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා වන සංගමය නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සිදු කරනු ලබයි. මෙම සමිති තුළින් බොහෝ අවස්ථාවන්හීදී පැන නගින ගැටලු පිළිබඳව විසඳුම් ලබා ගැනීම උදෙසා භාවිත කරනු ලබයි.

නිදසුනක් ලෙස නිවාස සංකීර්ණය තුළ දෛනිකව එක් රැස්වන කසළ බැහැර කිරීම පිළිබඳව ගැටලුවක් පැන නැගී තිබුණි. ඒ නගර සභාවේ කසළ බැහැර කරනු ලබන ලොරිය

පැමිණීමේ අක්‍රමිකතාවයන්ය. එම ලොරිය දවසේ විවිධ අවස්ථාවන්වල පැමිණීමත් ඔවුන්ට කසළ බැහැර කිරීම සඳහා නිශ්චිත වෙලාවක් නොමැති වීමත් ගැටලුවක් වී ඇත. එසේම කසළ ලොරිය පැමිණි විට ඒ පිළිබඳව දැන ගැනීමට ඉහළ මහල්වල පදිංචි පුද්ගලයින්ට අපහසු වී තිබුණි. ඒ අවස්ථාවේ පැවති ගැටලුවට සමිතිය හරහා විසඳුම් ලබා ගැනීමට උත්සාහ දරා ඇත. සමිතියේ සාමාජිකයින් විසින් කසළ ලොරිය සඳහා සංඥා නලාවක් සකස් කර ඇත. මෙවැනි නිවාස සංකීර්ණයේ ගැටලු සඳහා විසඳුම් ලබා ගැනීමට තරම් බලයක් සමිති තුළින් නිර්මාණය කර ගෙන තිබුණි.

එසේම නිවාස සංවර්ධන අධිකාරියට සහ අනෙකුත් නිවාස සංකීර්ණය පිළිබඳ වගකිව යුතු ආයතනයන්වලට නිවාස සංකීර්ණයේ ඇති ගැටලු ඉදිරිපත් කරනු ලැබුවේද මෙම සමිතිය මගිනි.

> 'නිවාසවල ගැටලු ගැන අපි ගොඩක් වෙලාවට කතා කරන්නේ රැස්වීම්වලින්. සමිතිවල සභාපති ලේකම් ආදී අය ප්‍රශ්න පිළිබඳව දැනුවත් කළාම ඒ අය අදාළ නිලධාරීන් දැනුවත් කරනවා'
>
> ක්ෂේත්‍ර පර්යේෂණ දත්ත,2020

තව ද සමිතිය තුළ නිලතලයන් බෙදී යාමේ ස්වරූපය තුළද කිසියම් සමාජමය බලයක් ඒ තුළ අන්තර්ගත වූ බව පැහැදිලි කරයි. සමිතිවල සභාපතිත්වය, ලේකම් ධූරය, භාණ්ඩාගාරික සහ කාරක සභික යන තනතුරු බෙදී ගොස් තිබුණේ එම පුද්ගල කණ්ඩායම් අතරින් ධනවත්බවකින් යුක්ත වූවන්ට සහ රජයේ රැකියා හෝ වෙනත් ස්ථිර රැකියාවල නිරත වූවන්ට සහ මහජන නියෝජිතයන් ලෙස පෙනී සිටි පුද්ගලයන්ටය. එසේම නිවාස සංකීර්ණයේ මුල් පදිංචිකරුවන්ට ද වැදගත් ස්ථානයක් හිමිවී තිබුණි. ඔවුන් තමන්ට ලැබුණු තනතුර උපරිම කැපවීමකින් යොදා ගැනීමට උත්සාහ දරා ඇති බව ද පැහැදිලි විය.

**බල රහිත වීම කෙරෙහි බලපාන පුද්ගල ආකල්ප**

නියැදියට අයත් පුද්ගලයින් සියලු දෙනාම තොරතුරු ඉදිරිපත් කිරීමේ දී තමන් අසරණ දුප්පත් හෝ කවරෙකුගෙන් හෝ පිහිටක් අවශ්‍යය යන ආකල්පයෙහි තදින් එළඹ සිටි බව පැහැදිලි විය. එය සනාථ කරනු ලැබූ අවස්ථාවන් රාශියක් සම්මුඛ සාකච්ඡාවලදී අනාවරණය විය.

> 'කන්ද කඩන් වැටුණට පස්සේ අපිට කිසිම සරණක් තිබුණේ නැහැ. ආණ්ඩුව වුණත් ගෙවල් හදලා දුන්නා විතරයි. අපිට හරියට අලාභෙ ගෙව්වේ නැහැ. දැන්නම් අපි ගැන වගක් වත් නැහැ.'
>
> 'ගෙවල් නාය ගිය දවස්වල අපේ දුක විකුණගෙන කන්න ඕන තරම් අය හිටියා. ඒත් දැන් තියන ප්‍රශ්න මොනවද කියලවත් අහන්න කෙනෙක් නැහැ.'
>
> 'රජය හැමදාම බොරු පොරොන්දු විතරයි දුන්නේ. අපේ අසරණකම ගැන හිතුවෙම නැහැ. දැන් අපේ ඉඩම් උඩ උද්‍යානයක් හදනවා. ඒත් අපිට කිසි දෙයක් නැහැ.'
>
> 'කුණු කන්ද නාය ගියාට පස්සේ දැන් අපි මොකුත්ම කරගන්න බැරි තත්වෙට ඇවිත් ඉන්නේ. වැටිලා ඉන්න තැනක් විතරයි තියෙන්නේ.'

'කුණු කන්ද නාය ගිය නිසා මගේ වාහන තුනක් නැති වුණා. රක්ෂණ සමාගම්වලට පෙන්වන්නවත් වාහන තිබුණේ නැහැ. මට අවසානේ රක්ෂණ වන්දියවත් ගන්න බැරි වුණා.'

'මොන දේ තිබ්බත් වැඩක් නැහැ අපිට හිටපු අගේ ගෙවල් දොරවල් නැතිව'

ක්ෂේත්‍ර පර්යේෂණ දත්ත,2020

සම්මුඛ සාකච්ඡා දත්ත අනුව ආපදාවට ලක්වූවන් සඳහා රජය සහ වෙනත් ආයතනයන් මගින් ජීවත් විම සඳහා අවශ්‍ය මූලිකම භෞතික ද්‍රව්‍යයන් ලබාදුන් බව පැහැදිලි විය. නමුත් මෙම ආධාර තුළින් එම පුද්ගලයින් තුළ යැපුම් මානසික තත්ත්වයක් නිර්මාණය කර ඇත. නිදසුනක් ලෙස මීතොටමුල්ල කසළ අංගණය නාය යෑමට පෙර ඒ සම්බන්ධයෙන් ආපදාවන්ට ලක්වූවන්ට 2012 සිට 2016 තෙක් ගෙවල් කුලී, නව නිවාස සහ උපකරණ ලබා ගැනීම සඳහා එක් අයෙකුට රුපියල් ලක්ෂ 15 බැගින් මුදල් ලබා දී ඇති බව සහ ස්ථිර පදිංචිකරුවන් තුන් දෙනෙකුට මුදල් ලබා දීම සහ තාප්පවලට සිදුවූ හානි ගෙවීම් සඳහා සමස්ත මුදල් රුපියල් 605,914,020 ක මුදලක් වැය කර ඇති බව සම්මුඛ සාකච්ඡාවලදී අනාවරණය විය.

වගු අංක 3: ආපදාවෙන් පසුව රජයෙන් ලබාදුන් ආධාර සහ සහන සේවා පිළිබඳ අදහස

| ප්‍රතිචාරය | සංඛ්‍යාව | ප්‍රතිශතය(%) |
|---|---|---|
| කිසිසේත් සෑහීමට පත් නොවේ | 9 | 42 |
| තරමක් සෑහීමට පත් වේ | 7 | 33 |
| සෑහීමට පත් වේ | 4 | 19 |
| සම්පූර්ණයෙන්ම සෑහීමට පත්වේ | - | - |
| අදහසක් නොමැත | 1 | 4 |
| එකතුව | 21 | 100 |

මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර පර්යේෂණ දත්ත,2020

මෙම ප්‍රතිචාර අතුරින් පැහැදිලි වන්නේ 42%(9)ක ඉහළම පිරිසක් ආපදාවෙන් පසුව ලැබුණු ආධාර සහ සේවාවන් පිළිබඳව සෑහීමකට පත් නොවන බවය. ප්‍රතිචාරක අදහස් වූයේ රජයෙන් ලැබුණු ආධාර තම අලාභයට කිසිසේත් සමාන කළ නොහැකි බවය. නායයාම හේතුවෙන් පූර්ණ වශයෙන් විනාශයට පත්වූ නිවාස සංඛ්‍යාව 71%(15) වූ අතර එසේ පූර්ණ හානි වූ නිවාසවල පුද්ගලයන් ආධාර පිළිබඳව කිසිසේත් සතුටු නොවීම අතර ධනාත්මක සම්බන්ධතාවයක් හඳුනාගත හැකි විය. එසේම මේ පිළිබඳව සම්පූර්ණයෙන්ම සෑහීමට පත් නොවන ප්‍රතිචාරකයින් නොසිටීමද විශේෂ ලක්ෂණයක් ලෙස දැක්විය හැකිය.

වගු අංක 4 කසළ කන්ද නායයාම හේතුවෙන් නිවාසවලට වූ හානියේ ස්වභාවය

| හානියේ ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රතිශතය(%) |
|---|---|---|
| පූර්ණ හානි | 15 | 71 |
| අර්ධ හානි | 5 | 23 |
| සුළු හානි | 1 | 4 |
| එකතුව | 21 | 100 |

මූලාශ්‍රයෘ ක්ෂේත්‍ර පර්යේෂණ දත්ත, 2020

නමුත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනයන් මගින් ආපදාවට ලක්වූවන්ට ආධාර ලබාදීම යනු භෞතික සම්පත් ලබාදීමය යනුවෙන් සකස් කරගෙන ඇති රාමුගත ආකල්පය හේතුවෙන් පුද්ගලයන්ගේ යැපුම් මානසික තත්ත්වය තවදුරටත් වර්ධනය කර ඇති බව අධ්‍යයනයේදී අනාවරණය විය. ඉහත දක්වන ලද අදහස් තුළින් පැහැදිලි වන්නේ ඔවුන් කසළ කන්ද නායයාමෙන් පසුව ලබා දුන් දේපළ සහ වෙනත් ආධාර පිළිබඳව තෘප්තිමත් නොවන බවත් කසළ කන්ද නාය යාමෙන් පසු තමන්ගේ ශක්‍යතාවයන් නැති වූ බවට තමා තුළම ආකල්පයක් ගොඩ නගා ගෙන ඇති බවත්ය. එය පුද්ලයා සතු ස්වබලය සහ ස්ව හැකියාවන් යටපත් කරනු ලබන නිශේධනාත්මක ආකල්පයකි.

> මෙම ආකල්පයන් පිළිබඳව නිවාස සංකීර්ණය භාර නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරීවරයා විසින් ලබා දුන්නේ මෙවන් අදහසකි. 'මේකේ ඉන්න මිනිස්සුන්ට රජයෙන් හරි වෙනත් ආයතනයකින් හරි මොනම දේයක් දුන්නත් අරක නැහැ, මේක නැහැ කියාගෙන ඉන්න එක පුරුද්දක් වෙලා. තමන්ගේ උත්සාහයෙන් නැගිටින්න උත්සාහ කරන අය අඩුයි .ඒ වගේම මීඩියා හරි, වෙනත් පර්යේෂණයකට හරි, ආධාර දීමනාවක් ලබා දෙන්න හරි පිරිසක් ආවොත් කියන්නෙම තමන්ට නැති දේවල්. මේ පරිසරයේ ඉන්න මිනිස්සු උත්සාහ කරන්නේ නිතරම වෙනත් කෙනෙක්ගෙන් දෙයක් ලබාගෙන ජීවත් වෙන්න'

ක්ෂේත්‍ර පර්යේෂණ දත්ත,2020

කෙසේ නමුත් මෙම පුද්ගලයින් තුල තමා විසින්ම තමා බල රහිත පුද්ගලයෙකු කර ගැනීමේ ආකල්පය ආපදාවට පත්වූවන් කෙරෙහි අවධානය යොමු කරනු ලැබූ ආයතනයන් විසින් හඳුනාගෙන නොතිබුණි. ඔවුන්ට අවශ්‍ය මානසික බල ගැන්වීම වෙනත් බාහිර පාර්ශ්වයන් තුළින් නොලැබී තිබීම ද අවධානයට ලක් නොවූ අංශයක් ලෙස හඳුනාගත හැකි විය.

**අධ්‍යයන නියැදියේ කසළ කළමනාකරණ ලක්ෂණ**

අධ්‍යයන නියැදියෙන් බහුතරයකගේ ම බිරින්දෑවරුන් 76%(16)කම ගෘහණියන් ලෙස නිවසේ රැඳී  සිටින බව අනාවරණය විය. ඔවුන් අතරින් නිවසේ සිට නිරත විය හැකි සුළු

පරිමාණයේ ස්වයං රැකියාවල නිරතවන්නියන් ද කිහිපදෙනක් විය. ඔවුහු අසල්වැසි නිවාසවල දරුවන් දහවල් කාලයේදී බලා ගැනීම, නිවාසවල ආහාර පිසීම වැනි ස්ථිර නොවන රැකියාවල නිරත වූහ. කෙසේ නමුත් මෙම පවුල් නියැදියෙන් වැඩිම ප්‍රතිශතයක් වූ 90%(19)කම පවුල්වල ප්‍රධාන මුදල් උපයන්නා ලෙස නම් කර තිබුණේ ස්වාමි පුරුෂයා ය.

අධ්‍යයන නියැදිය සමග කළ සම්මුඛ සාකච්ඡාවන් අනුව පෙනී ගියේ පවුල තුළ ස්ත්‍රීයකගේ කාර්යයභාරය සහ අපද්‍රව්‍ය කළමණාකරණය කෙරෙහි පුරුෂයින්ට වඩා කාන්තාවන්ගේ නැඹුරුව වඩාත් කැපී පෙනෙන බවය. එහි දී කාන්තාව විසින් නිවසේ පරිභෝජනය කරනු ලබන භාණ්ඩ තීරණය කිරීම, පරිභෝජනය කරනු ලබන භාණ්ඩයන්වල ස්වභාවය තීරණය කිරීම මෙන්ම භාණ්ඩයක් පරිභෝජනය කරනු ලබන වාර ගණන තීරණය කිරීම තම වගකීමක් ලෙස සිතමින් කටයුතු කරන ලදි. තවද නිවසේ පරිහරණය කර ඉවත දමන ද්‍රව්‍යයන් නැවත භාවිත කළ හැකිද, එය අපද්‍රව්‍යයක්ද යන්න තීරණය කිරීමෙහිලා කාන්තාවට පවුල තුළ කළමනාකරණය සඳහා ලැබී තිබුණු ගෘහීය පරිපාලන බලයට වැදගත් ස්ථානයක් හිමි වූ බවට සාක්ෂියක් විය. නිදසුනක් ලෙස භාවිතයෙන් පසුව ඉවත දමනු ලබන ජෑම් බෝතල්, නැවත කුළුබඩු ඇසුරුම් ලෙස භාවිත කිරීම, ඉවත දමන රෙදි කැබලි නිවසේ පිරිසිදු කිරීම් කටයුතු සහ පාපිසි ලෙස භාවිත කිරීම ආදිය දැක්විය හැකි ය. ශ්‍රී ලංකාවේ පවුල තුළ වගකීම් සහ කාර්යයන් බෙදීයාමේ සාම්ප්‍රදායික ක්‍රමවේදය මෙම අධ්‍යයන නියැදිය තුළ ද එලෙසින්ම දෘශ්‍යමාන විය. **කාන්තාවන් සහ බලය** පිළිබඳව විස්තර කරනු ලබන Gristhcotch (1992) විසින් සංස්කෘතිය අනුව කාන්තාවන්ගේ බලය වෙනස්වන බව දක්වයි. ඔහුට අනුව කාන්තාවක් නිවසේ බලය ලබා ගන්නා අතර පිරිමින් සමාජ බලය ලබා ගනු ලබයි. කාන්තාව විසින් තමන්ගේ බලය ආර්ථිකය සහ සමාජය සමග සම්බන්ධ කර ගනියි යන න්‍යායාත්මක පැහැදිලි කිරීම් අධ්‍යයන නියැදියේ කාන්තාවනගේ ගෘහීය හැසිරීම තුළින් සනාථ වේ (Gristhcotch,1992).

මීතොටමුල්ල කසළ කන්ද නාය යාමට පෙර එම ප්‍රදේශයට කසළ බැහැර කිරීම පිළිබඳව කරනු ලැබූ විමසීම්වලදී ඔවුන් ලබාදුන් පිළිතුරු අනුව කසළ කන්ද ඔවුන් ආසන්නයේම තිබුණ ද එය භාවිත කිරීම අවම මට්ටමක වූ බව සඳහන් කරන ලදි. එහි දී ඔවුන් නිවස තුළ නිපදවනු ලබන කසළ හැකිතාක් අවම කර ගැනීමට උත්සාහ දරා ඇත.

> 'කුණු කන්ද ගෙදර ළඟම තිබුණත් අපි කුණු කන්දට කුණු දැම්මේ නැහැ. අපේ වෙල්වල කුණු අපි භාර දුන්නොත් ලොරිවලටමයි. නිතරම උත්සාහ කළේ ගෙදර කසළ අඩු කරගන්නයි. කුණු කන්දෙන් වෙන හානිය අපිට අවබෝධයක් තිබුණ නිසා අපි අපේ කුණු අඩු කරගත්තා'
>
> ක්ෂේත්‍ර පර්යේෂණ දත්ත,2020

කාන්තාවන් තුළ කැළි කසළ වෙන් කිරීම, කුණු ලොරි වෙත කසළ භාරදීම, කසළ බැහැර කිරීමේ ගැටලු පිළිබඳව නිවාස සංකීර්ණයේ නිලධාරීන් දැනුවත් කිරීම වැනි වැදගත් අංශයන් රාශියක් කාන්තාවන් විසින් ආවරණය කරන ලදි. එසේම දත්ත රැස් කරන මොහොතේ දී නිරීක්ෂණය වූ කාරණයක් වූයේ කසළ ප්‍රවාහනය කරන ලොරිය පැමිණි විට අසල්වාසී කාන්තාවන්ටද ඒ පිළිබඳව දැනුවත් කිරීමට ඔවුන් ස්වෙච්ඡාවෙන්ම යොමු වී තිබීමයි.

අධ්‍යයනයට අදාළව සිදු කරන ලද ක්ෂේත්‍ර නිරීක්ෂණයන් තුළින් පැහැදිලි වූයේ නිවාස සංකීර්ණය තුළ කසළ කළමනාකරණයෙහිලා ගැටලු රාශියක් පවතින බවය. එනම් එහි කසළ රැස් කිරීම සඳහා වෙන් වෙන් දිනයන්හිදී කොළොන්නාව නගර සභාවට අයත් ලොරි රථ පැමිණෙයි. එම ලොර රථවලට පැමිණීම සඳහා නිශ්චිත වේලාවක් නොමැතිවීම කසළ බැහැර කිරීමේ දී ප්‍රධාන ගැටලුවක් වී තිබුණි. එසේම එක් දිනකට වැඩියෙන් කසළ රැස් කරන ලොරි රථ නොපැමිණියහොත් නිවස තුළ කසළ රඳවා ගැනීම අපහසු බව කාන්තාවන්ගේ අදහස විය. තව ද නිරීක්ෂණයේ දී අනාවරණය වූ කාරණයක් වූයේ ඉහළ මහල්වල සිටින පුද්ගලයින් පහළට පැමිණ කසළ ලොරියට භාර දෙනු විනා කසළ ඉහළ මහලේ සිට පහළට විසි කරන බවය. එමගින් නිවාස සංකීර්ණය අසල බිම් කොටස අපවිත්‍ර වී තිබූ අතර නොයෙක් වර ඒ පිළිබඳව පුද්ගලයින් දැනුවත් කළ ද ඔවුන් ඒ පිළිබඳව සැලකිලිමත් නොවන බවය.

**මීතොටමුල්ල කසළ අංගනය සම්බන්ධ සුළු පරිමාණ ව්‍යාපාර තුළ බිම් මට්ටමේ බලය ක්‍රියාත්මක වීම**

මීතොටමුල්ල කසළ අංගනයට සම්බන්ධව ලබා ගන්නා ලද අධ්‍යයන නියැදියට අනුව කසළ අංගණය හා සම්බන්ධ ප්‍රාථමික මට්ටමේ ව්‍යාපාරයන් රාශියක් හඳුනාගත හැකි විය. එහි දී නීතිගත සුළු ව්‍යාපාරයන් මෙන්ම නීති විරෝධි ව්‍යාපාරයන්ද සිදු වූ බව අනාවරණය විය.

අධ්‍යයන නියැදියෙන් ස්වයං රැකියාවල නිරත වූ පවුල් 6 න් (28.5%) පවුල් 4 ක් කසළ අංගනය හා සම්බන්ධ ව්‍යාපාරවල නිරත වී සිටියහ. එයින් පවුල් තුනකගේ ප්‍රධාන රැකියාව කසළ අංගණය හා සම්බන්ධ වූ ස්වයං රැකියාවන් විය. කසළ කන්ද නාය යාමට පෙර ඒ ආශ්‍රිතව සිදු කරනු ලැබූ ව්‍යාපාරයන් ලෙස පත්තර එකතු කිරීම, පරණ පොත්පත් ලිපි ද්‍රව්‍ය රැස් කිරීම,වීදුරු එකතු කිරීම,ලී සහ ලැලි පතුරු එක්රැස් කිරීම ආදිය ව්‍යාපාර ලෙස වර්ධනය වී තිබී ඇත.

මේ පිළිබඳව දහම්පුර ග්‍රාම නිලධාරිවරයාගේ අදහස් මෙසේය.

> ''කුණු කන්ද නිසා මිනිස්සු ගොඩක් ජීවත් වුණා. දුර පදිංචි අය පවා දෛනික රැකියාව විදියට කුණු කන්දෙන් දේවල් රැස් කළා. පත්තර, වීදුරු වගේ දේවල් තොග වශයෙන් පවා වෙළෙඳාම් කළා''

ක්ෂේත්‍ර පර්යේෂණ දත්ත,2020

නියැදියට අදාළ පුද්ගලයින්ගේ අදහස වූයේ වැඩි වශයෙන්ම පිට පළාත්වල සිට පැමිණෙන පුද්ගලයින් විසින් මෙම ව්‍යාපාරවල නිරත වූ බවය. මෙම ව්‍යාපාරයන් තනි පුද්ගල ලෙස සහ කණ්ඩායම් ලෙස නිරත වූ ව්‍යාපාර විය. ඒ අනුව කිසියම් පුද්ගලයෙකු විසින් ස්වයං රැකියාවක් ලෙස පත්තර, ලිපි ද්‍රව්‍ය රැස් කරන්නේ නම් ඒවා මිල දී ගැනීම සඳහා සැකසී තිබූ ව්‍යාපාරික ජාලයක් තිබී ඇත. මෙම ව්‍යාපාරයන් පුද්ගල සම්බන්ධතාමත නිර්මාණය වූ ඒවා විය. කසළ කන්දෙන් ලබා ගන්නා අපද්‍රව්‍යයන් එම ස්වරූපයෙන්ම ලබා ගන්නා ආයතන සහ කොසු මෙට්ට ආදිය සකස් කරන ආයතන වෙත තොග වශයෙන් ලබා දීමද සිදු කර ඇත.

මේ ව්‍යාපාරය තුළ යම් විධියකින් අවිධිමත් බලයෙන් සැදුම්ලත් කුණු මුදලාලිලාගේ සංස්කෘතියක් නිර්මාණය වී තිබුණි. එනම් කසළ අංගනයේ එක් එක් ප්‍රදේශවල කසළ රැස්

කිරීමට එක් එක් පුද්ගලයින් විසින් බෙදා වෙන් කර ගෙන තිබුණි. එමෙන්ම කසළ ලොරි මගින් ගෙන එනු ලබන කසළ බෙදා ගැනීමේදීත් සුළු පරිමාණ ආරවුල් ඇති වූ අවස්ථා ද තිබූ බව අනාවරණය විය. නමුත් ඒවා පොලිස් රාජකාරිවලට සම්බන්ධ වීමට තරම් බරපතල ආරවුල් නොවේ.

> ''කුණු බිස්නස් එක එක්තරා විදියකට කරන්න ඕන බිස්නස් එකක්. උඩ ඉන්න මුදලාලිලාගේ ගේම්වලට අපි අහුවෙනවා. කුණු ගෙනල්ලා දානවා වගේම එළියට කුණු අදිනකන් කාගේ හරි ලොක්කෙක්ගේ උදව්වක් ඕන''
>
> ක්ෂේත්‍ර පර්යෙෂණ දත්ත,2020

මේ අනුව පැහැදිලි වන්නේ කසළ ව්‍යාපාරය තුළ මතුපිටට නොපෙනෙන බල ව්‍යාපාරික හස්තයන් මගින් සුළු පරිමාණ ව්‍යාපාරකයින් හැසිරවීමට ලක්කරන බවය. නමුදු කසළ කන්ද නායයාමත් සමගම මෙම ව්‍යාපාරයන් සම්පුර්ණයෙන්ම අඩාල විය. ඒ පිළිබඳව ප්‍රතිචාරිකාවක් දක් වූ අදහස් මෙසේය.

> ''කන්ද නාය ගියාට පස්සේ මේ පැත්තේ අය කරපු පොඩි පොඩි බිස්නස් ඔක්කොම නතර වුණා. පස්සේ කන්දට පොලිස් ආරක්ෂාව දැම්මට පස්සෙ ඒ පැත්තට යන එකත් තහනම් වුණා. කුණු දාන එක නතර වුණ නිසා දැන් ඒ අය වෙන වෙන රැකියාවල් කරනවා''
>
> ක්ෂේත්‍ර පර්යෙෂණ දත්ත,2020

එනම් මින් සනාථ වන්නේ කසළ කන්ද නායයාමත් සමග ඒ හා බැඳී තිබුණු ව්‍යාපාරයන් දුර්වල වූ බවය. කසළ කන්දට කුණු දැමීම නතර කිරීමත්, කසළ අංගණයට විශේෂ පොලිස් ආරක්ෂාවක් යෙදවීමත්, කසළ කන්ද ආශ්‍රිතව නාගරික උද්‍යානයක් ආරම්භ කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ වීමත් සමගම මීතොටමුල්ල කසළ ව්‍යාපාරයන්ගේ ස්වරූපය වෙනස් වූ බවය.

**නිගමනය**

මීතොටමුල්ල කසළ කන්ද හේතුවෙන් නව කසළ උප සංස්කෘතියක් කොළඹ උප නාගරික කලාපය ආශ්‍රිතව නිර්මාණය වී ඇති බව අධ්‍යයනයේ දී සනාථ විය. එසේම වසර කිහිපයක් තුළ වර්ධනය වූ කසළ කන්ද සමග මීතොටමුල්ල ආශ්‍රිත ප්‍රදේශය තුළ පාරිසරික සහ සාමාජීය ගැටලු රාශියක් ඇති නිර්මාණය කර ඇති බවත් එම අහිතකර බලපෑම් හේතුවෙන් නිර්මාණය වූ අයෝග්‍ය භෞතික පරිසරයේ ලක්ෂණ වූ කසළ කන්දෙන් වහනය වූ දුර්ගන්ධය, කසළ කන්ද නිසා ස්වභාවික ජල ප්‍රභවයන්ට හානි වීම, කසළ කන්ද හේතුවෙන් මී උණ, පාචනය ව්‍යාප්ත වීමයි. එම පරිසරය පුද්ගලයන්ට ජීවත් වීම සඳහා නුසුදුසු පරිසර තත්ත්වයක් බවට පත් වී තිබූ බව පැහැදිලි විය. ඒ හේතුවෙන් කසළ කන්ද ආශ්‍රිතව විශේෂ පාරිසරික සංකුලතා සහිත උපසංස්කෘතියක් නිර්මාණය වූ බව උපකල්පනය කළ හැකිය තව ද කසළ කන්ද නායයාමෙන් ආපදාවට පත් වූවන් නැවත පදිංචි කරනු ලැබූ නිවාස සංකීර්ණය තුළ නව උපසංස්කෘතියක සාමාජිකත්වය ගැනීමට සිදු වීම හේතුවෙන් අවිධිමත් බල සම්බන්ධතාවල බලපෑමට යටත්වීමට සිදු වූ බව අධ්‍යයනයේ දී අනාවරණය විය. නව නිවාස සංකීර්ණයන්

පිළිබඳව හෝ රජයෙන් ලැබුණු ආධාර වන්දි මුදල් පිළිබඳව ප්‍රතිචාරකයින් සෑහීමට පත් නොවූ අතර අධ්‍යයන නියැදියේ පුද්ගලයින්ගෙන් දකගත හැකි විශේෂ ලක්ෂණය වූයේ යැපුම්වාදී මානසික තත්ත්වයයි. එම නිශේධනාත්මක ආකල්පය ඇති වීම කෙරෙහි කසළ කන්ද නායයාමේ ආපදාව සෘජුව බලපෑ බවත් භෞතික අවශ්‍යතා සාධනය විනා මානසික බලගැන්වීම් කෙරෙහි ආයතනික අවධානය යොමු නොවූ බව ද අනාවරණය විය.

## සමුද්දේශ


Bandara, N.(2008) *Municipal Solid Waste Management: A Sri Lankan Case*. University Of Sri Jyawardhanapura. Department of Forest and Environmetal Science.

Chathumani,D.,Gunarathna,I.,Wickramasinghe,D.(2019) *'Decades of Accumelate Seconds to Fall: A Case Study on Meethotamulla Garbade Dump in Sri Lanka'*.Interenational Journal of Trend in Scienctific,vol(3),ISSN: 2456-6470

Dunlap,R.E.(1993) *'From the Environmental Problem to Ecological Problems'* in C.C.Calhuon and G.Rister(eds),Social Problems.New York: Mcgraw-Hellen.

Gill,Z.(2007) *From the cult of Waste to the Trash Heap of the History:* Thec politics of the waste of Sociolist and Post Sociolist Hungary.Bloomington: Indian University Press.

Hoorweg,D.and Bhada-Tata,D (2012) What a Waste: a Global Review of Solid Waste Management',World Bank,Washington,DC.Available at: *http://open knowledge.worldbank.org/handle/10986/17388)* Accessed Date: 3rd January 2020

National Building Research OrganiZation (2017) Geo Technical Assesment on the Meethotamulla Waste fill.Colombo 5: Ministry of Disaster Management.

Petly,D.(2017) The Meethotamulla Garbage Dump in Sri Lanka.Available at http//blogs.agu.org/landslideblog/2017/04/16/meethotamulla-1/ (Accessed Date:2nd January 2020).

Thilakarathna,K.A.A.N (2018) *The Sociological Perspective on the Laksanda Sewana Housing Sceme Project.* Journal of Studies in Sicial Science and Humanities.Vol(4),No (2).Available at: *http//isshonline.com/.* (Accessed Date:30th December 2019)

අතුකෝරාල, දයා., අතුකෝරාල, හේලි. (2016) අධ්‍යාපන මනෝවිද්‍යාව හා ගුරුවරයා. බොරලැල්ල : ශික්ෂා ප්‍රකාශන.

ද සිල්වා, ප්‍රේමකුමාර සහ අත්තනායක, අබේරත්න (2017) සංස් : එස්. එල්. දෝෂි නූතන හා පශ්චාත් නූතන නව සමාජ විද්‍යා න්‍යාය කොළඹ: ෆාස්ට් පබ්ලිකේෂන්ස් ප්‍රයිවට් ලිමිටඩ්.

සිරිසේන,ඩබ්.එම් (2016) පාරිසරික සමාජ විද්‍යාව: වාරියපොළ, ආරිය ප්‍රකාශන.

නිරිඇල්ල,චන්ද්‍රසිරි (2017) නිවාස පිළිබඳ සමාජ විද්‍යාව සහ තිරසර නාගරික සංවර්ධනය නුගේගොඩ සරසවි ප්‍රකාශන.

**ආඛ්‍යාන** narrations
**Volume 06 | Issue 02 | July - December 2021 | Article 04**
**ISSN 2478-0642**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

---

# බෞද්ධ සාහිත්‍යයික ප්‍රස්තුත චිත්‍රණය කිරීමේ දී ශ්‍රී ලාංකේය චිත්‍ර ශිල්පියා විශද කළ නිර්මාණ ශක්‍යතාව: අනුරාධපුර හා පොළොන්නරු අවධිවල බිතු සිතුවම් ඇසුරෙන්

අයි.එම්.ටී. ඉලංගසිංහ[8]
sathsarailangasinghe@gmail.com

**සාරසංක්ෂේපය**

බුදුන් වහන්සේ ස්වකීය ධර්මය දේශනා කිරීමෙන් දීර්ඝ කාලයක් ඉක්ම ගොස් ඇති බැවින් "**ආදි බෞද්ධ දර්ශනය**" බ්‍රාහ්මණ දහමින් වැසී ගිය පශ්චාත් බෞද්ධ ධර්මයෙන් වෙන්කොට හඳුනාගත යුතුය. ඉක්බිති කාලානුරූපීව එකී දාර්ශනික මතවාද ආගමක් බවට පත්විය. **බෞද්ධාගම** යනු සත්‍යාබෝධය ප්‍රමුඛ අරමුණ ලෙස තබා ගත් පෘතග්ජන ස්වභාවය වැඩි දියුණුකර ගත්තකි. රජු හා පාලන අධිකාරිය බෞද්ධාගමට අනුග්‍රාහකත්වය සපයනුයේ රාජ්‍යයේ අභිමානය හා බුදු දහමින් ශික්ෂිත සමාජය පාලනය කිරීමේ පහසුව නිසාය. **මහින්දාගමනයෙන්** (ක්‍රි:පූ: 250-210) ඉක්බිතිව රාජ්‍ය අනුග්‍රහය සහිතව ශ්‍රී ලාංකේය **සාහිත්‍ය** කලාව, **බිතු සිතුවම්** කලාව විධිමත් ලෙස ස්ථාපිත විය. අනුරාධපුර හා පොළොන්නරු අවධියේ සම්භාව්‍ය සාහිත්‍යය සඳහා බුදු දහම ප්‍රමුඛ ප්‍රස්තුතයක් විය. එකී සාහිත්‍යයෙන් අනුප්‍රාණය ලද චිත්‍ර ශිල්පීන් බිතු සිතුවම් සඳහා සාහිත්‍යයික ප්‍රලේඛන ප්‍රස්තුත ලෙස භාවිත කර ඇත. සාහිත්‍ය ප්‍රලේඛනයක විස්තෘත ප්‍රස්තුතයක් චිත්‍රණය කිරීමේ දී චිත්‍ර ශිල්පියා සතු නිර්මාණාත්මක ශක්‍යතාවය පිළිබඳ හඳුනා ගැනීම පර්යේෂණයේ ප්‍රමුඛ **අරමුණ**කි. සම්භාව්‍ය සාහිත්‍යයෙන් අනුප්‍රාණය ලද චිත්‍ර ශිල්පීන් චිත්‍රණය කරන ලද බිතු සිතුවම් විධිමත් **ක්‍රමය**කට ගොනුකර සන්සන්දනාත්මකව විශ්ලේෂණය කිරීමේ දී එක් එක් දෘශ්‍ය රූප සංඥා අත්පත්කරගන්නා අනන්‍යතාවයන් හඳුනාගත හැකි විය. බිතු සිතුවම්හි දෘශ්‍යමාන රූප සංඥාවන් මගින්, සිතුවමෙහි අදෘශ්‍යමානව චිත්‍ර ශිල්පියාගේ මතවාදය (ආකල්ප හා සන්දර්භය) නිරූපණය කෙරෙන අතර එය ශ්‍රී ලාංකේය සංස්කෘතික අනන්‍යතාවය බවටද පත්වෙයි. මෙම කරුණු හඳුනාගැනීම පිණිස විශ්ලේෂණයේ දී දාර්ශනික සංකථන **ක්‍රමවේදය** ලෙස **ජොහැන් ගල්තුංග්**ගේ "**ඒ.බී.සී. ත්‍රිකෝණය**" න්‍යාය සංකථනය හා **සංඥාර්ථවේදී ප්‍රවේශය** භාවිත කෙරිණි. දෘශ්‍ය රූප ස්ථානගත කිරීම, අවකාශය භාවිතය වැනි සංකේත හා දෘශ්‍යමය ශිල්ප ක්‍රම මගින්

---

[8] කථිකාචාර්ය, චිත්‍ර කලා අධ්‍යයනාංශය, දෘශ්‍ය කලා පීඨය, සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය.

බිතු සිතුවම නිමවන ලද්දේ වුව, එකී සංඥා මගින් නරඹන්නා රසවිඳිමින් ගොඩනගනු ලබන අර්ථාන්විත හැඟවීම් ක්‍රියාවලිය නිර්මාණ කාර්යයේ අවසන් **ප්‍රතිඵලය** බවට පත්වෙයි. බිතු සිතුවම් මගින් තීව්‍ර කෙරෙන දෘශ්‍යමය හැඟවීම් සංඥා වනාහී තත්කාලීන සංස්කෘතික අනන්‍යතා විශද කරන බව **නිගමනය** කළ හැකිය.

**මුඛ්‍ය පද**

බිතු සිතුවම්, බෞද්ධ සාහිත්‍යය, දෘශ්‍යමය සංඥා, නිර්මාණ ශබ්‍යතාව

**හැඳින්වීම**

ක්‍රි:පූ: 486 කාලයේ භාරතයේ විසූ **සිද්ධාර්ථ ගෞතම බුදුන්** වහන්සේ බෞද්ධ ධර්මයේ ආදි කර්තෘවරයාය (බෂාම්,1995,331.පි.). උන් වහන්සේ ස්වකීය ධර්මය ග්‍රන්ථාරූඪ නොකළ අතර (හිරියන්න, 2014,115පි.) ධර්මය දේශනා කර ඇත්තේ" **මාගධී** "බසිනි (ඥානානන්ද හිමි, 1994,xi පි.). බුද්ධ පරිනිර්වාණයෙන් පසුකාලීනව බුදුන් වහන්සේගේ ධර්මය **පාලි** භාෂාවෙන් ලේඛනගත විය (හිරියන්න, 2014, 116පි.). මුල් බුදු සමය, තත්කාලීන බ්‍රාහ්මණ දහම හා පසුකාලීනව ව්‍යාප්ත වූ පශ්චාත් බෞද්ධ නිකායන් (මහායාන ඇතුළු) ගේ සම්මිශ්‍රණයෙන් බෞද්ධ සාහිත්‍යය බිහිව ඇත. දෙවන පෑතිස් රජ සමයේ දී (ක්‍රි:පූ: 250-210) සිදු වූ **මහින්දාගමනය** ලක්දිව ථෙරවාදී බුද්ධ ධර්මයේ සහ ශිෂ්ටාචාරයේ කේන්ද්‍රීය සාධකය වූ බව විද්වතුන්ගේ අදහස වී තිබේ (සෙනෙවිරත්න,2001,56පි.). බෞද්ධාගම රැගෙන පැමිණි ධර්ම දූතයන් ත්‍රිපිටකය, බුද්ධ ශාසනය, බෞද්ධ ආගම හා ස්ථාපිත කළේය. ලාංකේය මුහුණුවරක් ගත් බුදු දහමේ ආභාසයෙන් සුපෝෂිත වූ ලාංකේය සංස්කෘතිය නවීකරණය විය. ඉක්බිති වාස්තු විද්‍යාව, වෙළෙඳාම, වාරි තාක්ෂණය, කෘෂි තාක්ෂණය, ආයුර්වේදය, වෛද්‍ය විද්‍යාව, කලා ශිල්ප ආදී භෞතික ශිල්පයෙහි නව්‍ය ප්‍රවර්ධනයක් ඇති විය (කුමාරස්වාමි,1962,2පි.) ඉන් ඉක්බිතිව නාගරික ශිෂ්ටාචාරයකට පදනම වැටිණි (සෙනෙවිරත්න,2001,31පි.). ආගමිකත්වය මගින් ශික්ෂණය ලද ජන සමාජයෙහි ආධ්‍යාත්මික සංවර්ධනයක්ද ඇතිවිය. බුදු දහම ස්ථිර ලෙස ස්ථාපිත වීමත් සමග, ශ්‍රී ලාංකේය බිතු සිතුවම් කලාව රාජ්‍ය අනුග්‍රහය ලද ශිල්පක්‍රමයක් ලෙස ස්ථාවර විය. එකී බිතු සිතුවම් කලාවේ මූලික පදනම බෞද්ධ සංකල්පයන් විය. මුල්කාලීන විදර්ශනාධූර භික්ෂූන් වහන්සේලා ගල්ලෙන්වල ස්වකීය භාවනා කටයුතු සිදු කළහ. රජවරුන් හා නොයෙක් ශ්‍රද්ධාවත් ධනවතුන් එම ලෙන් කටාරම් කොටා ශිලා ලේඛන පිහිටුවා ලෙන් පෘෂ්ඨ මත බදාම ස්තරයක් අතුරා මටසිලිටු කර (වජිර හිමි, 1995 ,14-16පිටු) ඒ මත නොයෙක් මල්කමින් හා ලියකමින් හෙබි චිත්‍රකර්මයන් කරවා (විසුද්ධි මාර්ගය,2017,23පි.) සඟසතුකොට පූජා කරන ලදී. ක්‍රි:පූ: 2 වන සියවසේ දී පමණ මෙම කටාරම් ලෙන් සංස්කෘතිය වඩාත් ව්‍යාප්තව ඇත (සන්නස්ගල ,1964,39පි.). ඉන් ඉක්බිති බිතු සිතුවම් ලෙන් පෘෂ්ඨ මතුපිට, කපරාරු බිත්ති මත, නොයෙක් මැදුරු හා උද්‍යානවල අමතර සැරසිලි ලෙස ආදි ස්ථාන ගනනාවක ව්‍යාප්ත විය (හේවාපතිරණ,2012,5පි.). මෙම බිතු සිතුවම් අඳින ලද බදාම ස්තරය; දහයියා සමග ඉරූ ශාඛ කෙඳි, ශාඛ මැලියම්, වියළීමේ තෙල් වර්ගයක් මිශ්‍ර කිරීමෙන් සාදාගත් මැටි තලය මත ඉතා තුනී හුණු පිළියමක් අතුරා සකස් කළ තලයක් බව රාජා ද සිල්වා පෙන්වා දෙයි (සිල්වා,1990,25පි.). දේශීය ශාක හා පාෂාණ වර්ණක ඇසුරෙන් බිතු සිතුවම් සඳහා වර්ණ සකසාගෙන ඇත (වජිර හිමි,1995,14පි.). අනුරාධපුර හා පොළොන්නරු අවධිවලට අයත් බිතු සිතුවම් වෙන් වෙන් වූ ශෛලීය ලක්ෂණ සහිතව හඳුනාගත හැකිය.

සාහිත්‍යයේ දී අක්ෂර, වචන, වාක්‍ය ,නොයෙක් උපමා , උපමේය ආදී සාහිත්‍යමය ගුණාංග අනූන වශයෙන් යොදමින් සංවිධිත සංඥා පද්ධතියක් ගොඩනගයි. පාඨකයා කියවීම මගින් ලබා ගන්නා සංඥාවන් සංවිධිතව ගොඩනගා ගනිමින් අදහස හෝ හැඟීම සංජානනය කර ගනී. එකී බෞද්ධ සාහිත්‍ය ප්‍රලේඛනයන්හි ප්‍රස්තුත භාවිතයෙන් චිත්‍රණය කළ බිතු සිතුවම් මගින්ද හඳුනාගත හැකිවනුයේ නරඹන්නාට ලබාදෙන දෘශ්‍යරූප සමූහයකි. ඒවා වර්ණ, රේඛා, හැඩතල මෙන්ම සංඛේත හා හැඩතල ලෙස වෙන්වෙන් වූ සංඥාර්ථ ලෙස අරුත් සම්පාදනය කරයි.

**පර්යේෂණ ගැටලුව**

ශ්‍රී ලාංකේය බිතු සිතුවම්හි දෘශ්‍යමාන නිර්මාණකාර්යය මගින් ගම්‍යමාන කෙරෙන්නේ මොනවාද?

**උපන්‍යාසය**

ශ්‍රී ලාංකේය බිතු සිතුවම්හි දෘශ්‍යමාන පිළිබිඹුව ලෙස නිර්මාණකාර්යය හඳුනාගත හැකිය. එහි දෘශ්‍යමාන රූප සංඥාවන් මගින් , සිතුවමෙහි අදෘශ්‍යමානව චිත්‍ර ශිල්පියාගේ මතවාදය (ආකල්ප හා සන්දර්භය) නිරූපණය කෙරෙන අතර එය ශ්‍රී ලාංකේය සංස්කෘතික අනන්‍යතාව බවටද පත්වෙයි. එමගින් තත්කාලීන චිත්‍ර ශිල්පියා බෞද්ධ සාහිත්‍යයේ අනුප්‍රාණය ලබමින් ස්වාධීන සිතුවම් සම්ප්‍රදායක් ගොඩනගා ඇත.

**අරමුණු හා පරමාර්ථ**


මෙම පර්යේෂණයේ ප්‍රමුඛ **අරමුණ** වනුයේ වර්තමානයේ ශේෂව ඇති අනුරාධපුර හා පොළොන්නරු අවධිවලට අයත් බිතු සිතුවම් වල දෘශ්‍යමාන ක්‍රියාවලිය (නරඹන්නාට දක්නට ලැබෙන බිතු සිතුවම) යනු චිත්‍ර ශිල්පියෙකු විසින් සිදුකල බෞද්ධාගමික ප්‍රස්තුතයක් ඇසුරු කරගෙන ගොඩනගන ලද සරල පෘෂ්ඨීය වර්ණ තැවරීමක් පමණක් නොව, එය චිත්‍ර ශිල්පියා විසින් සිදුකළ චිත්‍ර ශිල්පියාගේ අභ්‍යන්තරික භාවාත්මක හැඟීම්, අනුභූතීන් අනන්‍යතා මෙන්ම පුද්ගල විශ්වාසයන් හා චිත්‍ර ශිල්පියා අත්පත් කරගත් ඥානමය තත්වයන්ගේ මෙන්ම චිත්‍ර ශිල්පියා විශ්වාස කළ දේශපාලනය, ආර්ථික තත්ත්වය හා සමාජ ස්වභාවය ආදිය නියෝජනය කරන පෘථුල නිර්මාණ කාර්යයක් බව තීව්‍ර කිරීමයි. බිතු සිතුවමේ **දෘශ්‍යමාන** වර්ණ, රේඛා, හැඩතල යන අංග මගින් **අදෘශ්‍යමානව** හඳුනාගත හැකි නිර්මාපකයාගේ ආකල්පමය හා සන්දර්භමය තත්ත්වයන් මගින් තත්කාලීන ශ්‍රී ලාංකේය සමාජයේ තිබූ සමාජ දේශපාලනික හා ආර්ථික තත්ත්වය මෙන්ම එකී තත්ත්ව මගින් තීව්‍ර කෙරෙන ශ්‍රී ලාංකේය අනන්‍යතාවයෙහි සුවිශේෂතා හඳුනා ගැනීමද පර්යේෂණයේ **අරමුණක්** ලෙස දැක්විය හැකිය. සංක්ෂිප්ත ලෙස බිතු සිතුවමක් යනු හුදු වර්ණ තවරන ලද පැතලි පෘෂ්ඨයක් පමණක් නොව ඒ හා ආබද්ධ භාවාත්මක හා දේශපාලනික ආර්ථික හා අනන්‍යතා ලක්ෂණ විදහා දක්වන සංකීර්ණ සන්දර්භයන්හි ප්‍රකාශනයක් ලෙසත්, චිත්‍ර ශිල්පියා බිතු සිතුවම් කලාව ස්වාධීන ප්‍රකාශන මාධ්‍යයක් ලෙස වර්ධනය කර ඇති ආකාරයත් හඳුනා ගැනීම පර්යේෂණයේ **අරමුණක්** වේ.

**ක්‍රමය හා ක්‍රමවේදය**


අනුරාධපුර හා පොළොන්නරු අවධියේ බිතු සිතුවම් පිහිටි ස්ථාන වෙත ප්‍රවේශ වී ස්ථානීය නිරීක්ෂණ මගින් සාකල්‍යයෙන්ම ඒවා අත්විඳ ලබාගත් දෘශ්‍ය රූ සටහන් තොරතුරු ආදිය ලබා ගැනීම සිදුවිය. ප්‍රාථමික මූලාශ්‍රය ලෙස හඳුනාගත හැකි මෙකී දාශ්‍ය රූ හා තොරතුරු පර්යේෂණය සඳහා භාවිත කළ අතරම යම් ස්ථානවල බිතු සිතුවම් වර්තමානයේ විනාශව ඇති බැවින් ඒවා ලබාගත යුත්තේ මුද්‍රිත මූලාශ්‍රයවලින්ම පමණි. මෙම දෘශ්‍යමය මූලාශ්‍රයවලට අමතරව සාහිත්‍ය මූලාශ්‍රය කිහිපයක් පර්යේෂණයේ දී භාවිත කෙරිණ. ප්‍රථම ද්විතීයික හා තෘතීයික ලෙස හඳුනාගත හැකි සාහිත්‍යමය මූලාශ්‍රය පර්යේෂණයේ දී භාවිත විය. ප්‍රථම මූලාශ්‍රය ඇසුරෙන් ද්විතීයිකව කළ සංරක්ෂණ හා නව්‍ය විශ්ලේෂණ තෘතික මූලාශ්‍රයවල කරුණුද භාවිත කෙරිණි. ක්ෂේත්‍ර ගවේෂණයේ දී ලබාගත නොහැකි වූ (විනාශ වී ඇති බිතුසිතුවම් ආදී) දත්ත හා තොරතුරු සාහිත්‍යමය මූලාශ්‍රයවලින් සපයා ගැනිණි. බිතු සිතුවම් පිහිටි ස්ථාන වෙත ප්‍රවේශ වී ස්ථානීය නිරීක්ෂණ මගින් සාකල්‍යයෙන්ම අත්විඳ ලබාගත් ඡායාරූප, දළ සටහන්, තොරතුරු ක්‍රමානුකූලව විධිමත් ක්‍රමයකට පෙළගැස්විණි. එකී දෘශ්‍ය මූලාශ්‍රවලට අමතරව බිතු සිතුවම් පිළිබඳව ප්‍රකාශිත ග්‍රන්ථ, ලේඛනවල අඩංගු ඡායාරූප, හා තොරතුරු විධිමත් ක්‍රමයක් අනුව සකස් කරමින් පර්යේෂකයාගේ දේශපාලනික මතවාදය ගොඩනැගිණි.

**විශ්ලේෂණ ක්‍රමවේදය**

පර්යේෂණයේ සිතුවම් විශ්ලේෂණය කරන ක්‍රමවේදය ලෙස නෝර්වීජියානු දාර්ශනිකයෙකු වූ **ජොහැන් ගල්තුංග්**ගේ "**ඒ.බී.සී. ත්‍රිකෝණය** (Johan Galthung - ABC Tringle)" න්‍යාය සංකථනය භාවිතා කරනු ලැබිණි. ඒ. බී. සී. ත්‍රිකෝණය න්‍යායයට අනුව කිසියම් ක්‍රියාවලියක (ගැටුමක් හෝ වෙනත්) අවසන් ප්‍රතිඵලය වනුයේ දෘශ්‍යමාන චර්යාව හෝ ක්‍රියාදාමයයි. නමුත් ගල්තුංග් පෙන්වා දෙනුයේ එකී දෘශ්‍යමය ක්‍රියාදාමය කේවල සිදුවීමක් නොවන අතර එය සඳහා දෘශ්‍යමාන (නොපෙනෙන) ඥානමය හා භාවාත්මක ක්‍රියාදාමයක් ආබද්ධ බවයි (Galthung, 2008). එබැවින් මෙම දෘශ්‍යමාන ක්‍රියාදාමයේ අදෘශ්‍යමාන ක්‍රියාවලිය අවබෝධ කරගත හැකි කදිම පරිග්‍රහක ගතික ප්‍රවේශයක් ලෙස ගල්තුංග්ගේ ඒ.බී.සී. ත්‍රිකෝණ සංකථනය හඳුනාගත හැකිය.




**චර්යාව** ලෙස හඳුනාගත හැකි (ත්‍රිකෝණයේ B ලක්ෂය) ගැටුම, ප්‍රකාශනය, විරෝධය ආදී ප්‍රකාශන විධික්‍රම නරඹන්නාට හෝ ග්‍රාහකයාට දෘශ්‍යමාන වන ක්‍රියාවලිය බවට පත් වේ. එහෙත් එම ගැටුම, විරෝධය, ප්‍රකාශනය සිදු කළ කර්තෘකයාගේ **ආකල්ප** (ත්‍රිකෝණයේ A ලක්ෂය) ඥානමය හා භාවාත්මක හැඟීම්, අවබෝධය, විශ්වාසයන් ආදියත්, **සන්දර්භය** ලෙස (ත්‍රිකෝණයේ C ලක්ෂය) දේශපාලනික, සංස්කෘතික ආර්ථිකය හා බැඳුණු ඓතිහාසික තත්ත්වයන් ආදියත් අදෘශ්‍යමාන පිළිඹිඹුවක් වන බවට පත්වන ආකාරය ගල්තුංග්ගේ ඒ.බී.සී. ත්‍රිකෝණය න්‍යායාත්මක ලෙස විස්තර කරයි. මෙම දේශපාලනික විශ්ලේෂණය බිතු සිතුවම් නැමැති නිර්මාණ කාර්යයටද ආදේශ කළ හැකිය.




ඒ අනුව කර්තෘකයාගේ ක්‍රියාකාරීත්වය වන ගැටුමක් හෝ වෙනත් ක්‍රියාවලියක් වුවද සාහිත්‍ය කෘතිය නිර්මාණය කිරීම හෝ බිතු සිතුවම් ඇඳීම නැමැති නිර්මාණාත්මක භාවමය සට්ටනයක් සඳහා වුවද, දෘශ්‍යමාන ක්‍රියාදාමය සඳහා සන්දර්භය (සමාජ ව්‍යුහයන්ගේ ස්වභාවය) හා ආකල්ප සෘජුවම දායකවන බව විශ්ලේෂණය කෙරිණි. එමගින් බිතු සිතුවම්වල සංස්කෘතික අනන්‍යතා හඳුනාගැනීම පිණිස ඒ.බී.සී. ත්‍රිකෝණ සංකථනය භාවිත විය.

චර්යාව ලෙස හඳුනාගත හැකි (ත්‍රිකෝණයේ B ලක්ෂය) වනුයේ ගැටුම ප්‍රකාශනය, විරෝධය ආදී දෘශ්‍යමාන ප්‍රකාශන විලාශයයි. පර්යේෂකයාගේ විෂයට අදාළව එය බිතු සිතුවම නමැති දෘශ්‍යමය ගැටුමේ ප්‍රකාශනයයි. එය නරඹන්නාට දෘශ්‍යමාන වන ක්‍රියාවලියයි. එහෙත් එම ක්‍රියාවලියට පරිභාහිරව අදෘශ්‍යමාන ක්‍රියාවලිද්වයක් බිතු සිතුවමට ආබද්ධ බව ඒ.බී. සී. න්‍යාය පෙන්වා දෙයි. එනම් ආකල්ප ලෙස හඳුනාගත හැකි (ත්‍රිකෝණයේ A ලක්ෂය) චිත්‍ර ශිල්පියාගේ ඥානමය භාවාත්මක හැඟීම්, අවබෝධය හා විශ්වාසය අදෘශ්‍යමානව ගම්‍යමාන කෙරෙයි. සන්දර්භය ලෙස සැලකීමේ දී (ත්‍රිකෝණයේ C ලක්ෂය) චිත්‍ර ශිල්පියාගේ දේශපාලන, ආර්ථික තත්ත්වය හා ඔහු නියෝජනය කරන සංස්කෘතික අනන්‍යතාවය පිළිබඳව විශ්ලේෂණය කෙරේ. එහෙයින් බිතු සිතුවම් පෙනී සිටින දේශපාලනික හා ශ්‍රී ලාංකේය සංස්කෘතික අනන්‍යතා ලක්ෂණ තීව්‍ර කිරීම පිණිස පරිග්‍රහක විශ්ලේෂණීය ක්‍රමවේදයක් ලෙස ඒ.බී.සී. ත්‍රිකෝණ න්‍යාය භාවිත කළ හැකිය. චර්යාව (B) ලෙස හඳුනාගත හැකි බිතු සිතුවමේ දෘශ්‍ය විලාශ භාවිත කිරීම පිණිස **සංඥාර්ථවේදී ප්‍රවේශය** (Semiotics approach) **ක්‍රමවේදය** ලෙස භාවිත කරනු ලැබේ. චිත්‍රමය භාෂාවේදී හඳුනාගත හැකි රේඛාවේ ස්වභාවය, වර්ණයේ තත්ත්වය, හැඩතලවල වෙනස්කම්, ආකෘතියෙහි හැසිරීම, ආදී ගුණාංග හා ඒවායේ දෘශ්‍යමය සංඥාර්ථ භාවිත කරමින් ඒවා උපයෝගී වන සංස්කෘතික හා සමාජීය අවකාශයන් විශ්ලේෂණයට බඳුන් කෙරිණි. බිතු සිතුවමින් නිරූපිත අදෘශ්‍යමාන ආකල්පයන් හා සන්දර්භයන් හඳුනා ගැනීමේදී බිතු සිතුවමේ දෘශ්‍යමාන අංගයන් පිළිබඳ හඳුනා ගැනීම වැදගත් වේ. බිතු සිතුවමේ නිරූපිත ශාඛ, සත්ව, නිර්ජීවී, ආභරණ, ආයුධ ඇඳුම් පැළඳුම් හා පුද්ගල චරිත ආදී

වන දෘශ්‍යමය අංග හා පුද්ගල ස්වරූපයන් මෙන්ම ඒවා චිත්‍රණය කිරීමේදී භාවිත කළ චිත්‍ර ශිල්පීය ශක්‍යතාව (වර්ණ, රේඛා, හැඩතල හා සංරචන විධික්‍රම භාවිත කිරීම) යන අංශද්වය පිළිබඳවම සලකා බැලිය යුතුය.

**විශ්ලේෂණය :**

### 1.1 බුද්ධ චරිතය

#### 1.1.1 මායා දේවිය දුටු සිහිනය

තිවංක පිළිමගේ බිතු සිතුවම් අතර මායා දේවිය දුටු සිහිනය සිතුවම නරඹන්නාගේ ආකර්ෂණය දිනාගත්තකි. මායා දේවිය මනෝසීලාවක් මත දිගා වී සිටින අතරම ඒ වටා සිටින පුද්ගල චරිත සමූහයකි. බෞද්ධ සාහිත්‍යයේ මායා දේවිය දුටු සිහිනය සාහිත්‍ය රසයෙන් අනූනව දක්වා ඇත. මායාදේවිය නිදිගත් පසු සයනය සමග සතරවරම් දෙවිවරු ඔසවාගෙන විත් හිමව්කුලයේ අනවතප්ත විල අසල තබා පසෙකට වත්ම සතරවරම් දෙවිවරුන්ගේ බිරින්දෑවරු මායා දේවිය සුවඳ පැනින් නහවා, විලවුන් ගල්වා මලින් සරසවාලූහ. ඉක්බිති ඒ අසල මනෝසීලාවක් මත තබා සෙමෙර සලන්නට වම්හ. ඈත හිමව්කුලෙන් බට සුදු හස්තියෙකු හොඬින් නෙළුමක් ගෙන මායා දේවියගේ දකුණු ඇලයෙන් කුස තුළට වැදි ආකාරය ඉතා සාහිත්‍ය රසයෙන් අනූනව **අමාවතුර** කතුවරයා විස්තර කර තිබේ (ගුරුළුගෝමීන්,2017,6පි.). මෙම සිදුවීම තිවංක පිළිමගේ බිතුසිතුවම් ශිල්පියා ස්වකීය ප්‍රස්තුතය ලෙස භාවිත කර ඇත. සිතුවමේ දකුණු පස සිටින තරුණ පෙම්වත් යුවලගේ හැඩතල හා ස්වභාවය පර්යේෂණයේ දී දෘශ්‍ය විශ්ලේෂණය සඳහා භාවිතා කරනු ලැබේ.

මෙම සිතුවමේ දෘශ්‍යමාන **චර්යාව** ලෙස (ත්‍රිකෝණයේ **බී ලක්ෂය**) හඳුනාගත හැකි වනුයේ බිතු සිතුවමේ හැඩතල සමූහයයි. ඉතා සුන්දරව නිමවන ලද තරුණ පෙම්වත් යුවලකි. ඔවුන් දෙපළගේ ශරීර ඉතා රිද්මයානුකූල ආකාරයකින් නිරූපිතය. එය චිත්‍ර ශිල්පියාගේ නිර්මාණ ශක්‍යතාව විශද කරන්නෙකි. එම රිද්මයානුකූලත්වය තීව්‍ර කිරීම පිණිස චිත්‍ර ශිල්පියා දෘශ්‍යමය උපක්‍රම (සංඥාවන්) කිහිපයක් භාවිත කර ඇත. තරුණයාගේ වමතෙහි රැඳි උපකරණය, ගෙල බැඳි මාල, වළලු හා ආභරණ පිටුපසින් වන ශාක සිතුවමේ දෘශ්‍යමය හැඟවීම් සංඥා බවට පත්වෙයි. පෙම්වත් යුවල දෙපස පොළොව මට්ටමට ලම්බාකාරව පිහිටි ඍජු ශාක යුගලක් පිහිටුවා ඇත. එම ලම්බාකාර ශාක යුගල අතරමැදි වූ මානව රූ ද්වයෙහි රිද්මය නරඹන්නාට හොඳින්ම සංජානනය කෙරෙයි. එම ඍජු ලම්බාකාර රේඛාව අසල රිද්මක රේඛාව යෙදීම මගින් ද්වයෙහි වෙනස මැනවින් තීව්‍ර කෙරෙයි. එම දෘශ්‍යමාන විලාශය චිත්‍ර ශිල්පියාගේ දෘශ්‍යමය උපක්‍රමයකි. තරුණයාගේ දිගු ලම්බ කර්ණවල රුවා ඇති කුණ්ඩාභරණ දෙපසට ගලායන අතරම බැල්ම පහළට යොමු වී ඇත. දිගු දේදුනු බඳු ඇහිබැම,දිගු අගින් වක්වූ නැහැය, රිද්මක කෙසඟ ශරීරය සිතුවමේ දෘශ්‍යමාන අංග ලෙස පෙනී සිටියි. විසිතුරු ආභරණ හා ආයිත්තමින් සැරසී සිටින අතරම වමතින් යම් උපකරණයක් දරා සිටියි. ලලනා රුවෙහි නෙතු පුරුෂ රුව වෙත යොමුව ඇත. ලම්බකර්ණ රඳවන ලද කුණ්ඩලාභරණ දිගු කේෂ කලාපය හා සුරත ආදී සියලු අංග රිද්මක ලක්ෂණ තීව්‍ර කරමින් පහළට ගලා යයි. නග්න පූර්ණ පියයුරු යුවල තුළින් ලලනා රුවෙහි ගෙලබැඳි මාලය ගලායයි. දුහුල්ව බඳවටා එතුණු සේලය කාව්‍යාත්මක ආකාරයේ ස්ත්‍රී වර්ණනාවක දෘශ්‍යමය රූප රචනයක් බඳු වෙයි. මෙකී අංග බිතු සිතුවමේ දෘශ්‍යමය අංගය බවට පත්වෙයි. එවා

ගල්තුංග්ට අනුව ත්‍රිකෝණයේ **බී ලක්ෂය** නියෝජනය කරන නරඹන්නාගේ නෙතු හා ගැටෙන ප්‍රමුඛ දෘශ්‍යමය සංඥාවන් බවට පත්වෙමින් නරඹන්නාට රසාස්වාදය සපයයි.



1.මායා සිහිනය, තිවංක පිළිමගේ , 12-13 සියවස

බිතු සිතුවමේ දෘශ්‍යමාන මෙකී අංගලක්ෂණ වලින් හඳුනාගත හැකි අදෘශ්‍යමාන ආකල්ප ( **ඒ ලක්ෂය**) හා සන්දර්භය (**සී ලක්ෂය**) පිළිබඳව හඳුනාගත හැකිය. මෙම සිතුවම තුළින් අදෘශ්‍යමානව චිත්‍ර ශිල්පියාගේ දේශපාලනය හා ඥානමය හා භාවාත්මක හැඟීම් තීව්‍ර කෙරෙයි. චිත්‍ර ශිල්පියා අත්විඳි හෝ අත්දැකිම් ලෙස හඳුනාගත් ඍංගාරාත්මක, භාවමය හැඟීම් බිතු සිතුවමේ ආලිංගන ඉරියව්ව තුළින් පිළිබිඹු කෙරෙයි. එය දෘශ්‍යමාන සිතුවම තුළ සැඟවගත් අදෘශ්‍යමාන භාවාත්මක ක්‍රියාවලියේ ප්‍රකාශනය බවට පත්වෙයි. ත්‍රිකෝණයේ **සී ලක්ෂයෙන්** තීව්‍ර කෙරෙන දේශපාලනික ආර්ථික හා සංස්කෘතික තත්වයන් සමුදායකි. පෙම්වත් යුවලගේ සේල පිළිබඳව සැලකීමේ දී ඉතා කුඩා මල් මෝස්තර රටාවන් හා ඒවා රඳවන ලද බඳපටි හා මිණි මෙවුල ආදිය රිද්මක ලෙස භාවිත කර ඇත. ඉතා දුහුල් විසිතුරු මෙන්ම ශරීරයට පහසු උසස් තත්වයේ ඇඳුම් පොලොන්නරු අවධියේ භාවිතා කළ බව මින් හඳුනාගත හැකි ය. එම ඇඳුම් උසස් කුලවත් හා රදළ ප්‍රභූන්ගේ ඇඳුම් ලෙස සැලකිය හැකි වනුයේ මායා දේවිය අසල සිටින චරිතවල ආයිත්තම් තත්කාලීන ප්‍රභූ සමාජයේ භාවිත ඇඳුම් පැළඳුම්ම වීම සාමාන්‍යයෙන් සිදුවන්නෙකි. එම ඇඳුම් ලාංකේය නිෂ්පාදනයක් ද, නොමැතිනම් ඒවා ආනයනය කළේ ද යන ප්‍රශ්නාර්ථය මතු වුවද පොළොන්නරු අවධියේ දියුණු වෙළෙඳාම (ඇඳුම් හා පැළඳුම්) පිළිබඳව හා එවක පැවති ආර්ථික තත්ත්වය පිළිබඳව කදිම නිදසුනක් සපයනු ලබයි. මෙම ඉරියව් හා රිද්මය මගින් ස්ත්‍රීය පිළිබඳව හා ස්ත්‍රීය සමකාලීනව හිමිකරගත්

නිදහස හා සමානාත්මතාවය පිළිබඳ අදහසක් ලබාදෙයි. නිදහස් පූර්ණ නග්න පියයුරුවලින් ස්ත්‍රීය විඳින ලද සංස්කෘතික හා දේශපාලනික නිදහස පිළිබඳ සංකේතියව හැඟවීමක් ඇති කරයි. ඇගේ බැල්ම සෘජුව පුරුෂයාගේ නෙතු දෙස නොබියව එල්ල කර සිටින අතරම එයින් ස්ත්‍රියගේ සෘජු සෘංගාරාත්මක රුචිකත්වය සනාථ කෙරෙයි. ඒ සඳහා ඇයගේ රිද්මක ශරීරයේ ස්වභාවය හා පුරුෂ බඳ හා ස්පර්ශවීම දෘශ්‍යමය ලෙස උපකාර කෙරෙයි. ස්ත්‍රියගේ මෙම දෘශ්‍ය විලාශය මගින් පොළොන්නරු අවධියේ දී ස්ත්‍රීය අත්විඳි සමානාත්මතාවය ඇය සතු සමාජීය ස්ථාවරභාවය පිළිබඳ මූලික අවබෝධයක් ලබාදෙයි. ඒ අයුරින්ම තත්කාලීනව ස්ත්‍රීය හිමිකරගන්නා අනන්‍යතාවය හා සමානාත්මතාවය තත්කාලීන පොළොන්නරු අවදියේ දේශපාලනික හා සංස්කෘතික අනන්‍යතාවය බවටද පත්වෙයි. ඔවුන් දෙපළ පය තබා සිටින එක සමාන පොළෝ මට්ටමටද දෘශ්‍යමය සාධකයක් ලෙස ස්ත්‍රී පුරුෂ සමානත්වය පිළිබඳ සංකේතීය අරුතක් සම්පාදනය කරයි. කුණ්ඩලාභරණ වලලු මාල ,මෙන්ම අත රැඳි උපකරණ, පය රැඳි වළලු හා බාහුවෙහි රැඳි ආභරණවල විසිතුරුකරණය මගින් අලංකාරත්වයක් තීව්‍ර කරයි. එකී විසිතුරු රටාවන් මගින් පොළොන්නරු අවධියේ විසිතුරුකරණයට ලක් වූ බිතු සිතුවම් පිළිබඳව තීව්‍ර සංඥාවක් ලබාදෙයි. එම විසිතුරුකරණය පොළොන්නරු අවදියේ කලාත්මක හා සංස්කෘතික අනන්‍යතාවය බවට පත්වෙයි. පොළොව හා මානව ශරීර අතර ආබද්ධව නිරූපණය කෙරෙනුයේ ශාකයන් ය. තුරුලතා චිත්‍ර ශිල්පියා යොදාගෙන ඇත්තේ හුදු පසුබිම පිරවීමේ පසුබිම් චිත්‍ර සාධකයක් ලෙස පමණක් නොවේ. තුරුලතා හා සොබාදහම සමග පොළොන්නරු අවධියේ පුද්ගලයා අත්විඳින ලද සහයෝගීතාවයේ දෘශ්‍යමය ප්‍රකාශනයක් ලෙසිනි. පොළොන්නරු නගර සැලසුමේ දී සොබාදහම හා ආබද්ධ වෙමින් පරිසරයට අවම හානි සිදුකරමින් හරිත නගරයක් ලෙස පැවති බවට බිතු සිතුවම දෘශ්‍ය සාධකයක් ලෙස සැලකිය හැකි බව ඒ බී සී ත්‍රිකෝණ න්‍යාය අනුව හඳුනාගත හැකි වෙයි. එකී සොබාදහමට ආබද්ධ හරිත නගර ගොඩනැගීම පොළොන්නරු යුගයේ සංස්කෘතික අනන්‍යතාවය ලෙස ද හඳුනාගත හැකි වෙයි.

එකී සාධක අනුව චිත්‍ර ශිල්පියා මායා දේවිය ප්‍රස්තුතය අදාළ සාහිත්‍ය මූලාශ්‍රයන් ලබාගත්තද සිතුවමේ නිර්මිත අවශේෂ චරිත, අංග මගින්, දෘශ්‍යමය සංඥා භාවිතයෙන් චිත්‍ර ශිල්පියා ඔහුට ආවේණික ස්වාධීන ප්‍රකාශන මාධ්‍යයක් ලෙස බිතු සිතුවම සංවර්ධනය කළ බව පැහැදිලිය.

### 1.1.2 තේමිය ජාතකය


"**පන්සිය පනස් ජාතක පොත් වහන්සේ**ගේ" ජාතක කතා අතර වන **තේමිය ජාතකය** දීර්ඝ එහෙත් ජනතාව අතර ප්‍රකට වූවකි (පන්සිය පනස් ජාතක පොත් වහන්සේ,1961,473පි.). පොළොන්නරු අවධියට අයත් විශිෂ්ඨ සාහිත්‍ය පඬිරුවනක් වූ **විද්‍යාචක්‍රවර්තීන්** විසින් විරචිත "**අමෘතාවහ නම් වූ බුත්සරණ**" හි **තේමිය ජාතකයේ** කතා සාරය හකුළවා, මනරම් සාහිත්‍ය රසයෙන් අනූනව ඉදිරිපත් කොට ඇත.

> "තේමීය කුමාරවැ අතැ පත්, පව්පුරා කරණ, රාජ්‍යෙයහි කළකිරී සොළොස්හවුරුද්දක් මුළුල්ලෙහි සිතියමැ ඇඳි රුවක් සේ නිශ්චලවැ හෙවැ, වළ ලා පියන්නට ගෙණ ගිය තන්හි තමන් නොගොළු - නොපිළු - නොබිහිරිව හඟවා මහබිනික්මන් කොට සියලු ලොවට වැඩ සැදූ බුදුන් සරණ යෙමියි බුත්සරණ යා යුතු" (විද්‍යාචක්‍රවර්තීන්,2011,19පි.)

පොළොන්නරු තිවංක පිළිමගේ බිතු සිතුවම් නිමවන ලද චිත්‍ර ශිල්පියාද තේමිය ජාතකයේ සාරය එක් බිතු පෘෂ්ඨයක් මත චිත්‍රණය කර ඇත. එම එක් දෘශ්‍යමය රූප රාමුවෙන් සමස්ත කථාන්දරය පිළිබඳ මූලික හැඟවීමක් නරඹන්නාට ලබාදෙයි. ජොහාන් ගල්තුංග්ගේ ඒ.බී.සී. ත්‍රිකෝණ න්‍යායට අනුව ත්‍රිකෝණයේ "**බී ලක්ෂයෙන්**" පෙන්නුම් කරන බිතු සිතුවම නැමැති දෘශ්‍යමය චර්යාවේ නිරූපිත අංග හා චරිත රාශියකි. ආභරණවලින් සැරසී ගත් රාජ ලීලාවෙන් යුතු තේමිය කුමරු, ලා නිල් පැහැයෙන් යුතු මිටි උයන්පල්ලා හා තේමිය කුමරු රැගෙන ආ අශ්ව රථය හා අශ්වයින් දෙපළ, වළක් කණින උයන්පල්ලා අතැති උදැල්ල නොයෙක් විවිධාකාර පත්‍රවලින් හා මල්පලවලින් යුතු ශාක ඒවා අතර වෙයි. මේවා සියල්ල දෘශ්‍යමය සංඥා ලෙස හඳුනාගත හැකිය. මෙම දෘශ්‍යමය සාධක නරඹන්නාගේ නෙතට ගැටෙන සැමට දකගත හැකි දෘශ්‍යමය හැඟවීම් සංඥාවන් ය. ගල්තුංග්ට අනුව අදෘශ්‍යමනව, ත්‍රිකෝණයේ "**ඒ ලක්ෂයෙන්** "හඟවන චිත්‍ර ශිල්පියාගේ ඥානමය හා භාවාත්මක හැඟීම් හා ත්‍රිකෝණයේ "**සී ලක්ෂයෙන්**" හඟවන චිත්‍ර ශිල්පියා නියෝජනය කරන දේශපාලනය හා ශ්‍රී ලාංකේය සංස්කෘතික අනන්‍යතාවය පිළිබඳව හඳුනාගත හැකි වනුයේ "**බී ලක්ෂයේ**" නිරූපිත දෘශ්‍ය සාධක තුළිනි.ඒ අනුව සිතුවමේ උයන්පල්ලා යනු පොළොන්නරු අවධියේ ප්‍රාග්ධනය හා බලය (රජුගේ) හිමි පන්තියේ අවශ්‍යතා සඳහා භාවිත කරන ලද පුද්ගල චරිතයකි. එම උයන්පල්ලා අතැති උදැල්ල යනු සිතුවමේ දෘශ්‍යමය සංඥාවක් පමණක් නොව පොළොන්නරු අවධියේ අනන්‍යතාවය විදහා දක්වන දෘශ්‍ය සාධකයක් බවට පත්වේ. උයන්පල්ලා අතැති උදැල්ල නිමකර ඇති ලෝහය ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කළානම් **ලෝහ නිෂ්පාදනය** පිළිබඳව ශ්‍රී ලාංකිකයින් සතු නිපුණතාව පැහැදිලි වේ. එය එවිට කලාපීය හෝ ලෝකයේ වෙනත් රටවලට ආවේණික බිතු සිතුවම්වලින් වියුක්තව ප්‍රබල ශ්‍රී ලාංකේය අනන්‍යතා ලක්ෂණයක් බවට පත්වෙයි. එකී දෘශ්‍ය සංකේතය (උදැල්ල) අදෘශ්‍යමානව ශ්‍රී ලාංකේය අනන්‍යතා ලක්ෂණ තීව්‍ර කරයි. උදැල්ල නිමකර ඇති ලෝහය වෙනත් රටකින් ආනයනය කළා නම් පොළොන්නරු අවධියේ පැවති **ජාත්‍යන්තර සබඳතා** පිළිබඳව හැඟවීමක් ලබාදෙයි. තේමීය ජාතකයේ ප්‍රමුඛ චරිතය තේමිය කුමාරයා වන බැවින් චිත්‍ර ශිල්පියා තත්කාලීනව භාවිත කළ උසස්ම ඇඳුම් හා ආයිත්තම්වලින් කුමරු සැරසූ බව පැහැදිලිය. තේමිය කුමරු හැඳ සිටින දෝතිය බඳු ඇඳුම හා රෙදි පටිවලින් ද ගැටගසන ලද බඳ පටිය,දෑත් හා ග්‍රීවාභරණ, තෝඩු කිරුළ ආදී විසිතුරු කරන ලද ආභරණ පොළොන්නරු අවධියේ විසිතුරු මැදුරු අලංකරණය හා විසිතුරු ජීවන රටාව සිහිකරමින් ශ්‍රී ලාංකේය අනන්‍ය වූ **ආභරණ නිෂ්පාදනය** හා පැළඳීම පිළිබඳ හැඟවීමක් ලබාදෙයි. තේමිය කුමරු සිතුවමේ ස්ථානගත කර තිබෙන ආකාරයද විශේෂත්වයක් හිමිකර ගනී. තේමිය කුමරුගේ මුහුණේ ඇති බැල්ම හා උදාර ලීලාව, ළයාන්විත සෝභාව නරඹන්නා තුළ චාම් හැඟීමක් ජනිත කරයි. රාජ්‍යත්වය නියෝජනය කරන තේමිය කුමරුගේ චරිත ස්වභාවය හා ස්ථානගත කිරීම මගින් පොළොන්නරු අවධියේ රදළ පාලක තන්ත්‍රයේ ස්වභාවය හා විශේෂත්වය හැඟවීම් සංඥාවක් ලෙස තීව්‍ර කරයි. පැති පෙනුමට වක් වී පහළ බලා සිටින උයන්පල්ලාගේ චරිත ස්වභාවය මගින් රාජ්‍ය පක්ෂපාතීත්වය හා එක් එක් චරිත හිමිකරගන්නා වෘර්තීන්වල අනන්‍යතා පිළිබඳව සංඥාත්මක හැඟවීමක් ලබාදෙයි. අශ්ව රථය මගින් තත්කාලීනව භාවිත කරන ලද රථවල හැඩතල හා ස්වභාවය පිළිබඳ අදහසක් දෘශ්‍ය රූ මගින් හඟවයි. එයින් ගම්‍යමාන කරන අදෘශ්‍යමාන හැඟවීම් සංඥාව වනුයේ පොළොන්නරු අවධියේ රථ වාහන භාවිතය හා ප්‍රවාහන ක්‍රියාවලිය පිළිබඳව වන දේශපාලනික කියවීමයි. අශ්වයින්ගේ සැරසිලි හා රථවල සැරසිලිවල ස්වභාවයන් මගින් ප්‍රමුඛව පෙනී සිටිය හැකි ශ්‍රී

ලාංකේය අනන්‍යතාවය පිළිබඳ ප්‍රමුඛ හැඟීමක් ලබාදෙයි. සිතුවමේ ඇති ශාක ත්‍රිත්වයේ පත්‍රවල විවිධත්වයක් දක්නට ලැබේ. පළල් විශාල පත්‍ර සහිත කෙසෙල් ශාකයට සමාන ශාඛ, විශාල කඳ සහිත (අරටුව සහිත) පත්‍ර කුඩා ශාකය හා නා මලකට සමාන මලින් බරවූ දිගු කුඩා පත්‍ර සහිත ශාකය සිතුවමේ මූලික ප්‍රස්තුතයට අදාළ නොවුණද සිතුවමේ අලංකාරය තීව්‍ර කරවයි. පොළොන්නරු අවධියේ පරිසරයේ දක්නට ලැබුණු ශාක චිත්‍ර ශිල්පියා  සිතුවම සඳහා භාවිත කර තිබෙන අතරම ඒවා තත්කාලීන අනන්‍යතා ශාක බවට පත්වෙයි.  ඝර්ම කලාපීය රටක තිබෙන ශාකවල ස්වභාවය තීව්‍ර කරන එකී පත්‍ර සහිත ශාඛ මගින් ශ්‍රී ලාංකේය අනන්‍යතා ලක්ෂණ හැඟවෙනවා පමණක් නොව වර්තමානයේ වඩා ප්‍රචලිත **හරිත නගර සංකල්පය** පොළොන්නරු අවදියේදී භාවිතයට ගත් බවටද අදහසක් ලබා ගත හැකිය.

මේ ආකාරයෙන් තිවංක පිළිමගේ බිතු සිතුවම් දෘශ්‍යමය සංඥා මගින්  චිත්‍ර ශිල්පියා **පන්සිය පනස් ජාතක පොතෙන්** හා **බුත්සරණෙන්** ලබාගත් තේමාව ස්වාධීන ප්‍රකාශන මාධ්‍යයක් ලෙස  බිතු සිතුවම සඳහා වර්ධනය කළ ආකාරයත්, එමගින් සංස්කෘතික අනන්‍යතා ලක්ෂණ පිළිබඳව  සංඥාවක් ද ලබාගත හැකිය.




2. තේමිය ජාතකය , තිවංක පිළිමගේ , 12-13 සියවස

### 1.1.3 චුල්ලපදුම ජාතකය

තිවංක පිළිමගේ බිතු සිතුවම් අතර චුල්ලපදුම ජාතකය නිරූපිත සිතුවම මගින්, ජාතක කතාවේ මුඛ්‍ය තේමාව සම්පිණ්ඩනය කොට එක් දෘශ්‍යමය පෘෂ්ඨතලයක් වෙත ගොනු කොට තිබේ.  චිත්‍ර ශිල්පියා මෙහිදී කතා ප්‍රවෘත්තියේ තෝරාගෙන ඇත්තේ චුල්ලපදුම රජුට දන්සැල් අසලදී තම පුරාණ භාර්යාව හමුවීම (පන්සිය පනස් ජාතක පොත් වහන්සේ,1961, 269පි.) නමැති අවස්ථාවයි.  එම සිදුවීම ඉතා අලංකාර ආකාරයකට ඉදිරිපත් කිරීමට චිත්‍ර ශිල්පියා සමත්ව ඇත. පැතලි පෘෂ්ඨ තලයේ පහළ දාරය පොළොව මට්ටම ලෙස සලකා සියලු චරිත

සම්පිණ්ඩනය කර ඇත. දන්සල් දෙන හා ලබන සියලු දෙනාගේ පාද එම රේඛාවෙන් ඉහළට ස්ථානගත කර තිබේ. චුල්ල පදුම රජු රාජ්‍ය, බලය හා බෝධිසත්වයින්ය යන බල පරාක්‍රමය සංකේතවත් කරනු පිණිස සාමාන්‍ය ජනී ජනයාගේ පාදස්පර්ශිත රේඛාවෙන් ඔසවා තබයි. එය නරඹන්නාගේ නෙතට ගෝචර දෘශ්‍යමය සිතුවම් සංරචනයේ චිත්‍ර ශිල්පියා භාවිත කළ ස්වාධීන දෘශ්‍යමය සංඥාවකි. ඒ.බී.සී ත්‍රිකෝණයේ "**බී ලක්ෂයේ**" නිරූපිත චර්යාත්මක ක්‍රියාවලිය වූ බිතුසිතුවම මගින්, චුල්ල පදුම රජු, වෘද්ධ කාන්තාවක් හා නගරවාසීන් කිහිපදෙනෙකු නිරූපණය කර ඇත. එම පුද්ගල චරිත අතර ජාතක කතාවේ ප්‍රමුඛ සිදුවීමට අදාළ චුල්ලපදුම රජුගේ පුරාණ භාර්යාව කොටාද කර තබාගෙන සිටින ආකාරය නිරූපණය කර ඇත. චුල්ල පදුම රජු ඉතා විසිතුරු කරන ලද ආභරණ ආයිත්තම් සේල ආදියෙන් සරසා චිත්‍රණය කර ඇත. ඒ.බී.සී ත්‍රිකෝණයේ "**ඒ**" හා "**සී**" ලක්ෂවලින් තීව්‍ර කෙරෙන අදෘශ්‍යමාන හැඟවීමක් වනුයේ ප්‍රාග්ධනය හිමි පාලකයාගේ ස්වභාවයයි. අලංකාර විසිතුරු දෙයින් ඒ බව තීව්‍ර කර ඇත. දිගු විසිතුරු කරන ලද සේල වලින් සැරසුණු චුල්ල පදුම රජුගේ ඇඳුම් ආයිත්තම් හා රටවැසියෙකු ලෙස සැලකිය හැකි වෘද්ධ පුරුෂයාගේ කෙටි ඇඳුමද සැලකූ විට පොළොන්නරු අවධියේ පැවති ඇඳුම් ආයිත්තම්වල ස්වභාවයත්, රදළ පාලක හා පාලිත ජනතාව අතර වන විභේදනයේ ස්වභාවයත් තීව්‍ර කෙරෙයි. ඇඳුම හා පැළඳුමෙහි දෘශ්‍යමාන විලාශය අදෘශ්‍යමාන වූ සමාජ පරතරය පිළිබඳව ඉඟියක් ලබාදෙයි. චුල්ල පදුම රජු හා අනෙක් වෘද්ධ පුද්ගලයාගේ ඇඳුම් පැළඳුම්වල ස්වභාවයේ විවිධත්වය පමණක් නොව චුල්ල පදුම රජු හා වෙනත් ස්ත්‍රීන් (රටවැසියන්) අතරවන ආයිත්තම්වල විවිධත්වය සැලකූ කල ස්ත්‍රී හා පුරුෂයින්ගේ ආයිත්තම් හා ඇඳුම්වල විවිධතාවයද හඳුනාගත හැකිය. එම විවිධතාවය මගින් පුරුෂ හා ස්ත්‍රී යන පුද්ගලද්වතාවයෙහි වන ආකල්පමය ඒකඟතාවය හා විචල්‍යතා පිළිබඳව හඳුනාගත හැකිය යම් ස්ත්‍රීන්ගේ උඩුකය නග්නව සිතුවම තුල නිරූපණය වන අතර එයින් පොළොන්නරු අවධියේ ස්ත්‍රීය භුක්ති විඳි ශාරීරික නිදහස හා එයින් ගම්‍යමාන චින්තනමය නිදහසත් සමාජය ස්ත්‍රීය පිළිබඳව හෙළන ආකල්පයද අදෘශ්‍යමාන හැඟවීමක් ලෙස විස්තෘත කෙරේ. තත්කාලීනව භාවිත කෙරෙන ඇඳුම් ආයිත්තම් සඳහා ශිල්පීන් භාවිත කරන ලද විලාසිතා මෙන්ම පොළොන්නරු අවධියේ දී ජනතාව අපේක්ෂා කළ විසිතුරු සංකීර්ණ නාගරීකරණය හා එක ළඟ ගැවසෙන මානව ශරීර මගින් පෘථුල නාගරීකරණය තුළ හඳුනාගත හැකි සංකීර්ණ ක්‍රියාවලින් පිළිබඳව හඳුනාගත හැකිය. සිතුවමේ දකුණු පස එක් ස්ත්‍රියක් වෘද්ධ පුද්ගලයෙකුට යම් පසුම්බියක් (මුදල් විය හැකිය) ලබාදෙයි. වෘද්ධ පුද්ගලයා එම පසුම්බිය දෑතින් ලබා ගැනීමට අපේක්ෂා කරයි. මෙම "දීම" නමැති දෘශ්‍යමය සංඥාව මගින් පොළොන්නරු අවදියේ පවතින ආර්ථික විසමතාවය හා සමාජ ස්වභාවය පිළිබඳව අදෘශ්‍යමාන හැඟවීමක් ලබාදෙයි. මෙම දෘශ්‍යමය සංකේත මගින් අදෘශ්‍යමාන පොළොන්නරු අවධියේ, ආර්ථික විසමතාව, ස්ත්‍රීය පිළිබඳ ආකල්ප, සමාජ තත්ත්වය හා ස්වෛරී චින්තනය පිළිබඳ අදෘශ්‍යමාන හැඟවීමක් ලබාදෙයි. එම කරුණු සියල්ල පොලොන්නරු අවධියේ ශ්‍රී ලාංකේය සංස්කෘතික අනන්‍යතාවය බවට පත්වෙයි. චුල්ල පදුම ජාතකය පිළිබඳ ප්‍රස්තුතය සාහිත්‍යමය ප්‍රලේඛනයකින් අනුප්‍රාණය ලද්දේ වුව සිතුවම තුළ නිරූපිත දෘශ්‍යමය සංඥා මගින් එය ස්වාධීන ප්‍රකාශන මාධ්‍යක් බවට පත්කිරීමට චිත්‍ර ශිල්පියා ක්‍රියාකර ඇත. බිතු සිතුවම්හි දෘශ්‍යමාන ආභරන, ඇඳුම් පැළඳුම්, ආයිත්තම්, ශාක හා සත්ත්ව රූ, මානව චරිත ආදී දෘශ්‍යමය හැඟවීම් සංඥා මගින් ශ්‍රී ලාංකේය සංස්කෘතික අනන්‍යතා හඳුනාගත හැකිවනවා

සේම, බිතු සිතුවම්හි දෘශ්‍යමාන නිර්මාණාත්මක ගුණාංග මගින්ද (වර්ණ, රේඛා, හැඩතල භාවිතය) ලාංකේය අනන්‍යතා විශද කරයි.




3. චුල්ලපදුම ජාතකය , තිවංක පිළිමගේ , 12-13 සියවස

**1.2 ශ්‍රී ලාංකේය අනන්‍යතා ලක්ෂණය**

බෞද්ධ සාහිත්‍ය ප්‍රස්තුතයන්හි ලලනාවන්ගේ ආභරණ, ආයිත්තම් කුණ්ඩලාභරණ පිළිබඳව බොහෝ විස්තර අන්තර්ගත වේ. ලලනා රූ වරුණ සාහිත්‍යයේදී කාව්‍යාත්මකවද වර්ණනා කෙරේ. එහෙත් චිත්‍ර ශිල්පියා ස්ත්‍රීය පින්තාරු කිරීමේදී ස්වාධීන ප්‍රකාශන මාධ්‍යයක් ලෙස වර්ධනය කර ඇත. ක්‍රි.ව. 5 වන සියවසට පමණ අයත් සීගිරි බිතු සිතුවම් (Bandaranayake,2006 , p.26) නිර්මාණයේ දී චිත්‍ර ශිල්පියා භාවිත කළ ලලනා රූවල ස්වභාවය හා දෘශ්‍ය විලාශ, ඇඟලුු හා පැළඳුම්, උපකරණ සඳහා තත්කාලීන සමාජයේ අත්විඳි දේවල්ම භාවිත කළ බව පැහැදිලිය. සීගිරි ලලනා රූවල කුණ්ඩලාභරණ පැළඳීම හා තිවංක පිළිම ගේ බිතු සිතුවම්වල කුණ්ඩලාභරණ පැළඳීම පර්යේෂණයේ දී සලකා බැලිය හැකි ය. වර්තමානයේ ශ්‍රී ලාංකේය සමාජයේ කුණ්ඩලාභරණය කන් පෙත්ත අග එල්ලා වැටෙන ආකාරයට පැළඳුවද, සීගිරි සිතුවම්වල හා තිවංක පිළිමගේ බිතුසිතුවම්වල දිගු කන්පෙත්ත තුළ රඳවන කුණ්ඩලාභරණ පැළඳි ලලනාවන් චිත්‍රණය කර ඇත. යම් විට මෙය තත්කාලීනව පැවති කුණ්ඩලාභරණ පැළඳීමේ විලාශය විය හැකිය. මෙලෙස කුණ්ඩලාභරණ පැළඳීමේ විලාශය පැවතියේ රදළ ස්ත්‍රීන් අතර පමණක් නම් අනුරාධපුර හා පොළොන්නරු යුගයේ පැවති පංති විසමතාව පිළිබඳ හැඟවීමක් ලබාදෙයි. ඒ.බී.සී.ත්‍රිකෝණයේ "**බී ලක්ෂයේ** " චර්යාව ලෙස හඳුනාගත හැකි දෘශ්‍යමාන සිතුවම් වන කුණ්ඩලාභරණ පැළඳීමේ විලාසය අදෘශ්‍යමාන ත්‍රිකෝණයේ "**ඒ ලක්ෂයේ** " ආකල්ප හා "**සී ලක්ෂයේ**" සන්දර්භය ලෙස ශ්‍රී ලාංකේය අනන්‍යතා ලක්ෂණ තීව්‍ර කරයි. ඒ අනුව අනුරාධපුර හා පොළොන්නරු යුගයේ ස්ත්‍රීන් කුණ්ඩලාභරණ පැළඳීම වර්තමාන ශ්‍රී ලාංකේය ස්ත්‍රීන්ගේ කුණ්ඩලාභරණ පැළඳීමට වඩා වෙන්

වූ අනන්‍යතා රැක ගනිමින් ඉපැරණි ශ්‍රී ලාංකේය අනන්‍යතා ලක්ෂණයක් බවට පත්වෙයි. එය කලාපීය වශයෙන් ශ්‍රී ලාංකේය සලකුණක් බවට හැඟවෙන දෘශ්‍ය සංඥාවක් බවට පත්වෙයි.



4. සීගිරි බිතු සිතුවම් ,5 වන සියවස : තිවංක පිළිමගේ , 12-13 සියවස

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිහින්තලේ පිහිටා ඇති වසම්මලේ බිතු සිතුවම්හි ලලනා රුවක් හඳුනාගත හැකි ය. නුහුරු ඉරියව්වකින් වාඩි වී සිටින ලලනාව සුරතට බර දී වමත නිදහස් කොට ඉහළට ඔසවාගෙන සිටී. ඒ.බී.සී. ත්‍රිකෝණයේ **බී ලක්ෂය** හඟවන චර්යාව පිළිබඳ සැලකීමේ දී දෘශ්‍යමාන ස්වරූපය ලෙස මූලික කාරණා කිහිපයක් හඳුනා ගත හැකිය. ඉතා ලා පැහැති රඹ පැහැ සායම මත තද රතු දුඹුරු පැහැයෙන් රේඛා ගොඩනගා ඇත. අත්ල පියයුරු මඬල හා යටිකය ඇඳුමෙහි තද පැහය අතුරා ඉක්බිති වර්ණ රේඛා ගොඩනගා ඇත. උඩුකය නග්න ලලනා රුවෙහි රේඛා භාවිතය ඉතා නිදහස් හා වේගවත් බවකින් යුක්ත ය. එම වේගවත් නිදහස් බව මගින් ශිල්පීය ශබ්‍යතාවය තීව්‍ර කෙරෙයි.

වසම්මලේ එම ලලනා රුව සමග, ක්‍රි.ව. 5 වන සියවසට පමණ අයත් ඉන්දියාවේ අජන්තා ලෙන් බිතු සිතුවම් සමූහයේ වසම්මලේ ලලනාරුවෙහි හිඳි ඉරියව්වට සමාන ලක්ෂණ විදහා දක්වන බිතු සිතුවමක් සමග සන්සන්දනාත්මකව දෘශ්‍යමය විශ්ලේෂණයක් සිදුකල හැකි ය. අජන්තා සිතුවමින් නිරූපණය වනුයේ පෙම්වත් යුවලකගේ ආලිංගන ඉරියව්වකි. එහෙත් චිත්‍ර ශිල්පියා භාවිත කළ චිත්‍රමය ශිල්පක්‍රම වෙන්වෙන්ව හඳුනාගත හැකිය. ඒ.බී.සී. ත්‍රිකෝණයේ චර්යාව හඟවන (බී ලක්ෂයේ) දෘශ්‍යමාන ස්වරූපය විස්තර කළ හැකිය. අජන්තා ලලනා රුවෙහි ඡවි වර්ණය නීල පැහැයට හුරු පලා පැහැයකින් යුක්තය. උඩුකය නග්න වීම හා ඉරියව්ව දෑත්වල පිහිටීම බොහෝ සමාන ලක්ෂණ විදහා දක්වයි. දෘශ්‍යමය ලෙස සැලකීමේ දී වසම්මලේ ලලනා රුවෙහි රේඛාව ඉතා නිදහස් නිරයාසයෙන් ගලාගිය ස්වභාවයක් වේගවත් බවක් පුහුණුවත් හොඳින් තීව්‍ර කෙරේ. චිත්‍ර ශිල්පියා අතේ හෝ ඉණ, බඳ, පියයුරුවල වක්‍ර ස්වභාවය ආදියෙහි මූලික හැඩ පිළිබඳව සිතමින් ඉතා නිදහස් රේඛාකරණයකට අවතීර්ණ වූවා

විනා ඉතා ආයාසයෙන් කළ රේඛා නොවන බව පැහැදිලිය. එම නිදහස් රේඛාකරණය නැමැති දෘශ්‍යමය සංඥාවෙහි (චර්යාත්මක ක්‍රියාවලියේ) අදෘශ්‍යමාන චිත්‍ර ශිල්පියාගේ ඥානමය හා භාවාත්මක ක්‍රියාවලිය පිළිබඳව හඳුනාගත හැකිය. නිදහස්, වේගවත් රේඛාකරණය මගින් චිත්‍ර ශිල්පියාගේ චින්තනමය, ආධ්‍යාත්මික නිදහස, චිත්‍ර ශිල්පියා භුක්ති විඳි නිදහස් මානසිකත්වය, ශාස්ත්‍රීය පුහුණුව හා සමස්තයක් ලෙස ලෝකය හෝ යම් දෙයක් දෙස දැකීමේ ස්වභාවය හඳුනාගත හැකිය. අනුරාධපුර අවදියේ බිතු සිතුවම් ශිල්පියා යම් දෙයක් පිළිබඳව හඳුනාගන්නට පෙළඹී ඇත්තේ සංකථනයක් ( ආනුෂංගිකව) ලෙස නොව පරමාර්ථ ක්‍රියාවලියක් ලෙස ය. මේ සඳහා චිත්‍ර ශිල්පියාට සෘජු බලපෑම ලැබී ඇත්තේ මුල් බුදු සමයේ ආභාසයෙනි. චිත්‍ර ශිල්පියා අත්ල ඇඟිලි නියපොතු වැලමිට, උදරය, ගෙල, නැබ ආදී ලලනා රුවේ ආනුෂංගික අංග ලෙස, ඒවා එක් එක් අංග ලෙස වෙන් වෙන්ව හඳුනාගන්නවා වෙනුවට සමස්තයක් ලෙස ලලනා දේහයක් යන ප්‍රමුඛ සන්දර්භය පිළිබඳව අවධානය යොමු කර තිබේ. ලලනා රුවෙහි යටිකය ඇඳුමෙහි තද රඹ පැහැය මත දුඹුරු රත් පැහැයෙන් රේඛා ගොඩනගා තිබේ. එම රේඛා ඉතා සියුම්ව කළ මෝස්තරාත්මක රටාවක් නොවී වේගවත් රේඛාකරණයකින් සමස්ත නිමාවේ දී මෝස්තරාත්මක ඇඳුමක් යන හැඟීම පමණක් නරඹන්නාට සංජානනය කරවයි. එමගින් සමස්තය දෙස දැකීමට චිත්‍ර ශිල්පියා සිතුවම මගින් යෝජනා කරයි. බෞද්ධයාට ද්‍රව්‍ය, වස්තූන්, මම, ලෝකය ලෙස ලෝකය දැකීමට වඩා සමස්තයක් ලෙස සනාතන ක්‍රියාවලියක ප්‍රතිඵලයක් (උප්පාද - භංග) ලෙස ලෝකය දැකීම මගින් අත්හැරීම පහසු බවට වන මූලික ආධ්‍යාත්මික හැඟීම චිත්‍රශිල්පියා අදෘශ්‍යමාන ලෙස බිතු සිතුවම මගින් සංජානනය කරවයි. එම වේගවත් බව, නිර්මාණශීලී බව හා නිදහස් බව, පුහුණුවේ ප්‍රකාශනශීලී බව චිත්‍ර ශිල්පියාගේ පෞද්ගලික අනන්‍යතාව ශිල්පියා නියෝජනය කරන කලා ගුරුකුලයේ හෝ කණ්ඩායමේ අනන්‍යතාවය බවට පත්වීමන් එය ලාංකේය අනන්‍යතා ලක්ෂණයක් බවට පත්වෙයි. කලාත්මක කාර්යයන් යනු යම් රටක අනන්‍යතාවය විදහා දක්වන කැඩපතක් බඳුවන අතරම වසම්මලේ බිතු සිතුවම් යනු ශ්‍රී ලාංකේය සංස්කෘතික අනන්‍යතාව විදහා දක්වන ප්‍රතිබිම්භයක් බඳු වෙයි.

අජන්තා බිතු සිතුවමේ ලලනා රුව හා සන්සන්දනාත්මක විග්‍රහයේ දී වසම්මලේ බිතුසිතුවම්හි ලාංකේය අනන්‍යතාව හොඳින්ම හඳුනාගත හැකි වෙයි. අජන්තා චිත්‍ර ශිල්පියා ලලනා රුව චිත්‍රණය කිරීමේ දී ඉතා සියුම්ව, වෙහෙසකාරීව ආයාසයෙන් යුතුව එක් රේඛාවක් නඩත්තු කරමින් මූලික හැඩය ගොඩනැගීමට උත්සාහ දරයි. එම රේඛාවේ නිදහස වේගවත් බව වෙනුවට හඳුනාගත හැකි වනුයේ ඉතා වෙහෙසකරව ආයාසයෙන් ගොඩනගන ලද නිර්මාණ ක්‍රියාවලියකි. ලලනා රුවේ වට රේඛා ගොඩනැගීම ඉතා සියුම් එක රේඛාවකින්ම පමණක් නිමාකර තිබෙන අතරම වළලු අත්ලෙහි වන ආභරණ, මිණි මෙවුල හා ගෙල බැඳි පබලු හා ඇට මාල ඉතා සියුම්ව වෙහෙසකරව එක් එක් පබලුව බැගින් සියුම්ව, වෙහෙසකාරීව හා කැපවීමෙන් චිත්‍රණය කර ඇත. හිස රැඳි මල් සේලවල මෝස්තර රටාවන්ද ඉතා සියුම්ව නිමවා ඇති අතරම මෙම සියුම් බව අජන්තා චිත්‍ර ශිල්පියාගේ අනන්‍යතාවය බවට පත්ව ඇත. ඒ.බී.සී. ත්‍රිකෝණයේ අදෘශ්‍යමාන ඒ. හා සී. ලක්ෂවලින් තීව්‍ර කෙරෙන ආකල්ප හා සන්දර්භය පිළිබඳව සැලකීමේ දී චිත්‍ර ශිල්පියාට ලැබුණු නිදහස සීමා සහිත බව හඳුනාගත හැකිය. එම සීමා සහිත බව තුළ සියුම්ව හා වෙහෙසකර බව ගැබ් වී තිබෙන අතර එය ඉන්දීය අජන්තා චිත්‍ර ශිල්පියාගේ අනුභූතීන්වල ප්‍රකාශනයක් බවට

පත්වෙයි. එම අජන්තා බිතු සිතුවම්හි දෘශ්‍ය විලාශ හා ලාංකේය වසම්මලේ බිතු සිතුවම්හි දෘශ්‍ය විලාශවල අංග සන්සන්දනයේ දී ශ්‍රී ලාංකේය බිතු සිතුවම්හි අනන්‍යතාවය මනාව වෙන්ව හඳුනාගත හැකි වෙයි.

වසම්මලේ බිතු සිතුවම් අතර සුරතට බර යොදා නුහුරු ඉරියව්වකින් වාඩි වී සිටින ලලනා රූ ඉරියව්වෙහි (චාර්ල්ස්,2000,34පි.) දකුණු අතට බර යොදා වමත නිදහස් කර ඉහලට ඔසවා ගෙන සිටින ආකාරය දෘශ්‍යමාන වෙයි. උඩුකය නග්න රුවෙහි හිස කොටස මැකී ගොසිනි. ලා පැහැයක් මුල් වරට බදාම ස්ථරය මත අතුරා ඒ මත ඉතා නිදහස් රේඛාකරණයට අවතීර්ණ වී තිබේ. අත්ල පියයුරු යුගල හා යටිකය ඇඳුම මදක් අඳුරු පැහැයෙන් පෙන්වා ඇත. මෙම අංග ලක්ෂණ සිතුවමේ දෘශ්‍යමය අංග ලක්ෂණ බවට පත්වන අතර ඒ.බී.සී. ත්‍රිකෝණයේ "බී" ලක්ෂයෙන් පෙන්නුම් කරන චර්යාව නම් වූ ක්‍රියාවලිය ඒ ආකාරයෙන් දෘශ්‍ය රූ ලෙස පෙනී සිටියි. වර්ණ, රේඛා, හැඩතල හා දෘශ්‍ය රූ ස්ථානගතකිරීම අනුව වෙන් වෙන් වූ අනන්‍යතා ලක්ෂණ විද්‍යාමාන කරයි. ඒ අතර ලලනා රුවෙහි බර යෙදීම වෙන්ව සැලකිය හැකිය. වසම්මලේ සිතුවම් ලලනා රුවෙහි බර වැටීම සුරතින් ගලාවිත් ලම්බාකාර පොළොව මතට මුදා හරියි. ඉහළ සිට පහළට ගලා එන බර වැටීමේ රේඛාව බාහුව දිගේ ගලාවිත් වැලමිට මැදින් අත්ල කරා දිවෙයි. අත්ලේදී බර වැටීම පැතලි පෘෂ්ඨය මතට (පොළොව) පතුරුවා හරියි. ශරීරයේ සම්පූර්ණ බර වැටී ඇත්තේ සුරත් අල්ලට සහ දකුණු කලවට හා ගාත්‍රාවේ කොටසකටය. එහිදී බර වැටීමේ ප්‍රමුඛතාව අත්ලට ලැබේ. වසම්මලේ සිතුවමේ බර වැටීම අජන්තා ලෙන් සිතුවමක මේ ආකාරයෙන්ම නුහුරු ආලිංගන ඉරියව්වකින් වාඩි වී සිටින ලලනාරුවක බරවැටීමේ ස්වභාවය සමග සන්සන්දනාත්මක විග්‍රහයට එළැඹිය හැකිය. සිතුවම් ද්විත්වයෙහිම සුරතට බර යොදා ඇත. එහෙත් බර යෙදීම ඉහළ සිට පහළට (පොළොව දෙසට) ගලා ආවද බලය මුදා හැරීමේ විවිධත්වයක් දක්නට ලැබේ. වසම්මලේ චිත්‍ර ශිල්පියා බර යෙදුනු සුරතෙහි අත්ල ශරීරය දෙසට (අභ්‍යයන්තරයට) හරවාගෙන තිබෙන ආකාරයට නිරූපණය කර ඇත.5 සියවසට පමණ අයත් ඉසුරුමුණි කැටයම්වලද මෙම බර ශරීරය දෙසට (අභ්‍යයන්තරයට) ගලායාම දක්නට ලැබේ. අජන්තා සිතුවමේ නිර්මිත ලලනාරුවෙහි බරවැටී ඇති සුරත ශරීරයෙන් පිටතට (අවකාශයට) හරවා ගෙන සිටින ආකාරයට නිරූපිතය. මෙහිදී චිත්‍ර ශිල්පීන් දෙපළ භාවිත කර ඇත්තේ චිත්‍ර ශිල්පක්‍රම ද්වයකි. බර අභ්‍යන්තරය යෙදීම හා බර බාහිරට මුදා හැරීම යන චිත්‍රමය ශිල්පක්‍රමයයි. සිතුවමේ ද්වයෙහි දෘශ්‍යමය ස්වරූපය (බී ලක්ෂය - චර්යාව) ඒ ආකාරයෙන් වන අතර අදෘශ්‍යමාන ක්‍රියාවලියේ දී ඉන්දියානු චිත්‍ර ශිල්පියා ප්‍රකාශනමය මුදාහැරීම බාහිරයට යොමු කරන අතර ශ්‍රී ලාංකේය චිත්‍ර ශිල්පියා ස්වකීය මුදාහැරීම අභ්‍යයන්තරය වෙත යොමුකරයි. ඒ අනුව බිතු සිතුවමේ දෘශ්‍යමය විලාශය මගින්, ශ්‍රී ලාංකිකයන් ස්වකීය ශක්තීන්, අවබෝධයන් හා ඥාන ගවේෂණයන් අභ්‍යයන්තරික වශයෙන් පුද්ගලත්වය වෙතම පරාරෝපණය කර ගත් ආකාරය තීව්‍ර කරයි. එබැවින් වසම්මලේ බිතු සිතුවම් වල දෘශයමය හැඟවීම් සංඥාවන් විලාශයන් අදෘශ්‍යමානව ශ්‍රී ලාංකේය සංස්කෘතික අනන්‍යතාවයක් බවට පත්වෙයි.




5. ලලනාරුවෙහි බර ශරීරයෙන් පිටතට (අවකාශයට) ගලායාම, අජන්තා බිතු සිතුවම් ,5 වන සියවස ,ඉංදියාව ; ලලනාරුවෙහි බර ශරීරය දෙසට (අභ්‍යයන්තරයට)ගලායාම, වසම්මලේ බිතු සිතුවම්, 5-6 සියවස (?) තිවංක පිළිමගේ , ඉසුරුමුණි කැටයම් , 5 සියවස

## 1.3 රිද්මයානුකූලත්වය

මූර්ති කැටයම්වලදී මෙන්ම බිතු සිතුවම්වලදී ද මානව රුව හා වෙනත් ද්‍රව්‍යයන් හා හැඩතලවල රිද්මයානුකූල බවක් ගම්‍යවන පරිදි නිර්මාණය කර තිබේ. අනුරාධපුර යුගයේ මූර්ති කැටයම්වල මෙන්ම බිතු සිතුවම්වල ද මානව දේහයේ ඍජු බව ප්‍රබලත්වය, බර වැටීම ආදිය පිළිබඳව වැඩි වශයෙන් අවදානය යොමු කළ බව හඳුනාගත හැකිය. ස්ත්‍රී දේහයේ රිද්මය, ගලායාම, ලාලිත්‍යය පිළිබඳවද මූලික අවධානය ලබා දුන් බව පැහැදිලිය. ගොනාගොල්ල බිතු සිතුවම්වල වන්දනාමාන ඉරියව්වකින් යුතු ලලනා දේහය ඉහළ සිට පහළට ගලායන දිගු ලියවැලක බඳු රිද්මක රේඛා විලාශයක් දක්නට ලැබේ. ඉහළ සිට පහළට ගලායන මෙම රිද්මය නෙළුම් දඬුවේ ගලායන රිද්මයට බොහෝ සෙයින් සමාන වේ. නෙළුම් දඬුවේ මෙම රිද්මය සොබාදහමේ නිත්‍ය ගලායාමේ රිද්මයයි. මෙම සොබාදහමේ රිද්මය හොඳින් හඳුනාගත් චිත්‍ර මූර්ති ශිල්පීන් කැටයම් මූර්ති හා සිතුවම් සඳහා එම රිද්මය භාවිත කළ බව හඳුනාගත හැකි ය. දකුණුපසට බර කරනලද හිසින් ආරම්භ වී ගෙල හා පියොවුරු යුවල මධ්‍යයෙන් රිද්මක රේඛාව ගලාගොස් ඉඟටියේ රිද්මය සමඟ පහළට ගලායයි. එය සරල රිද්මක ගලායාමකි. ආනුෂංගික හැඩතල මූලික රිද්මයට අනුගත කොටගෙන ඇත. කොටියාගල, තිවංක පිළිමගෙය, අභයගිරිය, ගොනාගොල්ල, බිතු සිතුවම් අතර වන ලලනා රුවල ගලායන ආකාරයෙහි රිද්මක රේඛාවක සෝභාව හොඳින්ම හඳුනාගත හැකිය. වක්‍ර රිද්මක ගලායාම එක්වීම ඉතා පරිණත ශිල්පීය ලක්ෂණ විශද කරයි. ලලනා රුවල මාලයේ , ඉඟටියේ ගලායාම හා ඇඟිලිවල ගලායාම ඉතා රිද්මයානුකූල ලක්ෂණ තීව්‍ර කරයි. බිතු සිතුවම් ශිල්පියාගේ පරිණතභාවය අනුව හඳුනා ගැනෙන, ශිල්පියාගේ ප්‍රතිභාවිත්මක කාර්යයක් වූ රිද්මයානුකූලභාවය සිතුවමේ අංග තුළට අන්තර්ගත කිරීමෙන් එකී දෘශ්‍ය සංඥා අන්තර්ගත කිරීමට වෙසෙසින්ම උපකාර

වෙයි.මෙලෙස ස්වභාවික නෙළුම් දඬුවේ රිද්මයට සමාන ලෙස ලලනා රූ රිද්මය ගොඩනැගීමෙන් ශ්‍රී ලාංකේය  චිත්‍ර ශිල්පියා විශද කළ නිර්මාණ ශක්‍යතාව විශද කෙරෙනවා පමණක් නොව එය ශ්‍රී ලාංකේය සංස්කෘතික අනන්‍යතාවය බවටද පත්වෙයි.




6. නෙළුම් දඬුවේ රිද්මයට සමාන ලලනා රූ  රිද්මය, තිවංක පිළිමගෙය, අභයගිරිය, ගොනාගොල්ල, ශෛලමය කැටයම් හා බදාම මත සායම, 5-13 සියවස.

### 1.4 ස්වාභාවිකත්වය හා නිර්මාණශීලීබව

සොබාදහමේ දක්නට ලැබෙන ස්වාභාවික දේවල් ,සොබාදහමේ දක්නට නොලැබෙන දේවල් , ඉන්ද්‍රිය ගෝචර නොවන දේවල් , සාහිත්‍යයේ දී කියැවෙන චරිත , ස්ථාන, සිදුවීම් ආදී සියලු දේ නිමැවීමේ දී ඒවා නිසගයෙන් ම නිර්මාණශීලී ස්වභාවයකට පත්වේ. අනුරාධපුර හා පොළොන්නරු යුගයේ බිතු සිතුවම් ශිල්පියා ඉතා දක්ෂ අන්දමින් නිර්මාණකරණය වෙත ප්‍රවේශ වූ ආකාරය හඳුනාගත හැකි ය. එකී නිර්මාණශීලීත්වය යම් විටෙක ශ්‍රී ලාංකේය අනන්‍යතාවය බවට ද පත්වේ.

වසම්මලේ හා ගිරා පොකුණු හෙල යන ස්ථාන ද්වයෙහිම නාගරූව නිර්මාණය කර ඇත. නාග යන අදහසින් විවිධ කන්ඩායම් හමුවන බව සාහිතයයේ දී ජනශ්‍රැතිවල හා බෞද්ධ සාහිත්‍යයේ දී විස්තර කෙරේ. නාග ගෝත්‍රිකයන් , පරිසරයේ වෙසෙන නාගයා, නාග දිව්‍යමය බල සහිත කණ්ඩායම, නාගරාජයින් ආදී විවිධ කණ්ඩායම් පිළිබඳ ව විස්තර කෙරේ. මොවුන් කිසිවකුත් මිහිපිට අපගේ නෙතට ගෝචර නොවේ. එහෙත් අපට පරිසරයේ දී හමු වනුයේ නාග යන සර්ප විශේෂ පමණි.  එබැවින් චිත්‍ර ශිල්පියා කුමන නාග යන කණ්ඩායමක් නිමැවුවද සර්පයාගේ හැඩයට මූලිකත්වය ලබා දී තිබේ. ස්වාභාවික නාගයෙකුගේ මූලික හැඩය හොඳින් නිරීක්ෂණය කර නාග චරිතය ගොඩනගා තිබේ. නාගයාගේ පෙණය හොඳින් අධ්‍යයනය කර ඇස හොම්බ කෙළවර හා විෂ දළය මුඛයෙන් එළියට විදා සිටින ආකාරය ස්වාභාවික නාගයාගේ ආකාරයෙන්ම ගොඩනගා තිබෙන අතර පෙනය මධ්‍යයෙන්  සමාන වර්ණයන්ගෙන් යුතු වෘත්ත රටාවක් ඉහළ සිට පහළට දක්වමින් කොරපොතු සංකේතයක්  ලෙස දක්වා තිබේ. පෙණයේ ඇති කොරපොතු හැඩය හැඟවීම පිණිස පෙනයේ නැම්ම සහිත දාරය හඟවමින් එක

ළඟ පුන පුනා සමානව ගලායන තිත් ගොඩනගා තිබේ. එයින් පෙනයේ මූලික හැඩය තීව්‍ර කර තිබේ. නාගයාගේ ප්‍රබලත්වය තීව්‍ර කෙරෙනුයේ දීප්තිමත් ඇස හා ඒ අසලින්ම යොදා ඇති දිගු විෂ දළයෙනි. ස්වාභාවික නාගයාට ඇත්තේ එක් පෙණයක් වුව ද නාගරාජයා යන අරුත ගම්‍යවීම පිණිස , නාගරාජයා සතු ප්‍රබලත්වය , බලය අභිමානය හැඟවීම පිණිස පෙන රාශියක් ගොඩනගා තිබේ. පෙණ රාශියක් තිබුණ ද එකම නාගයෙක් ලෙස සිලින්ඩරාකාර එක් කඳකින් යුතුව නිරූපිතය. එක් ශරීරයකින් හිස් රාශියක් මතු වීම ප්‍රබල බලපරාක්‍රමයක් ද සංකේතවත් කරයි. පෙණය ගොඩ නැගීමේ දී ගිරා පොකුණු හෙල චිත්‍ර ශිල්පියා හා වසම්මලේ චිත්‍ර ශිල්පීන්ගේ මූලික වෙනස්කම් හඳුනාගත හැකි ය. ගිරා පොකුණු හෙල චිත්‍ර ශිල්පියා පෙනය ගොඩ නැගීමේ දී තිත වැඩිපුර ප්‍රමාණයක් භාවිත කර තිබේ. එහෙත් මූලික හැඩය ගොඩ නැගීමේ හා නිර්මාණශීලී ස්වභාවයේ සමානතා හඳුනාගත හැකි ය. නාගයාගේ සිලින්ඩරාකාර කඳේ හැඩය ගොඩ නැගීමේ දී එක් එක් දාරවල ස්වභාවය සහ වක්‍ර ස්වභාවයත් නැමී වක්‍ර වන ස්වභාවයන් පිළිබඳව මූලික අවදානය යොමු කර තිබෙන අතර තිත ක්‍රමානුකූලව යෙදීම හා ලා සහ අඳුරු පැහැය භාවිතා කිරීම මගින් මතු කර තිබේ. ස්වාභාවික නාගයාගේ දැකගතහැකි කොරපොතු ගොඩ නැගීම කෙරෙහි අවධානය යොමු කර නැත. එබැවින් චිත්‍ර ශිල්පියාට අවශ්‍ය වී තිබෙනුයේ ස්වාභාවික නාගයා ඒ අයුරින්ම ප්‍රතිනිර්මාණය කිරීම නොව ස්වාභාවිකත්වයේ අනුසාරයෙන් නිර්මාණශීලී නාගයෙකු නිර්මාණය කිරීමට ය. මුචලින්ද, නන්දෝපනන්ද වැනි නාගරාජයින් දිව්‍යමය තත්ත්වයන් ළඟාකරගෙන සිටින බැවින් ස්වාභාවිකත්වය ඒ අයුරින්ම ගොඩ නැගීම ඉවත හරිමින් නිර්මාණාත්මක කාර්යයේ දී දිව්‍යමය තත්ත්වයන් ළඟාකරගැනීමට චිත්‍ර ශිල්පියා උනන්දු වෙයි. පෙණ රාශියකින් තේජස, බල පරාක්‍රමය හා නාගරාජ යන සංකල්පය ද , ස්වාභාවිකත්වය ඉක්ම වූ නිර්මාණාත්මක අංග ලක්ෂණවලින් දේවත්වය පිළිබඳ අදහසක් ද , නාගයාගේ ස්වභාවික අංගවලින් නාගයා යන හැඟවීම් සංඥාර්ථයද ලබාදෙමින් චිත්‍ර ශිල්පියා නාග සංකල්පය පිළිබඳව විශිෂ්ට අදහසින් නරඹන්නාට ලබා දෙයි. ඒ සඳහා චිත්‍ර ශිල්පියා භාවිතා කල දෘශ්‍යමය උපක්‍රමය වූයේ ස්වාභාවිකත්වයේ ආභාසය ලබා ගනිමින් නිර්මාණශීලී සිතුවමක් වෙත ප්‍රවේශ වීමයි.



7. නාගරූව ස්වාභාවිකත්වයේ ආභාසය ලබා ගනිමින් නිර්මාණශීලීව ගොඩනගා ඇති අයුරු , වසම්මලේ, බදාම මත සායම, 5 සියවස.

**සමාලෝචනය**

මහින්දාගමනයෙන් ඉක්බිතිව බුදුදහමේ ආභාසයෙන් නවීකරණය වූ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ රාජ්‍ය අනුග්‍රහය ලද ප්‍රමුඛ අංගයන් ලෙස බෞද්ධ සාහිත්‍ය හා බිතු සිතුවම් කලාව ස්ථාපිත විය. බිතු සිතුවම්හි නිරූපණය කෙරෙන සංකේත ,හැඩතල, අංග, ද්‍රව්‍ය, මෙවලම්, සත්ත්ව හා මානව රූ ආදී දෘශ්‍යමය හැඟවීම් සංඥා මගින් විවිධ අරුත් සම්පාදනය කරයි. දාර්ශනික ජොහෑන් ගල්තුංග්ගේ " ඒ.බී.සී. ත්‍රිකෝණය " සංකථනය අනුව ත්‍රිකෝණයේ " බී " ලක්ෂයෙන් දෘශ්‍යමාන වනුයේ චර්යාව ලෙස හඳුනාගත හැකි බිතු සිතුවමේ දෘශ්‍යමය රූපක සමූහයයි. ඒ අනුව ; තිවංකගේ බිතු සිතුවම් අතර වන මායා දේවිය දුටු සිහිනය වැනි බුද්ධ චරිතය , තේමිය , චුල්ලපදුම වැනි ජාතක කතා , සීගිරි , වසම්මලේ හා තිවංක පිළිම ගේ ඉන්දියානු අජන්තා සිතුවම්වල දෘශ්‍යමය සාධක තීව්‍ර කරන අදෘශ්‍යමාන සංකල්ප, ලාංකේය අනන්‍යතාවය හා චිත්‍ර ශිල්පියා බෞද්ධ සාහිත්‍යයෙන් අනුප්‍රාණය ලද ප්‍රස්තුත භාවිත කළද ස්වාධීන ප්‍රකාශන මාධ්‍යයක් ලෙස බිතු සිතුවම වර්ධනය කර ඇති ආකාරය හඳුනාගත හැකි ය. ඒ අනුව බිතුසිතුවම්වල එකී දෘශ්‍ය සාධක මගින් පොළොන්නරු හා අනුරාධපුර අවධියේ ශ්‍රී ලාංකේය චිත්‍ර ශිල්පියා විශද කළ නිර්මාණ ශබ්‍යතාව; පුද්ගල භෞතික ස්වරූපය, පරිසර හිතකාමී හරිත නගර සංකල්පය, ප්‍රාග්ධනය හිමි හා පාලක පන්තියේ හා පාලිත පංතියේ මෙන්ම පීඩිත පංතිවල ස්වභාවය (පංති පරතරය), මෙන්ම සමාජ විසමතාවය පිළිබඳව දේශපාලනික කියැවීමක් සිදු කළ හැකිය. එකී දේශපාලනික විශ්ලේෂණය පැරණි ශ්‍රී ලාංකේය සමාජය ලබාගත් සංස්කෘතික අනන්‍යතාවය බවට ද පත්වෙයි.

**නිගමනය**

අනුරාධපුර හා පොළොන්නරු අවධියේ බිතු සිතුවම්හි දෘශ්‍යමාන රූප සංඥාවන් මගින් , සිතුවමෙහි අදෘශ්‍යමානව චිත්‍ර ශිල්පියාගේ මතවාදය (ආකල්ප හා සන්දර්භය) නිරූපණය කෙරෙන අතර එය ශ්‍රී ලාංකේය සංස්කෘතික අනන්‍යතාවය බවටද පත්වෙයි. එමගින් තත්කාලීන චිත්‍ර ශිල්පියා බෞද්ධ සාහිත්‍යයේ අනුප්‍රාණය ලබමින් ස්වාධීන සිතුවම් සම්ප්‍රදායක් වර්ධනය කර ඇති ආකාරය තීව්‍ර කෙරේ.

## සමුද්දේශ

විද්‍යාචක්‍රවර්තීන්, (2011) *අමෘතාවහ නම් වූ බුත්සරණ*, සංස්:සෝරත හිමි, වී. , කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

ගුරුළුගෝමීන්, (2017) *අමාවතුර*, සංස්: සෝරත හිමි, වී. , කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

හේවාපතිරණ, ඩී.,(2012) *ශ්‍රී ලංකාවේ විහාරාශ්‍රිත සිතුවම් කලාව*, කොළඹ: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සෙනෙවිරත්න, ඒ., (2001)*සිංහල ශිෂ්ටාචාරයේ උදාගිර මිහින්තලාව*, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

කුමාරස්වාමි, ඒ. කේ., (1962) *මධ්‍යකාලීන සිංහල කලා*, පරි :සෝමරත්න, ඇම්., කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

බුද්ධඝෝෂ හිමි.(2017 ) *විසුද්ධි මාර්ගය*, සංස්: ධර්මකීර්ති හිමි,එන්, එස්., කොළඹ: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සන්නස්ගල, පී,බී. (1964) *සිංහල සාහිත්‍ය වංශය*, කොළඹ: ලේක් හවුස් මුද්‍රණාලය.

කතුවරයා සඳහන්ව නැත, (1961) ,*පන්සිය පනස් ජාතක පොත් වහන්සේ*, සම්පා : ප්‍රේමතිලක,එන්., ප්‍රකාශක සඳහන්ව නැත.

චාර්ල්ස් ,ඇස්. පී., (2000) *පාරම්පරික සිංහල බිතු සිතුවම්*, කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල.

චාර්ල්ස්., එස්.පී. (2003). *පොලොන්නරුවේ විහාර බිතුසිතුවම්*, කොළඹ: එස්.ගොඩගේ සහ සහෝදරයෝ.
හිරියන්ත, ඇම්.,(2014) *සංක්ෂිප්ත ඉන්දීය දර්ශණය*, කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

කුමාරස්වාමි, ඒ.කේ. (1962) *මධ්‍යකාලීන සිංහල කලා* , සෝමරත්න., එච්.ඇම්. (පරි.). කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

රණසිංහ., සී. (2014). අනුරාධපුර *පොලොන්නරු සාහිත්‍යය පිළිබඳව කෙටි හැඳින්වීමක්.* කොළඹ: ෆාස්ට් පබ්ලිෂන් (ප්‍රයිවට්)ලිමිටඩ්.

මංජු ශ්‍රී., එල්.ටී.පී. (1977). *ලංකා බිතුසිතුවම් සටහන්.* කොළඹ: ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය.

බෂාම්. ඒ.එල්. (1995). *අසිරිමත් ඉන්දියාව.* (පරි.) කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

විජේසේකර, එන්. (1964). *පැරණි සිංහල බිතුසිතුවම්.* ක්‍රිසැන්තස්., ඇස්. ඩී.ටී. (පරි.). රාජ්‍යය භාෂා දෙපාර්තමේන්තුව.

*මහාවංශය සිංහල.* (2012 ). සුමංගල හිමි, එච්.එස්., දේවරක්ෂිත බී., අබේරත්න, ඩී.එච්.ඇස්., විජේසේකර., එන්. (සංස්.). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ඥානානන්ද හිමි., කේ. (2011). *සංයුක්ත නිකාය - දෙවන කොටස.* නිධාන වර්ගය. මහාමේඝ ප්‍රකාශකයෝ.

වජිර හිමි, එච්., (1995 ජනවාරි -මාර්තු, )"ශ්‍රී ලංකාවේ බිතු සිතුවම් සඳහා තලය සකසා ගැනීම. "*සංස්කෘතික පුරාණය.* 1 වෙළුම, 14-16 පිටු.

සිල්වා ,ආර්,ඩී. (1990)" චිත්‍ර කලාව - ආදි යුගය ක්‍රි:පූ:247-ක්‍රි:ව: 800 තෙක්. " චිත්‍ර කලාව, පස්වන වෙළුම, , 3-49 පිටු.

ජානගේ, වී. (2000 දෙසැම්බර්). නාග වන්දනයේ ඓතිහාසික පසුබිම හා නාග සංකේත. *නිශ්ශංක.* 1(1), 64-72.

Bandaranayake, Senake. (2006) ,*The Rock and Wall Paintings of Sri Lanka*, Colombo; Stamford Lake (Pvt) Ltd.

Jayasinghe, Gamini., *Classical Elegance*, Colombo; Sarasavi publishers (Pvt) Ltd', 2016

Galthung, Johan. (1993) *Buddhism : a quest for unity for unity and peace*, Sarvodaya Book Pub: Service.

Bal, M., & Bryson , N. (1991). Semiotics and Art history : A Discussion Of Context and Senders. E. Articles, 242-256.

අන්තර්ජාලය

Johan Galthung / ABC Triangle
Johan Galthung - Wikipedia.
APA Style – 6th edition.

ආඛ්‍යාන narrations

**Volume 06 | Issue 02 | July - December 2021 | Article 05**
**ISSN 2478-0642**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

CC BY NC ND

# අතීතය සහ ආඛ්‍යාන, ඉතිහාසයේ ස්වභාවය පිළිබඳ මුල්කාලීන අදහස සහ එහි න්‍යායාත්මක පසුබිම පිළිබඳ විමසීමක්

ඉන්දික තෙන්නකෝන්[9]
BA, MPhil
indikatmp@yahoo.com

**සාරසංක්ෂේපය**

අතීතය (Past) යනු කාලය හැඟවීම සඳහා යොදාගන්නා වචනයකි. අතීතය පිළිබඳ ආඛ්‍යානය ඉතිහාසය යි. අතීත මානව අත්දැකීම් සමුදාය සහ ඔවුන් සතු දැනුම අධ්‍යයනය කිරීම සඳහා භාවිතයට ගැනෙන ප්‍රධානම විෂය ක්ෂේත්‍රය හෝ ශික්ෂණ සම්ප්‍රදාය ලෙස ඉතිහාසයේ වැදගත්කම සහ එහි විෂය ස්වභාවය (Nature of Subject) අවබෝධ කරගැනීම තාර්කික දැනුම් පද්ධතියක් ගොඩනැගිම සඳහා ප්‍රධාන සාධකයක් වේ. අතීත මිනිස් ක්‍රියාකාරකම් හෝ සංසිද්ධි පිළිබඳව සමකාලීනව මෙන්ම පසුකාලීනව ගොඩනැගෙන ආඛ්‍යාන ස්වාභාවික නොවන අතර පුද්ගලානුබද්ධ අර්ථකථන සේ සැලකීම වඩාත් නිවැරදිය. බොහෝවිට අතීත ආඛ්‍යානය අපට සම්මුඛ වන්නේ ලිවීමක් (Text) ලෙසයි. එකී ඉතිහාස රචනාව (ඉතිහාසකරණය - Historiograhpy) මත බලය, ආධිපත්‍යය, පක්ෂපාතත්වය, දෘෂ්ටිවාදය ආදී ලක්ෂණ පවතී. එබැවින් මේ ලිපියේ ප්‍රධාන අරමුණ නම් සමාජයීය විද්‍යා විෂය ක්ෂේත්‍රයක් ලෙස ඉතිහාසයේ ස්වභාවය සහ අර්ථකථන පිළිබඳව විමර්ශනය කිරීමයි. එමෙන්ම ඉතිහාසඥයෝ විසින් සම්පාදිත ඓතිහාසික අර්ථකථන සම්බන්ධව සහ එහි න්‍යායාත්මක පසුබිම සාකච්ඡා කරමින් ඉතිහාසය රචනා වී ඇති ග්‍රන්ථ, ලිපි, ලේඛන ආදිය කියවීමේ දී සහ අධ්‍යයනය කිරීමේ දී අපක්ෂපාතී විමසීමක් ගොඩනගා ගැනීමට මේ පර්යේෂණ පත්‍රිකාව දායක කිරීම යි. එහෙත් මේ පර්යේෂණ පත්‍රිකාව ඉතිහාසයේ ස්වභාවය පිළිබඳ මුල්කාලීන (පැරණි පර්සියානු, ග්‍රීක, යුදෙව් චීන ආදී) කියවීම්වලට පමණක් සීමා වේ.

**මුඛ්‍ය පදඃ**අර්ථකථනය , ඉතිහාසය, ඉතිහාසකරණය, ඓතිහාසික දෘෂ්ටිවාදය

## හැඳින්වීම

අතීතය සහ ආඛ්‍යානය යනු කුමක් ද, කාලයට සාපේක්ෂව අනාගතයට ප්‍රතිවිරුද්ධ දිශානතිය අතීතය ලෙස හඳුනා ගැනේ. කතන්දර පාදක ස්වරූපයෙන් ඉතිහාසය ලිවීමේ පුරුද්ද හෝ ක්‍රමය ආඛ්‍යාන ඉතිහාසය යි. එහෙත් අතීතය මත පතිත වී ඇති මානව අත්දැකීම් සමුදාය සහ ඔවුන් සතු දැනුම අධ්‍යයනය කිරීම ඉතිහාසයේ කාර්යභාරය යි. ඊට අනුව ඉතිහාසය ලිවීම හුදු ආඛ්‍යාන ක්‍රියාවලියක ප්‍රතිඵලයක් බව සමහර උගතුන්ගේ අදහසයි. "The History and Narrative Reader" නම් ග්‍රන්ථයට The History and narrative debate, 1960-2000 නමින් හැඳින්වීමක් සම්පාදනය කරනු ලබන ජෙෆ්රි රොබට් (Geoffrey Roberts) මෙවැනි අදහසක්

[9] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුව, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

ඉදිරිපත් කරයි. "ඓතිහාසික ආඛ්‍යානවල සත්‍යය හෝ අසත්‍යය නොව එය සාරධර්ම පිළිබඳ කාරණයක් බව පශ්චාත්නූතනවාදීන් පෙන්වා දෙති. තවත් සමහරු ඉතිහාසය හැදෑරීමේ වාස්තවිකත්වය පිළිබඳ සාම්ප්‍රදායික දාර්ශනික සාකච්ඡාව වෙත නැවත අවධානය යොමු කිරීමට උත්සාහ කරති."[10] මේ අනුව ඉතිහාසයේ ස්වාභාවය සම්බන්ධව විවිධ සංකල්ප සහ න්‍යායයන් ඈත අතීතයේ සිට ඉදිරිපත් කර ඇත. මෙහි දී අපගේ අවධානය යොමුවන්නේ එහි මූලාරම්භය පිළිබඳවයි.

විසිවන සියවස ආරම්භයේ දී පමණ බර්ට්‍රන්ඩ් රසල් විසින් "ඉන්ඩිපෙන්ඩන්ට් රිවීව්" නැමැති සඟරාවට ඉතිහාසය නමින් ලිපියක් ලීවේය. එහි මෙසේ සඳහන් වේ. "බුද්ධිමය ජන සමාජයේ පුරවැසියෙකු වීම සඳහා මිනිසෙකු විසින් අවශ්‍යයෙන්ම අධ්‍යයනය කළ යුතු සියලු විෂයයන් අතර ඉතිහාසය ඉගෙනීම තරම් වැදගත් සහ අවශ්‍යයෙන්ම අධ්‍යයනය කළ යුතු වෙනත් විෂයයක් නොමැති තරම්ය."[11] මේ අදහසින් පැහැදිලි වන්නේ ඉතිහාසය යනු අධ්‍යයනයට භාජනය විය යුතු විෂය ක්ෂේත්‍රයක් හෙවත් ශික්ෂණ සම්ප්‍රදායක් ලෙස එහි වැදගත්කම යි. එබැවින් ශික්ෂණ සම්ප්‍රදායක් ලෙස ඉතිහාසයේ ස්වභාවය අවබෝධ කරගැනීම ද එක සේ වැදගත් වූ කරුණකි. ඉතා ඈත අතිතයේ සිටම ඉතිහාසය යනු කුමක් ද යන සංවාදය ගොඩනැඟී පැවති බව බොහෝ ඉතිහාසඥයින්ගේ අදහසකි. එහෙත් ඉතිහාසයේ ස්වාභාවය පිළිබඳ අතීතයේ දී සංවාදයක් පැවතුණා ද නැති ද යන්න පිළිබඳව නිවැරැදි තොරතුරු ප්‍රකාශ කිරීම අපහසු වන අතර ඉතිහාසය යන වචනයට අර්ථයක් සෙවීමට ඈත අතීතයේ සිට යම් උත්සාහයක් පැවති බව පැහැදිලි ය. පුරාතන අවධින් හි බුද්ධිමත් මිනිසා ඉතිහාසය පිළිබඳ ගොඩනගන ලද දෘෂ්ටියට හාත්පසින් වෙනස් කතිකාවක් වර්තමානයේ නිර්මාණය වී ඇත. ලෝකය සහ අතීත මිනිස් සමාජය ගැන සෙවීමේ හා අධ්‍යයනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් විවිධ සමාජ සංකල්ප හා මතවාද බිහිවිය. මේ නිසා ඉතිහාසයේ ස්වාභාවය පිළිබඳ කතිකාව ද එහිම දීර්ඝ වූ ඉතිහාසයක් තුළ ප්‍රමාණාත්මක කියවීමක් කරා අපව යොමු කරවනු ලබයි.

**ශික්ෂණයක ආරම්භය (සම්භාව්‍ය අවධිය – Classical Age)**

Arnaldo Momigliano විසින් රචිත "The Classical Foundations of Modern Historiography" නම් ග්‍රන්තයේ මෙවැනි අදහසක් ඉදිරිපත් කරයි "සමහර ප්‍රාථමික කරුණුවල ව්‍යාජත්වයේ අනතුර අපගේ මතකයේ තබා ගත යුතු වේ. කවදා ද මිනිසා විසින් ඉතිහාසය ලිවීම ආරම්භ කරන්නේ එදින ඔහුගේ අවශ්‍යතාව වූයේ වර්ෂ ක්‍රමානුගත රාමුවක් (Chronological Frame) තුළ අතීත සිදුවීම් වාර්තා කර තැබීමයි. එහෙත් ලේඛනයක් හෝ එහි කරුණුවල තෝරා ගැනීම සහ ඒ පිළිබඳ අර්ථකථනය නැමති මූලධර්මය නොසලකා හරිනු ලැබූවේය. සමහර විට සිද්ධිය තෝරා ගනු ලැබුවේ ලේඛනගත කිරීම සඳහාය. මක් නිසාද යත් ඔවුන්ගේ විශ්වාසය වූයේ ඉතිහාසයේ මූලධර්මයට අනුව වෙනස්වීම සහ සදාචාරය පුනරාවර්තීය රටාවක් තුළ (චක්‍රීය රටාවක්) පෙන්වා දීමට හැකි බවයි"[12]

මේ අදහස ඉදිරිපත් වන්නේ ග්‍රීක ඉතිහාසකරණ සම්ප්‍රදාය සම්බන්ධයෙනි. ඉතිහාසයේ ස්වභාවය පිළිබඳ අදහස ක්‍රමයෙන් වැඩෙන්නේ මේ මූලික රාමුව තුළ බව බොහෝ ඉතිහාසඥයින්ගේ අදහසයි. ඉතිහාසයේ ස්වභාවය ගැන ඊ.එච්. කා ගේ අදහසක් මෙහිදී උපුටා දැක්වීමට හැකිය.

> "ඉතිහාසය යනු කුමක්ද යන ප්‍රශ්නයට අප පිළිතුරු දෙන්නට තැත් කරන විට අපේ පිළිතුරින් සවිඥ්ඥාණිකව හෝ නිර්විඥ්ඥාණිකව පිළිබිඹු වන්නේ කාලය තුළ අපේම

[10] Geoffrey Roberts, **The history and narrative reader**, *The history and narrative debate, 1960-2000*, Routledge, London and Newyork, 2001, p. 17

[11] පෙරේරා කේ. ඒ. එන්. **ඉතිහාසය සහ දැනුම පිළිබඳ රසල්ගේ මතය**, ගොඩගේ, 2018, පි 38

[12] Momigliano, Aranaldo, **The Classical Foundations of Modern Historiography**, University of Califonia. Oxford, 1990,P.30

තැන වන අතර ඒ පිළිතුර අප වෙසෙන සමාජය ගැන අප දරන මතය කුමක් ද යන වඩාත් පළල් ප්‍රශ්නයට අපේම පිළිතුරින් කොටසක්ද වේ.''[13]

ඊ. එච්. කා ගේ මේ අදහසේ අර්ථය වන්නේ, මූලික වශයෙන් ඉතිහාසය යන්න අපට සමකාලීන කියවීමක් සේ පැහැදිලි කර ගැනීමට ගන්නා උත්සාහය යි. ඉහත සඳහන් කර ඇති පැරණි ග්‍රීක ඉතිහාසකරණ සම්ප්‍රදාය සහ ඉතිහාසය අපට සමකාලීන වන්නේ කෙසේ ද යන ඉතිහාසය පිළිබඳ ඊ. එච්. කා ගේ අර්ථකථනයත් සැලකිල්ලට ගනිමින් නැවතත් ඉතිහාසයේ ස්වාභාවය පිළිබඳ කතිකාව ක්‍රමානුකූලව වර්ධනය වූ ආකාරය විමර්ශනය කිරීමට හැකි වේ.

ඉතිහාසයේ ස්වාභාවය ගැන බටහිර බිහි වූ සංවාදය ආරම්භ කරන්නේ පර්සියානු, ග්‍රීක සහ යුදෙව් ඉතිහාසකරණයෙන්ය. (යුදෙව් ඉතිහාසකරණ සම්ප්‍රදාය බයිබලය - පැරණි ගිවිසුම පදනම් කරගෙන ආරම්භ වේ.) මීට අමතරව ඉදිරිපත් වන අදහස නම් චීනය ග්‍රීකයන්ට පෙර ඉතිහාසය පිළිබඳ ශික්ෂණ සම්ප්‍රදායක් ගොඩනගා තිබුණු බවයි. කෙසේ වෙතත් සම්ප්‍රදායක් ලෙස ඉතිහාසකරණය ලෝකයේ මුලින්ම පැන නැගුණේ කොහේද යන්න පෙන්වා දීම සංකීර්ණ ගැටලුවකි. සමහර ඉතිහාසඥයින් පෙන්වා දෙන්නේ ඉතිහාසය ශික්‍ෂණ සම්ප්‍රදායක් ලෙස ගොඩනැගීම සම්බන්ධයෙන් ග්‍රීකයන් ප්‍රමුඛ වන බවයි. ග්‍රීක ජාතික හෙරඩෝටස් එහි ආරම්භකයා විය. මේ නිසා ඔහු ඉතිහාසයේ පියා වශයෙන් නම් කරනු ලැබේ. එහෙත් මේ මතයට විරුද්ධව අදහස් දක්වන්නෝ පෙන්වා දෙන්නේ හෙරඩෝටස්ට ඉහත දී පෙරදිග ලෝකයේ ඉතිහාසය නම් ශික්ෂණ සම්ප්‍රදාය පහළ වූ බවයි. එමෙන්ම එහි ආභාසය ග්‍රීකයන්ට ලැබුණු බවත් ඔවුහු තර්ක කරති. එහෙත් ඒ සඳහා නිවැරදි තොරතුරු දැක්වීම අපහසු කාර්යයකි. චීනයේ ඉතිහාසය රචනා කරන ලද පැරණිම ග්‍රන්ථ (ෂර්- බෙන්) ක්‍රිස්තු පූර්ව අටවෙනි සියවස පමණ ඈත අතීතයක් නියෝජනය කරයි. ආසියාතික ප්‍රදේශවලට පර්සියානු හා ග්‍රීක ආක්‍රමණ එල්ල වන්නේ ක්‍රිස්තු පූර්ව හය වෙනි සිවසින් පසුවයි. එබැවින් මේ ආක්‍රමණ කණ්ඩායම් සමග හෝ පසුව සංචාරක කණ්ඩායම් සමග හෝ පැමිණි ග්‍රීක ලේඛකයෝ ආසියාවේ පැවති දැනුම උකහා ගත්තේ යැයි සිතීමට හැකිය. එමෙන්ම ඔවුන් සතුව පැවති විවිධ විෂය දැනුම චීනය හා ඉන්දියාව වැනි රටවල් තුළ පැතිරෙන්නට ඇතැයි විශ්වාස කිරීමට හැකිය. ක්‍රිස්තු පූර්ව 330 පමණ සිදුවූ ඇලෙක්සැන්ඩර්ගේ ආක්‍රමණය ද මෙහි දී වැදගත් සේ සැලකිය හැකිය.[14]

ඓතිහාසික කරුණු සහ සිදුවීම් රචනා කොට තැබීම පුරාතන ශිෂ්ටාචාර අවධියේ සිට පැවත එන සම්ප්‍රදායකි. එම රචනාවල ප්‍රධාන ක්‍රමවේදය වූයේ වර්ෂ ක්‍රමානුගත ක්‍රමයකට රචනා කිරීමයි. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාවේ ඉතිහාස රචනා සාම්ප්‍රදාය ද (දීපවංශය, මහාවංශය වැනි වංශකථා ආශ්‍රිත) වර්ෂ ක්‍රමානුගත ක්‍රමය මත පදනම් වූ බව පෙන්වා දීමට හැකිය. එමෙන්ම ආගමික හා දේශපාලන සිදුවීම් වටා මේ ග්‍රන්ථය නිර්මාණය වී පැවතුනි. දේශපාලන තොරතුරු ලෙස දක්නට ලැබෙන්නේ ප්‍රධානීන්ගේ හා රජවරුන්ගේ ඓතිහාසික තොරතුරු හුවා දැක්වීමයි. ආගමට ලැබුණේ ප්‍රමුඛත්වයකි. නිදසුනක් ලෙස ලංකාවේ මහාවංශය ලියැවෙන්නේ ශාසන කතා ප්‍රධාන කොට රාජ පරම්පරා කථායි. ශාසන කථා වූ කලී බුද්ධ ශාසනය හා එහි ඓතිහාසික විකාසනය ලියා දැක්වීමයි. රාජ පරම්පරා කථාවන්ගෙන් රාජ රාජ මහාමාත්‍යාදීන් ශාසනයට කළ උපකාර හා ඒ පරම්පරා ලංකාවේ පැවති ආකාරය කියා පෑමයි.[15] වංශකථාවල සඳහන් මේ කරුණු හා සිදුවීම් සියල්ල වාර්තා කොට ඇත්තේ වර්ෂ ක්‍රමානුගත පිළිවෙලකට ය. එමෙන්ම තම අතීතය ලෙස ඔවුන් දකින්නේ ආගමික ඉතිහාසය යි. එබැවින් ජාතිය හා දේශය වංශකථාවේ ප්‍රමුඛ සාධකය වූ බව පෙනේ. ලංකාවේ වංශකථා සාහිත්‍යයේ මෙන්ම චීන, ග්‍රීක සහ යුදෙව් ඉතිහාසකරණයෙහි ද ජාතිය, දේශය සහ ආගම පිළිබඳ

---

[13] කා.ඊ.එච් **ඉතිහාසය යනු කුමක්ද**, පරිවර්තනය, චරිතා විජේරත්න, ජත්‍යන්තර ප්‍රකාශය, කොළඹ, 1973, පිටුව, 123

[14] ක්‍රි. පූ. 330 දී පමණ ඩෙරියස් පරාජය කළ ඇලෙක්සැන්ඩර් පෙරදිග අල්ලා ගැනීමට සූදානම් වූ බව විවිධ ග්‍රීක ලේඛන සහ වාර්තාවලින් පැහැදිලි වේ. හෙරඩෝටස් කේතේසියස් සෙන්ඩෝන් සුට්‍රාබෝ සහ ඒරියන් ආදී ග්‍රීක ලේඛකයන්ගේ ලේඛනවලින් මේ තොරතුරු ලැබේ. ඔවුන්ට අනුව සයිරස්ට (ක්‍රි. පූ 558-530) වඩා ඇලෙක්සැන්ඩර් ආක්‍රමණ ආසියාවේ පැතිර ගිය බව සඳහන් වේ.

[15] **මහාවංශය**, පරිවර්තනය, හික්කඩුවේ සිරිසුමන හා අන්දිරිස් ද සිල්වා බටුවන්තුඩාවේ, ගොඩගේ, 1996, පිටුව 2

සංකල්පීය ලක්ෂණය එක හා සමානව රචනා වී ඇති බව දක්නට ලැබීම විශේෂිත කරුණකි. චීන ඉතිහාස සම්ප්‍රදාය තුළ දේශපාලන සහ ආගමික සම්බන්ධය නිරතුරුවම දක්නට ලැබේ. ආගමික වශයෙන් කොන්ෆියුසියස් ධර්මයේ බලපෑම මේ ග්‍රන්ථවල කැපී පෙනෙන ලක්ෂණය යි. මේ ග්‍රන්ථ ලිවීමේදී සමකාලීනව පැවති ජනප්‍රවාද පුරාවෘත හා දේවකතා ප්‍රයෝජනයට ගනිමින් ලියූ බව දක්නට ලැබේ. මැවුම්වාදය මේ රචනාවල එක් විශේෂ ලක්ෂණයකි.[16] කෙසේ වෙතත් මේ ග්‍රන්ථවල ඓතිහාසික විධික්‍රමය වූයේ වර්ෂ ක්‍රමානුගත රීතියයි.

පුරාතන චීන ඉතිහාකරණ සම්ප්‍රදායේ දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණයක් වන්නේ ඈත අතීතයේ සිටම අතීතය වාර්තා කර තැබීම සඳහා යම් ක්‍රමානුකූල විධික්‍රමයක් පවත්වාගෙන යෑමයි. චීන ඉතිහාකරණයේ හැරවුම් ලක්ෂය (Turning Point) ලෙස පිළිගනු ලබන්නේ සමා-චියැන් (Szma- Chien) විසින් ආරම්භ කළ ඓතිහාසික ලේඛන සම්ප්‍රදාය යි. එහෙත් ඔහුට පෙර ඉතිහාසය ලිවීම සම්බන්ධයෙන් උසස් හැකියාවන් චීනයේ පැවති බව සමහර ඉතිහාසඥයින්ගේ අදහසයි.[17] එහෙත් පැවති සම්ප්‍රදායෙන් නිදහස් වෙමින් නව ආකෘතියක් තුළ ඉතිහාසය ගවේෂණය කිරීමට සමා-චියැන්ට හැකි වූ බව අනාවරණය කෙරේ. රාජ්‍යතාන්ත්‍රික ඉතිහාසය පමනක් නොව සාමාන්‍ය මිනිස් කණ්ඩායම් හි ඉතිහාසය ගැන (සමාජ ඉතිහාසයක් පිළිබඳ අදහස) ඔහුගේ අවධානය යොමු විය. එහෙත් ඔහු ද විශාල වශයෙන් කරුණු රැස්කරමින් ඉතිහාසය රචනා කළ ද ඔහුගේ ක්‍රමවේදය වූ යේ ද වර්ෂ ක්‍රමානුගත ඉතිහාසය ලිවීමේ සම්ප්‍රදාය යි.

**අපරදිග ඉතිහාස ශික්ෂණ සම්ප්‍රදාය**

ලෝකයේ බුද්ධිමය පිළිගැනීමට අනුව අපරදිග ඉතිහාසය මෙන්ම දර්ශනය සම්බන්ධයෙන් පැරණි ග්‍රීක ශිෂ්ටාචාරය ඉතා ඉහළින් වර්ණනාවට පාත්‍ර වේ. විවිධ ශික්ෂණ සම්ප්‍රදායන් පිළිබඳ දැනුම ලෝකයට විසරණය කළ ජාතියක් ලෙස විශාල උරුමයක් ග්‍රීකයන් සතුව පවතී. ඔවුන් සතු දැනුම ලෝකයේ වඩාත් ඉහළින් ව්‍යාප්ත වීමට සහ වර්ධනය වීමට හේතු වූයේ යුරෝපයේ නූතන අවධියේ දී පැරණි ග්‍රික දැනුම ආයතනගත වීම නිසාය. දැනුම ආයතනගත වීම යනු දැනුම පදනම් කරගත් සමාජ ආයතන බිහිවීමයි. ඉංග්‍රිසි වචනයක් වන " ඇකඩමික්" (Academic) හි ඉතිහාසය අධ්‍යයනය කිරීමෙන් මේ පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීමට හැකිය. ඇකඩමික් යන වචනයේ මූලාරම්භය වන්නේ ග්‍රික දාර්ශනික පේලේටෝ ගේ (ක්‍රි පූ 427-347) අවධිය යි. ඔහු විසින් ආරම්භ කළ පාසල හැඳින් වූයේ ඇකඩමියා (Akademia) යන ග්‍රික වචනයෙන් ය. පුනරුදයේ ප්‍රධාන ලක්ෂණය වූ බුද්ධි ප්‍රබෝධය මගින් නැවත නැගීසිටි දැනුම පිළිබඳ මේ සමාජ ආයතනය 1580 දී පමන ඉංග්‍රිසි භාෂාවේ ඇකඩමික් හෝ ඇකඩමි ලෙස සමාජය තුළ මහත් ඒකාධිකාරියක් අත්පත් කරගත්තේය. එහි ප්‍රතිඵලය වූයේ බටහිර දැනුම කාලානුරූපී ක්‍රියාවලියක් ලෙස යුරෝපය තුළත් යටත් විජිතකරණය මගින් බලෙන් අත්පත් කරගත් ලෝකයේ අනෙකුත් කලාපවලත් ව්‍යාප්ත වීමයි. (එහෙත් ආසියාවේ දැනුම ආයතනගත නොවීම නිසා එහි ඓතිහාසික ප්‍රවණතා නැවත නැවත පරීක්ෂා කිරීමෙන් යුක්තව උකහා ගැනීමට සිදු වී තිබේ.) අපගේ සමකාලීන ඉතිහාසයට සාපේක්ෂව මෙය සාමාන්‍ය ලක්ෂණයකි. මන්ද ආසියාව සතුව පැවති පුරාතන දැනුම පිළිබඳ සිතීම සහ සංවාදය ඇතිවන්නේ විසිවෙනි සියවසේ ආරම්භයේ පමණ සිට ය.

ග්‍රීකයන් අතර ඉතිහාසය ශික්ෂණ සම්ප්‍රදායක් ලෙස සංවර්ධනය වීමට ප්‍රථම ඒ සඳහා ඉවහල් වූ ග්‍රීක ශාස්ත්‍රීය ප්‍රබෝධය ගැන යම් අවදානයක් යොමු කිරීම වැදගත් වේ. ග්‍රීකයන්ගේ ශාස්ත්‍රීය නවෝදය ඔවුන්ගේ ප්‍රාරම්භක චින්තන සම්ප්‍රදාය හා බැඳී පවතී. ග්‍රීක චින්තන සම්ප්‍රදායේ අතිශය වැදගත් ප්‍රතිඵලය වූයේ ලෝකයේ ඉතා ඉහළින් සාකච්ඡාවට භාජනය වූ ග්‍රීක දර්ශනයේ පැන නැගීමයි. සාහිත්‍ය කලා ඉතිහාසය ආදී විෂයයන් සහ විද්‍යා විෂයයන්ද ග්‍රීක දර්ශනයෙන් වියුක්ත වූයේ නොවේ. විශේෂයෙන්ම සමාජයීය විද්‍යා ක්ෂේත්‍රයේ විවිධ සංකල්ප බිහි කිරීම සඳහා ග්‍රීක දර්ශනයේ බලපෑම ඉතා ප්‍රයෝජනවත් විය. විශේෂයෙන්ම සමාජයීය විද්‍යා කේෂ්ත්‍රයට පෙර මානව ශාස්ත්‍රීය විෂයයන් ග්‍රීකයන් තුළ වර්ධනය වී තිබීම මේ

[16] විජයගෙන් ආරම්භ වන රාජ්‍ය වංශාවලිය මහාවංශය ඇතුළු වෙනත් වංශකථාවලින් හෙළි වේ. චීනයේ ෂර්-බෙන් වැනි ග්‍රන්ථවලින් ක්‍රි. පූ. 8 දක්වා පාලනය ගෙන ගිය නායකයින් නිලධාරින් හා ප්‍රභූන් පිළිබඳ තොරතුරු හෙළි වේ.

[17] Yang Hsien, Yiand Gladys yang, **Selections form Records of the Historian**, Foreign lanuages,Peking, 1979,P.37

සඳහා මූලිකව බලපෑවේය.[18] මේ අනුව ග්‍රීක ඉතිහාකරණය ද ඊට සමකාලීන ශාස්ත්‍රීය සන්දර්භය තුළ සාකච්ඡා කිරීමට සිදූ වේ.

ග්‍රීකයන් සතු ඉපැරණි කාව්‍ය සාහිත්‍ය ඔවුන්ගේ ශාස්ත්‍රීය සංවර්ධනයේ ප්‍රධාන සංධිස්ථානයක් වේ. ග්‍රීක ඉතිහාසකරණය ගැන විමර්ශනය කරන විට ද පැහැදිලි වන්නේ පුරාතන ග්‍රීක ශිෂ්ටාචාරයේ ඓතිහාසික සිදුවීම් සහ ඉතිහාසකරණය අතර පවතින අන්තර්සම්බන්ධය යි. එබැවින් පසුකාලීනව ග්‍රීක ඉතිහාසය රචනා කළ ලේඛකයන්ට පැරණි සාහිත්‍ය කෘති මූලාශ්‍රය වීම සාමාන්‍ය ලක්ෂණයකි. ඒ සඳහා පසුබිම් වූ ග්‍රීක චින්තන සම්ප්‍රදායක් ඇත. මුල් ග්‍රීක සාහිත්‍ය ග්‍රන්ථවල ''ලෝකයේ සහ ලෝක පටිපාටියේ ස්වභාවය කුමක්ද'' යන්න පිළිබඳ ප්‍රශ්න මතු කෙරුණි. ග්‍රීක ආගමික ප්‍රතිසංස්කරණ ඇතිවීමට ද මේ බුද්ධිමය සංවාදය බලපෑ බව පෙනේ. නිදසුනක් ලෙස දිවැස් කීමේ ක්‍රම ආදිය ප්‍රතික්ෂේප වීම පෙන්වා දීමට හැකිය. මේ නිසා ඔවුන්ගේ පැරණි සාහිත්‍ය ග්‍රන්ථවලින් ද සමකාලීනව පැවති පිළිගැනීම් සහ න්‍යායන් නැවත ප්‍රශ්න කිරීමට භාජනය වූ බව දක්නට ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස නව නිර්මාණාත්මක සංකල්ප සහ මතවාද බිහිවිය. ග්‍රීක කාව්‍ය සම්ප්‍රදායේ මුලින්ම කැපී පෙනෙන පුද්ගලයා වූයේ හෝමර්ය. බර්ට්‍රන්ඩ් රසල් බටහිර දර්ශන ඉතිහාසය නැමති ඔහුගේ ග්‍රන්ථයේ හෙලනිස්තික[19] සභ්‍යත්වයේ (Hellenic Civiization) ප්‍රථම විශිෂ්ටතම නිෂ්පාදනය ලෙස හඳුන්වා දෙන්නේ හෝමර්ය. නමුත් හෝමර් තනි පුද්ගලයෙකු නොව කවියන්ගේ එකතුවක් යන අනුමානයක් ඇත. ඉලියඩ් සහ ඔඩිසි යන ග්‍රන්ථ දෙක නිම කිරීමට ක්‍රි. පූ. 750 සිට ක්‍රි.පූ. 550 දක්වා අවුරුදු 200 පමණ කාලසීමාවක් ගෙවී යන්නට ඇතැයි බොහෝ දෙනා විශ්වාස කරති.[20] හෝමර්ගේ ග්‍රන්ථවල ට්‍රෝජන් යුද්ධය ගැන සඳහන් වන්නේ වීර කාව්‍යයක් ලෙසයි. එහෙත් මේ ග්‍රන්ථ ඉතිහාස කෘතියක් ලෙස නොවූවද අතීතය ගවේෂණය කිරීමේ මූලාශ්‍රයක් ලෙස පසු කාලීනව වැදගත් විය. ප්‍රධාන ග්‍රීක ඉතිහාසඥයා වූ හෙරඩෝටස් හා තුසිඩිඩීස් වැනි ඉතිහාස රචකයින් අතීත ඓතිහාසික සිදුවීම් ගවේෂණය කිරීම සඳහා හෝමර්ගේ ග්‍රන්ථ උපයෝගී කර ගත්හ.[21] මේ නිසා හෝමර්ගේ සාහිත්‍ය ග්‍රන්ථවලට විශේෂ වැදගත්කමක් ලැබුණි. වීරත්වය විදහා පෑම[22] හෝමර්ගේ සාහිත්‍ය ග්‍රන්ථවල ප්‍රධාන ලක්ෂණයකි. එමෙන්ම මේ කථා නිර්මාණශීලිව අතීත සිදුවීම් කියාපාන බැවින් ඉතිහාසයේ වීරත්වය (Heroie History) පදනම් කරගත් ලේඛන ලෙස හඳුනාගනු ලබයි. පොදුවේ ලෝකයේ විවිධ කලාපවල සහ විවිධ ඓතිහාසික ප්‍රජාව සතුව පැරණි ඉතිහාස ලේඛන සම්ප්‍රදායේ බොහෝ විට මේ ලක්ෂණ දක්නට ලැබේ. හෙකාටියස් වැනි මුල්ම යුගයේ ග්‍රීක ඉතිහාසඥයන්ට හෝමර්ගේ වෘත්තාන්තවල සඳහන් දෙවියන් හා වීරයන් ගැන කියැවෙන කරුණු විවේචනයකින් හෝ තර්ක කිරීමකින් තොරව සමීක්ෂණය කිරීම සිදුවිය.[23] එබැවින් පසුකාලීනව සාම්ප්‍රදායිකව පිළිගත් වෘත්තාන්ත ඓතිහාසික වශයෙන්

---

[18]මානව ශාස්ත්‍රය ද (Humanities) චිරාත් කාලයක සිට ස්වාභාවික විද්‍යාවන් සහ සමාජයීය විද්‍යාවන් පහළ වීමට පෙර සිට ශාස්ත්‍රීය ක්ෂේත්‍රය තුළ පැවතුණි.. (උදා :- සංගීතය, කලාව, ලලිත කලා, දර්ශනය, භාෂාවන්) එම විෂයන් ස්වාභාවික විද්‍යාවන්ගේ සහ සමාජයීය විද්‍යාවන්ගේ විෂය සන්දර්භයෙන් මෙන්ම එම විෂයයන් හදාරනු ලබන විධි ක්‍රමනුකූල එළඹීම්වලින්ද වෙනස් විය. (ඩෙස්මන් මල්ලිකාරච්චි - සමාජීය විද්‍යාවන්ගේ ස්වභාවය සහ එළඹුම සමාජ විද්‍යාත්මක කතිකාව තුළින් බැලීමක් **සමාජ විද්‍යා විමර්ශන** වෙළුම 1,අංක 2, 2001 අගෝස්තු)

[19] හෙලනිස්තික සභ්‍යත්වය (Hellenic Civiization) යනුවෙන් සඳහන් කරන්නේ මහා ඇලෙක්සැන්ඩර්ට ප්‍රථමයෙන් පැවති ග්‍රීක සභ්‍යත්වයයි. හෙලනිස්ත්‍රික සභ්‍යත්වය යනුවෙන් හඳුනාගනු ලබන්නේ ක්‍රි.පූ. 323 දී පමණ සිදුවූවා යැයි සැලකෙන මහා ඇලෙක්සැන්ඩර් රජුගේ අභාවයෙන් අනතුරුව ක්‍රි.පූ. 30 දී පමණ රෝම අධිරාජ්‍ය පිහිටුවීම දක්වා අවධියයි.

[20] රසල් බර්ට්‍රන්, **බටහිර දර්ශන ඉතිහාසය**, කොළඹ, 1970, පිටුව 22

[21] Breisach Erìt, **Historiography – Ancient,Medievet,Modern**, Second Edition,University of Chicago, Chicago and London, 1994,p.2.1997,p.12

[22] ඉතිහාසයේ වීරත්වය විදහා පෑම සම්බන්ධව ග්‍රීක සාහිත්‍යයේ ප්‍රබලවම මතු වූ එකම තැනැත්තා හෝමර් පමණක් නොවේ. ඉතාම ආසන්න වශයෙන් හෝ හෝමර්ට පසුකාලීන වූ හීසියඩ් ද මේ අතර කැපී පෙනේ. තවත් වීරත්වය විදහාපෑම බයිබලයේ හෝ මහාවංශය වැනි වංශකථාවක දක්නට ලැබේ.

[23] Breisach Erìt- 1994,p,14

පරීක්ෂාකර බැලීමේ ක්‍රමවේදය සංවර්ධනය විය. හෝමර්ට අනුව මනුෂය ප්‍රජාවගේ ඉතිහාසය යන්න චක්‍රිය ක්‍රියාවලියක් බව පෙනේ. ඔහුගේ නිර්මාණාත්මක වැකිවලින් ඒ බව පැහැදිලි වේ. "මනුෂ්‍ය ප්‍රජාව හැර යන සියලු පරම්පරාවන් වෘක්ෂයක් සුළඟට හසු වී පොළව මත ජනිත කරනු ලබන පත්‍ර සේ විනාශ වේ. එහෙත් ජීවමාන වෘක්ෂය නැවතත් වසන්ත කාලයට දළුලමින් වැඩෙන පරිද්දෙන්ම විනාශ වී ගිය මනුෂ්‍ය ප්‍රජාවන් තුළ නැවතත් අලුත් පරම්පරාවක් නිර්මාණය වේ.[24] සමහර ග්‍රීක ඉතිහාසඥයෝ ඉතිහාසයේ ද චක්‍රීය රටාවක් තිබෙන බව විශ්වාස කළහ. පොලීබියස් වැනි ග්‍රීක ඉතිහාසඥයන් තුළින් මේ ලක්ෂණය දැක ගැනීමට හැකිය.

ඉතිහාසයේ ස්වභාවය ගැන නව කියැවීමකට ග්‍රීකයන් යොමු වන්නේ ක්‍රි. පූ. 6 වෙනි සියවසෙන් පසුවයි. ග්‍රීක ශාස්ත්‍රීය නවෝදයේ ප්‍රධාන අවධියක් ලෙස මේ කාල පරිච්ඡේදය කැපී පෙනේ. දේශපාලන වශයෙන් සයිරස් (ක්‍රි. පු. 558-530) යටතේ පර්සියාවේ ආකිමීනියන් නමැති අධිරාජ්‍ය ගොඩනැගීම ද මීට බලපෑ තවත් හේතුවකි. සමකාලීනව ඉන්දියාවේ ආගමික ව්‍යාපාර (බෞද්ධාගම, ජෛනාගම) ගොඩනැගෙන්නේ ද මේ අවධියේ ය. ග්‍රීක බුද්ධිමය විප්ලවයක ආරම්භය සිදු වූ කාලයක් ලෙස ක්‍රි. පූ. 6 වෙනි සියවස පෙන්වා දීමට හැකිය. මේ බුද්ධිමය විප්ලවය තේලිස් නම් දර්ශනවාදියාගෙන් ආරම්භ වේ. මේ සංඝටනය නිසා විශ්ව ලෝකයෙහි මානවාරෝපණය[25] (මානවාරෝපණවාදය - Anthropomorphism) නමැති ව්‍යූහය බිඳ වැටිණ. මේ නිසා දර්ශනය විෂය යටතේ විශ්වය ගැන තර්කානුකූල නිගමන ඔස්සේ බුද්ධිමය තේරුම් ගැනීමක් වෙත එලඹුණි. මේ නව මතවාදී ප්‍රවණතා නිසා අතීතය පිළිබඳ සිතීම ද තර්කානුකූල ක්‍රමවේදයකට අනුව ගවේෂණය කිරීමට උත්සාහ කළ බව පෙනේ. ඒ අනුව ග්‍රීක ඉතිහාසඥයන් වූ හෙරඩෝටස්, තුසීඩියස්, හෙකාටියස් වැනි බුද්ධිමතුන් හට තම ඉතිහාසය පිළිබඳ සිතීමට සහ ලිවීමට දර්ශනය තුළින් පැන නැගී ආ බුද්ධිමය ප්‍රබෝධය ප්‍රයෝජනවත් වූ බව පෙනේ.

ග්‍රීක හා යුදෙව් ඉතිහාසකරණ සම්ප්‍රදාය පර්සියානු සාහිත්‍ය විසින් බිහි කරන ලද්දකි. මේ නිසා ග්‍රීක සහ යුදෙව් ඉතිහාසකරණ සම්ප්‍රදායට නෛසර්ගික වැදගත්කමක් ලැබෙන්නේ පර්සියානු අධිරාජ්‍ය ආකෘතිය තුළයි. ක්‍රි. පු. 558-530 අතර අවධියේ පර්සියාවේ ආකිමීනියන් අධිරාජ්‍ය තුළ වර්ධනය වූ ශාස්ත්‍රීය නවෝදය මේ සඳහා මූලිකව බලපෑවේය. ග්‍රීක ඉතිහාසකරණයේ ප්‍රධානීන් ලෙස සැලකෙන හෙරඩෝටස් සහ තුසිඩිසියස් වැන්නවුන්ගේ ක්‍රමවේද ගැන සලකා බැලීමේ දී ඔවුන්ට සමකාලීන ග්‍රීක සමාජ සන්දර්භය ද ඔවුන්ට බලපෑ බව පෙනේ. මේ අවධියේ දී දේශපාලන දර්ශනය සහ ආණ්ඩුක්‍රම පිළිබඳ නව අදහස් ද ප්‍රචලිත විය. විශේෂයෙන්ම බුද්ධිමය ක්ෂේත්‍රයේ වෙනස්වීම් නිසා සමාජ සංස්කෘතික පරිවර්තනයක් සමකාලීනව සිදු වූ බව පෙනේ. එමෙන්ම නගර අභ්‍යන්තරව සහ නගර අතර වෙළෙඳාම සම්බන්ධයෙන් නව ස්වරූපයක් නිර්මාණය වූ අවධියක් ලෙස මේ කාලය වැදගත් වේ. හෙරඩෝටස් සහ තුසිඩියස් වැන්නවුන්ගේ ඉතිහාස රචනා බිහිවන්නේ මෙවැනි සමාජ සන්දර්භයක් තුළයි.

ඉතිහාසය රචනා කිරීමේ දී හෙරඩෝටස් සහ තුසිඩිඩීස් ද අනුගමනය කරනු ලැබුවේ වර්ෂ ක්‍රමානුගත පිළිවෙල යි. එහෙත් ඔවුන්ටම ආවේණික ශෛලියක් පෙන්නුම් කරනු ලැබුවේය. එනම් විචාරාත්මක ක්‍රමයකට අනුව ඉතිහාසය රචනා කිරීමයි. සිද්ධි වාර්තා කර තැබීමේ විචාරාත්මක ක්‍රමවේදයක් කරා මොවුන් ගමන් කළේය. කරුණු සහ මනඃකල්පිත අතර වෙනස පැහැදිලි කරමින් විචාරාත්මක ක්‍රමවේදය සංවර්ධනය වන්නේ හෙරඩෝටස්ගෙනි.[26] එමෙන්ම ග්‍රීක ඉතිහාසකරණයේ තවත් ප්‍රධාන ලක්ෂණයක් වූයේ අතීත සිදුවීම් ලේඛනගත කොට තැබීමයි. එක් අතකින් මේ ලක්‍ෂණය අතීතය මනාව පාලනය කරමින් කාලනිර්ණයානුකූල ක්‍රමයකට අනුව වාර්තා කිරීමක් විය. ග්‍රීක ඉතිහාස ශික්‍ෂණයෙහි කාලනිර්ණය (Chronology) කිරීමේ සම්ප්‍රදාය හෙරඩෝටස්ගෙන් සහ තුසිඩියස්ගෙන් පැවත

---

[24] Breisach Erìt- 1994,p,9

[25] තේලිස් (ක්‍රි.පු. 624-546) ග්‍රීක දර්ශනයේ ආරම්භකයා ලෙස සැලකේ. ලෝකය ජලය මත පාවේ. ලෝකයේ සියලු වස්තු සෑදී ඇත්තේ ජලයෙනි යන්න ඔහු ප්‍රකාශ කළේය. ඇරිස්ටෝටල් අධිභෞතිකවාදය (Metaphysics) නමැති ග්‍රන්ථයේ ආරම්භකයා තේලිස් බව ප්‍රකාශ කරයි. අධිභෞතික බලවේග ගැන නිර්මණය වී පැවති සමාජ සංකල්ප මානවත්වාරෝපණය ලෙස සැලකීමට හැකිය. ස්වාභාවික වස්තු දේවත්වයට ආරෝපණය කිරිම වැනි සමාජ ආකල්ප මේ යටතේ සාකච්ඡා කෙරේ.

[26] Momigliano, Arnaido, 1990,p,30

එන්නකි. විශේෂයෙන්ම කාලනිර්ණය පිළිබඳ වැදගත්කම ඉතිහාසඥයින්ට පෙන්වා දීමට හෙරඩෝටස්ට හැකි වූ අතරම කාලනිර්ණය වඩාත් ක්‍රමවත් කිරීමේ අයෝනියානු පෙරළිය හෙරඩෝටස් අතින් සිදු විය. එහි වඩාත් වර්ධනීය තත්ත්වයක් ඇති කිරීමට සහ ක්‍රමානුකූල ක්‍රමවේදයක් බවට පත් කිරීමට තුසීඩියස්ට හැකි විය.[27]

හෙරඩෝටස් සහ තුසිඩියස් විසින් ග්‍රීක ඉතිහාස ශික්ෂණ සම්ප්‍රදාය මගින් පෙන්වා දුන් තවත් මූලික අංශයක් නම් අතීත කරුණු ගවේෂණය කිරීමයි. දෙදෙනාම විවිධ ප්‍රදේශවල සංචාරය කරමින් ඉතිහාස තොරතුරු එකතු කළ අය ලෙස සැලකේ. හෙරඩෝටස් ඊජිප්තුව, සිසිලියා ආදී ප්‍රදේශවල සංචාරය කරමින් ඓතිහාසික කරුණු ගවේෂණය කළ අයෙක් ලෙස සැලකේ. හෙරඩෝටස් විශාල වශයෙන් අතීත කරුණු රැස් කර වාර්තා තැබුවේය. ඒ අතර අවශ්‍ය සහ අනවශ්‍ය දෑ ද විය. සමහර විට මේ නිසාම හෙරඩෝටස්ගේ ඉතිහාස ග්‍රන්ථ සංකීර්ණ ස්වරූපයක් ගත්තේය. විශාල ඓතිහාසික තොරතුරු තොගයක් සංවිධානාත්මකව ඉදිරිපත් නොවීම නිසා මූලික තේමාවට පරිබාහිරව අනවශ්‍ය දෑ ද එහි අන්තර්ගත විය. විවිධ සමාජ ආශ්‍රිතව පවත්නා පුරාවෘත්ත සහ දේව කථා ආදිය පිළිබඳ විස්තර හෙරඩෝටස්ගේ කෘතිවල අන්තර්ගත විය. පර්සියානු ආක්‍රමණ පිළිබඳ තොරතුරු සපයන ඔහු සමකාලීන සංස්කෘතික හා සමාජ තොරතුරු ද සංවිධානයකින් තොරව ඊට ඇතුළත් කරන ලදී. මේ නිසා හෙරඩෝටස්ගේ ග්‍රන්ථ සංකීර්ණ ස්වරූපයක් උසුලන ලදී. කෙසේ වෙතත් ඔහු අතීත කරුණු ගවේෂණය කිරීම සහ කාලනිර්ණයකට අනුව වාර්තා කිරීම නිසා ඉතිහාසයේ විචාරාත්මක ක්‍රමවේදය සංවර්ධනය කිරීමට දායක වූ බව පෙනේ. මීට අමතරව ඊ. එච්. කා පෙන්වා දෙන පරිදි හෙරඩෝටස් ඉතිහාසයේ හේතුත්වය ගැන අවධානය යොමු කළ අයෙකි. යම් අතීත සිදුවීමක් කෙරෙහි බලපාන ලද හේතු ගවේෂණය කිරීම ඉතිහාසයේ වගකීමක් ලෙස ඊ. එච්. කා හඳුන්වයි.

> "ග්‍රීකයන්ද මිලේච්ඡයන්ගේ ද ක්‍රියා පිළිබඳ මතකයන් තබන්නටත් වෙසෙසින්ම අන් හැම දේටම වඩා ඔවුන් විසින් එකින් එකා සටන් වැදීමට හේතු දක්වන්නටත්ය.''[28] තමන් වැනූ සිද්ධිවලට පෙර කාලයේ අර්ථවත් කිසිවක් සිදුවූයේ නැතැයි ද ඉන්පසුවත් අර්ථවත් දෙයක් සිදුවන්නට ඉඩ නැතැයිද තුසිඩිසියස් සිතුවේය.[29]

තුසිඩිඩීස් ඉතිහාසය ගැන න්‍යායාත්මක අදහස් දැරුවෙක් ලෙස වැදගත් වේ. විශේෂයෙන්ම ඔහු දර්ශනය විෂය ගැන දැක්වූ උනන්දුව මේ සඳහා බලපෑම් කළ බව පෙනේ. පෙර සඳහන් කළ පරිදි විශ්වයේ ස්වාභාවය යම් චක්‍රිය රටාවකට අනුගත වී පවතින බව පැරණි ග්‍රීක අදහසකි. හෝමර් තුළ ද මේ ලක්ෂණය පැවති බව පෙර දක්නට ලැබුණි. සොබාදහමේ දක්නට ලැබෙන යම් චක්‍රිය ක්‍රියාවලියක් ඉතිහාසය තුළින් දැකීම මෙහි ස්වාභාවය යි. එක් අතකින් තුසිඩිඩීස් ඉතිහාසය පිළිබඳව මෙවැනි අදහසක් දැරීමෙන් පැහැදිලි වන්නේ සමකාලීන දර්ශනය ඔහුට බලපෑ ආකාරයයි.

ග්‍රීක ඉතිහාස ශික්ෂණ සම්ප්‍රදායේ දෙවන අදියර ලෙස හෙලනිස්තික ශිෂ්ටාචාරයේ ඉතිහාසඥයින්ට වැදගත් තැනක් හිමිවේ. (ක්‍රි. පූ. 323 සිදු වූ මහා ඇලෙක්සැන්ඩර් රජුගේ අභාවයෙන් පසු ක්‍රි. පූ 30 දී පමණ ඔගස්ටස් රෝම අධිරාජ්‍යය පිහිටවීම දක්වා වූ කාලය) මේ අවධියේ ගද්‍යයෙහි මුල් ස්ථානය ගත්තේ ඉතිහාසය බව කිය වේ. විශේෂයෙන් හෙලනිස්තික ලෝකයට ඇලෙක්සැන්ඩර්ගේ ඉතිහාසය ලියා තැබීම ඉතා වැදගත් වන්නට ඇත. පළමුවෙනි ටොලමි රාජ්‍ය දිනපොත් සහ අනෙකුත් රාජ්‍ය ලියකියවිලි ප්‍රයෝජනයට ගනිමින් ඇලෙක්සැන්ඩර්ගේ ඉතිහාසය ලිවීය. මීට අමතරව ඇරිස්ටෝමියුලස්, ඩියඩෝරස්, හියෙරොනිමස්, කැලීස්තිනිස් ආදී සමකාලීන බොහෝ ඉතිහාසඥයෝ ඇලෙක්සැන්ඩර්ගේ ඉතිහාසය ලිවීමට උත්සාහ ගත්හ.[30] මෙයින් වඩාත් පැහැදිලි වන්නේ මේ අවධියේ දේශපාලන ඉතිහාසය ලිවීමේ වැඩි නැඹුරුවක් ඔවුන් තුළ පැවති බවයි. පර්සියානු අධිරාජ්‍යය ගොඩනැගීමෙහිලා ඇලේසැන්ඩර්ගේ කාර්යභාර්ය, අධිරාජ්‍යය ලෝකය පුරා ව්‍යාප්ත වීම ආදී

---

[27] Bresach, Ernst 1994,p.11

[28] ඊ.එච්. කා. 1973, පිටුව 79

[29] -එම- පිටුව 101

[30] වර්න් ඩබ්. ඩබ්. **හෙලනිස්තික ශිෂ්ටාචාරය**, කොළඹ, 1971, පිටුව 233

දේශපාලන ජයග්‍රහණ ගැන ලිවීම ඒ අවධියේ ද ජනප්‍රිය වන්නට ඇත. මේ නිසා හෙලනිස්තික යුගයේ ද ඉතිහාසකරණයේ කැපී පෙනෙන ලක්ෂණක් ලෙස දේශනුරාගය ඔප්නැවෙන ආකාරයෙන් ලිවීම පෙන්වා දීමට හැකිය. ඉතිහාසය විෂය කර ගනිමින් අතීත පරම්පරාවන්ගේ විජයග්‍රහණයන් ගැන ලියමින් දේශානුරාගය නිර්මාණය කිරීමට හැකිය යන ආකල්පය ඇත අතීතයේ සිටම ප්‍රබල ලෙස මුල් බැසගත් බව පෙන්වා දීමට මේ ඓතිහාසික කරුණු උදාහරණ වේ. (අතීතයේ දී මෙන්ම වර්තමානයේ ද යම් සමාජයක හෝ ප්‍රජාවක් මත මතවාද සහ දෘෂ්ටිවාද නිර්මාණය කිරීම සඳහා බලය පැවරුණේ ඉතිහාසයට යි.)

හෙලනිස්තික අවධියේ විශිෂ්ටතම ඉතිහාසඥයා ලෙස සැලකෙන්නේ පොලිබියස්ය. ග්‍රන්ථ 40 කින් පමණ යුක්ත වූ ඉතිහාස රචනාවක් ඔහු විසින් කරන ලදි. ක්‍රි .පූ. 221 සිට ක්‍රි. පූ. 146 දක්වා වූ කාලය තුළ ජනාවාස පිළිබඳ කථා පුවත ඔහු විසින් ගෙනහැර දැක්විය. අලංකාර ශාස්ත්‍ර ආකෘතියෙන් බැහැර වූ ඔහු ආශ්චර්ය සිද්ධීන් ඉතිහාසය තුළ විශ්වාස නොකළ යුතු බව පැහැදිලි කිරීමට උත්සහ ගත්තේය. ග්‍රීක ශිෂ්ටාචාරයේ බිඳවැටීම සහ රෝමයේ බලය වර්ධනය වීම ගැන මොහුගේ අවධානය යොමු විය. විශේෂයෙන්ම ඓතිහාසික සිද්ධිවලට බලපාන ලද හේතු අතර සාපේක්ෂ වැදගත්කම ඉතිහාසය තුළ නිරීක්ෂණය කිරීම පොලිබියස්ගෙන් සිදු වූ මහත් සේවාවකි. ගැඹුරු ලෙසින් නොවුව ද සිද්ධීන්ට විෂය වූ හේතුන් අවබෝධ කර ගැනීමට ඔහු ප්‍රයත්න දැරුවේය. එසේම ආචාර ධර්ම කෙරෙහි බියක් ඔහු තුළ නොවීය. සියලු දේටම වඩා හෙතෙම ඉතිහාසයෙහි සම්පූර්න අභ්‍යාසය සත්‍යය බව අවධාරණයෙන් දැක්විය.[31] ඉතිහාසයේ හේතුත්වය ගවේෂණය කිරීම සම්බන්ධයෙන් ඊ.එච්.කා ද පොලිබියස්ට වැදගත්කමක් හිමි කර දෙනු ලබයි.

ඉතිහාසයේ සිදුවීම් පිළිබඳව පවත්නා හේතුත්වය ගැන මුලින්ම යම් ක්‍රමානුකුල පියවරක් අනුගමනය කළ පළමුවන ඉතිහාසඥයා පොලිබියස් ය.[32] ඉතිහාසය සම්බන්ධයෙන් පොලිබියස්ගේ දෘෂ්ටිය හුදෙක් පන්නරය ලබන්නේ සමකාලීන දේශපාලන වෙනස්වීම්වලිනි. ග්‍රීකයෝ තම අතීත උරුමයන් සමග බිඳ වැටෙත්ම රෝමය ජයග්‍රහණය කරා ගමන් කිරීම කෙසේ වීද යන්න විචාරශීලිව විමසීමේදී අනිවාර්යෙන් අතීතය වෙත ගමන් කිරීම අහඹු සිදුවීමක් වැනිය. සමස්තයක් ලෙස ග්‍රීක ඉතිහාසකරණය ගැන සලකා බලන විට කරුණු එකතු කිරීම මත ඉතිහාසයේ හේතුත්වය ගවේෂණය කිරීම සහ එහි චක්‍රීය රටාවල් සොයා යෑම වැනි නිශ්චිත ක්ෂේත්‍රයකට සීමා වූ බව පෙනේ. එසේ නොමැතිව අතීතය සහ අනාගතය අතර කෙරෙන සංවාදයේ දී ඉතිහාසයේ කාර්යභාරය කුමක් විය යුතුද යන්න ඔවුන් සිතුවේ නැත. මේ නිසා පසුකාලීන බොහෝ ඉතිහාසඥයන් විසින් ග්‍රීක ඉතිහාසකරණ සම්ප්‍රදාය විවේචනයට ලක් කරන ලදී. ග්‍රීකයන්ට ඉතිහාසය පිළිබඳව අර්ථ නිරූපණයක් නොමැති බව බොහෝ අයගේ පිළිගැනීම විය. ඊ. එච්. කා පවසන්නේ ද සම්භාව්‍ය ග්‍රීක රෝම ශිෂ්ටාචාරයද මූලික වශයෙන් නිර්ඓතිහාසික (Unhistorical) වූ බවයි.

**ආගමික ඉතිහාස රචනා සම්ප්‍රදාය**

ආගමික ඉතිහාස රචනා සම්ප්‍රදාය, ඉතිහාසයේ ස්වභාවය ගැන පවතින සාකච්ඡාවේ තවත් ප්‍රධාන ලක්ෂණයකි. අතීත සිදුවීම් සමුදාය ආගමික මුහුණුවරකින් ඉදිරිපත් කිරීම හෝ රචනා කිරීම මෙහි ස්වාභාවය යි. පැරණි ශිෂ්ටාචාර ආශ්‍රිතව වර්ධනය වූ ආගමික ඉතිහාස රචනා සම්ප්‍රදාය වර්තමානයේ වුව ද පැහැදිලිව දැක ගත හැකි සුලභ ලක්‍ෂණයකි. එහෙත් සමස්ත අතීතයම ආගමික දෘෂ්ටියකින් දැකීම ඉතා පැරණි රචනා සම්ප්‍රදායකි. තම අතීතය ආගමික රාමුවකින් දැකිමේ දී බටහිර ලෝකය දෙවියන් පදනම් කර ගැනීම ත් චීනය කොන්ෆියුසියස් දහම පදනම් කර ගැනීම ත් නිදසුන් ලෙස පෙන්වා දිය හැකිය. ලංකාවේ වංශකතා සාහිත්‍යය බුදු දහම මූලික කර ගැනිම ද මීට සාපේක්‍ෂව විමසා බැලීමට හැකිය. ඉස්ලාමීය ඉතිහාසකරණය ද ආගමික දෘෂ්ටියට අනුව ලේඛනගත වූයේ වෙයි.

දේවවාදී දෘෂ්ටියෙන් ඉතිහාස විවරණය මුලින්ම දක්නට ලැබෙන්නේ පර්සියානු ආධිරාජ්‍ය ආකෘතිය තුළයි. එනම් යුදෙව් ඉතිහාස රචනා සම්ප්‍රදායයි. යුදෙව්වන්ට දැනුම

[31] ටාර්න් ඩබ්. ඩබ්. 1971 පිටු 237

[32] කා.ඊ.එච්. 1971, පිටුව 91

ලැබෙන්නේ ඊජිප්තුවෙන් හා බැබිලෝනියාවෙන්ය. දේවවාදී දෘෂ්ටියෙන් මුලින්ම ලියවෙන ලේඛන රෝම සම්ප්‍රදායට සම්බන්ධ නොවුණි. එහෙත් පසුකාලීනව ක්‍රිස්තියානි ඉතිහාස රචනා සම්ප්‍රදාය වර්ධනය වූයේ රෝමය මූලික කරගත් මධ්‍යතන යුරෝපා සමයේය.

දේවවාදී දෘෂ්ටියෙන් ඉතිහාසය ලියවී ඇති ඉතා පැරණි ග්‍රන්ථයක් ලෙස ශුද්ධ බයිබලයේ පරණ ගිවිසුමට (Old Testament)[33] ලැබෙන්නේ ප්‍රධාන තැනකි. ලංකාවේ පැරණි ඉතිහාසය ලියවී ඇති වංශකතාවක් ලෙස මහාවංශය සලකා බැලුව ද පොදුවේ ආගමික ඉතිහාස රචනා සම්ප්‍රදායෙහි සමාන ලක්‍ෂණ දක්නට ලැබේ. ආගමික ඉතිහාස රචනයේ ස්වාභාවය පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී ශුද්ධ බයිබලයේ පරණ ගිවිසුම සහ ලංකාවේ පැරණි ඉතිහාසය ලියැවී ඇති මහාවංශය සංසන්දනාත්මකව විමර්ශනය කිරීමට හැකිය. මන්ද මේ ග්‍රන්ථ දෙක සංසන්දනාත්මකව විමර්ශනය කිරීමෙන් ආගමික දෘෂ්ටිවාද, විස්වාස, පිළිගැනීම් සහ සමාජ සම්මත ආකල්ප ආදියේ ස්වාභාවය ආගමික ඉතිහාස රචනාව මත ගොඩනගා ඇති ආකාරයෙහි එක්තරා සමාන ලක්ෂණ නිරීක්ෂණය කිරීමට හැකි බැවිනි.

මේ ආගමික ග්‍රන්ථවල ලිඛිත මිථ්‍යා මතවාදවලට ඊට සමකාලීන වශයෙන් යම් වැදගත්කමක් පවතින්නට ඇත. විශේෂයෙන්ම ආගම පදනම් කරගත් ජාතික සංස්කෘතියක් නිර්මාණය කිරීම සඳහා මේ ග්‍රන්ථ බලපෑම් කර ඇත. නිර්මාණාත්මක සහ සාහිත්‍යමය රචනා සම්ප්‍රදායක් දක්නට ලැබෙන මේ ග්‍රන්ථවල මිත්‍යා කථා අනුසාරයෙන් ඉතිහාස සිදුවීම් නිර්මාණය කර ඇත.

මහාවංශයට අනුව ලංකාවට බුදුන් වැඩම කිරීම හා විජයගේ පැමිණීම නිර්මාණය වී ඇත්තේ මිථ්‍යා කථා අනුසාරයෙන්ය. එමෙන්ම පරණ ගිවිසුමට අනුව දෙවියන් ලෝකය මැවීම සහ මෝසෙස්[34] මගින් මිසරයෙන් ඊශ්‍රායල්වරු මුදවා ගැනීම නිර්මාණය කර ඇත්තේ මිථ්‍යා කථා අනුසාරයෙන්ය. මහාවංශයට අනුව ලංකාවට ප්‍රථම වතාවට බුදුන් මෙහි වැඩම කරන විට මෙහි සිටියේ යක්ෂ, නාග, දේව ආදී අවිචාරවත් ගෝත්‍රික කොටස්ය. යකුන් විසින් පිරුණු ලක්දිව යක්ෂයෝ බැහැර කිරීම සඳහා බුදුන් මෙහි වැඩම කළ බව සඳහන් වේ.[35] යකුන් තුළ ඇති වූ මරණ බිය නිසා බුදුන්ගෙන් අභය දානය ඉල්ලා සිටියේය. මෙසේ යකුන් දමනය කිරීම සඳහා බුදුන් වහන්සේ විසින් අහස් කුස වැඩ සිටිමින් මහා වර්ෂාවන් සැඩ සුළං, ගල් වැසි, අග්නි ජාලා යොදා ගත්තේය. මේ සියල්ල සිද්ධවන්නේ මැවීම් ලෙසිනි. පැරණි තෙස්තමේන්තුවේ දෙවියන්ගේ අණ පරිදි මෝසෙස් මිසරයන්ට විරුද්ධව යුද වදින්නේද මෙසේ දෙවියන්ගෙන් ලැබුණු මැවුම්කාරක බයක් සහිතවය. මිසරයන්ගේ ගංගා ඇළ දොළ විල් සියලු දිය පොකුණුවල ජලය වෙනුවට ලේ ඇතිවීම මැසි වර්ගයන් ලවා පහරදීම මැඩියන් හා කිනිතුල්ලන් මගින් හිංසා කිරීම ගව වසංගත ඇති කිරීම ගල් වැසි වැස්සවීම ආදී වශයෙන් පීඩාවන් දහසක් ඇතිකොට මිසරවරු පීඩාවට පත්කොට ඊශ්‍රායල්වරු වහල්භාවයෙන් මුදවාගනී.[36] ලෝකයේ පැරණි ජනප්‍රවාද සහ සාහිත්‍යයේ සුලබ ලක්ෂණයක් වන මිත්‍යා කථා මේ ග්‍රන්ථවල පමණක් නොව ඊජිප්තු මිත්‍යා කථා, හින්දු ආගමේ මිත්‍යා පුරාණ, රාමායනය වැනි වීර කාව්‍යයන් සහ බෞද්ධ ජන කථා ආදියේ ද මැවීම් හා මිත්‍යා කථා ඇතුළත්ය.

පරණ ගිවිසුමට සහ මහාවංශයේ දක්නට ලැබෙන තවත් සමාන ලක්ෂණයක් වන්නේ ආගම සහ ජාතිය ඒකාබද්ධ කරන පුද්ගලයා ආගමේ ශාස්තෘවරයාගෙන් ආරක්‍ෂාව හා ආශීර්වාදය ලබා තිබීමයි. හිබ්‍රෘ ජනතාවගේ සංස්කෘතික ජීවිතය ගොඩනැගීමෙහි ලා මෝසෙස්ට

---

[33] බයිබලය ප්‍රධාන කොටස් දෙකකට බෙදෙන අතර එයින් ක්‍රිස්තු උපතට පෙර සකස් වී ඇති කොටස පැරණි ගිවිසුම ලෙස සැලකේ. ක්‍රිස්තු උපතට පසු කොටස අලුත් ගිවිසුම වේ. යුදෙව් ධර්ම හා නීති සංග්‍රහයක්වත් පිළිවෙත් හා සිරිත් සාම්ප්‍රදායන් පැරණි ගිවිසුමේ අන්තර්ගත වේ. යුදෙව් ජාතිය පදනම් කර ගනිමින් ඊශ්‍රායලය ගොඩනැගීම පිළිබඳ කථාන්තරය මෙහි සඳහන් වේ.

[34] හීබ්‍රෘවරු( ඊශ්‍රායෙල් ජාතිකයන්) ඊජිප්තුවේ සිට පැමිණියේ මෝසෙස්ගේ නායකත්වය යටතේය. යුදෙව් විශ්වකෝෂයට අනුව මෝසෙස් යුදෙව් ජාතියන්ගේ නේතෘවරයාය. නීතිදායකයාය, අනාගත වක්තෘන්ගේ නායකයාය. දෙවියන් වහන්සේ මුහුණට මුහුණලා හමු වූ තැනැත්තාය.

[35] **මහාවංශය** ,ප්‍රථම භාගය, පරිවර්තනය, හික්කඩුවේ සිරිසුමන හා අන්දිරිස් ද සිල්වා බටුවන්තුඩාවේ. නුගේගොඩ, 196, පිටුව 2

[36] බයිබලය, පැරණි ගිවිසුම, ශ්‍රී ලංකා බයිබල් සමාගම, කොළඹ, 1938, පිටු 81-89

පදනම් වූයේ දෙවියන් වහන්සේගෙන් ලද දස පනතය[37] මෝසෙස් දෙවියන් හා සම්මුඛ වූ තැනැත්තා විය. ඒ සඳහා ඇරයුම් ලැබුනේ ද දෙවියන්ගෙනි. දෙවියන්ගේ ඇරයුම මත ඔවුහු ඊජිප්තුවේ සිටි තම වැසියා බේරාගත් ගැලවුම්කරුවාය. මේ හා සමානවම විජය ලංකාවට පැමිණීම සහ ඊට බුදුන්ගේ ආශිර්වාදය සහ ආරක්ෂාව ලබාදීම මහාවංශයේ සඳහන් වේ. විජය ලංකාවට ගොඩබසින අවස්ථාවේ දී බුදුන් වහන්සේ පිරිනිවන් මංචකයේ සිටි බව මහාවංශයේ සඳහන් වේ. මෙහිදි විජය ලංකාවට ගොඩබසින බව බුදුන් වහන්සේ දිවැසින් දැක ඔවුන් ආරක්ෂා කිරීමේ කාර්යය ශක්‍රයාට පැවරීය. තම ධර්මය ලංකාවේ පිහිටුවන බවත් ඒ සඳහා ඔවුන්ට ආරක්ෂාව දීම හා ආශිර්වාද කිරීමට කටයුතු කරන බවත් ඔහු පැවසීය.[38] මෙහි ප්‍රතිඵලයක් වශයෙන් උපුල්වන් දේවිය දිවයිනට පැමිණි විජය ඇතුළු පිරිසට ආමන්ත්‍රණය කොට මෙය ලක්දිව බවත් මිනිසුන් මෙහි නොමැති බවත්, නමුත් කිසිවෙකුට බිය නොවිය යුතු බවත් ප්‍රකාශකර පිරිත් පැන් ඉස පිරිත් නූල් බැඳ ආරක්ෂාව සැලසීය.[39] මේ ආකාරයෙන් ඉහත ග්‍රන්ථ පරීක්ෂා කිරීමේ දී පැහැදිලිවෙන ප්‍රධාන කරුණකි, එනම් ආගමික දෘෂ්ටිවාද පදනම් කරගනිමින් ඉතිහාසය රචනා කිරීම හා ඊට නිර්මාණාත්මක අර්ථකථනයක් ගෙනදෙන බව. එමෙන්ම යුදෙව්වන්ගේ හා කිතුනුවන්ගේ ඉතිහාසය පිළිබඳ දැක්ම සාධයතාවාදී (Teleology) ස්වරූපයක් ගන්නා බව ඊ.එච්. කා ගේ අදහසයි.[40] ඔහුගේ දැක්මට අනුව ඉතිහාසයට සුබවාදී දෘෂ්ටියක් සම්පාදනය කිරීමට සහ ඊට නව අර්ථකථනයක් දීමට ක්‍රිස්තියානි ඉතිහාසකරණයට හැකි වූ බවයි. එනම් ඉතිහාසය යන්න සමකාලීන වශයෙන් නිර්මාණය කිරීමට හැකි දෙයක් බවට පරිවර්තනය විමයි.

මුළුමනින්ම ඉතිහාසය දේවවාදීව ලිවීම හා කියැවීම ආරම්භ වන්නේ යුරෝපයේ මධ්‍යතන අවධියේ ක්‍රිස්තියානි ඉතිහාස රචනා සම්ප්‍රදාය තුළයි. Buckle වැනි දේවවාදී විද්‍යාඥයන් සමස්ත ඉතිහාසයම දේවියන්ට අනුව තීරණය කළේය. කෙසේ වෙතත් ඉතිහාසය තුළ දෙවියන් වහන්සේගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ මූලික වෙනස පැමිණියේ පරණ තෙස්තමේන්තුවේ දෘෂ්ටියට සාපේක්ෂවය.[41] නමුත් පැරණි ග්‍රීක ඉතිහාසකරණ සම්ප්‍රදායෙන් ක්‍රිස්තියානි ඉතිහාස සම්ප්‍රදාය වෙන් කර හඳුනා ගනු ලබන්නේ මධ්‍යතන අවධියට සම්බන්ධ නිසා ය.

ක්‍රිස්තියානිය රෝම අධිරාජ්‍යය පුරා ව්‍යාප්ත වීමත් අධිරාජ්‍යවරු ක්‍රිස්තියානිය වැළඳ ගැනීමත් නිසා රෝමය නිරායාසයෙන් ක්‍රිස්තියානි අධිරාජ්‍යයක් බවට පත්විය. පූර්ණ වශයෙන් කතෝලික සංවිධානයේ ආධිපත්‍යය මත රෝමය නිර්මාණය විය. සම්භාව්‍ය ග්‍රික රෝම ශිෂ්ටාචාරයේ පූර්ණ බිඳවැටීමක් ලෙස සැලකීමට හැකි මේ කාලපරිච්ඡේදය යුරෝපයේ මධ්‍යතන යුගය හෙවත් ශුද්ධ රෝම අධිරාජ්‍යය ලෙස හඳුනා ගනු ලබයි. මේ අවධියේ දී යුරෝපය ග්‍රීක දැනුම් සම්ප්‍රදායෙන් මිදී ක්‍රිස්තියානි මූලධර්ම හා ආචාරධර්ම පද්ධතියක් තුළ නිර්මාණය විය. සමකාලීන ඇති වූ මතවාද හා දර්ශනය ද ක්‍රිස්තියානි ආගමික දෘෂ්ටිය මත පදනම් වී පැවතුණි. මේ නිසාම මධ්‍යතන යුගයේ ඉතිහාසය පිළිබඳ කියවීම ද ක්‍රිස්තියානි ආගම කේන්ද්‍ර කර ගත්තේ වේ. ඉතිහාසයේ ආකෘතිය හා සදාචාරය දේව යුක්තිවාදයට අනුව ව්‍යූහගත විය. ක්‍රිස්තියානි ඉතිහාස රචකයාගේ අවශ්‍යතාවය වූයේ ආගමික සභාවෙහි ස්වාධීනත්වය ගොඩනැගිමට හා ශුද්ධ රෝම අධිරාජ්‍යයේ ස්වෛරීභාවය උදෙසා සාධනීය ඉතිහාසයක් නිර්මාණය කිරීමයි. එසේ නොමැතිව ඉතිහාසය ශාස්ත්‍රියව අධ්‍යයනය කරමින් අතීත, වර්තමාන සහ අනාගත යන කාලත්‍රයට නව අර්ථකථනයක් සම්පාදනය කිරීම නොවේ. ශුද්ධ රෝම අධිරාජ්‍යයේ කැපී පෙනෙන බුද්ධිමතුන් සිව්දෙනෙක් පිළිබඳවද සඳහන් වෙයි. ඔවුන් නම් ඇම්බ්‍රෝස් ජෙරොම්, ශාන්ත ඔගස්තීන් සහ මහා ග්‍රෙගරි පාප්තුමාය. මේ ක්‍රිස්තියානි ආගමික චින්තකයෝ රෝම අධිරාජ්‍ය නව ආකෘතියක් තුළ සකස් කිරීමට උත්සහා ගත්හ. බර්ට්‍රන්ඩ් රසල්ගේ බටහිර දර්ශනය ඉතිහාස කෘතියේ මොවුන් ගැන සඳහන් වන්නේ ක්‍රිස්තියානි සභාව

---

37 බයිබලය, පැරණි ගිවිසුම, ශ්‍රී ලංකා බයිබල් සමාගම, කොළඹ, 1938, පිටු 74

38 මහාවංශය, 1996, පිටුව 32.

39 එම, පිටුව 32.

40 කා.ඊ.එච්. 1977 පිටුව 123

41 Breisach, Erngt 1994, P.77-78

සහ රාජ්‍ය අතර සම්බන්ධතාවය ආගමානුකූල විකල්පය නිර්මාණය කළ බුද්ධිමතුන් ලෙසයි.[42] මෙයින් පැහැදිලිව පෙන්නුම් කරන්නේ සමකාලීන ශුද්ධ රෝම ආධිරාජ්‍යයේ පැවැත්ම ආරක්ෂා කර ගැනීම පිණිස ආගමානුකූල තාර්කික සංකල්ප නිර්මාණය කිරීමට ගත් උත්සාහයකි. තවදුරටත් එහි හිදැස් වසාලනු පිණිස ඉතිහාසය ඌන පූර්ණය කර ගත්තේය. අතීතය හැදෑරීම සම්බන්ධයෙන් තාර්කිකව කරණු ගවේෂණය කිරීමක් හෝ ලේඛන ගත කිරීමක් ක්‍රිස්තියානි ඉතිහාසකරණය තුළ දක්නට නොලැබේ.

ඉතිහාසය පිළිබඳ ක්‍රිස්තියානි දර්ශනය වනාහි මිනිසාගේ ආරම්භයත් අවසානයත් අතර ඇති කරුණු විමර්ශනයට භාජනය කරන අතර ඒ විමසුම කාලයට පමණක් සීමා නොකර මිනිසාගේ පැවැත්මට පෙර සිදු වූ ද අවසානයට පසුව සිදුවන්නා වූ ද සාධක රාශියක් පසුබිම් කරගෙන කරුණු පහදා ගැනීමට උත්සහ දැරීමේ ප්‍රයත්නයකි. එය කාලීන සිදුවීම් සදාකාලික දෘෂ්ටියකින් ද ලෞකික දෙය ලෝකෝත්තර බැල්මකින් ද මානව හැකියාවන් දිව්‍යමය වූ ප්‍රබෝධයකින් ද ක්‍රියාත්මක වන අයුරු නැරඹීමකි.[43] මෙහිදී වඩාත් වැදගත් වන්නේ කාලීන සිදුවීම් සදාකාලික දෘෂ්ටියකින් සහ මිනිස් ක්‍රියාකාරකම් ලෝකෝත්තර දිව්‍යමය වූ මානයකින් පදනම් විරහිතව ඉතිහාසය ලෙස ගොඩනැගීමයි. මේ අනුව ඇත්තෙන්ම ඉතිහාසය වූ කලී දෙවියන්ගේ කැමැත්ත මත විනිශ්චය වූවක් මිස අතීත මිනිස් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් නොවේ.

ඉතිහාසය ගැන ශාන්ත ඔගස්තීන්ගේ සිද්ධාන්ත හෙළිවන්නේ The City of God නම් ග්‍රන්ථයෙන්ය. දෙවියන්ගේ රාජ්‍යයෙහි ස්වාභාවය ඔහු මේ ග්‍රන්ථයේ සඳහන් කරනු ලබයි. ලෞකික රාජ්‍යයට වෙනස්ව යමින් නමුත් ලෝකෝත්තර රාජ්‍ය සංකල්පයක් පිළිබඳව අදහසක් ඔහු නිර්මාණය කළේය. ග්‍රීකයන් ස්වාභාවික රීතිය ගැන තැබූ මතයට මොහු විරුද්ධ වූ අතර ඔහු එය ප්‍රතික්ෂේප කළේය. ලෝකයේ වයස අවුරුදු හය දහසහකට අඩුය. ඇතැම් දාර්ශනිකයන් සලකන පරිදි ඉතිහාසය චක්‍රීය නැත. තර්ක බුද්ධිය මගින් සොයාගත හැකි දෑ ඇත. එහෙත් සම්පූර්ණ වැඩිදුර ආගමික ඥානය ලියවිලි කෙරෙන්ම අප දත යුතුය.[44] තාර්තික පදනම් ඉක්මවා ගිය ආගමික විශ්වාසයන් මූලික කරගත් දැක්මක් තුලින් ඉතිහාසය දැකීම ක්‍රිස්තියානි ඉතිසාහය රචනා සම්ප්‍රායේ සාමාන්‍ය ලක්ෂණයයි. නමුත් දේවවාදී දෘෂ්ටියකින් ඉතිහාස නිර්මාණය කිරීම සඳහා ක්‍රිස්තියානි ඉතිහාසඥයා තර්කානුකූල විධි ක්‍රමයක් භාවිතා නොකළේ යැයි කීමට නොහැකිය.

**නිගමනය**

අතීතය සහ ආඛ්‍යාන, ඉතිහාසයේ ස්වභාවය පිළිබඳ මුල්කාලීන අදහස සහ එහි න්‍යායාත්මක පසුබිම පිළිබඳ විමසීමේ දී පැරණි පර්සියානු, ග්‍රීක, චීන සහ ආගමික (යුදෙව්) ඉතිහාසකරණයට සීමාවෙමින් පර්යේෂණ පත්‍රිකාව ඉදිරිපත් කර ඇත. මේ යටතේ විමර්ශනයට භාජනය වූයේ එකී ඉතිහාස රචනාව (ඉතිහාසකරණය - Historiograhpy) මත ඊට සමකාලීනව පැවැති බලය, ආධිපත්‍යය, පක්ෂපාතීත්වය, දෘෂ්ටිවාදය ආදී ලක්ෂණ බලපවත්වන බව පැහැදිලි කර ගැනීමයි. එමෙන්ම ඒ ඒ අවධීන් හා සබැඳි දැනුම් පද්ධතීන් ඉතිහසෙයේ ස්වභාවය වෙනස් කිරීමට බලපෑම් කර ඇති ආකාරය පරීක්ෂා කරන ලදි. පැරණි ග්‍රීක, පර්සියානු, චීන ඉතිහාසකරණයට ඊට සමකාලීනව පැවති චින්තනය සහ ආචාර ධර්ම බලපෑම් කළ ආකාරයත් ආගමික (යුදෙව්) ඉතිහාසකරණයට ඊට සමකාලීනව පැවති ආගමික දෘෂ්ටිවාද සහ බලය සහ ආධිපත්‍යය බලපෑම් කළ ආකාරයත් පැහැදිලි කරන ලදි. මේ අනුව ලිපියේ ප්‍රධාන අරමුණ වූ සමාජයීය විද්‍යා ශික්ෂණ සම්ප්‍රදායක් ලෙස ඉතිහාසයේ ස්වභාවය සහ එහි අර්ථකථනය පිළිබඳව විමර්ශනය කිරීම මේ පර්යේෂණ පත්‍රිකාව යටතේ ඉදිරිපත් කරන ලදි.

---

42 රසල් බට්රන්, **බටහිර දර්ශන ඉතිහාසය**, කොළඹ, 1970, පිටුව. 366

43 ප්‍රනාන්දු ඇලේක්ස්, ජේ. **ඊශ්‍රායෙල් ඉතිහාසයේ විකාශනය**, ගුණසේන, කොළඹ,1987, පිටුව 12

44 රසල් බට්රන්, 1970, පිටුව. 391-392

**සමුද්දේශ**


කලන්සූරිය. ඒ.ඩී.පී. **නූතන බටහිර දර්ශනය**, කොළඹ, 1973

කා. ඊ.එච්, **ඉතිහාසය යනු කුමක්ද**, පරිවර්තනය, කම්කරු ගොවි ආයතනය, මහනුවර. 1973

ගුණසිංහ නිව්ටන්, **ඇන්තෝනිඕ ග්‍රාම්ස්චි කෙටි හැඳින්වීමක්**, කම්කරු ගොවි ආයතනය, මහනුවර. 1986

ජයවර්ධන කුමාරි, **විද්‍යාත්මක සමාජවාදය කෙටි හැඳින්වීමක්**, දියැස, රාජගිරිය, 1995

ජී. සී. මෙන්ඩිස්, **ලංකා ඉතිහාසයේ ප්‍රධාන බලවේග,** කොළඹ, 1973

දිසානායක විජය, **රාවණා- විජය මිත්‍යාවක්ද**, කොළඹ සරසවි ප්‍රින්ටස්, 1981

රසල් බට්රන්ඩ්, **බටහිර දර්ශන ඉතිහාසය**, කොළඹ, 1970

ටාර්ස් ඩබ්. ඩබ්., **හෙලනිස්තික ශිෂ්ටාචාරය**, කොළඹ, 1971

ප්‍රනාන්දු ඇලෙක්ස්, ජේ. **ඊශ්‍රායෙල් ඉතිහාසයේ විකාශන**, ගුණසේන, කොළඹ, 1987

මල්ලිකාරච්චි ඩෙස්මන්, **සමාජ විද්‍යා විමර්ශන**, සමාජ විද්‍යා සංගමය, පේරාදෙණිය, 2000

මල්ලිකාරච්චි ඩෙස්මන්, **Philosophy Monthly Buein**, " Readng History",Department of Phisohy, University of Peradeniya, 2001 August.

Collingwood, R.G. **The Idea of History**, revised edition, Oxford University, New York, 1993

Breisach Ernst, **Historiography- Ancient, medievel, Modern**, 2nd Edition, University of Chicago, Chicago and London, 1994

Bunzil Martin, **Real History**, **Reflections in historical practice**, Routledge London and New York, 1997

Jenkins Keith, (Edi.).**The Pstmodern history Reader**, Routledge, London and New York, 1997

Jenkins Keith, **Re- thinking History**, Routledge, London and New York, 1991.

Munslow Alun, **Deconstructing History**, Rutledge, London and New York, 1997

Momigliano Arnaldo, **The Classical Foundatins of Modern Historography**, University of California, Oxford, 1990

Yang Hsien, Yiand Gladys Yang, **Selections from Records of the Historian Freign Languages**, Peking, 1979


## ප්‍රාථමික මූලාශ්‍රය


**මහාවංශය**, පරිවර්තනය, හික්කඩුවේ සිරිසුමන හා අන්දිරිස් ද සිල්වා බටුවන්තුඩාවේ, ගෙඩගේ, 1996

**බයිබලය**, පැරණි ගිවිසුම, ශ්‍රී ලංකා බයිබල් සමාගම, කොළඹ, 1938

**කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය**, ප්‍රගති, මොස්කව්, 1980

**තෝරාගත් කෘති,** වෙළුම 1. මාක්ස් සහ එංගල්ස් , ප්‍රගති, මොස්කව්, 1982

**පවුල පෞද්ගලික දේපොළ හා රජය ඇතිවූ සැටි**, එංගල්ස්, ප්‍රගති මොස්කව්. 1979

ආඛ්‍යාන narrations
**Volume 06 | Issue 02 | July - December 2021 | Article 06**
**ISSN 2478-0642**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

# ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රභවය, විකාසනය හා 1971 පළමු සන්නද්ධ අරගලය පිළිබඳ විමර්ශනයක්

දේව මයිකල් ද සිල්වා[45]
B.A(SP), M.Phil, PhD
devamichael@live.com

## සාරසංක්ෂේපය

ශ්‍රී ලංකාවේ මෑත කාලීන දේශපාලන ඉතිහාසය තුළ ආණ්ඩු බලය ලබා ගැනීම අරමුණු කරගෙන දේශපාලනයේ නිරත වූ පක්ෂයක් වශයෙන් ජනතා විමුක්ති පෙරමුණ (ජ.වි.පෙ.) හැඳින්විය හැකිය. නිදහසින් පසුව මෙරට පැවති දේශපාලන, සමාජ, ආර්ථික, සංස්කෘතික ගැටලු විසඳීමට පැවති දේශපාලන පක්ෂ සතුව ප්‍රතිපත්තියක් හා වැඩපිළිවෙලක් දක්නට ලැබුණු ද තවදුරටත් සමාජයේ නොවිසඳුණු ගැටලු පැවති නිසා, ජනතා විමුක්ති පෙරමුණ නව විප්ලවකාරී දේශපාලනයකට අවතීර්ණ විය. ශ්‍රී ලංකාවට බ්‍රිතාන්‍යයන් විසින් නිදහස ලබා දී දශක දෙකකට පසුව පැවති ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන රටාව බිඳ දමමින් සන්නද්ධ අරගලයක් තුළින් සමාජවාදී පාලන ක්‍රමයක් මෙරට තුළ ස්ථාපිත කිරීමට ජනතා විමුක්ති පෙරමුණු උත්සාහ දරා ඇත. ''ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පක්ෂ ක්‍රමයක් පැවති ශ්‍රී ලංකාව තුළ විප්ලකාරී පක්ෂයක් ලෙස ජනතා විමුක්ති පෙරමුණ බිහි වූයේ ඇයි ද? යන පර්යේෂණ ගැටලුව මෙම අධ්‍යයනය තුළින් සාකච්ඡාවට ලක් වේ. සමාජවාදී පාලන ක්‍රමයක් බිහි කිරීම මගින් ශ්‍රී ලංකාවේ දේශපාලනය නව දිශානතියකට රැගෙන යෑමට මෙම පක්ෂය උත්සාහ දරා ඇත. පවතින දේශපාලන රටාවට එරෙහිව ජනතාව තුළ විප්ලවකාරී හැඟීම් ජනිත කරවමින් විමුක්ති සටනක් ඇති කිරීමට ජ.වි.පෙ.ට බල පෑ හේතු අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ වැදගත්කම වේ. මෙම පර්යේෂණය සඳහා දත්ත ඒකරාශී කිරීමට පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදය ප්‍රධාන වශයෙන් යොදා ගන්නා ලදී. ජ.වි.පෙ. බිහි වීමට ආසන්න සමයේ පැවති සමාජ, ආර්ථික, දේශපාලන ගැටලු විශ්ලේෂණය කිරීමට පුස්තකාල සමීක්ෂණයෙන් හඳුනා ගත් දත්ත ප්‍රයෝජනවත් විය. ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරී දේශපාලන සාමාජිකයන්ගෙන් සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය ඔස්සේ ලබා ගත් ගුණාත්මක දත්ත ද මෙම පර්යේෂණය සඳහා යොදා ගන්නා ලදී. නිදහසින් පසු යුගයේ ශ්‍රී ලංකාවේ පැවති සමාජ, ආර්ථික, දේශපාලන

[45] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

පීඩනයට එරෙහිව කරලියට පැමිණි දේශපාලන බලවේගයක් ලෙස ජ.වි.පෙ. බිහි වූ බව හඳුනාගත හැකිය.

**ප්‍රමුඛ පදඃ** ජනතා විමුක්ති පෙරමුණ, සමාජවාදය, විප්ලවය, දේශපාලන ක්‍රියාකාරකම්, සන්නද්ධ අරගලය

**01 හැඳින්වීම**

එක්දහස් නවසිය හතළිස් අටේ දී අර්ධ රාජ්‍ය හෙවත් ඩොමීනියන් නිදහස ලැබීමෙන් පසු දේශීය පාලකයන් යටතේ ශ්‍රී ලංකාව තුළ පාර්ලිමේන්තු ක්‍රමය දශක ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක විය. එක්සත් ජාතික පක්‍ෂය හා ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂය ප්‍රමුඛ සමගි සන්ධාන වරින් වර දිගින් දිගට ම බලයට පත්වීමේ ප්‍රවණතාවක් දැකිය හැකි විය. මෙලෙස ධනේශ්වර දේශපාලන පක්ෂ දෙක බලයට පත්වුව ද ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික ගැටලු විසඳීමට එම පක්‍ෂවලට නොහැකි විය. පාර්ලිමේන්තු ක්‍රමය ප්‍රශ්නවලට විසඳුම් ලබා නොදුන්නා සේම එම ක්‍රමය තවදුරටත් අධිපති පංතියේ අවශ්‍යතා ඉෂ්ට කරන්නක් බවට පත් වී තිබුණේය. මේ තත්ත්වය පීඩිත තරුණ කොටස් තුළ කලකිරීමක් ඇති කිරීමට හේතු විය. පැවතියා වූ වාමාංශික දේශපාලන පක්ෂ හා සංවිධාන ද රටේ ප්‍රශ්නවලට සාර්ථක විසඳුම් සෙවීමට සමර්ථ නොවූයෙන් සියලු පක්ෂ හා සංවිධාන ජනතා අපේක්ෂා ඉටු නොකරන තත්ත්වයකට පත්ව තිබුණි. මේ තත්ත්වයෙන් ගොඩ ඒම සඳහා ජනතාවට මග පෙන්වන සැබෑ දේශපාලන පක්ෂයක් පිළිබඳ නව අපේක්‍ෂාවකින් සමාජය පෙළෙමින් සිටියේය.

සමාජය වූ කලී පුද්ගල සමවායකි. ඒ අනුව පුද්ගලයින්ගේ නිරන්තර එකතුවීමෙන් සමාජයේ විවිධ සංවිධාන බිහි වේ. එසේ බිහිවන්නා වූ සියලු සංවිධානයන්ට නිතැතින්ම යම් අරමුණක් වේ. මෙලෙස බිහිවන්නා වූ සමාජ සංවිධාන අතර දේශපාලන පක්ෂයක අරමුණ වන්නේ තම පක්ෂය වෙත රාජ්‍ය බලය ලබාගැනීම හෝ රාජ්‍ය බලයට කුමන ආකාරයකින් හෝ හවුල්වීම වේ. කෙසේ නමුත් පවතින පංති සමාජයේ දී සෑම දේශපාලන පක්ෂයක්ම කිසියම් පන්තියක් නියෝජනය කරන පංති සංවිධානයක් වන්නේය. මේ තත්ත්වය තුළ ජනතා විමුක්ති පෙරමුණ නිර්ධන පංතියට රාජ්‍ය බලය ලබාගැනීම උදෙසා නිර්ධන පංතියේ පංති සංවිධානයක් වශයෙන් ශ්‍රී ලාංකේය දේශපාලනය තුළ බිහි වූවක් වශයෙන් හඳුන්වා දීම වඩාත් නිවැරැදිය. (සම්මුඛ සාකච්ඡාව, ජිනදාස කිතුලගොඩ, 2016.10.12)

එකී පක්ෂය බිහිවීමට බලපෑ ඓතිහාසික සමාජ, ආර්ථික, දේශපාලන හේතු සාධක විමසා බලන විට එය එකවර බිහි වූවක් නොවන බව පෙනේ. කාල් මාක්ස් කියා ඇති පරිදි ''ජුපිටර්ගේ හිසින් මිනර්වා දෙවිදුව බිහි වූවාක් මෙන් පුද්ගලයින්ගේ සිත් තුළ අදහස් හෝ මතවාද බිහිවන්නේ නැත'' (ද සිල්වා, 2016ඃ 167-184) පුරාණ ග්‍රීක මිත්‍යා කතා අනුව 'මිනර්වා' බුද්ධියට අධිපති දෙවිදුවය. ඇයගේ පියා වූ ජුපිටර් තද කල්පනාවේ යෙදී සිටින අවස්ථාවක ඔහුගේ හිසින් මිනර්වා දෙවිදුව පහළ වී ඇත. (Hornblower and Antony, 2003:90) අදහස් හා මතවාද හුදු පුද්ගල නිර්මාණ නොවේ. ඒවා ඓතිහාසික, සමාජ, ආර්ථික සාධක තුළින් බිහි වේ. මෙනයින් බලන කල ජනතා විමුක්ති පෙරමුණ ද අහම්බෙන් හෝ පුද්ගලයෙකුගේ හිතුවක්කාරකමක ප්‍රතිඵලයක් ලෙස හෝ බිහි වූවක් නොව පැවතියා වූ ඓතිහාසික, සමාජ,

ආර්ථික හා දේශපාලන හේතු විසින් නිර්මාණය කරනු ලැබූවකි. මූලික වශයෙන් එම හේතු ජාතික හා ජාත්‍යන්තර හේතු වශයෙන් වර්ග කළ හැකිය.

රටක් දේශපාලන හා සමාජ ආර්ථික වශයෙන් අර්බුදයට මුහුණ දෙන විට ඉන් මුලින්ම සලිත වන්නේ තරුණ ප්‍රජාව ය. එක්දහස් නවසිය හැටේ දශකයේ දෙවන භාගය වන විට පශ්චාත් යටත්විජිත ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික අර්බුදය නව අදියරකට ළං වෙමින් තිබුණි. ඒ අනුව සංස්කෘතික, භාෂාමය, ආධ්‍යාපනික, කුල යනාදි සමාජ අසාධාරණකම් රැසක් ද සමාජීය වශයෙන් ජ.වි.පෙ. බිහිවීම කෙරෙහි බලපාන ලදි.

## 02. අරමුණු සහ වැදගත්කම

ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ අතුරින් ජ.වි.පෙ. ට සුවිශේෂී වැදගත්කමක් හිමි වන්නේ එම පක්ෂයේ විප්ලවීය ක්‍රියාමාර්ග හේතුවෙනි. ශ්‍රී ලංකාවේ ජනතා අපේක්ෂා පැවති ආණ්ඩුවලින් ඉටු නොවීම හා පැවති සමාජ අසහනය දුරු කිරීමට නව දේශපාලන ව්‍යාපාරයක් ලෙස ජ.වි.පෙ. බිහි වූයේ කෙසේද? යන්න හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ.

1931 සර්වජන ඡන්ද බලය ලැබීමේ සිට ශ්‍රී ලංකාවේ දේශපාලන රටාවේ ක්‍රමික විකාසනයක් හා පක්ෂ ක්‍රමයක ආරම්භය සිදුවිය. නිදහස ලබන අවධිය වනවිට ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අත්දැකීම් මෙන්ම සමාජවාදී දේශපාලන ව්‍යාපාර පිළිබඳව ද යම් අවබෝධයක් මෙරට මධ්‍යම පාන්තිකයින්ට තිබුණි. ශ්‍රී ලංකාවේ නව විප්ලවීය ව්‍යාපාරයක් ලෙස පවතින රජය සන්නද්ධ විප්ලවයකින් අවසන් කිරීම අරමුණු කරගෙන බිහි වූ ජනතා විමුක්ති ව්‍යාපාරයේ මූලාරම්භය පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ වැදගත්කමකි. ශ්‍රී ලංකාවේ ජනතාවට දේශපාලන විප්ලවය පිළිබඳව අත්දැකීම් නොතිබූ පසුබිමක, ඒ සඳහා ජනතාව මෙහෙයැවීමට ජනතා විමුක්ති පෙරමුණට හැකි වූයේ කෙසේද? යන්න හඳුනා ගැනීමට මෙම අධ්‍යයනයෙන් උත්සාහ දැරීම ද අධ්‍යයනයේ තවත් වැදගත්කමක් ලෙස හැඳින්විය හැකිය. ජනතා විමුක්ති පෙරමුණ බිහිවීමට බලපෑ හේතු හඳුනාගෙන ඒවා විග්‍රහ කිරීම මෙම අධ්‍යයනය මගින් සිදුකර තිබීම ද අධ්‍යයන වැදගත්කම ඉහළ නැංවීමට හේතු වේ.

## 03. පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයේදී දත්ත ඒකරාශී කිරීම සඳහා පර්යේෂණ ක්‍රමවේදය ලෙස ප්‍රධාන වශයෙන් යොදා ගන්නා ලද්දේ පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදය වේ. ජනතා විමුක්ති පෙරමුණ බිහිවීමට පසුබිම් වූ හේතු හඳුනා ගැනීම සඳහා සමකාලීන විචාර කෘති, පර්යේෂණ ලිපි, කොමිෂන් සභා වාර්තා, එම පක්ෂයේ ප්‍රකාශන, අධ්‍යයනය හා ඒවායේ දත්ත හඳුනා ගැනීම සිදු කරන ලදී. සමකාලීන පුවත්පත් වාර්තා, අන්තර්ජාල ප්‍රකාශවල දැක්වෙන සාක්ෂි ද මෙම අධ්‍යයනයට යොදා ගන්නා ලදී. ජනතා විමුක්ති පෙරමුණේ බිහිවීම හා විකාසයට අදාළ සාක්ෂි සමාලෝචනය කරමින් අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමවේදය ද (Content Analysis) මෙහිදී යොදා ගන්නා ලදී. සමකාලීන දේශපාලන අත්දැකීම් සහිත පක්ෂ සාමාජිකයන්ගෙන් සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය යටතේ හඳුනාගත් ගුණාත්මක දත්ත ද මෙම පර්යේෂණය සඳහා යොදා ගෙන ඇත. පුස්තකාල සමීක්ෂණය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය යටතේ එකතු කරන ලද දත්ත සමාජ විද්‍යාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ විග්‍රහ කිරීම සිදුවිය. සමාන දත්ත සමවර්ගීය ලෙස

විග්‍රහ කරමින්, ජනතා විමුක්ති පෙරමුණ බිහිවීමට බලපෑ හේතු අනුමාතෘකා ලෙස පෙළ ගස්වා මෙම අධ්‍යයනය සිදු කොට ඇත.

## 04. විමර්ශනය

ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රභවය සහ විකාසනය පිළිබඳව කරුණු අධ්‍යයනයේ දී සමකාලීන සමාජ, ආර්ථික, දේශපාලන ආදි විවිධ ක්ෂේත්‍රවලට අවධානය යොමු කිරීමට සිදුවිය. නිදහසින් පසු යුගයේ පැවති දේශපාලන, ආර්ථික හා සමාජ අස්ථාවරත්වය, තරුණ අසහනය, ආණ්ඩුවල වැඩසටහන්වල පැවති දුර්වලතා වැනි විවිධ හේතු පොදු ජනතාවගේ සුභසාධනය හා  මහජන අපේක්ෂා බිඳ දැමීමට බලපාන ලදි. පැවති රාජ්‍යයන්ගේ දුර්වලතාවලට එරෙහිව නව දේශපාලන ව්‍යාපාරයක් ලෙස ජනතා විමුක්ති පෙරමුණේ වර්ධනයට බලපෑ හේතු පිළිබඳව උප මාතෘකා කිහිපයකින් කරුණු පෙළ ගස්වා ඇත.

### 4.1 සමාජීය හේතු

ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රභවය සහ විකාශනය සඳහා සමකාලීන සමාජීය හේතු ද බලපා ඇත. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ධනපති සුළුතර පංති සංස්කෘතියේ භාෂාව, ජීවන රටාව, ඇඳුම් පැළඳුම්, හැසිරීම්, සබඳතා,සිතුම් - පැතුම් පාලිත බහුතර පංති සංස්කෘතියට වඩා හාත්පසින්ම වෙනස් වන්නට වූහ. ශ්‍රී ලාංකේය දේශපාලනය තුළ ඉංග්‍රීසි භාෂාවේ ආභාසය ප්‍රබලව හා සියුම්ව ක්‍රියාත්මක වන්නට විය. ඉංග්‍රීසියට මේ පසුබිම තුළ ප්‍රමාණවත් පහසුකම් හා සැලකිලි ලැබුණා සේම සැලකිය යුතු පිළිගැනීමකට ද ලක්විය.

මේ සමගම එදා පාලකයන් විසින් දේශපාලන මතය හැදීමට ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන අවියක් වශයෙන් යොදා ගැනීමට සමත් වූහ. (අලස්, 1978:209) ඒ තුළ දැනුම එන්නේ ඉංග්‍රීසියෙනැයි සහ මතය සදන්නේ ඉංග්‍රීසි ආකෘතියට අනුව යැයි තීරණය කර තිබුණි. මේ තත්ත්වය කරණ කොටගෙන එදා ශ්‍රී ලංකාවේ පැවතියා වූ දේශපාලන ආකෘතිය ප්‍රකාරව තීන්දු තීරණ ගැනීම සහ ඒ වෙනුවෙන් බල කෙරෙන මත හා අදහස් බිහි වී වැඩි වර්ධනය වූයේ ඉංග්‍රීසියෙන් හිතා ඉංග්‍රීසියෙන් වැඩ කරන පොදු ජනතාව අතර සිටි සුළුතර පිරිස අතරිනි. මේ කාලය තුළ ශ්‍රී ලාංකේය සමාජයේ මධ්‍යම පංතිය ප්‍රසාරණය වූ අතර එහි අතිබහුතරය උක්තව සඳහන් කළ එක්තරා කොටසකට සීමා වූහ. මොවුනට ඉහළ වරදාන හා වරප්‍රසාද හිමි වූහ. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ දරුවන්ගේ බස ඉංග්‍රීසිය වුවා සේම විශ්ව දැනුම ලබන්නේ ඉංග්‍රීසි දත් අය පමණක්මය යන මතය තහවුරු වී තිබුණි. මෙලෙස බහුතරයකට ආගන්තුක වූ ඉංග්‍රීසි බස අධිපති බස කරගත්තවුන් විසින් පොදු ජනයා නියෝජනය කළ අවවරප්‍රසාදීන් පීඩාවට පත්කර වරප්‍රසාද රැකගැනීමේ අවියක් ලෙස ඉංග්‍රීසි භාෂාව යොදා ගත්හ. එපමණක් නොව එය සමාජ පංති අතර පරතරයක් පවත්වා ගැනීමේ සාධකයක් ලෙස ද වරප්‍රසාදධාරීන් භාවිත කළහ. (සම්මුඛ සාකච්ඡා, ජිනදාස කිතුලගොඩ, 2016.10.12)

සමාජීය පීඩනය වැඩි වශයෙන් එල්ල වී තිබුණේ අධ්‍යාපන හා සුබසාධන ක්ෂේත්‍රය තුළටය. ලිපිකරු වැනි සේවා අවශ්‍යතා සැපිරීමට අධ්‍යාපන ක්‍රමය සකස් වී තිබුණි. වෘත්තිය සුදුසුකම් ලබාදීම මුල් කරගත් අධ්‍යාපන ක්‍රමයක් ක්‍රියාත්මක නොවූ අතර අධ්‍යාපන පහසුකම් කැපී යැම සහ අධ්‍යාපනයේ සමාන අවස්ථා ලැබී නොතිබිණි. එක්දහස් නවසිය හතළිස් නවය

වන විට නිදහස් අධ්‍යාපනය හා 1956 ස්වභාෂා ප්‍රතිපත්තිය යටතේ විශාල ලෙස තරුණයන් අධ්‍යාපන කටයුතුවලට සම්බන්ධ වන්නට වූහ. එක්දහස් නවසිය පනස් නවයේදී විශ්වවිද්‍යාල ද පුළුල් ලෙස හඳුන්වා දීමත් සමග විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන පිරිස් ද විශාල වශයෙන් වැඩි වර්ධනය වන්නට විය. මේ අයුරින් දෙවන ලෝක යුද්ධයෙන් පසු අධ්‍යාපන දියුණුවට පරිබාහිරව ජනමාධ්‍ය හා මහාමාර්ගවල ද සංවර්ධනයක් ඇතිවන්නට විය. මීට සමාන්තරව සමාජය තුළ අපේක්ෂාවල ද වර්ධනයක් ඇතිවන්නට වූහ. මේ නිසා 1950 ගණන් වන විට සිංහල මාධ්‍යයෙන් සමාජ විද්‍යා විෂයයන් හැදෑරීමට විශ්වවිද්‍යාල වෙත පැමිණි පිරිස ක්‍රමයෙන් වර්ධනය වූහ.

එහෙත් මුල් කාලයේ පැවති අධ්‍යාපනයේ විසමතා අනුව ගැමි පාසල්වලින් අධ්‍යාපනය ලැබූ අයට ඉදිරියට එන්නට ඉඩක් නොලැබිණි. බටහිර ක්‍රමයට අධ්‍යාපනය ලැබූ සමාජයේ වරප්‍රසාද ලත් එක්තරා කොට්ඨාශයකට පමණක් අධ්‍යාපන පහසුකම් හිමි වී තිබුණි. එනමුදු සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නංගරයන් විසින් හිමිකර දුන් නිදහස් අධ්‍යාපනය මත අලුතින් බිහි වූ මහා විද්‍යාල හා මධ්‍ය මහා විද්‍යාල මගින් 1956 දී ගැමි සිංහල පවුල්වලින් සිසු සිසුවියන් පිරිසක් විශ්වවිද්‍යාලවලට ඇතුළත් වන්නට වූහ. එසේ වුව ද ඔවුන්ගේ ප්‍රධානම විෂය ධාරා වූයේ සිංහල, බුද්ධාගම, බෞද්ධ සංස්කෘතිය,භූගෝලය, ඉතිහාසය ආදි කලා අංශයට බර වූ ඒවාය (අලස්, 1978:207.)

කලා හෙවත් ආර්ට්ස් (Arts) යන්නේ සැබෑ තේරුම ශාස්ත්‍ර යන්නය. මේ වචනය සිංහලයට පැමිණ ඇත්තේ දහනම වන සියවසේ දී පමණ ආරම්භ වු ලිබරල් ආර්ට්ස් (Liberal Arts) නම් අධ්‍යාපන ක්‍රමයෙනි. ඇමරිකාව වැනි බටහිර රටවල මුල් බැසගත් මේ අධ්‍යාපන ක්‍රමය එහිදී හැඳින්වූයේ සුන්දරත්වයට පත් කරවන අධ්‍යාපනය නමිනි. මේ ශික්ෂණය ප්‍රධාන වශයෙන් කොටස් තුනකින් ලැබේ.

පළමුව කරුණු රාශියක් අතුරින් යුක්ති සහගත සාධාරණ නිගමනයන්ට එළඹීමේ හැකියාව ජනිත කෙරෙන තර්ක කිරීමේ ශක්තිය (Reasoning Power) ලබා දේ. මේ තර්ක ඥානය කිසි දිනෙක පරිගණක යන්ත්‍රයකට ලබා දිය හැකි නොවේ. දෙවනුව කුල, ගෝත්‍ර, ජාති හා ආගම් භේදවලින් විකෘතිව ගිය මනස ශුද්ධ කිරිම හෙවත් මනස නිදහස් කිරිම කරනු ලබයි. (Fring the Mind) තෙවනුව පංතියට ළමයා පැමිණෙන විට ගෙනා සියලු මනෝවිකාර බැහැර කොට පංතියෙන් එළියට පිටව යන්නේ නැතිනම් සමාජයට පිවිසෙන්නේ මනෝභාව පරිවර්තනයකින් යුතුවය (Transforming Emotion) (ද සිල්වා, දිවයින, 1998.04.03:04.)

මෙවන් ශික්ෂණයකට මග පෙන්වන කලා විෂය ධාරාවන් ගැමි දරුවන්, ප්‍රගුණ කර විශ්වවිද්‍යාලයට ඇතුළත් වුව ද ප්‍රමාණාත්මක රැකියා අවස්ථා පිළිබඳ ගැටලු පැවතුණි. ගැමි පාසල් දරුවන් තුළ ඉගෙනීමේ සමත්කම් ස්වභාවයෙන්ම පිහිටා තිබුණි. නමුත් ඔවුන්ගේ පාසල්වල විද්‍යා විෂය සඳහා ගුරුවරුන් හෝ විද්‍යාගාර පහසුකම් නොවීය. ඒ නිසා ඒ අංශයෙන් ඔවුන්ට ඉදිරියට ඒමට ඉඩක් ද නොවීය. අනෙක් අතින් ගැමි මා පියන් තම දරුවන් කෙලෙසක හෝ විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීම අගය කර සිටියහ. තම දරුවන්ට අධ්‍යාපනය

ලබාදීම වෙනුවෙන් ඔවුන් සිය ගේ - දොර, ස්වර්ණාභරණාදිය පවා උගස් කර හෝ විකුණා දැමීමට කටයුතු කළහ. ඔවුන්ට තිබූ එකම බලාපොරොත්තුව වී තිබුණේ තම දරුවන්ට දිය හැකි වටිනාම දායාදය ලෙස අධ්‍යාපනය සාර්ථක කරගැනීමට අත දීමය.

මේ අයුරු අධ්‍යාපන ක්ෂේත්‍රයේ දියුණු වෙමින් පැවති අර්බුදය හමුවේ උගත් තරුණ පිරිස්වල උන්නතිකාමී අපේක්ෂාභංගත්වයට පත් වී තිබුණි. එකී තත්ත්වය නව දේශපාලන රටාවක් බිහි කිරීමෙහිලා ප්‍රබල සාධකයක් විය. මෙවන් සමාජ පසුබිමක් යටතේ නව යොවුන් වියට පා තැබූ තරුණයන්ට තවදුරටත් දෙමව්පියන්ගෙන් යැපෙන්නන් වශයෙන් සිටීමට නොහැකි විය. දෙමාපිය රක්ෂාවරණයේ සිටි තරුණයන් ස්වාධීන සමාජ ප්‍රපංචයක් ලෙස සමාජයට පිවිසෙන්නේ මේ අවධියේ සිටය. තමන්ගේ සියලු අපේක්ෂා අධ්‍යාපන සුදුසුකම් මත ලබන රැකියාව මත රඳා පැවතිණ. මේ අන්දමින් අධ්‍යාපන ක්‍රමය රැකියා ප්‍රශ්නයට බලපෑමක් ඇති කළ ද රැකියාව ප්‍රධාන වශයෙන් ආර්ථික ප්‍රශ්නයක් මෙන්ම සමාජ ප්‍රශ්නයක් බවට පත් වී තිබිණි.

විශේෂයෙන් 1965 බලයට පත් වූ අගමැති ඩඩ්ලි සේනානායකගේ (1911-1973) එ.ජා.ප. ආණ්ඩුව විසින් ආහාරවලින් රට ස්වයංපෝෂිත කිරීමේ අරමුණින් 1966 දී පමණ ක්‍රියාත්මක කළ වගා සංග්‍රාමයෙන් සැලසුම් කළ තරම් සාර්ථකත්වයක් අත්පත් කර ගැනීමට නොහැකි වී තිබුණේය. මේ වගා සංග්‍රාමය යටතේ එක් අතකින් එ.ජා.ප.යට සම්බන්ධ ග්‍රාමීය ගැමි පසුබිමකින් යුත් අ.පො.ස. සා.පෙළ හා ජ්‍යෙෂ්ඨය සමත් තරුණයන් එ.ජා.ප. මන්ත්‍රී හෝ සංවිධායක හමු වී රැකියා අවස්ථාවක් ලබා ගන්නට ගිය විට දී ගොවි හමුදාවේ පළල් දොරටුව විවෘත කරමින් ඔවුන් ගොවි හමුදාවට අනුයුක්ත කර ගනු ලැබුවේය. අනෙක් අතින් එ.ජා.ප.යට සම්බන්ධ ගම්වල වරප්‍රසාදලත් පවුල්වල තරුණයන් රජයේ සහ සංස්ථාවල රැකියාවලට බඳවා ගනු ලැබුවේය. මේ අසාධාරණ රැකියා අවස්ථා හිමිකර දීමේ ක්‍රියාපටිපාටිය පිළිබඳව ගොවි හමුදාවට බැඳි සිටි තරුණයෝ කනස්සලු සහගතව අකර්මණ්‍යව පසු වූහ. එපමණක් නොව එ.ජා.ප. ශාඛා සමිති, තරුණ පෙරමුණ හා කාන්තා සමිතිවලට සම්බන්ධව සිටි සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු හෙබැ වූ ක්‍රියාකාරීන්ට රජයේ හෝ සංස්ථාවක රැකියාවක් ලබා දීමට වඩා ලබා නොදීම උචිත බව එ.ජා.ප. මන්ත්‍රී හෝ සංවිධායකගේ උපදේශකයෝ වක්‍රව හා ඍජුව උපදෙස් සපයා ඇත. (සම්මුඛ සාකච්ඡාව, ජෝතිපාල ගමගේ, 2017.05.05) මෙහි දී ඔවුන් විසින් ගම් මට්ටමේ එ.ජා.ප. තරුණ ක්‍රියාකාරීන් රැකියාවකට ගිය පසු පක්ෂයේ ඉදිරි සංවිධාන කටයුතු සඳහා වෙහෙස වී ක්‍රියා කරන්නේ කවුරුන් ද යන ප්‍රශ්නය නිතැනින්ම මතු කර සිටියහ. එහෙත් මන්ත්‍රීවරු ද තම දූ පුතුන්ට රජයෙන් සියලු වරප්‍රසාද හා රැකියා ලබා ගන්නට පියවර ගත්තේය. මෙබඳු සිදුවීම් රට පුරා සෑම මැතිවරණ කොට්ඨාශයකම සිදුවෙමින් පැවතිය දී තරුණ තරුණියෝ එ.ජා.ප. විරෝධී ස්ථාවරයක පසුවෙමින් විකල්ප දේශපාලන ප්‍රවාහයන් වෙත පියනැඟීම සිදු විය.

අද මෙන් එදා තරුණ තරුණියනට ස්වයං රැකියා ව්‍යාපෘති, වෘත්තීය පුහුණු පාඨමාලා හා ස්වයං රැකියා ණය ව්‍යාපෘති රජයෙන් ක්‍රියාත්මක නොවීය. එමෙන්ම එදවස ගැමි තරුණ තරුණියෝ රැකියා අවස්ථාවන් සොයා යාමට එතරම් වෙහෙසක් ද නොදැරූහ. ගුරු වෘත්තිය, සාත්තු සේවාව විශේෂයෙන් තරුණියන්ට වෙන්ව තිබුණි. අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත්

තරුණියෝ වැඩි වශයෙන් අත් යන්ත්‍ර හා පේෂ කර්මාන්තය වෙත යොමු වූහ. එකල කාන්තාවෝ විදේශ රැකියා සඳහා යොමු වූයේ නැති තරම්ය. විශේෂයෙන් ගම්වල ඉතා සුළුතරයක් උසස් අධ්‍යාපන කටයුතු සඳහා විශ්වවිද්‍යාලවලට පියනැඟුහ. මෙබඳු වාතාවරණයක් තුළ රැකියා වියුක්තිය ඉහළ ගොස් තිබුණ ද එයට විසඳුම් ලබාදීම උදෙසා රජය දිගුකාලීන හෝ කෙටිකාලීන සැලසුම් සකස් කර නොතිබුණේය. අනෙක් අතින් තරුණයකුට තරුණියකට රැකියාවක් ලැබීම පවුලකට ඉඩමක් හෝ නිවසක් හිමිවීම හෝ සිසු දරුවකුට උසස් අධ්‍යාපනය සඳහා වරම් හිමි වීම සිදුවන්නේ පූර්ව කර්මඵල විපාක මත යැයි යනුවෙන් ධර්ම දේශනාවන් පැවැත් වූ ඇතැම් භික්ෂූන් වහන්සේලා පන්සල්වල විරාජමානව වැඩ වසමින් සිටියදී ගම්දනව්වලින් පිරිවෙන් අධ්‍යාපනය ලබා ගැනීම සඳහා වැඩම කර සිටියා වූ තරුණ භික්ෂූන්වහන්සේලා ද දැඩි කලකිරීමකින් යුතුව විකල්ප දේශපාලන මතවාදවලට නැඹුරුවෙමින් සිටියහ.

කෙසේ නමුත් 1970 පමණ වනවිට රටේ පැවති අධ්‍යාපන තත්ත්වය පිළිබඳව දෙමාපියන්ට ගුරුවරුන්ට හා වෙනත් අයට කරුණු දැන ගැනීමට ඇති ඉඩකඩ සීමා සහිතව පැවතිය දී කිසියම් ආකාරයකින් හෝ අධ්‍යාපනය පිළිබඳ වැදගත් සාකච්ඡාවක් කර තිබුණේ ''ශ්‍රී ලංකා ජාතික ගුරු සංගමය'' මගින් පමණකි. එකල බලගතු පුද්ගලයන්ගේ සහභාගිත්වය ඇතිව කළ සාකච්ඡාවලදී හෝ දේශනවලදී ඒවාට සවන් දීම හැර යටත් පිරිසෙයින් ප්‍රශ්නයක්වත් ඇසීමට කිසිදු පුද්ගලයකුට ඉඩක් නොවීය. තම දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳ මනා අවබෝධයක් දෙමාපියන් විසින් ලබාගත යුතුව තිබුණු නමුදු ඒ අවබෝධය තබා, තම දරුවනට කුමන අන්දමේ අධ්‍යාපනයක් කොතැනකදී කුමන අයුරකින් ලබා දිය යුතු දැයි නොදැන මව්පියෝ අසරණව ලත වූ බව කියැවේ. (ගුලවත්ත, දිවයින, 2015.07.27)

මේ පසුබිම තුළ හොඳ අනාගතයක් දිනාගත හැකි ශිෂ්‍යයන් පාසල් ප්‍රතිසංවිධානය යටතේ හත්වන පංතියේදීම තම අධ්‍යාපනය අත්හැර ගිය ආකාරය ගම්බද පළාත්වලින් විශාල වශයෙන් වාර්තා වන්නට විය. එමෙන්ම 1965 න් පසු අධ්‍යාපනය පිරිහී ගොස් ඇති ආකාරය සංඛ්‍යා ලේඛන දත්ත උපයෝගී කර ගනිමින් ශ්‍රී ලංකා ජාතික ගුරු සංගමය විසින් පෙන්වා දීමට පියවර ගෙන තිබුණහ. 1943 දී නිදහස් අධ්‍යාපනය ක්‍රියාත්මක කළේ අධ්‍යාපනය මුදලට සීමා කිරීම නිසා රටේ සිටින කල්පනා කළ හැකි බුද්ධිමත් දරු පිරිසකට තම රටේ යහපත සඳහා කටයුතු කිරීමට අවස්ථාව නැතිව යන බැවිනි. නමුත් ඇති හැකි අයට පමණක් මුදල් ගෙවා ඉගෙන ගැනීමේ ඉඩකඩ නැවත සැලැස්වීම නුසුදුසුය යන්න එකී සංගමයේ එකල ප්‍රබල හැඟීම වූයේය. තත්ත්වය එසේ වුව ද එකල ද දරුවන් පාසලකට ඇතුළත් කර ගැනීමට දෙමාපියන්ට වෙහෙසවීමට සිදු වී තිබුණේය. විශේෂයෙන් හාල්පොත මාරු කිරීම, ග්‍රාම සේවක හා පාඨශාලා පරීක්ෂක ආදීන් පසුපස යාමට සිදුවීම, ඇතැම් විට නිලධාරීන් දන්නා අඳුනන තැනැත්තන්ගෙන් ලියුම් කියුම් ගැනීමට සිදුවීම හා දරුවන් සැතපුම් ගණන් ඈත පාසල්වලට යැවීමට සිදුවීම යන අනර්ථය දෙමාපියන්ට මුහුණ දීමට සිදුවූ අනන්තවත් හිරිහැර හා කරදර අතර ප්‍රමුඛස්ථානයක් ගනු ලැබුවේය. මේ දුෂ්කරතාවයන් හේතු කොට ගෙන දුප්පත් දෙමාපියනට දැරීමට සිදු වූ අනවශ්‍ය වියදම හා හිරිහැර ප්‍රමාණය විශාල වූයේය. මේ අයුරු නිදහස් යැයි කියන රටක අධ්‍යාපනය සම්බන්ධයෙන් උදා වී ඇති තත්ත්වය කුමක්ද? යනුවෙන් ප්‍රශ්න කරමින් එහි වූ ඉතා ශෝචනීය හා ඛේදනීය බව ඔවුන් පෙන්වා දී තිබුණහ.

මේ තත්ත්වය හමුවේ රටක අධ්‍යාපනය ආර්ථික සැලැස්මක් මත ගොඩනැගේ නම් පමණක් නොයෙක් මට්ටමේ උගතුන්ට රැකි රක්ෂා සැපයිය හැකි බැව් සහ එමගින් ජාතික සංවර්ධනයක් ද ඇතිවන්නේ යැයි යනුවෙන් එවකට ජාතික අධ්‍යාපන කොමිසම විසින් ද ප්‍රකාශ කර තිබිණි. ඒ අනුව සෑම දෙමාපියකුටම තම දරුවා ද මේ අයිතිවාසිකම ලැබීමට සුදුස්සකු බව රජයට කියා සිටීමේ අයිතියක් ඇති බව පෙන්වා දී තිබුණේය. මේ පිළිබඳ කරුණු දැක්වීමට ලංකා ගුරු සංගමය රට පුරා සිය සංගමයේ දිසා සභා මෙහෙයවීමෙන් ගුරු දෙගුරු රැස්වීම් පවත්වා තිබුණේය. මේ රැස්වීම්වලදී ගිහි පැවිදි අධ්‍යාපන විශාරදයන්, විශ්වවිද්‍යාල ආචාර්ය භවතුන්, කලාකරුවන්, සාහිත්‍යධරයින් හා එම සංගමයේ ප්‍රධාන සභාපති වූ යාපා කුලතුංග, ප්‍රධාන සංවිධායක ඇල්. ආරියවංශ හා හිටපු සභාපතිවරුන්වූ දේ. පීටර් සිල්වා සහ කු. ජැ. ප්‍රනාන්දු යන්නවුන් කථිකයින් ලෙස දෙසුම් පවත්වා තිබුණේය. (ශ්‍රී ලංකා ජාතික ගුරු සංගමය, පත්‍රිකාව, 1970.02.22)

රටේ අධ්‍යාපන ප්‍රශ්න 1965 බලයට පත්වූ ඩඩ්ලි සේනානායකගේ හත් හවුල් ආණ්ඩුව විසින් සමාජ අර්බුදයක් දක්වා තීව්‍ර කරමින් දේශපාලන වශයෙන් ගුරු භවතුන් විශාල ප්‍රමාණයක් දේශපාලන පළිගැනීම්වලට ලක් කිරීමට සිදු විය. ඒ අනුව ගුරු සේවයෙන් ඉවත් කළ, දඬුවම් මාරු ලබාදුන් විවිධ දුෂ්කරතාවන්ට භාජනය කළ ගුරුවරු විශාල ප්‍රමාණයක් එ.ජා.ප. විරෝධී ප්‍රබල පෙරමුණු බල ඇණියක් ගොඩනගා ගෙන සිටියහ. දඬුවම් මාරු ලැබූ ගුරුභවතුන් අතර වමේ ක්‍රියාධරයන් රැසක් ද වූහ. ඒ අතර ගුරු සේවයෙන් පහ කළ ප්‍රබල වමේ සටන්කාමියකු වූ ලයනල් සරත් වැනි විශාල පිරිසක් දහසක් දුක් වේදනා දරාගෙන පවතින දේශපාලන ක්‍රමය වෙනස් කිරීම වෙනුවෙන් බොහෝ ප්‍රචාරක ව්‍යාපාරයන් දියත් කරමින් සිටියහ.

මෙකල ජනගහනයේ පාලනයක් දක්නට නොලැබුණි. (අලස්, 1978:207) ගැමි දරු පවුල්වල සාමාජික සංඛ්‍යාව බොහෝ විට 5 - 6 ඉක්මවා තිබුණහ. එහෙත් මේ එක් පවුලකින් විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීම සඳහා වරම් ලැබුයේ එක් අයෙකු පමණි. මේ එක දරුවා වෙනුවෙන් පවුලේ අනෙක් දරුවෝ බොහෝ කැපකිරීම් කළහ. ඒ අනාගතය පිළිබඳ ඉහළ බලාපොරොත්තු රඳවා ගෙනය. මේ අයුරු මුළු මහත් පවුලක්ම එක් වී කැප කිරීම් කළ උගත් දරුවාට මෙන්ම උසස් පෙළ හා සාමාන්‍ය පෙළ සමත් දරුවන් රැකියා නැතිව නිකරුණේ ගෙදර සිටින විට තරුණ ජනගහනයටත් සංවිධාන ගතවීමට ඉඩ ප්‍රස්තාවක් ලැබුණි. මේ බුද්ධිමත් සංවාදශීලි පිරිස කාටත් ලෙහෙසියෙන් විප්ලවයකට ඇරයුම් කරනු ලැබූහ.

එකී සමාජ හේතුවලට අමතරව අල්ලස් හා දූෂණත්, නුසුදුස්සන්ට රටේ විවිධ ක්ෂේත්‍රවල තනතුරු හිමිවීමත්, දේශපාලකයන් විසින් එම අවස්ථාවන් තම තමන්ටම හිමිකර ගනිමින් සිටීම මෙකී උගත්, බුද්ධිමත් තරුණ පිරිසගේ කලකිරීම, කෝපය හා නොසන්සුන්කම කෙරේ බලපෑම් කරන්නට විය.

මේ හැර කුල වශයෙන් පීඩනයට පත් වූ ප්‍රදේශවල තරුණ කොටස් පමණක් නොව වැඩිහිටි කොටස් ද ගම්මාන පිටින්ම පාහේ ජ.වි.පෙ. වෙත නැඹුරු වී සිටියහ. 1930-40

ගණන්වල දී සමසමාජ පක්ෂය තුළ දී ද කුල පීඩනයට පත්ව තිබූ ප්‍රදේශ ජනයා ගම්මාන පිටින් එය කරා පැමිණි තත්ත්වයට එය තරමක් දුරට සමාන විය. (සම්මුඛ සාකච්ඡාව, ජෝතිපාල ගමගේ, 2017.06.02)

මෙම ඓතිහාසික සමාජ තත්ත්වයන් තුළ ජීවිතයේ වසන්ත සමයේ සිටියා වූ තරුණ පරපුර තුළ උන්නතිකාමී අපේක්ෂා හා ප්‍රාර්ථනා බොහෝ සෙයින් වර්ධනය වී තිබිණි. එහෙත් එකී අපේක්ෂා ප්‍රාර්ථනා පවතින සමාජ, ආර්ථික, දේශපාලන යථාර්ථය හමුවේ එකිනෙක බිඳ දමන විට පවතින ක්‍රමය පෙරළීමට අවි අතට ගැනීමට ඔවුන්ට බල කරනු ලැබ සිටියේ ය (කීරවැල්ල, දිවයින, 2015.04.20:iv.)

### 5.2 ආර්ථික හේතු

එක්දහස් නවසිය හැත්තෑ එකේ අරගලයට ආර්ථිකමය හේතු සාධක ඉවහල් වීය. මෙහිදී විශේෂයෙන් විරැකියාව පිළිබඳ ගැටලුව ප්‍රධාන කරුණක් වශයෙන් අවධාරණයෙන් පෙන්වා දීමට බොහෝ දෙනා උත්සුක වී ඇති බව පෙනේ. සාමාන්‍යයෙන් රටක් ආර්ථික වශයෙන් දියුණුව කරා ළඟා වූ විට රැකියා අවස්ථා බහුල වී විරැකියාව පිළිබඳ ගැටලුව විසඳීම සිදු වේ.

කෙසේ නමුත් නිදහස් අධ්‍යාපනය හඳුන්වාදීමත් සමග ඇති වූ නව ආර්ථික වෙනස්කම් කරණ කොට ගෙන සමාජ ප්‍රතිසංස්කරණ යටතේ අධ්‍යාපන කටයුතුවල යෙදුණ පිරිස් බිහිවන්නට වූහ. මේ ආකාරයට සිදු වූ වර්ධනයන්ට සමගාමීව ප්‍රතිසංස්කරණ සිදුවෙද්දී ඊට සාපේක්ෂව ආර්ථිකයේ කිසිදු වර්ධනයක් සිදු නොවී තිබිණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මෙකල ලෝක වෙළෙඳපොළ තුළ ඇති වූ උච්චාවචනයන්ට ශ්‍රී ලංකා ආර්ථිකයට මුහුණ දීමට සිදු විය. 1960 වන විට පාරිභෝගික භාණ්ඩ මිල ශීඝ්‍රයෙන් ඉහළ ගොස් රට තුළ උද්ධමන වේගය ඉහළ ගියේය. එසේම 1964 සිට 1969 දක්වා රටේ අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍යවල හා භාණ්ඩවල මිල මට්ටම් විශාල අනුපාතයකින් ඉහළ යන ලදි. මේ උග්‍ර ආර්ථික අර්බුදකාරී තත්ත්වය එදා මැතිවරණ ව්‍යාපාරයේදී ප්‍රතිවාදීන් විසින් පළකර තිබූ ''යූඇන්පියේ පස් අවුරුද්ද කෙරුවාව මෙන්න'' නම් වූ පත්‍රිකාව මගින් බඩු මිල ගණන් සහිතව දක්වා තිබුණේ මෙසේය.

| එදා - 1964 බඩු මිල | | අද - 1969 බඩු මිල | |
|---|---|---|---|
| | රු. ශත | | රු. ශත |
| හාල් සේරු 2 (පොතකට) | .50 | හාල් සේරු 1<br>(පොතකට 1 ක් නොමිලේ) | .30 |
| මිල්චාඩ් (වෙළෙඳසැලේ දී) | .80 | මිල්චාඩ් (වෙළෙඳසැලේ දී) | 1. 30 |
| මිරිස් රාත්තල් 1 | 1. 20 | මිරිස් රාත්තල් 1 | 4. 70 |
| පරිප්පු සේරු 1 | .80 | පරිප්පු සේරු 1 | 2. 50 |
| අල රා. 1 | .28 | අල රා. 1 | .90 |
| කහ රා. 1 | 60 | කහ රා. 1 | 3. 50 |
| හාල්මැස්සන් රා. 1 | 1. 20 | හාල්මැස්සන් රා. 1 | 2. 40 |

| | | | |
|---|---|---|---|
| බොම්බැයි එළු‍ෂු රා. 1 | .28 | බොම්බැයි එළු‍ෂු රා. 1 | ඞ්75 |
| රතු එළු‍ෂු රා. 1 | .28 | රතු එළු‍ෂු රා. 1 | .80 |
| හොර්ලික්ස් රා. 1 | 2. 90 | හොර්ලික්ස් රා. 1 | 5. 20 |
| පාන් රා. 1 | .25 | පාන් රා. 1 | .35 |
| සන්ලයිට් කැට 1 | .32 | සන්ලයිට් කැට 1 | .44 |
| බයිසිකලයක් | 250. 00 | බයිසිකලයක් | 380. 00 |
| පොල් ගෙඩි 1 | .15 | පොල් ගෙඩි 1 | .40 |
| පලා (කීර) මිටි 1 | .5 | පලා (කීර) මිටි 1 | .8 |
| කූපන් එකකට රෙදි යාර 6 චිත්ත යාරයක් | 1. 80 | කූපන් එකකට රෙදි යාර 2 චිත්ත යාරයක් | 2. 55 |

(ගුලවත්ත, දිවයින, 2015.07.27)

මේ හැර මේ පත්‍රිකාවෙන් එදා (1964) 112.5 ක් වශයෙන් තිබූ ජීවන වියදම් අංකය මෙදා 1969 දී 134.6 ක් දක්වා ඉහළ ගොස් තිබූ ආකාරය ද දක්වා තිබිණි. එමෙන්ම 1964 දෙසැම්බර් වනවිට 1,65,456 ක් වූ ලියා පදිංචි රැකියා විරහිත වූවන්ගේ සංඛ්‍යාව 1970 වනවිට 7,50,000 දක්වා වූ ඉහළ ප්‍රමාණයක් ගෙන තිබුණේය.

මේ කාලය තුළ දී උසස් අධ්‍යාපනය ලබා විශ්වවිද්‍යාලවලින් පිටවන සංඛ්‍යාවේ ද ඉහළ යාමක් සිදු වී තිබුණි. එහෙත් 1965 වන විට මෙලෙස සරසවිවලින් පිට වූ උපාධිධාරීන්ගේ අනාගත රැකියා සම්බන්ධයෙන් සුරක්ෂිතභාවයක් ඇති කිරීමට බලය හෙබවූ ආණ්ඩු අපොහොසත් වූහ.

ඒ නිසා අධ්‍යාපනය නිමකර රැකියා වියුක්තියෙන් පෙළුණ අතිවිශාල පිරිසක් රටේ සිටියහ. මේ අනුව රැකියා විරහිත ලියාපදිංචි උපාධිධාරින්ගේ සංඛ්‍යාව 14000 දක්වා 1969 වනවිට ඉහළ යන ලදි. මේ අයගෙන් අතිබහුතරය ගොවීන්ගේ දරුවෝ වූහ. නමුත් ඔවුන් අධ්‍යාපනය ලද පසු අපේක්ෂා කළේ ලිපිකරු ක්ෂේත්‍රයට ඇතුළු වන්නටය. ලංකාවේ ඒ වන විට ගොවිතැනට සුදුසු අධ්‍යාපන ක්‍රමයක් දියුණු කර නොතිබුණු බැවින් මේ තුළ ගැටීමක් ඇතිවන්නට විය. කලා උපාධිධාරින් විශ්වවිද්‍යාලවලින් පිටව ගොස් ගොවිකම් ක්ෂේත්‍රයට එකතු වන්නට අකැමැති වූහ. සැබැවින්ම එකල වූ අධ්‍යාපන ක්‍රමය ගැමි දරුවන්ට අනාගතයේ රැකියා මාර්ග සලසන්නන් ලෙස සකස් වී නොතිබිණි (අලස්, 1978:221-222)

අනෙක් අතින් ඉගෙනීමට සමත් මේ ගැමි තරුණ පරපුර සාක්ෂරතාවය අතින් දෙවැනි වී සිටියේ ආසියාතිකයෝ ලෙස ජපානයට පමණි. ජනතාවගෙන් 89% ක් එසේ වීම ලාංකීය තරුණයන්ගේ ආඩම්බරයට ද හේතුවක් වී තිබුණේය.

ශ්‍රී ලංකාව ඌන සංවර්ධිත රටකි. එවැනි රටක රැකියාවලට යොමු කළ යුතුව තිබුණේ හැකිතාක් උගත් පිරිසය. අවාසනාවකට රටේ උගත් තරුණ පිරිස අතිවිශාල ප්‍රතිශතයක් කරා ගමන් කළ නමුත් ඔවුන් බහුල වශයෙන් රැකියා වියුක්තියෙන් පෙළෙන්නට වූහ. විශේෂයෙන් පොදුවේ ගත් කළ ඌන සංවර්ධිත රටවල ජනතාව අධ්‍යාපනය ලැබීමේ දී දැනුම පුළුල් කර

ගැනීම කෙරෙහි අවධානයක් යොමු කරනවාට වඩා ඒ මඟින් රැකියාවක් සොයා ගැනීම ප්‍රධාන ඉලක්කයක් විය. මේ තත්ත්වය තුළ අවුරුදු 18 ත් 35 ත් අතර වූ තරුණ ජනගහනය නියෝජනය කළ උගතුන්ගෙන් 85% ක් රැකියා වියුක්තිය කරණ කොටගෙන අසහනයට පත්වී සිටියහ.

මේ සමාජ, ආර්ථික වටපිටාව තුළ උසස් අධ්‍යාපනය ලැබූ තරුණයන් හා අන් තරුණයන් ද අරගලකාරී දේශපාලනයට සම්බන්ධ වීමේ ප්‍රවණතාවයක් නිර්මාණය වෙමින් පැවතිණි. යථෝක්ත තත්ත්වය තුළ අසහනයට පත්ව හෙම්බත්ව සිටි තරුණ පරපුරට පවතින සමාජ, ආර්ථික ක්‍රමයෙන් කිසිදු සාධාරණයක් ඉටු නොවන බව පෙනී යන්නට විය. ඒ මත ඔවුන්ට අසාධාරණ සමාජ ක්‍රමය මුළුමනින්ම වෙනස් කිරිමේ නැතිනම් මාරු කිරීමේ දැඩි වුවමනාවක් ඇති වී තිබුණි. මේ අයුරු අයුක්තියට හා සමාජ අසාධාරණයන්ට ගොදුරු වූවන් ලෙස සැලකෙන පුද්ගලයන්ගේ සාමූහික අරගල පිටුපස ඇති හේතු හඳුනාගැනීමට සමාජ විද්‍යාවේ හා දේශපාලන විද්‍යාවේ ඩේවිස්ගේ සහ ජේ කර්විගේ කල්පිතයන් මගින් ද උත්සාහ දරා ඇති බව පෙනේ. මෙම උපකල්පනයන්ට අනුව කිසියම් රටක ආර්ථික වර්ධනය හා දියුණුව අඛණ්ඩව වැඩි දියුණු වනු ඇතැයි යන මනෝ විද්‍යාත්මක අපේක්ෂාව වර්ධනය කිරීමට හේතු වේ. එවැනි අපේක්ෂාවන් හදිසියේ ව්‍යර්ථ වූ විට පුද්ගලයන් තමන් අපේක්ෂා කළ දේ සහ පවතින යථාර්ථයන් අතර දරාගත නොහැකි පරතරයක් අත්විඳිති. ඒ අනුව මෙවැනි අවස්ථාවන්හිදී පුද්ගලයන් සාමූහික ක්‍රියාකාරකම්වල නිරත වීමට බොහෝදුරට ඉඩ ඇතිබව කියැවේ. (https://www.britanica.com/topic/J-curve-hypothesis24.08.202223.22.p.m.)

### 5.3 ජ.වි.පෙ. බිහිවීමට බලපෑ ජාතික දේශපාලන හේතු

1971 අරගලය ආරම්භ වීමට බලපාන ලද දේශපාලන පසුබිම පිළිබඳව සාකච්ඡා කරන විට ශ්‍රී ලාංකිකයන්ට බ්‍රිතාන්‍ය පාලනය යටතේ ප්‍රථම වරට ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ තුළින් සර්වජන ඡන්ද බලය හිමිවුව ද 1950 ගණන් වන තෙක් ග්‍රාමීය අංශය තුළ දේශපාලන වශයෙන් සැලකිය යුතු මට්ටමක ප්‍රබෝධයක් දක්නට නොවූහ. එසේ වුව ද කිසියම් ප්‍රමාණයකට හෝ දේශපාලන වශයෙන් පිබිදීමක් ශ්‍රී ලාංකේයන් අතර ඇති වීමට ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරයේ බිහිවීම හා පරිණාමය හේතු වී ඇති බව පෙනේ.

බටහිර රටවලට ගොස් අධ්‍යාපනය ලැබූ ජාත්‍යන්තර මාක්ස්වාදී ව්‍යාපාරයේ ආභාසය ලත් ලාංකීය තරුණයන් කීප දෙනෙකුගේ මූලිකත්වයෙන් 1930 දී පමණ ආරම්භ වූ ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරය වර්ධනය වී 1935 දෙසැම්බර් මස 18 වන දින නිල වශයෙන් ලංකා සමසමාජ පක්ෂය නමින් බිහිවිය. (Amarasinghe, 2000:14)

මෙනයින් බිහිවූ ශ්‍රී ලංකාවේ පළමු දේශපාලන පක්‍ෂය වන සමසමාජ පක්ෂය තුළ දෙවන ලෝක යුද්ධය ආරම්භ වී වැඩි කලයක් යාමට පෙර ''ට්‍රොට්ස්කිවාදීන් '' හා ''ස්ටැලින්වාදීන්'' වශයෙන් භේදයක් ඇති විය. සෝවියට් දේශය ස්ටැලින්ගේ නායකත්වය යටතේ පිරිහුණ සමාජවාදි රාජ්‍යයක් වී ඇතැයි සෝවියට් රජය සමග මත භේදයක් ඇති කරගෙන මෙක්සිකෝවට පලා ගොස් සිටි 1918 රුසියන් විප්ලවයේ නායකයෙකු වූ ලියොන් ට්‍රොට්ස්කි

ප්‍රමුඛ ට්‍රොට්ස්කිවාදීහු සෝවියට් දේශය හා ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය විවේචනය කිරීම ඇරඹූහ. එවකට ලොවේ එකම සමාජවාදි රාජ්‍යය වූ සෝවියට් දේශයේ රජයට කොන්දේසි විරහිතව සම්පූර්ණ සහයෝගය දිය යුතු යයි කියා සිටි පිරිස ස්ටාලින්වාදිහු යයි හංවඩු ගසනු ලැබූහ. වැඩි පිරිස වූ ට්‍රොට්ස්කිවාදීන් විසින් සුළු පිරිසක් වූ ස්ටාලින්වාදීන් විසින් සමසමාජ පක්ෂයෙන් නෙරපූහ.

මෙතැන් පටන් ඇන්.ඇම්., පිලිප්, කොල්වින් හා ලෙස්ලිගේ නායකත්වයෙන් යුත් සමසමාජ පක්ෂය, ට්‍රොට්ස්කි විසින් සෝවියට් රජයට හා තුන්වෙනි ජාත්‍යන්තරයට නැතහොත් ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයට එරෙහිව ආරම්භ කරන ලද හතරවෙනි ජාත්‍යන්තරය පිළිගත් පක්ෂයක් විය (Amarasingha, 2000:31). මෙම සමසමාජ පක්ෂය විසින් රටවල් කීපයක පමණක් සුළු සුළු කණ්ඩායම්වලට සීමා වූ වෙනත් ට්‍රොට්ස්කිවාදි පක්ෂ අභිබවා පාර්ලිමේන්තුවක ආසන කීපයක් දිනාගත්තේය.

ස්ටාලින්වාදින් වශයෙන් නම් කරනු ලැබ සමසමාජ පක්ෂයෙන් නෙරපනු ලැබූ වෛද්‍ය වික්‍රමසිංහ, ඇම්.ජී. මෙන්ඩිස්, උඩකැන්දවල සරණංකර හිමි ප්‍රමුඛ කණ්ඩායම එක් වී එක්සත් සෝෂලිස්ට් පක්ෂය බිහි කරන ලදි. 1943 වර්ෂයේ දී මෙම එක්සත් සමාජවාදී පක්ෂය ලංකා කොමියුනිස්ට් පක්ෂය බවට පරිවර්තනය විය. ඉහත සඳහන් තිදෙනාට අමතරව පීටර් කේනමන්, ඒ. වෛද්‍යලිංගම් හා ෂන්මුගදාසන් ද කොමියුනිස්ට් පක්ෂයේ නායකයන් අතර වූහ.

එතෙක්-මෙතෙක් වරින්වර, කීප වරක් කෙටි කාලීන එක්සත් පෙරමුණු ඇති වුවත් ජාත්‍යන්තර වශයෙන්ම ට්‍රොට්ස්කිවාදින් හා ස්ටාලින්වාදින් පරම හතුරන් වූවා සේම සමසමාජ පක්ෂය හා කොමියුනිස්ට් පක්ෂය අතර ද කිසි දිනෙක දීර්ඝ කාලීන සමගියක් ඇති නොවීය.

පසු කාලයේ දී කොමියුනිස්ට් ව්‍යාපාරයේ සෝවියට්-චීන මතභේදය ලංකා කොමියුනිස්ට් පක්ෂයට ද බලපෑවේය. ෂන්මුගදාසන්ගේ නායකත්වයෙන් කොටසක් කැඩී චීන කොමියුනිස්ට් පක්ෂයට ලැදි පක්ෂයක් ලෙස සංවිධානය විය. ශන්මුගදාස අනුව ගියවුන් ද ඔහු හැරගොස් සමහර විට සුළු සුළු කණ්ඩායම් වශයෙන් සංවිධානය වී ඇත.

දෙවන ලෝක යුද්ධය උත්සන්න වීමත් සමගම බ්‍රිතාන්‍ය සම්බන්ධ වූ මිත්‍ර - පාර්ශ්වයේ යුද්ධ ප්‍රයත්නයට විරුද්ධ වූවන් ලෙස සමසමාජ නායකයන් වූ ඇන්. ඇම්., පිලිප්, කොල්වින් ප්‍රමුඛ කණ්ඩායමක් අත්අඩංගුවට ගෙන හිරකර තබන ලදී. යටත්විජිත රජය විසින් ගන්නා ලද මේ පියවර පසු කාලයේ දී සමසමාජ පක්ෂයට මහජනයා අතරට යැමට බලවත් රුකුලක් විය. 1942 වර්ෂයේ දී අත්අඩංගුවේ සිටි සමසමාජ නායකයන් හිරගෙදරින් පැන යාම ඒ දිනවල රටේ දේශපාලන අංශවල ආන්දෝලනයක් ඇති කළ සිද්ධියක් විය. ඔවුහු ඉන්දියාවට පැන ගොස් එහිදී ද එරට සුළු කොටසක් වු ට්‍රොට්ස්කිවාදි කණ්ඩායම් සමඟ සබඳකම් පවත්වා ඇත. ඇන්. ඇම්. සහ පිලිප් ඉන්දියාවේ දී නැවතත් හිරභාරයට ගන්නා ලදි. දෙවන ලෝක යුද්ධය අවසාන වීමෙන් පසු සමසමාජ නායකයන් හිරෙන් නිදහස් වී මහජනයා අතරට නැවතත් පැමිණියේ දෙපිලක් වශයෙන් බෙදෙමිනි. ඇන්. ඇම්. හා පිලිප් ප්‍රමුඛ කණ්ඩායම ලංකා සමසමාජ පක්ෂය ලෙස දිගටම පෙනී සිටියහ. පිලිප්ගේ සොහොයුරු රොබට් ගුණවර්ධන, ටී.බී. සුභසිංහ හා රෙජී

පෙරේරා ආදිහු ද මෙම කණ්ඩායමේ වූහ. කොල්වින් හා ලෙස්ලි ප්‍රමුඛ කණ්ඩායම හතරවන ජාත්‍යන්තරයට සම්බන්ධ ඉන්දීය බොල්ෂෙවික් ලෙනින්ස්ට් පක්ෂයේ ලංකා ශාඛාව බවට පත් විය.

වාමාංශික පක්ෂයක් වශයෙන් ප්‍රසිද්ධියට පත් ව තිබූ ලංකා සමසමාජ පක්ෂය (L.S.S.P.) 1947 පවත්වන්නට යෙදුණ මහා මැතිවරණයේ දී ආසන 10 ක් කොමිනියුස්ට් පක්ෂය (C.P.) ආසන 3 ක් හා බොල්ෂෙවික් ලෙනිනිස්ට් පක්ෂය ඉන්දියා (B.L.P.I.) විසින් ආසන 05 ක් වශයෙන් ආසන 18 ක් ජයග්‍රහණය කරන ලදි. තවද දෙමළ කොන්ග්‍රසයට (T.C.) ආසන 07 ක් (ලංකා ඉන්දියානු සංගමය හා ද්‍රවිඩ සංගමය) සහ ස්වාධීන ආසන 21 ක් ඇතුළුව පත්වූ මන්ත්‍රීවරු 53 ක් ද එක්සත් ජාතික පක්ෂයටමන්ත්‍රීවරු 42 ක් ද වශයෙන් ආසන 95 කට මුල්ම පාර්ලිමේන්තුව බෙදී ගොස් තිබුණි (Result of Parlimentary General Elections in Ceylon 1947–1970)

සමසමාජ, බොල්ෂෙවික් ලෙනිනිස්ට් හා කොමියුනිස්ට් පක්ෂ ද ජී.ජී. පොන්නම්බලම්ගේ නායකත්වයෙන් වූ ද්‍රවිඩ සංගමය හා එවර පාර්ලිමේන්තුවේ ආසන ගණනක් දිනා ගෙන සිටි ඉන්දියානුසංගමය ද විල්මට් පෙරේරා, අයි.ඇම්.ආර්.ඒ. ඊරියගොල්ල, සී. සුන්දරලිංගම් ආදි ස්වාධීන මන්ත්‍රීවරුන්පිරිස ද සම්බන්ධ කර ගෙන වාමාංශික පළල් පෙරමුණක රජයක් පිහිටුවා ගැනීම සඳහා සාකච්ඡා වටයක් ස්වාධීන සමාජවාදියෙකු වූ එවකට කුරුණෑගල මන්ත්‍රී වශයෙන් තේරී පත්ව සිටි ශ්‍රී නිස්සංකගේමුලිකත්වයෙන් 'යමුනා' නම් ඔහුගේ නිවසේ දී පවත්වන ලදි. නමුත් වාමාංශික නායකයන්ගේ කෙස් පැළෙන න්‍යායයික තර්ක නිසා මේ සාකච්ඡා අසාර්ථක විය. ස්වාධීන මන්ත්‍රීවරුන් ස්ථිර ප්‍රතිපත්තියක්නැති 'ඔලු තුනේ බූරුවන්' වැනි යයි කොල්වින් ආර්. ද සිල්වා විසින් කරන ලදැයි කියන ප්‍රකාශය වාමාංශික රජයක් පිහිටුවා ගැනීම සඳහා ලද ඓතිහාසික 'යමුනා' දේශපාලන සාකච්ඡාව බිඳ වැටීමට බොහෝ සෙයින් හේතු විය. මෙලෙස යමුනා සාකච්ඡාව බිඳ වැටීමෙන් පසු සුන්දරලිංගම් වැනි ස්වාධීන මන්ත්‍රීවරුන් ද ජී.ජී. පොන්නම්බලම්ගේ කණ්ඩායම ද හවුල් කර ගෙන ඩී. ඇස්. සේනානායක නව දේශපාලන ගමනකට පිවිසෙන්නට විය. එ.ජා.ප. නායක ඩී. ඇස්. සේනානායකගේ උපක්‍රම නිසා වමේ පක්ෂ අතර තිබූ සමගිය දෙදරා යාම සහ ස්වාධීන ප්‍රබල කණ්ඩායමක් වීම යන හේතු සාධක කරණ කොට ගෙන ඩී.එස්. සේනානායකගේ අගමැති තනතුරෙන් යුත් ශ්‍රී ලංකාවේ පළමුවැනි හවුල් ආණ්ඩුව පිහිටුවන ලදී.

එක්දහස් නවසිය පනස් දෙක මාර්තු මස 22 වැනි දින අග්‍රාමාත්‍ය ඩී.ඇස්. සේනානායක හදිසියේ අභාවයට පත්වීමත් සමග ඔහු පුත් ඩඩ්ලි සේනානායක අගමැති ධූරයට පත්විය. අගැමැතිවරයාගේ හදිසි අභාවය දේශපාලන වාසියක් බවට පෙරළාගත් එක්සත් ජාතික පක්ෂය යළි 1952 මැයි මස 24, 26, 28, 30 යන සිව් දිනයන් හි පවත්වන්නට යෙදුණ මහා මැතිවරණයෙන් බලය ලබා ගැනීමට සමත් වූහ (De Silva, 1979:111).

මේ මහා මැතිවරණයේ දී කොමියුනිස්ට් පිලිප් හවුල එක පෙරමුණක් වශයෙන් තරග කළහ. සමසමාජ පක්ෂය පිරිසිදු ගොවි-කම්කරු සමසමාජ රජයක් සඳහා රටපුරා අපේක්ෂයන්

ඉදිරිපත් කොට තනිවම තරග කළේය. නමුත් ප්‍රතිඵලය වූයේ සමසමාජ නායක ඇන්.ඇම්. ට පළමුවැනි පාර්ලිමේන්තුවේ තිබූ විපක්ෂ නායක පදවිය ද අහිමි වී යාමය. කොමියුනිස්ට් පිලිප් පෙරමුණේ සහාය ඇතිව ඇස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක 1952 පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකවරයා බවට පත්විය. විපක්ෂ නායකවරයා වූ එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක 1947 එ.ජා.ප. හවුල් ආණ්ඩුවේ සභානායක මෙන්ම පළාත් පාලන හා සෞඛ්‍ය අමාත්‍යවරයා ද විය. ඔහු 1951 ජුලි මස 02 වැනි දින එ.ජා.ප. හවුල් ආණ්ඩුවෙන් සහ පක්ෂයෙන් ඉල්ලා අස්වී 1951 සැප්තැම්බර් මස 02 වැනි දින ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නමැති අලුත් ධනේශ්වර දේශපාලන පක්ෂය ආරම්භ කළේය. මේ ආරම්භයත් සමග බලය හොබවමින් සිටි එ.ජා.ප. ආණ්ඩුවට 1955 වනවිට අර්බුදයන් රැසකට මුහුණ දීමට සිදුවිය. ඒ අනුව එ.ජා.ප. ආණ්ඩුවට පළමුකොටම 1953 අගෝස්තු මස පැන නැගි ජනතා හර්තාලයට මුහුණ දීමට සිදුවිය.

සුළු ධනේෂ්වර වමේ ව්‍යාපාරය වඩා ශක්තිමත්ම අවධියේ පැන නැඟුණ 1953 අරගලය සැබැවින්ම ධනේශ්වර විරෝධී අරගලයකට සීමා වූවක් නොවීය. පංති සටන් පාවා දෙන සුළු ධනේශ්වර අවස්ථාවාදයට කළ අභියෝගයක් ද විය. සුළු ධනේශ්වරයේ අණ නොතකා ඉදිරියට ඇදී ගිය මේ මහාජනතා අරගලය නිර්ණායකතාවයකින් යුතුව පැන නැගී අරගලයක ස්වරූපය ගත්තේ සුළු ධනේශ්වර දෙබිඩි පිළිවෙත නිසාය. 1953 හර්තාලය විසින් එතෙක් ශ්‍රී ලාංකේය දේශපාලනය තුළ පැවති මැතිවරණ අනුව දේශපාලන බලය පක්ෂයෙන් පක්ෂයට ශ්‍රී ලංකාවේ මාරුවී යාමේ ක්‍රමයට අභියෝගයක් එල්ල කළේය. එම අභියෝගය හරහා අර්ධනිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට සිදුවූ මේ ජනතා නැගිටීම ඇතමුන් විසින් ශ්‍රී ලාංකේය දේශපාලන ප්‍රචණ්ඩත්වයේ උපත ලෙස හුවා දැක්වීමට උත්සුක විය (සමරනායක : 1991). එහෙත් 1953 ඇතිවූ මුළු මහත් සටන් ව්‍යාපාරයම පරම ප්‍රජාතන්ත්‍රවාදි වූවක් මිස දාමරිකකම් පුළුල් ලෙස පැතිර ගිය කැරැල්ලක් ලෙස නොව ජනතාවගේ නියම නැගිටීමක් වශයෙන් ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා විසින් පෙන්වා දෙනු ලැබීය (ද සිල්වා, 1954:01).

එක්දහස් නවසිය පනස් තුන හර්තාලයෙන් අනතුරුව පැන නැඟී 1954 බෞද්ධ කොමිෂන් සභා වාර්තාව හා සිංහල රාජ්‍ය භාෂා කිරීම සඳහා පැවති උද්ඝෝෂණ සහ රැකීරක්ෂා, නිවාස, සෞඛ්‍ය, ප්‍රවාහන ආදි පොදුජන ප්‍රශ්න විසඳීමට අපොහොසත් වූ එ.ජා.ප. ආණ්ඩුව 1947 බලය ලබාගත් අවස්ථාවේ සිටම බටහිරට ගැති අධිරාජ්‍යවාදී කඳවුරට පක්ෂපාති විදේශ ප්‍රතිපත්තියක් ගෙන යැමට සමත් වීය.

මෙබඳු වාතාවරණයක් තුළ එ.ජා.ප. වර්ෂ නවයක පාලනය වහා මුළුමනින්ම පෙරළා දැමියයුතු යන ප්‍රබල ජනමතයක් එකල සමාජයේ ගොඩනැගෙමින් පැවතිණි. මේ සමග ප්‍රගතිශීලි කඳවුර නියෝජනය කළ භික්ෂූන් වහන්සේලා පෙරටු කොට ගත් සමාජ පෙරළියක කාලීන අවශ්‍යතාවය දුටු ගත් කතුවරුන් ලේඛකයන්, කවියන් ආදි විවිධ තරාතිරමේ විද්වතුන් පෙරටු කොටගත් සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු යන පංච මහා බලවේගය පෙරමුණු බල ඇණියක් ලෙස ගොඩනැඟි පෙළ ගැසෙන්නට විය.

එලෙස ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ ප්‍රථම වතාවට සියලු එ.ජා.ප. විරෝධි බලවේග, අධිරාජ්‍ය විරෝධී බලවේග, ධනේශ්වර විරෝධී බලවේග වශයෙන් සකලවිධ සමාජ තීරු 1956 දී

එක ධජයක් යටතේ දැවැන්ත පෙරමුණකට ඒකරාශී වූහ. ප්‍රතිගාමීන් විසින් මෙම ජනතා බලවේග රාජ්‍ය බලය යොදා ගනිමින් මර්දනය කිරීමට කැස කවමින් සිටියහ. මෙබඳු වටපිටාවක් තුළ ශ්‍රී ලංකාවේ තුන්වන මහා මැතිවරණය 1956 අප්‍රේල් මස 05 වැනි දින ආරම්භ වී එම මස 07 සහ 10 යන තෙදින තුළ පවත්වන ලදී (De Silva, 1979 : 111).

එ.ජා.ප.ය අර්බුදයක් මැද වුවද මෙම මැතිවරණය ජයග්‍රහණය කර බලය ලබා ගැනීමේ අටියෙන් උපක්‍රමික ලෙස තමන්ට නියත වශයෙන්ම ජයග්‍රහණය හිමිවෙතැයි නිශ්චිතවම අපේක්ෂා කරන ලද ඡන්ද කොට්ඨාශවල ඡන්දය මුල් දිනයේදීම පවත්වනු ලැබුව ද ඉන් ජයගත හැකි වූයේ ආසන 08 ක් පමණි. එ.ජා.ප.ට ජයග්‍රහණය පිළිබඳ නිශ්චිත අදහසක් නොවූ අඩමාන ඡන්ද කොට්ඨාස සඳහා 07 වැනි දින ඡන්දය පවත්වනු ලැබූ අතර කිසිසේත් ජයග්‍රහණය කළ නොහැකි බවට එ.ජා.ප.උපදේශක කමිටුව විසින් කල්තියාම තීරණය කරනු ලැබූ බල කඳවුරු තිහක් පමණ සඳහා ඡන්දය 10වැනි දින පවත්වන ලදි. මෙයට වාමාංශික නායකයන් තරග වැදුණ අවිස්සාවේල්ල, රුවන්වැල්ල, බිංගිරිය සහ ශ්‍රී.ල.නි.ප. නායක එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක ඉදිරිපත් වූ අත්තනගල්ල සහ ගම්පහද ඇතුළත් වී තිබුණි.

කෙසේ නමුත් පැවතියා වූ එ.ජා.ප. ආණ්ඩුවට එරෙහි වූ පොදු ජනතාව විශිෂ්ට ජයග්‍රහණයක් වාර්තා කරමින් 1956 අප්‍රේල් 12 වැනි දින ''මහජන එක්සත් පෙරමුණු'' ආණ්ඩුවක් පිහිටුවන ලදී. ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ සිදු වූ මේ වෙනස දේශපාලන විචාරකයන් විසින් 1956 පෙරළිය, 1956 පොදුජන විජයග්‍රහණය, 1956 යුග පෙරළිය, 1956 පරිවර්තන යුගය, පොදු මිනිසාගේ යුගය, ගැමිජන පෙරළිය යනාදි වශයෙන් හඳුන්වන්නට විය. හෙළයේ මහ ගත්කරු මාර්ටින් වික්‍රමසිංහයන් විසින් මෙම පෙරළිය ''බමුණු කුලයේ බිඳ වැටීමක්'' වශයෙන් හුවා දක්වනු ලැබීම ද විශේෂත්වයකි.

ශ්‍රී ලාංකේය ජාතියක් යන්න වෙනුවට විකල්ප ජාතිවාදි පරිසරයක් නිර්මාණය වෙමින් පැවතිණි. 1956 ජාතික අවුරුදු උත්සවය තුළ ද මේ සිංහල බෞද්ධ ජාතිකවාදය පිළිබිඹු විය. අපේකම යන සංකල්පය පෙරට විත් අපේ ආණ්ඩුව, අපේ අගමැති, අපේ මන්ත්‍රී යන ආමන්ත්‍රණයක් ව්‍යවහාරයට එමින් මව් භාෂාව ලෙස සිංහල බසට නිසි තැනක් ලබා දීමේ වැඩපිළිවෙලක් දියත් වෙමින් තිබිණි. පොදුජන හිතවාදී ජන සමාජයක් උදෙසා රජය විසින් සුවිශේෂ පියවර රාශියක් ක්‍රියාත්මක කරන ලදි. ඒ සමගම ශ්‍රී ලාංකේය දේශපාලනයේ ප්‍රථම වරට සංස්කෘතික කටයුතු භාර කැබිනට් අමාත්‍ය තනතුරක් ද ඇති කරමින් ඒ සඳහා ජයවීර කුරුප්පු යටතේ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවක් ද ඇති කරන ලදි. 1956 පෙරළියත් සමඟ ගොඩනැගුණු සමාජ රටාව තුළ ගොඩනැගුණ වාතාවරණය මෙබඳු ස්වරූපයක් ගනු ලැබීය. මෙම වෙනස නව විදේශ ප්‍රතිපත්තියක් සකස් කිරීම කෙරෙහි ද බලපෑම් කරනු ලැබීය.

එතෙක් පැවති බටහිරගැති අධිරාජ්‍ය ගැති විදේශ ප්‍රතිපත්තිට වෙනුවට මැදහත් විදේශ පිළිවෙතක් ප්‍රථම වතාවට හඳුන්වා දෙන ලදි. ඒ පදනම මත එ.ජා.ප. රජය විසින් භීතියක් වශයෙන් සලකන ලද කොමියුනිස්ට් රාජ්‍යය වූ චීනය හා රුසියාව ප්‍රමුඛ සමාජවාදි රටවල් සමග තානාපති සබඳකම් යුහුසුළුව ගොඩනගා ගන්නා ලදි. එකෙණෙහිම ත්‍රිකුණාමලය හා

කටුනායක බ්‍රිතාන්‍යයට අයත්ව තිබූ යුද හමුදා කඳවුරු නිදහස් කරගන්නා ලදි. මෙම කර්තව්‍යයෙහි පරමාර්ථය වූයේ නැගී එන වාමාංශික බලවේගය පාලනය කිරීමය.

සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීම, කුඹුරු පනත, බහුකාර්ය සේවා පනත, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය පිහිටුවීම, පිරිවෙන් හා විශ්වවිද්‍යාල ස්වාධීන කිරීම, අර්ථසාධක අරමුදල පිහිටුවීම, 1956 බෞද්ධ තොරතුරු පරීක්ෂක සභා වාර්තාවේ මෙන්ම 1957 බුද්ධ ශාසන කොමිෂන් වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම ආදි පියවර රැසක් ගනු ලැබූහ. මෙම ප්‍රගතිශීලී ක්‍රියා මාර්ග මෙන්ම ඇතැම් ජාතිවාදි මුහුණුවරක් ගත් ක්‍රියාමාර්ග රජය තුළ වෙස් මුහුණු බැඳගෙන සිටි දේශීය හා විදේශීය ප්‍රතිගාමීන් සේම ඊට අමතරව සුළු ජාතිකවාදී බලවේග ද රහසේ නව රජයට විරුද්ධව කුමන්ත්‍රණ ක්‍රියාත්මක කරන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස අගමැති එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායකට සහාසිකයකුගේ වෙඩි පහරින් සිය ජීවිතයෙන් වන්දි ගෙවීමට සිදුවිය.

බණ්ඩාරනායක අගැමැතිවරයා ඝාතනය වීමත් සමඟ අරාජික වූ දේශපාලන තත්ත්වය උපයෝගී කරගනිමින් ආණ්ඩුකාර ඔලිවර් ගුණතිලක සැලසුම් සහගතව විජයානන්ද දහනායක අගමැති කරනු ලැබුවේය. පිලිප් ගුණවර්ධන හා විලියම් සිල්වා ආණ්ඩුවෙන් ඉවත්ව ගිය අතර දින 33 කින් ආණ්ඩුවක් ගොඩනැගුණි.

එක්දහස් නවසිය හැට මාර්තු මස 19 වැනි දින පැවති මහා මැතිවරණයෙන් යළි ඩඩ්ලි සේනානායකගේ නායකත්වයෙන් යුත් එ.ජා.ප.ය ජය ගෙන ආණ්ඩුවක් පිහිටුවා ගනු ලැබුව ද රාජාසන කතාව පරාජය වීමත් සමඟ 1960 අප්‍රේල් මස 23 වැනි දින ආණ්ඩුව විසුරුවා හරින ලද්දේ ය (De Silva, 1979:111).

අනතුරුව 1960 ජුලි මස 20 වැනි දින පවත්වන ලද මහා මැතිවරණයෙන් ශ්‍රී.ල.නි.ප. ප්‍රමුඛ ආණ්ඩුවක් පිහිටුවා අගමැති ධුරයට ලෝක ඉතිහාසයේ ප්‍රථම වරට කාන්තාවක් වශයෙන් සිරිමා ආර්.ඩී. බණ්ඩාරනායක පත් විය. නව රජයට නොබැඳි රටවල් විසින් උපරිම වශයෙන් ආධාර උපකාර ලබාදෙනු ලැබීය. වමේ සහයෝගිතා ව්‍යාපාරයේ ප්‍රබලයෙකු වූ ආහාර හා වෙළෙඳ ඇමති ටී.බී. ඉලංගරත්නගේ සංකල්පයකට අනුව වෙළෙඳ ඒකාධිකාරය බිඳ දමමින් සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව (ස.තො.ස.) ආරම්භ විය. බහුකාර්ය සේවා ක්‍රියාත්මක කෙරිණි. මහජන බැංකුව ස්ථාපිත කරන ලදි. එසේම සමාජවාදී රටවල් සමඟ ඇති කරගනු ලැබූ ආධාර සහයෝගිතා ගිවිසුම් අනුව රටට අත්‍යාවශ්‍යව තිබූ වානේ, ටයර්, ලෝහ භාණ්ඩ, පිඟන් සහ රෙදි යන කර්මාන්ත ශාලා ස්ථාපිත කරන ලදි. (සම්මුඛ සාකච්ඡාව, කිතුලගොඩ, 2016.10.12)

මෙම ශ්‍රීල.නි.ප. ආණ්ඩුව ද තම නිල කාලය වූ 1965 දක්වා අර්බුදයන් රැසකට මුහුණ දුනි. මෙනයින් ශ්‍රී ලාංකේය රාජ්‍ය තුළ මතුවෙමින් පැවති ධනේෂ්වර ආර්ථික අර්බුදය විසින් විප්ලවීය තත්ත්වයන් සඳහා අවශ්‍ය විෂයමූල තත්ත්වයන් නිර්මාණය වෙමින් තිබුණි. 1963 දී වෘත්තීය සමිති එකතු කර ''වෘත්තීය සමිති ඒකාබද්ධ බල මණ්ඩලයක්'' හා වමේ දේශපාලන පක්ෂ එකතු වි ''වාමාංශික එක්සත් පෙරමුණක්'' ගොඩනගා එවකට පැවති සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ ආණ්ඩුවෙන් වෘත්තීය ඉල්ලීම් 21 ක් ඉල්ලා අරගලයක් දියත් තර

තිබුණි. (විජේවීර,1979:24) එහෙත් ශ්‍රී ලාංකේය ධනපති පංතිය මුහුණ දුන් අර්බුදයත් සමඟ නිර්ධන පංතියට නායකත්වය සැපයීමට ඉදිරිපත් වී සිටි වමේ ව්‍යාපාරය විසින් මීට පෙර අවස්ථාවල දී මෙන්ම නිර්ධන පංතිය පාවා දෙනු ලැබීය. 1964 දී වර්ධනය වෙමින් පැවති කම්කරු අරගලයේ වූ වෘත්තීය ඉල්ලීම් 21 පාවා දී බණ්ඩාරනායක මැතිණියගේ ධනපති ආණ්ඩුවේ ඇමතිකම් 3 ක් හා උපඇමතිකම් 2 ක් ලබා ගැනීමට ඔවුහු කටයුතු කළහ (පක්ෂයේ ඉතිහාසය 2012:10)

මේ සිදුවීම් යටතේ ශ්‍රී ලාංකේය දේශපාලනය තුළ නිවැරදි වමක අවශ්‍යතාවය මතුවී අලුත් වාමාංශික පක්ෂයක් ලෙස ජ.වි.පෙ. බිහිවීමට දේශියව එක් ඉඩකඩක් විවර විණි. (අලස් 1978:07) අනෙක් ඉඩකඩ විවෘත වූයේ 1960 දශකය දක්වා ශ්‍රී ලංකාවේ නිර්ධන පංති ව්‍යාපාරය තුළ රජ කළ අවස්ථාවාදය පරාජය කරනු වස් කොමියුනිස්ට් පක්ෂයේ චීන පෙළේ නායකත්වය හෙබවූ ෂන්මුගදාසන් මහතා නෙරපා දමා එම පක්ෂය පූර්ණ මාක්ස්වාදී-ලෙනින්වාදී පදනමක් මත ප්‍රතිස්ථාපනය කොට අඩුපාඩු මකාලන්ට එම පක්ෂයේ පිරිසක් විසින් දරණ ලද උත්සාහය ව්‍යර්ථ වී යාමේ ප්‍රතිඵලයක් වශයෙනි.

**4.4 ජ.වි.පෙ. බිහිවීමට බලපෑ ජාත්‍යන්තර දේශපාලන හේතු**

ජාත්‍යන්තර දේශපාලන ක්ෂේත්‍රය තුළ ද ජවිපෙ ආරම්භයට අවශ්‍ය දේශපාලන තත්ත්වයන් 1960 දශකයේ මුල් භාගය වන විට නිර්මාණය වෙමින් පැවතිණි. ප්‍රධාන වශයෙන් 1963 මතු වූ චීන සෝවියට් මතවාදී අරගලය විසින් ලෝ පුරා විසිරී සිටි තරුණ විප්ලවාදීනට මාක්ස් ලෙනින්වාදය පිළිබඳ සංවාද ඇති වෙමින් යළි එය හැදෑරීමට ප්‍රබල උත්තේජනයක් සපයනු ලැබීය. එපමණක් නොව මේ තත්ත්වයට සමගාමීව අප්‍රිකා, අසියා ඇතුළු ලතින් ඇමරිකානු රටවල් කිහිපයකම නව විප්ලවවාදි අරගල හා ජාතික විමුක්ති අරගල මතුවීම තුළින් ඇතිකළ තත්ත්වය ලෝපුරා විසිරී සිටි තරුණ විප්ලවවාදීනට මෙන්ම ශ්‍රී ලංකේය නැගී එන විප්ලවවාදීන්ට ඉමහත් බලපෑමක් කළේය.

මේ අයුරින් හැටේ දශකයේ මුල් භාගයේ දී ලෝක වාමාංශික ව්‍යාපාරය තුළ හටගත් මහා දේශපාලන කුණාටුව ශ්‍රී ලාංකේය වමේ ව්‍යාපාරය කෙරෙහි ද ගැඹුරු බලපෑමක් ඇති කරන ලදි. 1948 නිදහසින් පසු තරුණයින්ගේ දේශපාලන හැඩගැස්ම මුළුමනින්ම කණපිට පෙරළීමට මෙම ජාත්‍යන්තර දේශපාලනය තුළ සිදු වූ වෙනස සමත් වීය. මෙම අවදිය වනවිට ලෝක කොමියුනිස්ට් ව්‍යාපාරය දෙකඩ වී පැවතුණි. චීනයේ මාඕ සේතුං විසින් සංස්කෘතික විප්ලවය දියත් කිරීම මොස්කව් ක්‍රියාදාමයෙන් තවත් ඔබ්බට යෑමක් වශයෙන් මාක්ස්වාදී මත දරන්නන් විසින් පිළිගෙන තිබුණේය. මේ නිසා මොස්කව් පිළෙන් වෙන්වී චීන පිළ නම් මහජන චීනය මුල් කරගත් නව පිළක් ලෝකය පුරා ගොඩනැගෙමින් පැවතුනි. (අබේපාල, 2016: 107) චීනයේ ඇති වූ මේ විප්ලවීය තත්වය හේතු කොටගෙන ලෝක කොමියුනිස්ට් පක්ෂ සාම්ප්‍රදායානුකුල සෝවියට් දේශ මොස්කව් නායකත්වයෙන් ඉවත් වී චීනය මුල් කොටගෙන නව විප්ලවාදී චින්තාවක් ඔස්සේ සිය පක්ෂ වර්ධනය කරන්නට විය. මේ අනුව ලෝකයේ බොහෝ රටවල චීනයට පක්ෂපාතී කොමියුනිස්ට් පක්ෂ චීන පිළ යනුවෙනුත් සෝවියට් දේශයට පක්ෂ කොමියුනිස්ට් පක්ෂ මොස්කව් පිළ යනුවෙනුත් හඳුන්වා ගනු ලැබීය. සන්නද්ධ අරගලයක් පවතින පාලන ක්‍රමය පෙරළා දැමීමට කැප වූ කොමියුනිස්ට් පක්ෂවලට චීනය නායකත්වය

ලබා දීමට ඉදිරිපත් වෙද්දී පාර්ලිමේන්තුව තුළින් සමාජවාදයට යෑමට යෝජනා කළ ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයන්ට සෝවියට් සංගමය නායකත්වය ලබා දීමට ඉදිරිපත් වී සිටියේය. (අබේපාල, 2016:108).

මේ තත්ත්වය තුළ ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය ද මෙම මතවාදි දේශපාලනය ඔස්සේ දෙපිලකට බෙදී කටයුතු කළහ. පාර්ලිමේන්තුවාදී මාර්ගය සංශෝධිතවාදී ක්‍රියාමාර්ග සේම නිර්ධනයින්ගේ අපේක්ෂාවන් පාවාදීමක් වශයෙන් හැඳින්වූ චීනයේ මාඕවාදීන් විසින් තවදුරටත් රාජ්‍ය බලය අල්ලා ගැනීම ප්‍රමාද කිරීම නිවටකමක් වශයෙන් අවධාරණය කළහ. මේ කාලය තුළ 1959 කියුබානු විප්ලවයේ ආස්වාදය ද ලතින් ඇමරිකානු, අප්‍රිකානු හා ආසියාතික රටවල ජනප්‍රිය වෙමින් පැවතිණි. ඒ අනුව සමාජ විමුක්තිය උදාකර ගැනීමේ එකම මාර්ගය සන්නද්ධ අරගලය බවට කොමියුනිස්ට් පක්ෂයේ රුසියානු හා චීන මතවාදි කණ්ඩායම් නියෝජනය කළ රැඩිකල්වාදි තරුණ පිරිසට අවබෝධ වෙමින් තිබුණි. මෙම තත්ත්වය තුළ එම තරුණයන්ගේ සමාජවාදි සිහිනය යථාර්ථයක් කරනු වස් කොමියුනිස්ට් පක්ෂයේ චීන පිලේ නායක එන්. ෂන්මුගදාසන් පෙනී සිටියේ ය.

### 4.5 ජ.වි.පෙ. බිහිවීමට බලපාන ලද නායකත්ව සාධකය

මේ අයුරින් බලන කළ යථෝක්තව සඳහන් කරන්නට යෙදුණු ජාතික හා ජාත්‍යන්තර දේශපාලන තලයේ උද්භව වු හේතුන්ගේ තර්කානුකූල ප්‍රතිඵලයක් වශයෙන් ජවිපෙ බිහිවීමට අවශ්‍ය පදනම සකස් වූවා සේම ඒ සඳහා පූර්ණ මැදිහත්වීමක් සිදු කළ ජවිපෙ නිර්මාතෘවරයාද ඉතා වැදගත් සාධකයක් වූ බැව් පෙනේ.

එක් දහස් නවසිය හතළිස් තුනේ ජූලි මස 14 වැනි දින දික්වැල්ල කෝට්ටගොඩ සුළු ව්‍යාපාරික දොන් අන්ද්‍රිස් විජේවීර නම් වූ නිර්ධන පංති පියෙකුට හා නැසිනෝනා වික්‍රම කළුතොටගේ යන නිර්ධන පංති මවකට දාව තංගල්ලේ දී දොන් නන්දසිරි විජේවීර උපත ලැබීය. (අලස්, 1978:02) හෙතෙම මූලික අධ්‍යාපනය කෝට්ටේගොඩ ගොඩඋඩ රජයේ පාසලෙන් ලබා ද්විතීයික අධ්‍යාපනය සඳහා 1959 දී අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයට ඇතුළත් විය. ඔහුගේ පියා කොමියුනිස්ට් පක්ෂ සාමාජිකයෙක් වූ නිසාම එම පක්ෂයේ සාමාජිකයින් ඇසුරු කිරීමට හා මාක්ස්වාදය පිළිබඳ අධ්‍යාපනයක් ලබා ගැනීමට විශේෂ අවස්ථාවක් ඔහුට ලැබී තිබිණි. පාසල් වියේදීම ''කොමියුනිස්ට් ප්‍රකාශනය'' කියවා තිබූ අතර ලියු ෂා ඕගේ ''හොඳ කොමියුනිස්ට්වාදියකු වන්නේ කෙසේද?'' යන පොත ද ඔහුගේ ජීවිතයට මහත් බලපෑමක් ඇතිකර තිබුණි. 1960 සැප්තැම්බර් 25 වන දින වැඩිදුර අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්වයක් ලබා වෛද්‍ය උපාධිය සඳහා සෝවියට් දේශයේ මොස්කව් අගනුවර පිහිටි ''පැට්‍රික් ලුලුම්බා මිත්‍රත්ව විශ්වවිද්‍යාලයට'' ඇතුළත් විය. (අලස්, 1978:03)

විශ්වවිද්‍යාලයේ දී වෛද්‍ය විද්‍යාවට අමතරව දේශපාලන විද්‍යාව, ඓතිහාසික භෞතිකවාදය වැනි විෂයන් හැදෑරීම තුළින් දේශපාලන දැනුම වැඩි දියුණු කර ගැනීමට ද ඔහු කටයුතු කළේය. 1961 ජුලි හා අගෝස්තු එළඹි නිවාඩු කාලයේදී පිළිවෙලින් සෝවියට් මෝල්දවියාවේ හා ජෝර්ජියාවේ සංචාරයක ද නිරත විය. මේ සංචාරයන්ගෙන් ලැබූ අත්දැකීම්වලින් සමාජවාදි දේශපාලන හා ආර්ථික ක්‍රමය පිළිබඳව ලබාගත් දැනුම තුළින් ඒ ගැන පැහැදීමක් ද ඇති කරගෙන තිබුණේය. අනතුරුව 1961 දී දීප්තිමත් ශිෂ්‍යයාට හිමි රන් පදක්කම ද දිනා ගැනීමට සමත් වූ රෝහණ විජේවීර 1962 දී නිවාඩුවක් සඳහා ලංකාවට පැමිණි අවස්ථාවේදී කොමියුනිස්ට් පක්ෂයේ වැඩ කටයුතු ගැන කලකිරීමක් ඇති වන්නට විය. නැවත

සෝවියට් දේශයේ අධ්‍යාපනය ලබමින් සිටියදී 1963 මතු වූ චීන සෝවියට් මත භේදයේ දී විජේවීර චීන ස්ථාවරය තුළ හිඳිමින් කටයුතු කළ අතර ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයෙන් චීන පිල වෙන්වී ගිය අවස්ථාවේදී එයට සුබ පැතුමක් ද එවීමට කටයුතු කර තිබුණේය.

කෙසේ නමුත් අධ්‍යාපන නිවාඩුවක් ගත කිරීම සඳහා 1964 මුල දී පමණ ලංකාවට පැමිණි විජේවීර නැවත මොස්කව් යාමට වීසා ලබා ගැනීමට උත්සාහ කිරීමේදී තානාපති කාර්යාලය විසින් වීසා ලබාදීම ප්‍රතික්ෂේප කර තිබුණේය. මේ තීරණයට බලපා තිබුණේ විජේවීර චීන මතවාදයට දක්වන ලද පක්ෂපාතත්වයයි. මෙය ඔහුගේ ජීවිතයේ තීරණාත්මක අවස්ථාවක් වූ අතර සිය ප්‍රතිපත්ති වෙනුවෙන් වෛද්‍ය උපාධිය කැප කොට ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ චීන පිලේ දේශපාලනය සමග සම්බන්ධ විය.

### 5. ජ.වි.පෙ. දාර්ශනික හා ප්‍රචාරක අවධිය

මේ ආකාරයට කොමියුනිස්ට් පක්ෂයේ චීන පිලට සම්බන්ධව දේශපාලනයේ නියැළෙමින් සිටියදී ඒ තුළ පැවති අවස්ථාවාදී ප්‍රවණතා හඳුනා ගන්නා රෝහණ විජේවීර එය නිවැරදි කිරීමට නම් එහි බලය ලබාගත යුතු බව තේරුම් ගෙන තිබුණේය. ඒ සඳහා සුදුසු කිහිප දෙනෙකු තෝරාගෙන විශේෂ සාකච්ඡාවක් 1965 මැයි මස 14 වන දින අක්මීමන කරුණාරත්න නමැත්තාගේ නිවසේදී පවත්වනු ලැබුණි. (අලස්, 1978:07) මෙය ජ.වි.පෙ. ආරම්භ කිරීමට මුල් වූ පළමු සාකච්ඡාව ලෙස ඉතිහාසයට එක්වී ඇත. මේ සාකච්ඡාවට විජේවීර, සනත්, කරුණාරත්න, දෙල්ගොඩ රාජා, විල්සන් දූදිගම, එච්. මිල්ටන් සහ සිරිපාල අබේගුණවර්ධන යන හත් දෙනා සම්බන්ධ වූහ. තවද මෙම සාකච්ඡාවට ටී.බී.සී. ප්‍රනාන්දු හා මුතුමාල යන දෙපළ ද සහභාගී වීමට නියමිතව සිටිය ද ඔවුන්ගේ හැසිරීමේ සදාචාර ප්‍රශ්නයක් හේතු කොට ගෙන ඔවුන් සම්බන්ධ කර නොගැනීමට වගබලා ගෙනතිබුණි. එකී සාකච්ඡාවේ ප්‍රතිඵලයක් වශයෙන් රෝහණ විජේවීර චීන පිළ තුල පූර්ණකාලීනව දේශපාලන වැඩ කටයුතු කරගෙන යන ලද්දේය. 1965 අගෝස්තු චීන පිලේ තරුණ සංගම් ප්‍රතිසංවිධානය කිරීමේ කමිටුවේ ලේකම් ධූරයට පත්වන විජේවීර එම තනතුර උපයෝගී කර ගනිමින් චීන පිලේ සමුළුවේදී එහි බලය ලබා ගැනීමට කටයුතු සූදානම් කරන ලදි. මේ අතරතුර ප්‍රේමලාල් කුමාරසිරි පක්ෂය හැර යාමෙන් ෂන්මුගදාශන් චීන පිලේ පක්ෂ නායකත්වයට පත්විය. ඉන්පසු චීන පිල තුළ විජේවීර බලය ලබා ගැනීමට දියත් කර තිබූ වැඩපිළිවෙල හෙළිදරව් වීමෙන් විජේවීර චීන පිලෙන් ඉවත් කරනු ලැබීය. ඒ සමගම චීන පිල නිවැරදි කර ගැනීමට විජේවීර දරන ලද උත්සාහය අත්හැර දැමීමට සිදුවිය.

චීන පිලෙන් විජේවීර නෙරපා හැරීමත් සමග 1966 අප්‍රේල් මැයි කාලයේදී පමණ අක්මීමන කරුණාරත්නගේ නිවසේදීම සිය නව දේශපාලන ව්‍යාපාරයේ දෙවන සාකච්ඡාව පවත්වා තිබුණි. එයට මුල් සාකච්ඡාවට සහභාගී වූ හත්දෙනාට අමතරව ලොකු අතුල හෙවත් අතුල නිමලසිරි හා විමල ගුණේ යන අය ද සහභාගි වී ඇත. මෙම සාකච්ඡාවේ දී ගනු ලැබූ තීරණ අනුව චීන පිල නිවැරදි කිරීමට ගන්නා ලද උත්සාහය අසාර්ථක වී ඇති තත්ත්වයක් තුළ විප්ලවවාදී පක්ෂයක් ගොඩනැගිය යුතුය යන මූලික එකඟතාවයට පැමිණ තිබිණි. ඒ අනුව එවැන්නකට එකඟ පිරිස් හඳුනාගෙන ඔවුන් තුළින් විප්ලවවාදීන් ගොඩනැගිය යුතුය යන තීරණයට එළඹ තිස්සමහාරාමය හා අනුරාධපුරයේ ගොවිපළ කිහිපයක් ආරම්භ කිරීමට ද, මෙයින් පසු පක්ෂය ගොඩනගනු වස් ක්‍රියාධරයන් බිහි කිරීම ආරම්භ කරනු ලැබුවේය. මෙම කාලය විජේවීරගේ නව දේශපාලන ව්‍යාපාරයේ ඉතා දුෂ්කරම කාල පරිච්ඡේදය වශයෙන්

සැලකේ. මුල දී කම්කරුවන් සංවිධානය කිරීමට උත්සාහ කරනු ලැබූ නමුත් ඔවුන් බලවත් ලෙස විශ්වාසභංගත්වයට පත්ව සිටි නිසා එම උත්සාහයන් සාර්ථක ප්‍රතිඵල අත්කර නොදුන්නේය. මේ නිසා ගොවි ජනතාව සංවිධානය කිරීම කෙරෙහි වැඩි නැඹුරුතාවයක් දක්වන්නට විය. මේ අනුව තිස්සමහාරාමයේ හා අනුරාධපුරයේ ආරම්භ කර තිබූ ගොවිපළවල් අසාර්ථකත්වයට පත්වීම නිසා කිරින්දේ නව ගොවිපළක් ආරම්භ කිරීමට කටයුතු කරන ලදි. මෙකල ආහාරපාන මෙන්ම මුදල් දුෂ්කරතා ද බලවත්ව නැගි ආයෙන් විජේවීර හා විමලගුණේ තිස්සමහාරාම බස් නැවතුම්පොළේ මුට්ට කර ගැසීම පවා සිදුකර තිබුණේය. මේ කාලයේදීම සංවිධාන ක්‍රියාකාරීන් සඳහා මත්පැන් හා දුම්වැටි පානය නොකිරීමේ සදාචාරාත්මක විනය සම්ප්‍රදායක් ද හඳුන්වා දී තිබුණි. මෙපරිද්දෙන් වසර දෙකක පමණ කාලයක් දුෂ්කරතා යටතේ වැඩ කරමින් හැටකට ආසන්න සාමාජික පිරිසක් හඳුනාගැනීමට ඔහු සමත් වී තිබුණේය.

ජාත්‍යන්තර විප්ලවවාදියකු වූ අර්නස්ටෝ චේ ගුවේරාගේ මරණය (1967.10.09.) සිදුවීමත්, 1967 ජුලි, අගෝස්තු මුළු දුන් ලතින් ඇමෙරිකා සහයෝගීතා සමුළුවත්, කියුබන් විප්ලවයේ ලියකියවිලි ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධියට පත්වීමත් නිසා කියුබානු විප්ලවයේ සටන් මාදිලිය ලංකාවට යොදාගැනීමේ අදහසක් විජේවීරගේ දේශපාලන සංවිධානයේ සමහර සාමාජිකයන් තුළින් මතුවන්නට විය. සංවිධානය තුළ පැන නැගි මේ අදහස නිරවුල් කිරීම සඳහා හා තවත් භේද කිහිපයක් මුල් කොට 1967 දෙසැම්බර් අනුරාධපුර කැලෑත්තෑවේදී සාකච්ඡාවක් කැඳවනු ලැබුවේය. මේ සඳහා සංවිධානයට සම්බන්ධ වී සිටි සාමාජිකයින් හැටදෙනා අතරින් ඉදිරියෙන්ම සිටි සාමාජිකයින් විසි එක් දෙනා පමණක් කැඳවනු ලැබීය. මෙහිදී වැදගත් තීරණ කිහිපයක්ම ගෙන තිබුණේය. ඉන් ප්‍රධානතම අදහස් දෙකක් වූයේ ශ්‍රී ලංකාවේ විප්ලවයේ මාදිලිය වෙනත් රටකින් කොපි නොකළ යුතු ලාංකීය එකක් විය යුතු බව හා දැනට හඳුනාගෙන සිටින සාමාජික පිරිස්වලට දේශපාලන දැනුම ලබාදෙනු වස් ආර්ථික අර්බුදය, නිදහස නව යටත්විජිත උපක්‍රම, ඉන්දියානු ව්‍යාප්තවාදය, ලංකාවේ වාමාංශික ව්‍යාපාරය හා ලාංකීය විප්ලවය ගත යුතු මග යනුවෙන් අධ්‍යාපනය පංති පහක් සකස් කර සාකච්ඡා ලෙස පවත්වාගෙන යා යුතු බවය. මේ කැලෑත්තෑව සාකච්ඡාවෙන් පසුව විජේවීර විසින් පංති කිරීම ආරම්භ කරන ලදි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වෘත්තීය සමිති මගින් ද පංති පැවැත්වූ අතර එහි ''සංවර්ධන හඬ'' නම් වූ පුවත්පතට ලිපි රචනා කිරීම ද කරන ලදි. 1968 - 1969 කාලය තුළ ග්‍රාමීය තරුණ පිරිස් තුළ හා විශ්වවිද්‍යාල තුළ දේශපාලන කටයුතු පැතිර යාමත් සමග සංවිධානය පුළුල් වීම ඇරඹිණි. ඒ සමඟම යම් රහස්‍යභාවයකින් යුතුව සංවිධානයේ වැඩ කටයුතු කරගෙන යනු ලැබීය. (සම්මුඛ සාකච්ඡාව, කිතුලගොඩ, 2016.10.12)

සාමාජිකයින් උදෙසා පංති පහේ සාකච්ඡා කිරීමට අමතරව අධ්‍යාපන කඳවුරු පැවැත්වීමේ අවශ්‍යතාවය ද මේ වනවිට උද්ගත වී තිබූ අතර 1968 අගදී පමණ අක්මීමන කරුණාරත්නගේ නිවසේ දී පළමු අධ්‍යාපන කඳවුර පවත්වන ලදි. ඉන් අනතුරුව 1969 මැද භාගයේ දී පමණ මීගමුව මඩම්පැල්ල පදිංචිව සිටි ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ධනපාල ගේ නිවසේ දී සංවිධානයේ ඉදිරියෙන් සිටි පිරිස් කැඳවා සාකච්ඡාවක් පවත්වා තවදුරටත් අධ්‍යාපන කඳවුරු ඉදිරියට ගෙන යාමට හා වේගවත් කිරීමට තීරණය කෙරිණි. මේ අනුව අධ්‍යාපන කඳවුරු දිගටම පවත්වන්නට යෙදුණ අතරතුර වමේ අවස්ථාවාදීන් විසින් යොමු කරන ලද ඔත්තුකරුවකු විසින් 1969 අග දී තණමල්විල ප්‍රදේශයේ පවත්වන්නට යෙදුණු අධ්‍යාපන කඳවුර

පිළිබඳව තොරතුරු කොමියුනිස්ට් පක්ෂයේ ''ඇත්ත'' පුවත්පත මගින් හෙළිදරව් කරනු ලැබීය. ඔවුන් එය හඳුන්වා දී තිබුණේ ''සමගි පෙරමුණට පහරදීමට තරුණයන් බා ගන්නා සී.අයි.ඒ. කෙමනක්'' වශයෙනි. මේ තොරතුරු හෙළිවීමත් සමග 1969 අග නැවතත් සංවිධානයේ ඉදිරිපෙළ විසි එක් දෙනාගේ සහභාගිත්වයෙන් සාකච්ඡාවක් මාතර දිස්ත්‍රික්කයේ ඌරුබොක්ක දම්පහල ප්‍රදේශයේ පැන්ටිස්ගේ නිවසේදී පවත්වන ලදි. එහිදී එ.ජා.ප. ය විසින් හමුදා ආණ්ඩුවක් සෑදීමට සූදානම් වීම පිළිබඳව සාකච්ඡා කෙරුණ අතර එවැනි තත්ත්වයකදී ගත යුතු පියවරයන් ද සාකච්ඡාවට බඳුන් කර තිබුණේය. ඒ අනුව පක්ෂ ක්‍රියාකාරීන් ව්‍යාජ නමකින් පෙනී සිටීමටත්, ආරක්ෂක වැඩපිළිවෙලක් ලෙස කලුකැලේ හා වෙලංවිට ආරක්ෂක ගම්මාන ගොඩනැගීමට හා ලයනල් බෝපගේ හා ප්‍රේමසිරි සිරිවර්ධන යටතේ ආයුධ පිළිබඳ පර්යේෂණ කිරීමට ද තීරණයක් ගෙන තිබුණි. කෙසේ නමුත් ටික දිනකින් හමුදා කුමන්ත්‍රණය පිළිබඳ තර්ජනය පහව ගොස් මහා මැතිවරණයක් පැවැත්වීම පිළිබඳ අදහස පෙරට ඒමත් සමග 1970 මුල සංවිධානයේ විසි එක් දෙනාගේඑකතුවෙන් තවත් විශේෂ සාකච්ඡාවක් දෙව්නුවරදී කැඳවනු ලැබුවේය. එහිදී ළඟ එන මැතිවරණයේ දී ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව කරනු ලැබූ පුළුල් සාකච්ඡාවේ දී ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම වෙනුවෙන් සමගි පෙරමුණට සහය දීමට තීරණය විය. එමෙන්ම මෙහිදී පළමුවරට සංවිධානයේ නම ලෙස 'ජනතා විමුක්ති පෙරමුණ' යන්න යොදා ගැනීම සිදු විය. (සම්මුඛ සාකච්ඡාව, කිතුලගොඩ, 2016.10.12) ඉන් අනතුරුව විසි එක්දෙනාගේ කණ්ඩායම විසින් මාතර කඹුරුපිටියේ දී ද සාකච්ඡාවක් පවත්වා ඇත.

යථෝක්තව සඳහන් කළ පරිදි කොමියුනිස්ට් පක්ෂයේ ඇත්ත පුවත්පත මගින් ජ.වි.පෙ. පිළිබඳව කළ හෙළිදරව්ව කරණ කොටගෙන නායක විජේවීර පිළිබඳව තොරතුරු ආරක්ෂක අංශ වෙතට වාර්තා වන්නට විය. මේ තොරතුරු පදනම් කරගෙන 1970 අප්‍රේල් මාසයේදී පමණ සමගි පෙරමුණ ආණ්ඩුව විසින් ජ.වි.පෙ. මර්දනය කිරීම වෙනුවෙන් ''චේ ගුවේරා බියුරෝව'' නමින් රහස් පොලීසියේ විශේෂ ඒකකයක් පිහිටුවීමට ක්‍රියා කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස අත්අඩංගුවට ගැනීම් හා බාධා කිරීම් ඔස්සේ මර්දනය දිගටම ක්‍රියාත්මක කරමින් 1970 මැයි 12 වන දින හම්බන්තොට ජුල්ගමුවේදී ප්‍රථම වතාවට රෝහණ විජේවීර අත්අඩංගුවට ගනු ලැබීය. මේ සමගම පක්ෂයේ අභ්‍යන්තර ප්‍රතිවිරෝධතා ද උත්සන්න වී විජේවීර පිලට එරෙහිව ප්‍රධාන කණ්ඩායම් තුනක් බිහි වන්නට විය. (සිල්වා, 2011:09) ඒවා නම් ජී.අයි.ඩී. ධර්මසේකර කණ්ඩායම, කෝට්ටේ ඩී.ඒ. ගුණසේකර කණ්ඩායම හා පේරාදෙණියේ සරත් විජේසිංහ ප්‍රමුඛ කණ්ඩායමයි. මේ හැරුණු විට විජේවීර නියෝජනය කළ කණ්ඩායම තුළ ද අලුත් හා පැරණි ලෙස මතු වී ආ මතභේද ලොකු අතුල ඇතුළු කිහිපදෙනෙකු හා ලයනල් බෝපගේ ඇතුළු කිහිපදෙනෙකු අතර ඇති වූ ගැටුම් ලෙස ප්‍රකාශ විය. මේ සමගම ලොකු අතුල ඇතුළු පිරිස විසින් විජේවීරගේ අත්අඩංගුවට පත්වීම තුළ පක්ෂයේ ඉදිරිපෙළ විසි එක් දෙනාගේ සංවිධානය විසුරුවා හැර ආයුධ පර්යේෂණ අංශය තමන් යටතට පවරා ගෙන තිබුණේය.

පැවති මහා මැතිවරණයෙන් 1970 මැයි 27 වන දින එ.ජා.ප. පරදා සමගි පෙරමුණු ආණ්ඩුව බලයට පත්විය. ජ.වි.පෙ. විසින් තම නායකයා වූ විජේවීර උසාවියට ඉදිරිපත් කිරීමට නියමිතව තිබූ දිනට පෙර දින රාත්‍රියේ දී ''දේශප්‍රේමී විජේවීර වහා නිදහස් කරනු'' ලෙස සඳහන් පළමු ප්‍රචාරක පෝස්ටර් ව්‍යාපාරය රට පුරා දියත් කරමින් 1970 ජුලි 09 දින ඔහු නිදහස්

වීමත් සමග පක්ෂයේ ප්‍රචාරක කටයුතු තවදුරටත් විධිමත්ව ගෙන යනු ලැබුවේය. මේ අනුව 1970 ජුලි 14 දින විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ දී සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ආරාධනයෙන් ''සී.අයි.ඒ. කාරයෝ'' නමින් ප්‍රථම ප්‍රසිද්ධ දේශනය පවත්වන්නට යෙදුණි. ඉන් අනතුරුව රට පුරා විවිධ මාතෘකා යටතේ සම්මන්ත්‍රණ මාලාවක් ද පවත්වන ලදි. මීට අමතරව 1970 අගෝස්තු 10 දින පක්ෂයේ මංගල රැළිය හයිඩ් පාර්ක් පිටියේදී පවත්වා තිබුණි. ඉනික්බිතිව රට පුරා නගර ගණනාවක රැස්වීම් මාලාවක් පවත්වා තිබූ අතර අවසන් මහා රැළිය ද 1971 පෙබරවාරි 27 වන දින හයිඩ් පාර්ක් පිටියේදීම පවත්වා තිබුණේය. මේ අතරතුර පක්ෂයේ මතවාදය ප්‍රචාරය කරනු වස් 1970 අගෝස්තු ඔවුන්ගේ මුල්ම පුවත්පත වූ ''ජනතා විමුක්ති'' නිකුත් කිරීමෙන් නොනැවති ඉනික්බිතිව ''දේශප්‍රේමී'', ''රතු කැකුළු'', ''රතු බලය'' හා ''රතු ලංකා'' යන පුවත්පත් ද මුද්‍රණය කොට ජනතාව අතර බෙදා හැරීමට කටයුතු කර තිබුණි.

**6. සන්නද්ධ අරගලය ආරම්භය හා මර්දනය**

ජ.වි.පෙ. මේ අන්දමින් තම විප්ලවීය පක්ෂයේ ආරම්භක අවධිය වූ ප්‍රචාරක අවධිය හෙවත් දාර්ශනික අවධිය පසු කරමින් සිටියදී 1970 බලයට පත්වූ සමගි පෙරමුණු ආණ්ඩුව ඔවුන්ට එදිරිව දිගටම මර්දනය පවත්වා ගෙන ගියේය. ඒ බැව් මොනවට සනාථ කරමින් 1970 අගෝස්තු 12 වන දින ආරක්ෂක ලේකම් ආතර් රාජ්කුමාර් රත්නවේල් ප්‍රකාශයක් කරමින් කියා සිටියේ ''චේ ගුවේරා ව්‍යාපාරයට ආණ්ඩුවේ අංක එකේ සතුරා බවත්, එය මුලුනුපුටා දැමිය යුතු බවත්ය.'' මේ සමගම ආරක්ෂක අංශ විසින් දිගින් දිගටම ජ.වි.පෙ. ට එරෙහිව අත්අඩංගුවට ගැනීම්, පහරදීම්, බිය වැද්දීම් හා නොයෙක් ආකාරයේ බාධා කිරීම් ක්‍රියාත්මක කරගෙන යන ලද්දේය. මේ අතරතුර 1969 අග දී පමණ ජ.වි.පෙ.න් නෙරපා හරින ලද ජී.අයි.ඩී. ධර්මසේකර කණ්ඩායම විසින් 1971 මාර්තු 06 දින කොළඹ ඇමෙරිකානු තානාපති කාර්යාලයට පහරදීමත් සමග ආණ්ඩුව හදිසි නීතිය පනවා මර්දන කටයුතු උත්සන්න කරන ලදි. ඉන්පසුව 1971 මාර්තු 13 දින රෝහණ විජේවීර සහ කෙලී සේනානායක අම්පාර ප්‍රදේශයේදී අත් අඩංගුවට ගෙන පසුව යාපනය බන්ධනාගාරයේ රඳවා තැබීමට කටයුතු කරන ලදි. 1971 මාර්තු 15 දින ''පරීක්ෂණයකින් තොරව මළ කඳන් විනාශ කිරීමේ බලතල'' පොලිසීවලට පැවරෙන විශේෂ නීති ආණ්ඩුව විසින් ප්‍රකාශයට පත් කෙරිණි. මේ මර්දනකාරී වාතාරණය තුළ දේශපාලන මණ්ඩල සාමාජිකයින් හය දෙනෙකුගෙන් හා ඉදිරිපෙළ නායකයින් නව දෙනෙකුගේ සහභාගීත්වයෙන් අප්‍රේල් 02 වන දින සවස 2.00 ට විද්‍යෝදය සංඝාරාමයේ දී නායකයින් ගේ රැස්වීමක් කැඳවා තිබුණේය. (අලස්, 1978:95) එහිදී අප්‍රේල් 05 දින රාත්‍රී 11.30 ට පහර දීමට තීරණයක් ගෙන තිබුණි. (අලස්, 1978:96) නමුත් ඒ වනවිට කළින් තීරණය වූ අප්‍රේල් 05 දින අලුයම පහරදීම සමහර දිස්ත්‍රික්කවලට දන්වා තිබිණ. එහෙත් මොණරාගල පණිවුඩය වෙනස් කිරීමට නොහැකි වීමෙන් වැල්ලවාය පොලීසියට 05 දින පාන්දර පහරදීම සිදුවිය. (අලස්, 1978:99) ආණ්ඩුවෙන් එල්ල වූ බරපතල මර්දනයත්, පක්ෂයේ අභ්‍යන්තර ගැටලුත් කරණ කොටගෙන 1971 අප්‍රේල් ඇති වූ මෙම සන්නද්ධ නැගිටීම රාජ්‍ය බලය ලබා ගැනීමේ නැගිටීමකට වඩා මර්දනයට එරෙහිව ක්‍රියාත්මක අවිගත් නැගිටීමක් බවට පත්වී තිබුණේය. එහිදී පොලිස් ස්ථාන 92 කට පහර දුන් අතර තවත් පොලිස් ස්ථාන 57 කට අලාභහානි සිදු විය. මෙම මර්දන ක්‍රියාන්විතයේදී තරුණ පිරිස් 10,000 ක් පමණ ඝාතනයට ලක් වූ අතර 20,000 ක් පමණ සිරගත කරන ලදි. එසේම මෙම මර්දනය සාර්ථකව ගෙනයනු වස් ඇමෙරිකාව, බ්‍රිතාන්‍ය, ඉන්දියාව, සෝවියට් දේශය හා චීනය ඇතුළු රටවල් 14 කින් සමගි පෙරමුණ ආණ්ඩුවට උදව් කරනු ලැබූ බව 1971 අරගලයෙන් හතළිස් වසරකට පසු බ්‍රිතාන්‍යයේ

''කෝපරේට් වොච්'' (Coperate Watch) සංවිධානයේ පර්යේෂකයෙකු වශයෙන් කටයුතු කරන ෆිල් මිලර් (Phil Miller) විසින් සිදුකළ පර්යේෂණ මගින් අනාවරණය කර ඇති බව කියැවේ. (http://www.jdslanka.org/s/index.php/2014.12.20)

මිනිසාගේ සම්භවයේ සිට මේ දක්වා මානව වංශ කතාවේ පරිණාමයේ දී බහුලව ජයග්‍රහණයන් ලබා ඇත්තේ පාලක පංතියයි. පාලිත නැති නම් පීඩිත පංතිය ජයග්‍රහණ අත්පත් කරගෙන ඇත්තේ ඉතා අල්ප වාරයන්හිදීය. එමෙන්ම මිනිසා එම ජයග්‍රහණයන් ලබාගෙන ඇත්තේ රුදුරු පාලකයින් සමග අරගල කිරීමෙනි. එම කාර්යභාරයේදී ජනතාව ප්‍රජාතන්ත්‍රවාදීව අරගල කරන විට පාලකයන් විසින් ඒවා ෆැසිස්ට්, ත්‍රස්තවාදී, කඩාකප්පල්කාරී ක්‍රියා සේ සලකා මර්දනය කරන විට ජනතාව තුවක්කු වලින් අරගල කිරීමට පෙළඹිණි. මේ අනුව ජ.වි.පෙ. 1971 අප්‍රේල් සන්නද්ධ නැගිටීම ද එවැන්නකි.

**8. සමාලෝචනය**

මෙම අධ්‍යයනයේදී ශ්‍රී ලංකාවේ විප්ලවීය දේශපාලන ව්‍යාපාරයක් වන ජනතා විමුක්ති පෙරමුණේ බිහිවීම, විකාශනය හා 1971 සන්නද්ධ ව්‍යාපාරය පිළිබඳව කරුණු විමර්ශනය කරන ලදි. නිදහසින් පසු යුගයේ බිහි වූ විප්ලවීය දේශපාලන පක්ෂයක් වන ජනතා විමුක්ති පෙරමුණේ බිහිවීම සඳහා බලපෑ හේතු පහක් මෙම මූලිකවම විමර්ශනයට භාජනය විය. නිදහස ලැබීමෙන් පසු යුගයේ ශ්‍රී ලංකාවේ සමාජ රටාවේ පැවති පීඩනය හා ජනතා අපේක්ෂා ඉටු නොවීම පිළිබඳව කරුණු ජනතා විමුක්ති පෙරමුණේ බිහිවීමට බලපෑ අන්දම මූලිකව සාකච්ඡා කරන ලදී. නිශ්චිත වැඩපිළිවෙලක් හෝ ආර්ථික දැක්මක් නොමැති වීම නිසා ජනතාව ආර්ථිකව සූරාකෑමට පැවති රජයන් ක්‍රියාත්මක වූ අන්දම ජනතා විමුක්ති පෙරමුණේ බිහිවීමට බලපා ඇති බව මෙහිදී පැහැදිලි විය. ජාතික දේශපාලන රටාවේ පැවති අඩුපාඩු හා ප්‍රතිපත්තිමය දුර්වලතා ද, ජනතා සුබසාධනයට ලබාදුන් අඩු අවධානය ද, ජනතා විමුක්ති පෙරමුණේ බිහිවීමට ඉවහල් වූ අන්දම මෙහිදී විග්‍රහ කර ඇත. තුෂ්ණි යුද සමයේ සමාජවාදී ලෝකය හා ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් අතර පැවති බල තරගය මෙන්ම සමාජවාදී ප්‍රවාහයේ පැවති මානවවාදී දේශපාලන රටාව ජ.වි.පෙ. නව දේශපාලන පිබිදීමට ආශීර්වාදයක් විය. රෝහණ විජේවීරගේ කැරිස්මාව හා සමාජ දැක්ම, සංවිධාන ශක්තිය ජනතා විමුක්ති පෙරමුණ බිහි කිරීමට ඉවහල් වූ ආකාරය ද මෙහි දී අවධානයට ලක්විය. දේශපාලන ව්‍යාපාරයක් ලෙස වර්ධනය වූ ජනතා විමුක්ති පෙරමුණ තම පළමු විමුක්ති අරගලය 1971 දී දියත් කළ අතර එය අසාර්ථක විය. මෙතෙක් පැවති දේශපාලන ව්‍යාපාරවලට අලුත් අත්දැකීමක් එක් කළ ජනතා විමුක්ති පෙරමුණ තම දැක්ම මත පදනම්ව ශ්‍රී ලංකාවේ දේශපාලන රටාව වෙනස් කිරීමට උත්සාහ දරා ඇත. ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන වර්ධනයට හා ක්‍රියාකාරකම්වලට සමකාලීන සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලන ගැටලු විශේෂ වූ දායකත්වයක් ලබා ඇති බව පෙනී යයි.

**සමුද්දේශ**


1. අබේපාල යසවර්ධන (2016), **71 කැරැල්ල සහ අපි,** කොළඹ : සාරාංගා ප්‍රකාශකයෝ
2. අලස්, ඒ.සී. (1978) **71 කැරැල්ල,** අනුවාදය, නීල් ශ්‍රී විජේසිංහ, කොළඹ: ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට් ප්‍රකාශන
3. සිල්වා, ටිල්වින් (2011) **කල්ලිවාදය පිළිබඳ දේශපාලන කියවීමක්**, බත්තරමුල්ල : නියමුවා ප්‍රකාශනයකි.
4. ද සිල්වා, කොල්වින් ආර් (1954) **හර්තාලය**, කොළඹ: සමසමාජ ග්‍රන්ථයකි.
5. ද සිල්වා, දේව මයිකල්, (2016), **''ප්‍රතිමාන'' විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහය, 10 වෙළුම**, මාතර: රුහුණ විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයනාංශය
6. **පක්ෂයේ ඉතිහාසය**, (2012),බත්තරමුල්ල: නියමුවා ප්‍රකාශන, විජේවීර, රෝහණ, (1979)**රතු ඔක්තෝබරයේ පාඩම්**, කොළඹ: නියමුවා ප්‍රකාශනයකි.
7. Amarasinghe, Ranjith (2000) **Rrevolutionary Idealism and parlimantary politics: A Study of Trotskyism in Sri Lanka**, Colombo: Social Scientist Association
8. De Silva, G.P.S.H. (1979) **Statistical Survey of Election to the Legislatures of Sri Lanka 1911 – 1977**, Colombo: Marga Institute
9. Hornblower, Simon and Antony, Spawforth, (2003),"**Jupiter'' The Classical Dictionary**, Oxford:Oxord University Press.
10. **Result of Parlimentary General Election in Ceylon 1947 – 1970**, 1971 Colombo: Govenment Press


**පුවත්පත්**


කීරවැල්ල, ගාමිණී, **දිවයින, දේශපාලනයේ මෙතෙක් කතාව**, 2015.04.20:

ගුලවත්ත, බන්දුල ආර්. **1970 මහා මැතිවරණයට පෙර දිවයින, දේශපාලනයේ මෙතෙක් කතාව,** 2015.07.27

ද සිල්වා, දේව මයිකල්, දිවයින, 1998.04.03


**පත්‍රිකා**


**ශ්‍රී ලංකා ජාතික ගුරු සංගමය, පත්‍රිකාව**, 1970.02.22


**අන්තර්ජාලය**


https://www.britanica.com/topic/J-curve-hypothesis24.08.202223.22.p.m.

http://www.jdslanka.org/s/index.php/2014.12.20


**සම්මුඛ සාකච්ඡා**


ජිනදාස කිතුලගොඩ, හිටපු ජනතා විමුක්ති පෙරමුණ පාර්ලිමේන්තු මන්ත්‍රී, බත්තරමුල්ල, අවුරුදු 70, 2016.10.12

ජොතිපාල ගමගේ, මාරඹ අකුරැස්ස, අවුරුදු 72, 2017.06.02

ආඛ්‍යාන narrations
**Volume 06 | Issue 02 | July - December 2021 | Article 07**
**ISSN 2478-0642**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

CC BY NC ND

# Authoritative Domestic Power versus Latent Domestic Power: The Decision-Making Process in the Context of Rural Sri Lanka

N.V.G. Hemantha Kumara[46]
nvghemantha@soci.ruh.ac.lk

## Abstract

The family is the most important primary group in every society. On the basis of the depth of generation, a family can be classified into two types: the nuclear family and the extended family. It is a well-known fact that different decisions are made for the survival of any kind of family. Thus, the nature of such decisions about family units can be categorised from the simplest to the most sensitive and in-depth decisions. This study analyses how reproductive health decision and economic decisions made in the rural family units. The research problem is to examine whether family decisions are made by the husbands still in the families in rural Sri Lanka. The research methodology of the study is post-positivism. Primary data for this research was obtained from the field study conducted in two villages in the Galle District, Sri Lanka. The primary data were analysed by using statistical and thematic methods. The general expectation in rural societies sticks to the point where decisions in family units should be made by men/husbands. The reason for this is men/husbands are still the heads of the family units in rural communities. Although the male dominance may appear on the surface, this researcher has identified how wives maintain a latent domestic power in rural family units. In this study, the economic role the husband as a breadwinner was significant and dominant but the power of the woman/wife in the management of the rural family was seen as latent but at the highest level. The special context of contemporary rural families in Sri Lanka can be pointed out as a force that is not visible on the surface but underlies the family structure.

**Keywords:** Rural Family, Decision Making, Male domination, Latent Power, Gender

[46] Senior Lecturer, Department of Sociology, University of Ruhuna

## 01. Introduction and problem statement

The family is the primary and most influential social institution in every society. It can be classified as a nuclear or single unit family (parents and children) and extended or undivided family (parents, children and other relatives). Furthermore, family can be described as a social group of people created by the ties of blood, marriage or adoption constitution a single household, interacting and intercommunication with each other in their respective social role of husband and wife, mother and father, brother and sister creating a common culture (Rao, 1999:392). It is generally assumed today that the recent family has changed in its structure. However, each of these families is integrated into the cultural foundation of their society. In this context, recent research has found that the structural transformation in rural families is the transformation of extended families into nuclear families (Nass,1998; Hemantha kumara,2017, Rasnak,2011; Karunanayake, 2000). It is a well-known fact that different decisions are made for the survival of any kind of family. In this context, it is useful to look at the concept of the decision-making process. Decision making is a term used to describe the process by which families make choices, determine judgments, and come to conclusions that guide their behaviour. Family decision making is a term used to describe the behaviour of family members, the discussion of choices, the formation of consensus, and the finalisation of conclusions (Foster and Olshansky, 1989). This study intends to investigate how gender relations operate on the decision-making process in the rural family system. As such, the researcher defines gender relations and household work are necessarily the hierarchical relationship of power system built upon between men and women, women and women, men and men in the gender wise that tend to disadvantage for women. Accordingly, the process of making family decisions can be divided into four main themes as follows.

(a) The nature of power relationships in the utilization of family income,

(b) The nature of decision - making regarding to procreation,

(c) The nature of decision - making related to the use of family planning methods,

(d) The nature of decision -making about the time of the first childbirth and the gap between two births.

In particular, it should be noted that women in this study area have created and maintained nuclear families after their marriages. The research problem is to examine whether the family decisions are made by the husbands in rural family units in Sri Lanka.

## 02. The objective of the Study

The overall objective of this study was to identify how gender relations operate in the decision-making process in rural families. But this study has not considered the overall decisions making process in family units. Accordingly, the study sought to identify how reproductive health decisions and economic decisions interact in two selected rural communities in Sri Lanka.

## 03. Methods and Methodology

This study was descriptive research and both qualitative and quantitative methods were used. The data were analysed using statistical and thematic analysis methods. Rejinopura and Bathdungoda villages were selected as the field settings for this study. These villages are situated within the two Divisional Secretariat divisions in the Galle District of Southern Sri Lanka.

From the list of 1706 people over 18 years of age in these two villages, 200 people were selected (refer table no. 01). The sample technique was the non-probability sampling method. Data collection entailed questionnaires and face- to-face interviews with samples. Apart from this, overt direct observations, case studies and key informants were used to gather information. Hence researcher met with 03 key informants and conducted 06 case studies in these two villages.

**Table No. 01: Sample of the Study**

| Gender | Rejinopura | | Bathungoda | |
|---|---|---|---|---|
| | **Population** | **Sample** | **Population** | **Sample** |
| Female | 164 | 30 | 748 | 80 |
| Male | 133 | 20 | 661 | 70 |
| Total | 297 | 50 | 1409 | 150 |

Source: Field Study, 2017

### Ethical Consideration

In order to maintain the privacy of respondents as per the research ethics, it should be noted that pseudonyms were used here instead of real names of people and villages. But one might speculate the above villages, but it is impossible to guess who respondents were. Therefore, the privacy of any respondents will not be compromised by this research. Accordingly, no harm was done to the respondents by the research.

## 04. Conceptual Frame

There are various definitions and interpretations of the core concepts associated with this research. Therefore, it is important to clarify how this researcher used these core concepts in the study.

**Family unit and decision-making process**: The researcher formulated working definitions for the concept of family unit. A family unit consists of at least two generations of people living under a single roof. The following two types of units in the study area were considered by the researcher.

i. A person who settled with neo-local residence after the marriage and registered under the Grama Niladhari office as a separate family unit,

ii. A person who continues to live with his or her parents after marriage but is registered as a separate nuclear family unit under the Grama Niladhari office.

After the concept of the family unit is defined as above, the meaning of the decision-making process should be pointed out. The decision-making process has previously been

defined simply by the researcher. In addition, it is important to point out the following ideas. It can be seen that the most attractive and fancy models related to the decision-making process of any organisation or institution have been created by various academics by now. But at the grassroot level in Sri Lanka, family decisions are not made in accordance with such models. Therefore, it is more important to find out how they make their decisions and to examine if the way they create their decisions is compatible with such models. Therefore, this study does not focus on the literature of decisions making models. It should be made clear that this study is intended to present the grassroot level decision making process of family units in the rural context of Sri Lanka.

**Emic and Etic approaches:** Emic and etic are two different approaches when attempting to explain social realities observed during field studies in social anthropology and other social sciences. The Etic approach is the perspective of the observer or the outer realm. In this approach the researcher tries to explain the social realities they observe using the theoretical perspectives of social sciences. The Emic approach is the native view or else the view of the community that was subjected to the study. In this approach, explanations, logic, meanings, beliefs, and worldviews of the studied communities are used to explain the particular values, beliefs, or practices. This is the way actual people understand what they do and think. These approaches may contradict each other in some conclusions, but they are not mutually exclusive and good ethnography should include both. Studies done from an emic perspective often include more detailed and culturally rich information than studies done from an etic point of view (https://www.anthroencyclopedia.com/entry/emic-and-etic, Accessed on 02nd January 2021). As per the emic view, collected primary data and information have been mentioned in the boxes with the very words of relevant respondents of these two villages. This was done to prevent the distortion of ideas and sentiments.

**Authoritative Domestic Power and Domestic Latent Power:** Power can be defined as the ability to make decisions that affect the lives of others (Silva, 2007). The authoritative power is the power of the husbands as the breadwinners. It refers to the power of husbands or fathers of children in a rural society with a patriarchal family system. In these villages, the Grama Niladhari also registered the husband's name as the head of the family when registering these rural families for governmental activities. For this reason, the superficial recognition of the husband as the head by the family members and grassroots level government administrative officers. In this situation husbands or fathers are considered the head of the family with authoritative domestic power. Ramanie Jayathilake (1998) has pointed out, what kind of the changes occurred in the domineering power of the family. Mallika Pinnawala (2013) in her research has also pointed out that wives have become stronger in the management of family and community-based activities. Michael Ruth Gamebird describes how Sri Lankan women have migrated as housemaids in the Middle East. These women have changed not only the myth of women’s intelligence but also the perception of women’s work. Not only that the notion of the power of men in the family units has changed within this context (Gamebird, 2000). Mallika Pinnawala too has mentioned how women act as the manager of the household. According to her women's involvement in the family decision-making process has increased (Pinnawala, 2013).

**05. Findings and Discussion**

This study was conducted in order to identify the decision-making processes of family units in Rejinopura and Bathdungoda. The study findings are presented below according to the following themes.

1. The nature of the power relationship of family income utilisation,
2. The nature of the decision to build a family of the pro-creation,
3. The nature of the decision on the use of family planning methods,
4. The nature of the decision making about the time of the first childbirth and determine the gap between two births.

**7.1 The nature of the power relationship of family income utilisation**

The majority of women in both villages do not involve in any formal employment activities. As such the majority of the family units in these villages depend on the husband as the breadwinners whose responsibilities play vital roles (Refer table No.02).

**Table No.02: The nature of the income earning process in rural families**

| **Responses** | **No. of Respondents** | **Percentage** |
|---|---|---|
| Husband only | 147 | 73.5 |
| Wife only | 03 | 1.5 |
| Husband and wife | 22 | 11 |
| Husband and children | 12 | 06 |
| All members of the family | 16 | 08 |
| Total | 200 | 100 |

Source: Field study, 2017

The significant question asked of the respondents was "Who earns the income of the family?" According to the answers given by the respondents, as in the table No: 02, in 73.5% of families, income is earned by the husbands. The wives reported that they had earned family income of 1.5%. The husband and wife earn 11% of families and husband and children 6% respectively. The answer of eight percent (8%) of the respondents is that they earn the family income together. According to the observation, the dominance of husbands in earning family income is prominent in these villages. Also, it reveals the significance of the economic role of husbands. They play the role of "The Economic Heads" in their families (Refer box No. 01 & 02).

**Box No. 01 - (Case study No. 01) - Male – 42 years, Bathdungoda Village**

"I work as a mason. My wife takes care of every household chore. My children tell everything to their mother and ask the mother to give them what they need. After my daily work, I enjoy some hot drink on my way home. Then, I came home and eat whatever was ready and sleep peacefully. I must say that my family is run by my wife."

**Box No. 02 – (Case study No. 02) - Male – 31 years, Rejinopura Village**

"I have passed just grade five in my school level. My wife has studied more than me and she sat for her advanced level examination too. We are blessed with two children. The wife fulfils all household chore. I only have to handover my monthly wage. I treat her less than she deserves."

**Table No. 03: The decision on who keeps the husband's income**

| Responses | Rejinopura | | Bathdungoda | | Total Percentage |
|---|---|---|---|---|---|
| | No. of Respondents | Percentage | No. of Respondents | Percentage | |
| By the husband only | 09 | 26 | 27 | 22 | 22 |
| Handing over to the wife | 21 | 60 | 71 | 63 | |
| By both the husband and wife | 05 | 14 | 17 | 15 | 15 |
| Total | 35 | 100 | 112 | 100 | 100 |

Source: Field study,2017

According to table no.02, 147 (35+112) of respondents reported that family income had been earned only by the husbands. The details of them have been presented in table no. 03, and also, they have highlighted that the husbands are not possessed of bank accounts. But they have understood the importance of it. The women too have not opened bank accounts due to the unavailability of the banks in their proximity.

This researcher next asked them, "Who keeps the husband's daily or monthly income". According to figure no. 02, 60% of the income earned by husbands in Rejinopura and 64% of in Bathdungoda, hand over their income to wives, marking 63% of average.

This is considered a special situation. If there is a patriarchy regarding the keeping of family income, the men themselves must retain it. But only 22% of husbands keep the income with them. This situation shows, that by empowering the women kind to maintain family expenses, they are more careful than their counterparts in the management of income.

Also, the earnings of the families in both villages are insufficient for luxurious lives, but just for their survival. In their own words, it is hardly enough to meet the daily

requirements. This situation leads their wives to follow frugal ways of spending for their daily needs (Refer box. No. 03 and 04). Although this situation is unobvious, it can be conceptualised that wife is indispensable for managing the family income. It can be described that the wife has become an integral part of the process of managing it. This is a unique situation that has been identified in these two villages.

**Box No. 03 – (Case study No.03) - Male 42 years, Bathdungoda Village**

"l am a daily wage earner. Every evening of my working day, I keep some money to enjoy some hot drink and cigarette and give the rest to my wife. This method has been practiced since the beginning of my marriage. She spends money very carefully. Also, she saves a portion of this money even for the days I could not hire my labour."

**Box No. 04 – (Case study No. 02) – Male, 31 years, Rejinopura Village**

"When I get the monthly salary, I keep some amount for my expenses and give the balance to my wife. She manages the monthly expenditures of my household with difficulty. Sometimes I am compelled to ask for some money from her in the case of an emergency. Also, my wife earns some amount of money herself by making and selling coir."

Under the column "by husbands only" in table no.03, total percentage of respondents is 22%. It reveals that the husbands operate their whole power within the family unit. However, gender equality in matters of family units is expected within the modern globalisation process. Under the column "by both husband and wife", the percentage of Rejinopura is 14% and 15% in Bathdungoda, respectively, showing 15% of the average percentage. This is a somewhat adverse result of considering the concept of gender equality. (Refer to box no. 05)

**Box No. 05 – (Case study No. 02) - Male, 31 years - Rejinopura Village**

"How can women be equal to men? However, I give the money to the wife for family expenses. She spends the money that I gave her on family chores. Women are not equal to men just because they do that. It would be a shame for men if we say women are somewhat similar to men. Anyhow, women should be put in the right place for them, but it should be lower than men."

### 7.2 The nature of the decision to make the family of procreation


The section one of the International Convention of the Economic, Social and Cultural Rights (ICESCR) has proclaimed that selecting a partner for the family of procreation and starting a family is a human right. Then, the researcher also examines the nature of those rights in the selected study area. According to the findings by the researcher in the study area on the above concept, 88% of marriages from Rejinopura and 83% of marriages from Bathdungoda have been arranged based on love affairs. These figures show that 84% of families from both villages have started their families by

selecting a partner through a love affair. Responses are in box no. 04, to the question posed by the researcher, "Who made the decision to get married?" This means the decision was made by the boyfriend, girlfriend or other person. The response to this question is given in the below table.

**Table No. 04: 2. The nature of the decision to build a family of procreation**

| **Responses** | **Rejinopura** | | **Bathdungoda** | | **Percentage** |
|---|---|---|---|---|---|
| | **No. of Respondents** | **Percentage** | **No. of Respondents** | **Percentage** | |
| By the lover | 13 | 30 | 05 | 04 | 11 |
| By both (lover and his fiancée) | 18 | 40 | 71 | 58 | 53 |
| Forced by fiancée | 02 | 05 | 13 | 11 | 09 |
| Forced by fiancée's father | 04 | 09 | 17 | 14 | 13 |
| Forced by fiancée's brother | 07 | 16 | 16 | 13 | 14 |
| **Total** | 44 | 100 | 124 | 100 | 100 |

Source: Field study, 2017




Source: Field Study, 2017

Table no. 04 shows that 40% of families in Rejinopura and 58% of Bathdungoda have arranged their marriages as a result of love affairs and with the decision taken by both fiancés, marking an average of 53%. This feature of arranging marriages on mutual understanding is common to both villages. Another important feature of marriages in both villages is, that 36% of them have married under the influence of the father or

brother of fiancée. This situation has occurred due to the tendency to break up intimacy on the part of males, delay of marriages, or postponement of marriages in order to build up the family economy (Refer box no. 03, 04, 06, and 07).

**Box No. 06 – (Case study No. 01) - Male, 42 years - Bathdungoda Village**

"I got married to her after our love relationship. I had several similar intimacies. I became friendly with her without the idea of getting married to her. Yet we carried on our love affair sexually very closely and thereby I could not escape from her grip. Finally, I too felt sympathy. Now we have got big children. I am not lost because of my marriage. My wife is a good woman."

Even though their affairs are ended with a marriage according to the case study in box 06, the women are unaware of that; they have been used as sex objects at higher percentage in these two villages. (Refer box no. 06 & 07). The women have evidenced that it had been a common situation in their society. They do not recognise it as a patriarchal system (emic view).

**Box No. 07 – (Case study No. 04) - Female, 24 years - Rejinopura Village**

"Our love affair began since our school time. After I left the school, he started to visit my home. My boyfriend's job was a fisherman (in Sinhala '*Muhudu rassawa*'). But now he owns an engine boat. However, those days my mother and little sister favoured him. Later on, my father strongly told him ' it is not correct to visit me now and then. My father has commanded him to decide before the end of 2014. Due to the father's strong command, this marriage has happened. But now there are no family issues within us."

### 7.3.The nature of the decision on the use of family planning methods

It should be noted that this is a matter of sexual freedom and sexual protection for the individual. The number of respondents is limited for this matter because sexual freedom and protection are very sensitive issues that can affect to the personal lives of individuals. Therefore, eighteen women out of thirty who live in Rejinopura and forty two out of eighty women who live in Bathdungoda, only agreed to answer the questionnaire about family planning methods (Refer box no. 08).

**Box No. 08- (Case study No. 04) - Female, 24 years - Rejinopura Village**

"We do not discuss family planning openly with outsiders. Those things are considered as a matter of great shame in our villages. You are no longer an outsider to us. I mean, now that you became friendly with us, I can tell you about these things."


It should be further mentioned that 08 women of Rejinopura and 21 of Bathdungoda are over 45 years old. The question asked on family planning, "Which type of family planning method are used at present and were used in the past?". The

other women were asked, "Which type of family planning methods are practiced at present"? (Refer box. No. 09). Data are presented in table no.05.

**Table No. 05: The decision about the family planning**

| Responses | Rejinopura | | Bathdungoda | |
|---|---|---|---|---|
| | No. of Respondents | Percentage | No. of Respondents | Percentage |
| By husband | 01 | 06 | 03 | 07 |
| By wife | 06 | 33 | 11 | 26 |
| By both | 02 | 11 | 05 | 12 |
| By Midwives | 09 | 50 | 23 | 55 |
| Total | 18 | 100 | 42 | 100 |

Source: Field study, 2017




**Box No. 09 – (Case study No.05) Female, 48 years - Bathdungoda Village**

"I cannot tell these things openly. I am ashamed. I don't even talk to the midwife"

According to the above data, the majority of family planning methods related to these women are based on the decisions of midwives. This is shown to be 50% in Rejinopura village and 55% in Bathdungoda community, making an average of 53% for the study areas. As per the influence of external factors the behaviour of family planning

will be subjected to change. Also, these women seem to have accepted the interactions given by the family health officers/ midwives (see box no.10). Besides, the lack of knowledge about family planning methods has led the majority of these women. Therefore, they depend on the decisions of the midwives. This reveals their lack of knowledge in these matters and their willingness to obtain relevant guidance from knowledgeable people. This can be considered as a progressive step in deciding on family planning methods by both study areas. Subsequently, the same situation was identified when the following question was asked the respondents. That is, who determines the number of children a family need? women furnished similar information somewhat parallel to aforesaid particulars.

### 7.4. The Nature of the decision making about the time of first childbirth and the determining the gap between two births

**Box No. 10 – (case study No. 06) Female, 34 years - Rejinopura Village**

“Advice given by the midwife is more believable. We do not learn much, so we accept her advice.”

As mentioned earlier, below are the answers to the question “How many children the family need? It was decided by the husband or wife alone, and it is a lower percentage in both communities. It is pretty much the same in both villages that it was decided by both spouses as well as midwives collectively. However, there are few women in the villages who make this decision based on the opinion of the midwives. The reason for making a decision only on the advice of midwives is the low level of education of these women (see box no. 11). The education level of women in Bathdungoda is higher than that of the Rejinopura community. Therefore, the percentage of the women who make this decision collectively is higher in Bathdungoda village. It is 32% in Bathdungoda and 25% in Rejinopura. This seems to be more progressive step than making such a decision alone.


**Box No.11 – (Case study No. 06) - Female, 34 years - Rejinopura Village**

" “During my school days, I didn’t study well. I don’t think that women in our villages have studied well. Therefore, when it comes to the topic of rearing children, most women have the habit of accepting the advice of midwives."

**Table No. 06: The Decision about the time of first childbirth**


| Responses | Rejinopura | | Bathdungoda | | Percentage |
|---|---|---|---|---|---|
| | No. of Respondents | Percentage | No. of Respondents | Percentage | |
| By Husband | 08 | 16 | 12 | 13 | 14 |
| By Wife | 02 | 04 | 04 | 04 | 04 |
| By Both | 39 | 76 | 76 | 83 | 82 |
| Total | 49 | 96 | 92 | 100 | 100 |

Source – Field Study, 2017




Source – Field Study, 2017

It is important to consider how long it will take to have a child after the marriage. The majority of marriages in both villages are based on romantic (love) relationships. There are 49 marriages based on romantic relationships in Rejinopura and 92 in Bathdungoda. Also, a married couple in Rejinopura and two couples of Bathdungoda have no children. But they were included in the study sample. A married couple in Bathdungoda has no children even after seven years. They too have decided about the duration of first childbirth hence included in the sample. According to the above table 80% of Rejinopura and 83% of Bathdungoda, an overall percentage of 82% for both the taken were together this decision. This nature reflects the symmetrical behaviour existing among these families. Nevertheless, it cannot be forgotten that 16% of Bathdungoda and 13% of Rejinopura men have taken this decision aloneAlso, the decision on the duration between child birth and number of children, should be noted. The decision on how many children should be in a family also has been depicted in the following graph (Refer figure no.05).




Source – Field Study, 2017

It has already been mentioned that the decision on the number of children in the family should be taken by all parties as shown by 25% in Rejinopura and 32% in Bathdungoda. The next focus is on the relationship between determining the age gap between two childbirths. Whereas, the nature of this decision is that Rejinopura shows 35% and Bathdungoda shows 45% (refer figure no. 05). This can be identified as an asymmetrical relationship related to the family units in both communities. The defference between the number of children a family needs and the two child births is determined by the fact that only one of the spouses has a very low percentage in both villages. At the same time, the decision made on the instructions given by the midwives shows a higher percentage of family units. But it should not be considered as an individual decision. This decision should be considered as a decision that combines modern medical knowledge with the ideology of globalization. Because village level health officers/ midwives have always advised the villagers to build up a small family unit with two children. This idea is in line with sustainable development goals (SDGs) and global tendencies. Accordingly, western medical knowledge and the ideology of globalisation have been internalised in these villages in the beneficial decision making of family units.

## 08. Conclusion

The structure of the family has shifted from the extended to the nuclear in rural Sri Lanka. This situation is also seen in the study areas. Despite the fact that the family is structurally changing, the idea of treating the husband as the breadwinner of the family and the wife as the housewife is still established in these two villages. Although the work of wives in formal employment or income streams is considered as the 'work,' the roles played by wives in domestic work are not considered as 'the work'. It was observed in both these villages. This common situation can be conceptualised as the inner view of rural people or the emic view.

The husband's economic role in earning income for the family was dominant in both villages. But the power of married women in managing the family was seen as latent but at the top level. In other words, gender decision on earning and wages of husbands increase their power and authority in the family economy. But rural wives who exercise the controlling power of wages and earnings can be identified accordingly. The modern cultural ideology of globalisation has not influenced the re-establishment of this situation for rural families. As per the etic perspective (outsiders' view) these type of decisional making patterns are not suitable for a modern globalised society. But the vision of these communities (the emic perspective or Insider's view) does not see it as an unsuitable thing. It can be conceptualised as a ' global-local structure in rural families.

Reproductive health decisions were analysed as follows in this study. They are (a). Creating a family of procreation, (b). practising family planning methods, (c). birth of the first child and (d). the age gap between two births. Marriages solemnised on love have a common percentage of 84% in both villages, while marriages solemnised on mutual or common agreement have percentage of 53%. It is evident a considerable number of males enjoy the freedom to have love affairs without the aim of selecting a female partner for his marriage.

Thereafter the decision making in selecting family planning methods by the midwives had influenced 53% of her beneficiaries. Whoever enforced, whether, by wife, husband or midwives, it maybe inclined to use 'feminine methods. 'Hence the majority of women use pills, loops etc. It cannot be concluded that the presence of any male domination has caused this position. Some of the reasons that might have affected this one side practice are; being an easier and more widespread method, more reliability in women than men etc. When deciding the number of children required for the families in Rejinopura and Bathdungoda showed the percentages of 25% and 32% respectively, were opted by common agreement. Based on the advice from midwives were taken by 54% and 32% respectively for the same two villages. Even the school textbooks advising on the "idea of the small family" might have been conceived in the minds of these residents. Some 82% declared, that they fully agreed to have their first childbirth begin after some duration from their marriages. It is a progressive feature that the marriage partners jointly decide on the number of children needed for their families. The age difference between two childbirths is determined by a single party with a 05% percentage for Rejinopura and 13% percentage for Bathdungoda village.

Thus, from the overall analyses of this research, it was observed that "a shade of symmetrical relationship in the family" in these villages. It is needed not to say this silhouette of the extended structure of a family transform into the nuclear structure. This too clarifies the decision -making relationships of these rural families based on the view of global-local nature. This means that these rural communities have created a special decision-making process by combining the emic vision (local view) and the etic vision (global view). Accordingly, it explains the inability to look at the decision-making process of rural families from one perspective.

**References**

Dasgupta, S. (2004). The Changing Face of Globalization, New Delhi: Sage Publications.

De Silva, Premakumara and Abeyrathna Aththanayake. (2007). Modernity, Post Modernity and Sociological Theory, Colombo: Fast Publishing Limited.

https://www.anthroencyclopedia.com/entry/emicIrene,( Accessed on 02.01.2021).

Foster, R. and R. W. Olshansky. (1989). "An Exploratory Study of Family Decision Making Using a New Taxonomy of Family Role Structure", in NA - Advances in Consumer Research Volume 16, eds. Thomas K. Srull, Provo, UT: Association for Consumer Research, Pages: 665-670

Gamebird, M.R. (2000). The Kitchen Spoon's Handle: Transnationalism and Sri Lanka's Migrant Housemaids, New Delhi: Cornell University Press.

Hemantha-Kumara, N.V.G.A. (2017). Sociology of Family, Kinship and Marriage, Galle: New National Printers and Ruhuna Study Circle.

Jayathilake, R. (1998). Globalization and Rural Women, Colombo: Centre for Society and Religion.

Karunanayake, N. (2000). Changing Patterns of Marriage in Sri Lanka, Colombo: Institute for Professional Development.

Moser, M. (1985). Gender Planning and Development, New York: Routledge Group.

Nass, S. (1998). Marriage and Family, Canada: Wesley Publishing Company.

Pinnawala, M. (2013). Sri Lankan Housewives in the Middle East, Colombo: Ariya Publishers.

Rao, C.N.S. (1999). Sociology, New Delhi: S. Chand and Company.

Ransack, B. (2011). Family and Society, Colombo: Ariya Publishers.

Robertson, R. and J.A. Scholte. (2007). Encyclopaedia of Globalization, New York: Rutledge Group.

Silva, K.T. (2007). Caste, Class and Changing Sri Lankan Society, Kandy -Sri Lanka: Community Study Circle.

Turner, B.S. (2010). The Routledge International Handbook of Globalization, London: Routledge Group.

Young, M. and P. Wilmot. (1975). The Symmetrical Family, Harmondsworth: Penguin Books.